# ආර්ථික විද්‍යාව

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

**(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

web : www.nie.lk
Email : info@nie.lk

# ආර්ථික විද්‍යාව

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

වාණිජ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

web : www.nie.lk

ආර්ථික විද්‍යාව

13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය 2018

ISBN :

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය :

# පටුන

| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v-viii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | ix |
| ඉගෙනුම් පල හා ආදර්ශ ක්‍රියාකාරකම් | 01-228 |
| මූලාශ්‍ර | 229 |

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

ආචාර්ය ජයන්ති ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශකත්වය හා අනුමතිය** **ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

**විෂය සම්බන්ධීකරණය**

ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර මයා,
කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂයමාලා උපදේශක කමිටුව**

| | |
|---|---|
| සම්මානිත මහාචාර්ය ඩී. අතපත්තු මයා | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,<br>රුහුණ විශ්ව විද්‍යාලය. |
| මහාචාර්ය ඊ. දයාරත්න මයා | වාණිජ විද්‍යා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. |
| මහාචාර්ය ප්‍රසන්න පෙරේරා මයා | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,<br>පේරාදෙණිය විශ්ව විද්‍යාලය. |
| ආචාර්ය එම්. ගණේශමූර්ති මයා | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,<br>කොළඹ විශ්ව විද්‍යාලය. |
| ආචාර්ය බී. ඩබ්. ආර්. දමයන්තී මිය | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය. |
| පී. එච්. කුසුමාවතී මිය | අධ්‍යක්ෂ වැඩ ආවර්ණ,<br>වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර මයා | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| එම්. කමනි පෙරේරා මිය | අධ්‍යාපන අධ්‍යක්ෂ, වාණිජ ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| එල්. අජන්තා විතාරණ මිය | විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති,<br>ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ. |
| අයි.පී. සීතා පද්මිණි මිය | ගුරු සේවය I,<br>ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය, කෑගල්ල. |
| ඩබ්. ලයනල් මයා | ගුරු සේවය I,<br>විශාඛා බාලිකා විද්‍යාලය, කොළඹ. |
| එ. එච්. ජී. එ. විජේවර්ධනන මිය | ගුරු සේවය I,<br>ගුරු මධ්‍යස්ථානය, තබුත්තේගම. |

| | |
|---|---|
| බී.එස්. තිලකරත්න මයා | ගුරු සේවය I,<br>ස්වර්ණමාලී බාලිකා විද්‍යාලය, මහනුවර. |
| හෂීනා මුසාදික් මිය | ගුරු සේවය I,<br>ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, බම්බලපිටිය. |

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| පී. එච්. කුසුමාවතී මිය | අධ්‍යක්ෂ වැඩ ආවර්ණ,<br>වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| එම්. ඒ. අයි. පී. පෙරේරා මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| කේ. ප්‍රභාහරන් මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>වාණිජ දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර මයා | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| ආනන්ද මද්දුමගේ මයා | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| එස්. ආර්. රත්නජීව මයා | සහකාර කථිකාචාර්ය,<br>වාණිජ දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩී. ඩී. දීපවංශ මිය | සංඛ්‍යා ලේඛනඥ,<br>ජනලේඛන හා සංඛයා ලේඛන<br>දෙපාර්තමේන්තුව. |
| එ. එච්. ජී. එ. විජේවර්ධන මිය | ගුරු සේවය I,<br>ගුරු මධ්‍යස්ථානය, තඹුත්තේගම. |
| එම්.එෆ්. මදනියා මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>ගාල්ල |
| කේ. පී. කරුණාරත්න මයා | ගුරු සේවය I,<br>ථේරපුත්ත ජාතික පාසල, අම්බලන්තොට. |
| පී. ආර්. එස්. රාජසිංහ මිය | නියෝජ්‍ය විදුහල්පති,<br>පොලේගොඩ මහා විද්‍යාලය හොරණ. |
| එල්. ඩී. ටී. නිෂානී මිය | ගුරු සේවය I,<br>ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ. |

## බාහිර සම්පත් දායකත්වය

| | |
|---|---|
| එල්. අජන්තා විතාරණ මිය | විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති, ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ. |
| ඩබ්. ලයනල් මයා | ගුරු සේවය I, විශාඛා බාලිකා විද්‍යාලය, කොළඹ. |
| අයි. පී. සීතා පද්මිණි මිය | ගුරු සේවය I, ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය, කෑගල්ල. |
| එ. එච්. පී. එ. විජේවර්ධනන මිය | ගුරු සේවය I, ගුරු මධ්‍යස්ථානය, තඹුත්තේගම. |
| බී. එස්. තිලකරත්න මයා | ගුරු සේවය I, ස්වර්ණමාලී බාලිකා විද්‍යාලය, මහනුවර. |
| කේ. පී. කරුණාරත්න මයා | ගුරු සේවය I, ථේරපුත්ත ජාතික පාසල, අම්බලන්තොට. |
| එ.එම්. එෆ්. මදනියා මිය | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගාල්ල. |
| හෂීනා මුසාදික් මිය | ගුරු සේවය I, ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, බම්බලපිටිය. |
| එල්. ඩී. ටී. නිෂානී මිය | ගුරු සේවය I, ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ. |
| කේ. පී. චන්ද්‍රලතා මිය | ගුරු සේවය I, විද්‍යාකර බාලිකා විද්‍යාලය, මහරගම. |
| පී. ආර්. එස්. රාජසිංහ මිය | විශ්‍රාමික නියෝජ්‍ය විදුහල්පති, පොල්ගොඩ මහ විද්‍යාලය, හොරණ. |
| පී. ඩී. ධම්මිකා මිය | ගුරු සේවය II, පොලේගොඩ මහ විද්‍යාලය, හොරණ. |
| එම්. පී. ජේ. පවිත්‍රානී | ගුරු සේවය II, සිරිමාවෝ බාලිකා විද්‍යාලය, කොළඹ. |

## සංස්කාරක මණ්ඩලය

| | |
|---|---|
| සම්මානිත මහාචාර්ය ඩී. අතපත්තු මහතා | ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්ව විද්‍යාලය. |
| ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර මයා | කථිකාචාර්ය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

**පරිගණක වදන් සැකසුම**

1. ජානකී දසනායක, ජාතික අධ්‍යාපන ආයතනය.

**විවිධ සහය**

1. ටී. එස්. මැණිකේ මිය, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

2 ඩබ්. ඒ. ඒ. වික්‍රමාරච්චි මයා, වාණිජ දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය, වසර අටකට වරක් ක්‍රියාත්මත වන්නා වූ විෂයමාලා නවීකරණ ප්‍රතිපත්තියට අනුව නවීකරණය කර 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. පළමුවරට 2009 වර්ෂයේ දී නිපුණතා පාදක ව හඳුන්වා දෙන ලද ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය යාවත්කාලීන කර 12 හා 13 ශ්‍රේණි සඳහා නිපුණතා 12ක් යටතේ පෙළ ගස්වා ඇත. 13 ශ්‍රේණිය සඳහා අදාළ වන විෂය නිර්දේශයේ හත් වන නිපුණතාවේ සිට 12 වන නිපුණතාව දක්වා වන නිපුණතා මට්ටම් 42 සඳහා පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙහි යොජනා කෙරේ.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ආර්ථික විද්‍යාව විෂය නිර්දේශයේ 13 ශ්‍රේණිය සඳහා වන සියලු ම නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත. මෙහි දී අදාළ නිපුණතාව, නිපුණතා මට්ටම, එම නිපුණතා මට්ටම සඳහා වෙන් කර ඇති කාලච්ඡේද ගණන හා නිපුණතා මට්ටම අවසානයේ දී ළඟා කර ගත යුතු ඉගෙනුම් ඵල පළමුව දක්වෙන අතර, අනතුරු ව පාඩම් සැලසම් කිරීම සඳහා යෝජනා කෙරෙන උපදෙස් හා විෂය කරුණු ද පැහැදිලි කර ගැනීමට අත්වැලක් ද ඉදිරිපත් කර ඇත.

මෙහි යොජිත, පාඩම් සැලසුම් කිරීම සඳහා වන උපදෙස් අනුව, ආර්ථික විද්‍යාව විෂයයට අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම පමණක් නොව ඒ පිළිබඳ සිසුන්ගේ ආකල්ප, කුසලතා හා පුරුදු සංවර්ධනය කෙරෙන පරිදි පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් ලැබේ යැයි අපේක්ෂා කෙරේ.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් හා විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් හි සඳහන් කරුනු පරිශීලනයෙන් පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කර ප්‍රායෝගික ඉගෙනුමට සිසුන් යොමු කිරීම සෑම ගුරුභවතෙකු විසින් කළ යුතු වේ.

ආර්ථික විද්‍යාව ප්‍රායෝගික විෂයයක් වන බැවින් එදිනෙදා ආර්ථිකයේ වෙනස් වීම් පිළිබඳ අධ්‍යනයේ සිට විෂය නිර්දේශයට අදාළ විෂය කරුණුවල ඇතිවන වෙනස් වීම් පිළිබඳ ව සැලකිලිමත් වී ගුරුභවතුන් විසින් පාඩම් සැලසුම් සකස් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර
**ව්‍යාපෘති නායක.**

# ඉගෙනුම් පල හා

# ආදර්ශ ක්‍රියාකාරකම්

**නිපුණතාව 7.0 : මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.1 :** මුදල්, මුදල් වර්ග හා මුදලේ කාර්යයන් විමසා බලයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- මුදල් අර්ථකථනය කරයි.
- හොඳ මුදලක ලක්ෂණ පැහැදිලි කරයි.
- මුදලේ කාර්යයන් නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- මුදල් වර්ගවල විශේෂ ලක්ෂණ ඉදිරිපත් කරමින් ඒවාට නිදසුන් සපයයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- අතීතයේ මුදල් වශයෙන් භාවිත කළ සිප්පි කටු, ලෝහ කැබලි, පැරණි කාසි හා වර්තමානයේ මුදල් වශයෙන් භාවිත කරන කාසි, නෝට්ටු, චෙක්පත්, භාණ්ඩාගාර බිල්පත්, ණයපත්, හරපත් ආදිය සිසුනට ප්‍රදර්ශනය කරන්න.
- ඒ පිළිබඳ ව ශිෂ්‍යයන්ගෙන් අදහස් විමසන්න.
- ඒ ඇසුරෙන් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අතීතයේ මුදල් වශයෙන් සිප්පි කටු, ලෝහ කැබලි වැනි දෑ භාවිතයට ගෙන ඇත.
  - වර්තමානයේ මුදල් වශයෙන් කාසි හා නෝට්ටු, චෙක්පත්, භාණ්ඩාගාර බිල්පත්, ණයපත් ආදි විවිධ දෑ භාවිත කරයි.
  - අතීත මුදල් හුවමාරු ක්‍රියාවලියේ දී පැවති ඇතැම් දුර්වලතා වර්තමාන මුදල් භාවිතයත් සමඟ මඟ හැරී ඇත.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් මූල්‍ය උපකරණ අතුරෙන් ඔබේ කණ්ඩායමට ලැබෙන මූල්‍ය උපකරණ පිළිබඳ අවධානය යොමු කරන්න.
  - රුපියල් දහසක් වටිනා මුදල් නෝට්ටුවක්
  - රුපියල් දස දහසක් වටිනා චෙක්පතක්
  - රුපියල් දස දහසක් වටිනා භාණ්ඩාගාර බිල් පතක්
  - රුපියල් දස දහසක් වටිනාකම ඇති ණයපත්
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති මූල්‍ය උපකරණය හොඳින් පරීක්ෂා කරන්න
- එහි දක්නට ලැබෙන අංග ලක්ෂණ හඳුනා ගන්න.

- අදාළ මූල්‍ය උපකරණ භාවිත කර ඔබට කළ හැකි කාර්යයන් නම් කරන්න.
- ඔබට ලැබී ඇති මූල්‍ය උපකරණය අනෙක් මූල්‍ය උපකරණ සමග සසඳමින් එහි ඇති සුවිශේෂ ලක්ෂණ හඳුනා ගන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑ ම දෙයක් මුදල් වශයෙන් සලකනු ලැබේ.
- හොඳ මුදලක පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි ය.
  - පොදු පිළිගැනීමක් තිබීම
  - කල්පැවැත්ම
  - සමජාතීය බව
  - කුඩා කොටස්වලට බෙදිය හැකි වීම
  - පහසුවෙන් එහා මෙහා ගෙනයාමට හැකි වීම
  - වටිනාකම ස්ථාවර ව පැවතීම
  - නීත්‍යානුකූල වලංගු භාවය
  - සුලබ හෝ දුර්ලභ හෝ නොවීම
  - අනුකරණය කළ නොහැකි වීම
  - පහසුවෙන් හඳුනාගත හැකි වීම
- මුදලේ ප්‍රධාන කාර්ය හතර පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  1. විනිමය (ගෙවීම්) මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම
  2. වටිනාකමේ සන්නිධියත් ලෙස කටයුතු කිරීම
  3. ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම
  4. විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම (කල්පසු වූ ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම)
- විනිමය මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම යනුවෙන් අදහස් කරන්නේ ගනුදෙනු කිරීමේ දී නැතහොත් භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කිරීමේ දී අතරමැදියකු වශයෙන් කටයුතු කිරීම යි.
- මෙම කාර්යය  නිසා මුදල් වෙනත් වත්කම්වලින් පැහැදිලි ව වෙන් කොට හඳුනා ගත හැකි ය. භාණ්ඩ හුවමාරු ක්‍රමයේ (බාටර් ක්‍රමයේ) පැවති ද්විත්ව සමපාතය, ප්‍රවාහණය, ගබඩා කිරීම, කුඩා කොටස්වලට බෙදීම ආදී ගැටලු බොහොමයක් මුදල් භාවිතය නිසා නිරාකරණය විය.

- හුවමාරුවට සම්බන්ධ වන දෙපාර්ශ්වයේ වුවමනා අන්‍යෝන්‍ය වශයෙන් ගැලපීම වුවමනාවන්ගේ ද්විත්ව සමපාතය නම් වේ.
- භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දී ද්විත්ව සමපාතයක් නොමැති විට ගනුදෙනුව සිදු කර ගැනීම අතිශය දුෂ්කර කාර්යයක් විය.
- එහෙත් මුදල් භාවිතය නිසා ගනුදෙනුව සිදු කර ගැනීමේ දී මුදල් අතරමැදියකු සේ කටයුතු කරන හෙයින් ද්විත්ව සමපාතයක් අවශ්‍ය නොවේ.
- මුදල් විනිමය මාධ්‍යයක් ලෙස භාවිත කිරීම නිසා ශ්‍රම විභජනය හා විශේෂීකරණය පුළුල් වූ අතර මහා පරිමාණ නිෂ්පාදනයට මඟ පෑදිණි.
- අවදානමකින් හා අපහසුතාවකින් තොර ව අනාගත අවශ්‍යතා සඳහා වටිනාකම රැස් කර තබා ගැනීම සඳහා මුදල් යොදා ගැනීම වටිනාකම් සන්නිධියක් ලෙස කටයුතු කිරීම යන්නෙන් අදහස් කෙරේ. භාණ්ඩවලින් වටිනාකම රැස් කිරීමේ දී ගබඩා කිරීමේ අපහසුව, ඉක්මනින් නශ්‍ය වීම ආදී ගැටලු පැන නැඟුණ ද මුදල්වලින් වටිනාකම රැස් කිරීමේ දී එම දුෂ්කරතා ඇති නොවේ.
- වටිනාකම රැස් කිරීමට වැඩි දෙනෙකු මුදල් භාවිත කරන්නේ මුදල් පූර්ණ ද්‍රවශීල වත්කමක් වන නිසා ය. මුදලේ ක්‍රය ශක්තිය ස්ථාවර මට්ටමක පැවතීම මුදලේ මෙම කාර්යය වඩාත් කාර්යක්ෂම කරනු ඇත.
- ගිණුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම යනුවෙන් අදහස් කරන්නේ සෑම භාණ්ඩයක ම, සේවාවක ම, වත්කම්වල වටිනාකම් අතර වෙනස හඳුනාගත හැකි වීම හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම ව සිදු කිරීමට හැකියාව ලැබීම ය.
- මුදල් වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම නිසා ව්‍යාපාර ගිණුම්කරණය, ජාතික ගිණුම්කරණය, රාජ්‍ය අයවැයකරණය, ගෙවුම් ශේෂ ලේඛනය සැකසීම ආදී මූල්‍ය වාර්තාකරණය පහසු වී ඇත.
- විලම්බිත ගෙවුම් මාධ්‍යයක් වශයෙන් කටයුතු කිරීම යන්නෙන් අදහස් කරනුයේ කල් පසු වී කරනු ලබන ගෙවීම් කාර්යක්ෂම ව සිදු කිරීමට මුදල් යොදා ගැනීමට ඇති හැකියාවයි. ව්‍යාපාර ආයතන භාණ්ඩ ණයට අලෙවි කිරීමේ දී හා මූල්‍ය ආයතන ණය සැකසීමේ දී එම ගෙවීම් සමාප්ත කිරීමට කාලයක් ගත වේ. අවිනිශ්චිතතාවකින් හෝ අවදානමකින් තොර ව එම ගෙවීම් නිම කිරීමට මුදල් භාවිත කිරීම නිසා හැකියාව ලැබී ඇත.
- මුදලේ අගය ස්ථාවර ව පැවතීම විලම්බිත ගෙවුම් මාධ්‍යයක් ලෙස මුදලේ කාර්යය වඩාත් කාර්යක්ෂම වීමට හේතු වේ.
- වර්තමානයේ භාවිත වන මුදල් වර්ග පහත දැක්වේ.
    - ව්‍යවහාර මුදල්
    - බැංකු මුදල්
    - ආසන්න මුදල්
    - මුදල් ආදේශක

- විද්‍යුත් මුදල් / ඩිජිටල් මුදල්

- ව්‍යවහාර මුදල් යනු යම් නෛසර්ගික වටිනාකමක් අන්තර්ගත නොවන නමුත් කිසියම් වටිනාකමක් නියෝජනය කිරීම සඳහා මූල්‍ය අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු වන අතර ව්‍යවහාර මුදල් රට තුළ ඕනෑ ම ගනුදෙනුවක් කිරීමට නීතියෙන් වලංගු වන අතර ව්‍යවහාර මුදල් පූර්ණ ද්‍රවශීලතාවකින් යුක්ත වේ.
- චෙක්පත් ලිවීම මගින් ප්‍රයෝජනයට ගත හැකි ඉල්ලුම් තැන්පතුවල ඇති මුදල් ශේෂය බැංකු මුදල් වශයෙන් හැඳින්වේ. බැංකු මුදල් තුළ ඉහළ ද්‍රවශීලතාවක් පවතී.
- වටිනාකමේ සන්නිධියක් ලෙස ක්‍රියා කරන, එහෙත් හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියා නොකරන ඉහළ ද්‍රවශීලතාවකින් යුතු වත්කම් ආසන්න මුදල් ලෙස හඳුන්වයි. ආසන්න මුදල් පහසුවෙන් හුවමාරු මාධ්‍යයක් බවට (මුදල්) පෙරළා ගත හැකි ය.
- ස්ථාවර තැන්පතු, ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු ආසන්න මුදල් සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය.
- මුදල් ආදේශක වශයෙන් හඳුන්වනු ලබන්නේ වටිනාකමේ සන්නිධියක් වශයෙන් ක්‍රියා නොකරන නමුත් තාවකාලික ව හුවමාරු මාධ්‍යයක් වශයෙන් කටයුතු කරන උපකරණ වේ. ණයපත් හා හරපත් මුදල් ආදේශක සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. ව්‍යවහාර මුදල් හෝ චෙක්පත් හෝ භාවිතයක් නොමැති ව කෙටි කාලීන ගනුදෙනු සඳහා මෙම මුදල් ආදේශක යොදා ගත හැකි ය.
- යම් මූල්‍ය ආයතනයක් විසින් අනුමත වූ මුදල් සීමාවන් යටතේ භාණ්ඩ හා සේවා ලබා ගැනීමටත් අවශ්‍ය විටක මුදල් ලබා ගැනීමටත් අවසරය ලබා දී නිකුත් කරන විද්‍යුත් කාඩ් පත ණයපතකි.
- පහත සඳහන් හේතු නිසා ණයපත් මුදල් ලෙස නොසැලකේ.
    - මුදල්වලින් ඉටු කරන සියලු කාර්යයන් ණයපත් මගින් ඉටු නොවීම
    - ණයපත් මගින් ගනුදෙනුකරුවා ට ලබා දෙන උපරිම ණය සීමාව ඉක්මවූ පසු තවදුරටත් ණයපත් ප්‍රයෝජනයට ගනිමින් ගනුදෙනු කිරීමට නම් අදාළ මූල්‍ය ආයතනය වෙත ණය මුදල ගෙවිය යුතු වීම (මුදල් ලෙස සැලකෙන්නේ මූල්‍ය ආයතනය වෙත ගෙවන මුදල් මිස ණයපත නොවේ).
- හරපත් යනු ගනුදෙනුකරුවන් මූල්‍ය ආයතනයක යම් මුදලක් තැන්පත් කළ විට ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රයක් මගින් ආපසු මුදල් ගැනීමට වෙනත් ගිණුමකට මාරු කිරීමට භාවිත කරන උපකරණයකි.
- හරපත් මුදල් ලෙස නොසැලකෙන්නේ මුදලින් ඉටු කරනු ලබන සියලු කාර්යයන් මෙමගින් ඉටු නෙකෙරෙන නිසා ය.
- මුදල්, විද්‍යුත් ක්‍රමය භාවිතයෙන් ගබඩා කර තබා මෘදුකාංගයක් මගින් ගනුදෙනු සඳහා යොදා ගන්නා ක්‍රමවේදය විද්‍යුත් මුදල් වශයෙන් හැඳින්වේ. හරපත්, ණයපත්, E-banking, Easy Cash Bit coin විද්‍යුත් මුදල් සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය.

**නිපුණතාව 7.0 :** **මුදල්වල හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.2:** මුදලට ඉල්ලුමක් ඇති වීමට බලපාන හේතු සහ මුදල් ඉල්ලුම තීරණය කරනු ලබන සාධක විමසා බලයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- මුදල් ඉල්ලුම අර්ථකථනය කරයි.
- මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු ඉදිරිපත් කරයි.
- මුදලට ඉල්ලුමක් ඇති වීමට හේතු ප්‍රස්තාර සටහන් භාවිත කරමින් විග්‍රහ කරයි.
- මුදලට ඇති ඉල්ලුම තීරණය කරන සාධක විග්‍රහ කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- සිසුන්ට මුදල් අවශ්‍ය ඇයි දැයි විමසන්න.
- එසේ මුදල් අවශ්‍ය වීමට හේතු සිසුන්ගෙන් අසා පෙළගස්වන්න.
- පහත සඳහන් කරුණු අනාවරණය වන අයුරෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - සිසුන් මෙන් ම සියලු ම ජනතාව විවිධ කටයුතු සඳහා මුදල් ළඟ තබා ගනී.
    - එසේ මහජනයා මුදල් ළඟ තබා ගැනීමට ඇති කැමැත්ත මුදල් ඉල්ලුම ලෙස හඳුන්වයි.
    - මුදල් ඉල්ලුම සඳහා විවිධ සාධක බලපායි.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ පුද්ගලයෙකුට මුදල් අවශ්‍ය වන අවස්ථා කිහිපයකි. ඒ අතරින් ඔබ කණ්ඩායමට ලැබෙන අවස්ථා කෙරෙහි අවධානය යොමු කරන්න.
    - සහල් මිල දී ගැනීම සඳහා
    - නිවසේ ඇති වන හදිසි අවශ්‍යතාවක් සඳහා
    - කොටසේ වෙළෙඳපොළේ ආයෝජනය සඳහා
    - ඔබේ කණ්ඩායමට ලැබී ඇති අවස්ථාව කෙරෙහි සැලකිලිමත් වන්න.
    - එවැනි මුදල් අවශ්‍ය වන වෙනත් අවස්ථා සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.
    - ඔබට යම් නිශ්චිත මාසික ආදායමක් පවතී යැයි උපකල්පනය කර එම මුදලින් කොපමණ ප්‍රමාණයක් අදාළ කාර්යය සඳහා වෙන් කරන්නේදැයි තීරණය


කරන්න.

- ඔබගේ මාසික ආදායම දෙගුණ වුවහොත් අදාළ කාර්යයට වෙන් කරන මුදල තීරණය කරන්න.

- ඉහත තොරතුරු ඇසුරෙන් ආදායම වෙනස් වීමක් හා අදාළ කාර්යයට මුදල් වෙන් කිරීම අතර සම්බන්ධය දක්වෙන ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න. (තිරස් අක්ෂයේ අදාළ කාර්යයට වෙන් කරන මුදල ද සිරස් අක්ෂයේ ආදායම ද)
- අදාළ ප්‍රස්තාර සටහන ඇසුරෙන් ආදායම හා ඔබට අදාළ කාර්යයට මුදල් වෙන් කිරීම අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- කිසියම් අවස්ථාවක දී මුදල්, මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව තුළ ඇති කැමැත්ත මුදල් ඉල්ලුම (ද්‍රවශීලතාවරණය) යනුවෙන් හැඳින්වේ.
- මුදලට ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු තුනකි.
    1. ගනුදෙනු චේතනාව
    2. ආරක්ෂණ චේතනාව
    3. සමපේක්ෂණ චේතනාව
- පුද්ගලයාට ලැබෙන ආදායම් සහ පුද්ගලයා කරන වියදම් එකිනෙකට නොගැළපීම නිසා එදිනෙදා ගනුදෙනු කිරීමේ අරමුණෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ගනුදෙනු චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම ලෙස හැඳින්වේ.
- ආදායම් උපයන කාලයත් වියදම් සිදු කරන කාලයත් අතර කාල පරාසයක් පවතින අතර එම කාල පරාසය තුළ සුමට ලෙස ඇති වන ගනුදෙනු සිදු කිරීම සඳහා මුදල් ශේෂ ළඟ තබා ගත යුතු ය.
- ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ පුද්ගලයන්ගේ ආදායමයි.
- ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී. එය පහත සඳහන් පරිදි ප්‍රස්තාර සටහනක් මගින් දක්විය හැකි ය.



- ඉහත ප්‍රස්තාර සටහනට අනුව පුද්ගලයාගේ ආදායම වැඩි වන විට එදිනෙදා ගනුදෙනු සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙළඹේ. ආදායම අඩු වන විට එදිනෙදා ගනුදෙනු සඳහා අඩු මුදල් ප්‍රමාණයක් තබා ගැනීමට පෙලඹේ.
- ආදායමට අමතර ව ගනුදෙනු චේතනාව සඳහා මුදලට ඇති වන ඉල්ලුම කෙරෙහි පොළී අනුපාතිකය, මිල මට්ටම, මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා හා ආයතනික සාධක ද බලපායි.
- සැලසුම් කළ නොහැකි අනපේක්ෂිත ව ඇති වන වියදම් කාර්යක්ෂම ව පියවා ගැනීමේ අරමුණෙන් පුද්ගලයන් මුදල් ශේෂ ළග තබා ගැනීම ආරක්ෂක චේතනාව නිසා මුදලට ඇති ඉල්ලුම ලෙස හැඳින්වේ.

  නිදසුන් : හදිසි අනතුරු, ලෙඩ රෝග වැනි අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මුදල් ශේෂ ළග තබා ගැනීමයි.
- ආරක්ෂණ චේතනාව නිසා මුදලට ඇති වන ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින අතර එය පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.





$M_p^d = f(Y)$ ආරක්ෂණ චේතනාවෙන් මුදලට ඇති වන ඉල්ලුම

(Y) = ආදායම

- ඉහත ප්‍රස්තාර සටහනට අනුව පුද්ගලයන්ගේ ආදායම වැඩි වන විට ආරක්ෂණ අරමුණ මත වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙලඹෙන අතර ආදායම අඩු වන විට ආරක්ෂණ අරමුණ මත අඩු මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙලඹේ.
- පිළිණපත්වල මුදල් ආයෝජනය කිරීමෙන් අනාගත වාසි (ප්‍රතිලාභ) ලබා ගැනීමේ

අරමුණෙන් මුදල් ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම යි. නැති නම් වත්කමක් ලෙස මුදල් ශේෂ ළඟ තබා ගැනීම සමපේක්ෂණ මුදල් ඉල්ලුම වේ.

- ජනතාව විවිධ වත්කම් ළඟ තබා ගැනීමට පෙලඹෙන අතර සිය වත්කම් ගොනුවේ මුදල් හා පිළිණපත් අතර තේරීම් කිරීම පොළී අනුපාතිකය අනුව සිදු වේ. මේ අනුව පොළී අනුපාතිකය හා වත්කමක් ලෙස මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් ඇති වේ. එම ප්‍රතිලෝම සම්බන්ධතාව පහත රූප සටහන මගින් පැහැදිලි වේ.




සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම

- ඉහත රූපයේ දැක්වෙන පරිදි පොළී අනුපාතිකය ඉහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ. පොළී අනුපාතිකය පහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම වැඩි වේ.
- පොළී අනුපාතිකය හා පිළිණපත්වල මිල අතර පවතිනුයේ ප්‍රතිලෝම සම්බන්ධතාවකි. එනම් පොළී අනුපාතිකය ඉහළ යන විට පිළිණපත්වල මිල පහළ යන අතර පොළී අනුපාතිකය පහළ යන විට පිළිණපත්වල මිල ඉහළ යයි.
- සත්‍ය වශයෙන් වර්තමානයේ පොළී අනුපාතිකය අඩු නම් පිළිණපත්වල මිල ඉහළ මට්ටමක පවතී. නමුත් අනාගතයේ දී පොළී අනුපාතිකය ඉහළ යතැයි සහ ඊට ප්‍රතිලෝම ව පිළිණපත්වල මිල පහළ යතැයි ජනතාව තුළ අපේක්ෂණයක් ඇති වේ. මේ නිසා ජනතාව පිළිණපත් මිල දී ගැනීමට පෙළඹෙන හෙයින්

  පොළී අනුපාතිකය ඉහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ. අනාගතයේ දී පොළී අනුපාතිකය පහළ යතැයි සහ ඊට ප්‍රතිලෝම ව පිළිණපත්වල වෙළෙඳපොළ මිල ඉහළ යතැයි ජනතාව තුළ අපේක්ෂණයක් ඇති වුවහොත් ජනතාව පිළිණපත් විකිණීමට පෙලඹේ. (ඉහත රූප සටහනෙහි b ලක්ෂ්‍යයෙහි දැක්වෙන පරිදි) මේ නිසා පොළී අනුපාතිකය පහළ යත් ම සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇත ඉල්ලුම වැඩි වේ.

මුදලට ඇති ඉල්ලුම තීරණය වීම කෙරෙහි පහත සඳහන් සාධක බලපායි.

- මූර්ත ආදායම
- පොළී අනුපාතිකය
- මිල මට්ටම
- අනාගත අපේක්ෂණ
- ආයතනික සාධක
- මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා

- මූර්ත ආදායම හා මුදල් ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී. එනම් මූර්ත ආදායම ඉහළ යන විට මුදල් ඉල්ලුම ඉහළ යයි.
- පොළී අනුපාතිකය හා මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී. එනම් පොළී අනුපාතිකය ඉහළ යන විට මුදල් ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.
- මිල මට්ටම ඉහළ යන විට මුදල් ඉල්ලුම ද ඉහළ යයි.
- අනාගතයේ දී උද්ධමන අනුපාතිකය ඉහළ යතැයි අපේක්ෂා කරන විට වර්තමානයේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට පෙලඹෙන බැවින් ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය වැඩි වේ.
- පිළිණපත්වල මිල අනාගතයේ දී වැඩි වෙතැයි අපේක්ෂා කරන විට වර්තමානයේ පිළිණපත් මිල දී ගැනීම පෙලඹෙන බැවින් ළඟ තබා ගන්නා මුදල් ශේෂ අඩු වේ.
- ආයතනික සාධක යනුවෙන් අදහස් කරන්නේ ආදායම් ලැබෙන වාර දෙකක් අතර කාල පරතරයි. අවම කාල පරතරයක් තුළ ආදායම් ලැබෙන විට මුදල් ඉල්ලුම පහළ යයි. මුදල් ලැබෙන කාල පරතරයන් දීර්ඝ වන විට ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය ඉහළ යයි.
- මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා වැඩි දියුණු වන විට මුදල් ළඟ තබා ගන්නා ප්‍රමාණය පහළ යයි.

**නිපුණතාව 7.0 : මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.3 :** මුදල් සැපයුම විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද ගණන :** 10

**ඉගෙනුම් පල :**

- මුදල් සැපයුම අර්ථ දක්වයි.
- මුදල් සැපයුමේ නිර්වචන අනුපිළිවෙළින් අර්ථ දක්වයි.
- මුදල් සැපයුමේ නිර්වචන විග්‍රහ කරයි.
- මුදල් සැපයුම තීරණය කරන සාධක ඉදිරිපත් කරයි.
- පදනම් මුදල් තීරණය කරන සාධක විග්‍රහ කරයි.
- මුදල් ගුණකය හා පදනම් මුදල් අතර සම්බන්ධතාව සමීකරණ භාවිතයෙන් විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මුදල් සැපයුම යනු කිසියම් නිශ්චිත අවස්ථාවක දී මහජනතාව අතර සංසරණය වන මුළු මුදල් තොගය යි. මුදල් සැපයුම මූල්‍ය සමස්තය වශයෙන් ද හඳුන්වයි.
- මුදල් සැපයුම නිර්වචනය කිරීම සඳහා යොදා ගන්නා නිර්වචන කාලයත් සමඟ වෙනස් වේ. ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකකි.
    1. රටක මූල්‍ය ව්‍යුහයේ ඇති වන වෙනස්කම්
    2. මුදල් ලෙස සැළකිය යුතු පූර්ණ ද්‍රවශීලතාවෙන් යුත් වත්කම්වල සිදු වන වෙනස්කම්
- ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම පිළිබඳ ව ඉදිරිපත්කොට ඇති විවිධ නිර්වචන පහත දැක්වේ.
    - පටු මුදල් සැපයුම $(M_1)$
    - පුළුල් මුදල් සැපයුම $(M_2)$
    - ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම $(M_2b)$
    - පුළුල් මුදල් සැපයුම $(M_4)$
- පටු මුදල් සැපයුම යනු මහජනතාව සතු ව්‍යවහාර මුදල් (කාසි හා නෝට්ටු) හා මහජනයා නමින් වාණිජ බැංකුවල ඇති ඉල්ලුම තැන්පතුවල එකතුව යි.

$$M_1 = C_P + DD_P$$

$M_1$ = පටු මුදල් සැපයුම

$Cp$ = මහජනයා සතු ව්‍යවහාර මුදල්

$DD_P$ = මහජනයා සතු වාණිජ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු

- පුළුල් මුදල් සැපයුම $(M_2)$ යනු, පටු මුදල් සැපයුම $(M_1)$ හා මහජනයා සතු ව වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතුවල ($TSD_{CP}$එකතුවයි.

$$M_2 = M_1 + TSD_{CP}$$

$M_2$ - පුළුල් මුදල් සැපයුම

$M_1$ = පටු මුදල් සැපයුම

$TSD_{CP}$= මහජනතාව සතු ව වාණිජ බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු

- පුළුල් මුදල් සැපයුමට $(M_2)$ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50% ක් හා විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය එකතු වීමෙන් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම $(M_{2b})$ සෑදේ.

$$M_{2b} = M_2 + TSD_{NRFC} + RD_{FCBU}$$

$TSD_{NRFC}$ = අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50%

$RD_{FCBU}$ = විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු

- ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට $(M_{2b})$ බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා කාලීන තැන්පතු එකතු වීමෙන් පුළුල් මුදල් සැපයුම $(M_4)$ සෑදේ.

$$M_4 = M_{2b} + LSB + REC$$

$M_4$ = පුළුල් මුදල් සැපයුම

$M_{2b}$ = ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම

LSB = මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

RFC = ලියාපදිංචි මූල්‍ය සමාගම්වල ඇති මහජනතාව සතු ඉතුරුම් හා ස්ථාවර තැන්පතු

මුදල් සැපයුම තීරණය කරන සාධක පහත දැක්වේ.

(1) බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්

(2) බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්

(3) අනෙකුත් ශුද්ධ වත්කම්

- බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්, බැංකු ක්‍රමය මගින් රජයට ලබා දෙන ශුද්ධ ණය හා වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ලද ණයවලින් සමන්විත වේ.
- රජය අයවැය හිඟය පියවීම සඳහා මහ බැංකුවෙන් හා වාණිජ බැංකුවලින් පිළිණපත් හරහා ණය ලබා ගනී. ඒවා ව්‍යවහාර මුදල් ලෙස මහජනතාව අතට පත්වීමෙන් මුදල් සැපයුමේ කොටසක් බවට පත් වී මුදල් සැපයුම ඉහළ නගී.
- වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ණය දීමේ දී ඉල්ලුම් තැන්පතු නිර්මාණය වේ. ඉල්ලුම් තැන්පතු මුදල් සැපයුමේ කොටසක් නිසා මුදල් සැපයුම ඉහළ යයි.
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් නමින් හැඳින්වෙන්නේ මහ බැංකුව සහ වාණිජ බැංකු සතු විදේශ වත්කම් හා වගකීම් අතර වෙනසයි.
- මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් සහ වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් ලැබේ.
- මහ බැංකුව සතු ශුද්ධ විදේශ වත්කම් පහත පරිදි දැක්විය හැකි ය.
  - මහ බැංකුව සතු විදේශ මුදල්
  - විදේශ රටවල සුරැකුම්පත්වල මහ බැංකුව කර ඇති ආයෝජන
  - මහ බැංකුව නමින් පවත්වා ගෙන යන විශේෂ ගැනුම් හිමිකම් (SDR)
- මහ බැංකුව සතු විදේශ වගකීම් පහත පරිදි වේ.
  - මහ බැංකුව විදේශ රටවලින් ලබා ගෙන ඇති ණය

- අන්තර්ජාතික ආයතන හා විදේශ බැංකු මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදල්

- වාණිජ බැංකු සතු විදේශ වත්කම් පහත දැක්වේ.
  - විදේශ  බැංකුවලට සපයා ඇති ණය සහ ආධාර
  - වට්ටම් කළ බිල්පත්
  - වාණිජ බැංකු සතු විදේශ මුදල්
  - වාණිජ බැංකුවලට අයත් විදේශ ශාඛාවල ඇති මුදල්
- වාණිජ බැංකු සතු විදේශ වගකීම් පහත සඳහන් සංරචකවලින් සමන්විත වේ.
  - වාණිජ බැංකු විසින් විදේශ බැංකුවලින් ලබා ගෙන ඇති ණය
  - විදේශීය බැංකු දේශීය බැංකුවල පවත්වා ගෙන යන තැන්පතු
- බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් ඉහළ යන විට බැංකු සතු සංචිත ඉහළ ගොස් ණය දීම් වැඩි වේ. එවිට ඉල්ලුම් තැන්පතු ප්‍රසාරණය වී මුදල් සැපයුම වැඩි වේ.
- බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම් ලෙස සැලකෙනුයේ ඉහත සඳහන් කරන ලද දේශීය හා විදේශීය ශුද්ධ විදේශීය වත්කම්වලට හසු නොවූ බැංකු ක්‍රමයේ වත්කම් හා වගකීම් අතර වෙනසයි.
- බැංකු ක්‍රමය සතු අනෙකුත් ශුද්ධ වත්කම් ඉහළ යන විට මුදල් සැපයුම ද ඉහළ යයි.
- කිසියම් රටක සමස්ත මුදල් සැපයුමට පදනම සපයන මහ බැංකුව සතු ඍජු මූල්‍ය වගකීම් පදනම් මුදල් වශයෙන් හැඳින්වේ. මේවා අධිබලැති මුදල්, සංචිත මුදල් යන නම්වලින් ද හැඳින්වේ.
- රටේ සමස්ත මුදල් සැපයුම පදනම් මුදල් මෙන් කීප ගුණයකි.
- පදනම් මුදල් පහත සඳහන් සංරචකවලින් සමන්විත වේ.
  - මහජනයා සතු ව්‍යවහාර මුදල්  (Cp)
  - වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්  ($C_{CB}$)
  - වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යන තැන්පතු (RR)
  - රාජ්‍ය නියෝජිත ආයතන මහ බැංකුවේ පවත්වා ගන යනු ලබන තැන්පතු ($D_{OI}$)

**මහ බැංකු ශේෂ පත්‍රය**

| වගකීම් | වත්කම් |
|---|---|
| • මහජනයා සතු ව්‍යවහාර මුදල් $C_P$<br>• වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් $C_{CB}$<br>• වාණිජ බැංකු සතු මහ බැංකුවේ ඇති තැන්පතු RR<br>• වෙනත් ආයතනවල තැන්පතු $D_{OI}$<br>• රජයේ තැන්පතු $DG_{CB}$<br>• විදේශ ණය $FB_{CB}$<br>• වෙනත් වගකීම් $OL_{CB}$ | • වාණිජ බැංකුවලට දුන් ණය $A_{KB}$<br>• රජයට දුන් ණය $CG_{CB}$<br>• විදේශ සංචිත $FA_{CB}$<br>• වෙනත් වත්කම් $OA_{CB}$ |
| මුළු වගකීම් $TL_{CB}$ | මුළු වත්කම් $TA_{CB}$ |

- ඉහත ශේෂ පත්‍රයට අනුව පදනම් මුදල් සැපයුමට අයත් වන මහ බැංකුවේ ප්‍රධාන වගකීම් අයිතම පහත පරිදි දැක්විය හැකි ය.
  1. මහජනයා සතු ව්‍යවහාර මුදල්
  2. වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්
  3. මහ බැංකුවේ ඇති වාණිජ බැංකු සතු තැන්පතු
  4. වෙනත් ආයතන සතු ව මහ බැංකුවේ ඇති තැන්පතු
- මහ බැංකු ශේෂ පත්‍රයට අනුව පදනම් මුදල් කෙරෙහි බලපාන සාධක (තීරණය කරන සාධක) පහත සඳහන් පරිදි හඳුනාගත හැකි ය.
  1. මහ බැංකුව සතු ශුද්ධ දේශීය වත්කම් (CGCB - DGCB)
     - මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට දෙනු ලබන අත්තිකාරම්
     - මහ බැංකුව විසින් රජයට සපයනු ලබන ශුද්ධ ණය
  2. මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් (DACB - FBCB)
  3. මහ බැංකුවේ වෙනත් වත්කම්
- ඉහත සඳහන් අයිතමවල ශුද්ධ වත්කම් වැඩි වන විට පදනම් මුදල් සැපයුම වැඩි වන අතර ඒවායේ ශුද්ධ වත්කම් අඩු වන විට පදනම් මුදල් සැපයුම අඩු වේ.
- (පදනම් මුදල්වලට අයත් නොවන අනිකුත් වගකීම් සහ මහ බැංකුවේ වත්කම් සංරචකයන් ඇසුරෙන් පදනම් මුදල්වලට බලපාන සාධක හඳුනාගත හැකි බව

සිසුන් සමඟ අධ්‍යනය කරන්න).

- ආර්ථිකයේ මුළු මුදල් සැපයුම හා පදනම් මුදල් අතර සම්බන්ධය මුදල් ගුණකයෙන් දැක්වේ. එය පහත සඳහන් පරිදි සමීකරණයක් මගින් දැක්විය හැකි ය.

$$M = kH$$

M = මුදල් සැපයුම

k = මුදල් ගුණකය

H = පදනම් මුදල්

**මුදල් ගුණකය හා මුදල් පදනම අතර පවත්නා සම්බන්ධතාව**

- ඒ අනුව මුදල් ගුණකය පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$$k = \frac{M}{H}$$

- ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම ක්‍රම කිහිපයකට ගණනය කරන නිසා මුදල් ගුණකය ද $M_1$, $M_{2B}$ $M_{2B}$, $M_4$, $M_5$ ආදී වශයෙන් ආකාර කිහිපයකට ගණනය කළ හැකි ය.

නිදසුන් :

$$\text{මුදල් ගුණකය} M_1 = \frac{\text{පටු මුදල් සැපයුම } (M_1)}{\text{පදනම් මුදල්}}$$

$$\text{මුදල් ගුණකය} M_2 = \frac{\text{පුළුල් මුදල් සැපයුම } (M_2)}{\text{පදනම් මුදල්}}$$

**නිපුණතාව 7.0 : මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.4 :** මිල මට්ටම ආශ්‍රිත සංකල්ප, න්‍යාය සහ මිනුම් විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද ගණන :**

**ඉගෙනුම් පල :**

- මිල මට්ටම අර්ථකථනය කරයි.
- එම මට්ටම ආශ්‍රිත සංකල්ප පැහැදිලි කරයි.
- උද්ධමනයට බලපාන හේතු විවිධ ප්‍රවේශ ඔස්සේ විග්‍රහ කරයි.
- උද්ධමනයේ ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- උද්ධමනය පාලනය කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස් වීම් මැනීමට යොදා ගන්නා මිල දර්ශක හඳුන්වයි.
- මිල දර්ශක ඇසුරෙන් ශ්‍රී ලංකාවේ මිල මට්ටම ආශ්‍රිත ප්‍රවණතා පරීක්ෂා කර බලයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනිමට අත්වැලක් :**

- භාණ්ඩවලත් සේවාවලත් වටිනාකම මිල යන්නෙන් අදහස් වේ.
- මිල වෙනස් වන විට යම් දෙන ලද මුදල් ප්‍රමාණයකින් මිල දී ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය (මුදලේ වටිනාකම) වෙනස් වේ.
- නිරපේක්ෂ මිල, සාපේක්ෂ මිල හා පොදු මිල මට්ටම (සාමාන්‍ය මිල මට්ටම) ලෙසින් භාණ්ඩයක හෝ සේවාවක හෝ මිල හා සම්බන්ධ වැදගත් ස්වරූපයන් තුනක් පවතී.
- කිසියම් භාණ්ඩයක හෝ සේවාවක හෝ වෙළෙඳපොළ මිල නිරපේක්ෂ මිලයි.

  නිදසුන් : පෑනක මිල රුපියල් 25 යි.

  සහල් කිලෝවක මිල රුපියල් 100 යි.

- භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය සාපේක්ෂ මිලයි.

  නිදසුන් : සහල් කිලෝවක මිල පෑනක මිල මෙන් හතර ගුණයකි (1 : 4)

- සියලු ම භාණ්ඩ හා සේවාවල නිරපේක්ෂ මිල ගණන්වල සාමාන්‍ය අගය පොදු මිල මට්ටම නමින් හැඳින්වේ.
- පොදු මිල මට්ටම ආශ්‍රිත ව සංකල්ප කිහිපයකි.
  - උද්ධමනය
  - අවධමනය
  - නිරුද්ධමනය
- පොදු මිල මට්ටමෙහි හට ගන්නා අඛණ්ඩ ඉහළ යාමක් උද්ධමනය නමින් හැඳින්වේ.
- අවධමනය යනු පොදු මිල මට්ටමෙහි අඛණ්ඩ ව සිදු වන පහළ යාමකි.
- උද්ධමන අනුපාතයෙහි අගය ක්‍රමයෙන් අඩු වීමක් නිරුද්ධමනය යි.
- උද්ධමනයට හේතු පැහැදිලි කෙරනුයේ න්‍යායාත්මක ප්‍රවේශයකිනි.
- ඒ අනුව උද්ධමනයට හේතු පැහැදිලි කිරීමේ ප්‍රධාන න්‍යාය දෙකකි.
  1. ඉල්ලුමෙන් ඇඳුණු උද්ධමන න්‍යායය
  2. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමන න්‍යායය
- සැපයුමට සාපේක්ෂ ව ඉල්ලුම වැඩි වීම නිසා භාණ්ඩවල හා සේවාවල පොදු මිල මට්ටම ඉහළ යන බව ඉල්ලුමෙන් ඇඳුණු උද්ධමන න්‍යායය යන්නෙන් අදහස් වේ.
- එනම් සමස්ත ඉල්ලුමේ අතිරික්තයක් නිසා පොදු මිල මට්ටම් ඉහළ යාම යි.
- සීමිත භාණ්ඩ ප්‍රමාණයක් පසුපස හඹා යන අතිවිශාල මුදල් ප්‍රමාණයක් යනුවෙන් හැඳින්වෙන්නේ ද ඉල්ලුමෙන් ඇඳුණු උද්ධමනය යි.
- ඉල්ලුමෙන් ඇඳුණු උද්ධමන න්‍යායයෙහි විකල්ප ප්‍රවේශ දෙකකි.
  1. මුදල් ප්‍රමාණවාදය
  2. කේන්සියානු න්‍යාය
- මුදල් ප්‍රමාණවාදය යනු විනිමය සමීකරණය පදනම් කර ගනිමින් මිල මට්ටමේ හැසිරීම පිළිබඳ ව ඉදිරිපත් කරනු ලබන න්‍යායයකි.
- මුදල් තොගය වෙනස් වීමත් මිල මට්ටම වෙනස් වීමත් අතර ඍජු හා සමානුපාතික සම්බන්ධයක් ඇති බව මුදල් ප්‍රමාණවාදී න්‍යායයෙන් පෙන්වා දේ.

නිදසුන් : මුදල් තොගය දස ගුණයකින් ඉහළ දැමුවහොත් මිල මට්ටම ද දස ගුණයකින් ඉහළ යනු ඇත.

- මුදල් ප්‍රමාණය සහ මිල මට්ටම අතර පවතින මෙම සම්බන්ධතාව පෙන්වා දීමට සඳහා මුදල් ප්‍රමාණවාදය MV = PT යන විනිමය සමීකරණය යොදා ගනී.
- විනිමය සමීකරණය ' නිර්වචනය කරන ආකාරයෙන් ම පූර්ණ සත්‍ය ප්‍රකාශනයකි.
- එය සමීකරණයක් ලෙස දක්වන නමුදු එය සැබැවින් ම අනන්‍යතාවකි (සර්ව සාම්‍යයකි). එම නිසා එය $MV \equiv PT$ යන ලෙස දැක්විය හැකි ය.
- PT යනු ආර්ථිකයේ මුළු ගනුදෙනුවල වටිනාකමයි. ( P = මිල මට්ටම, T = ගනුදෙනු ප්‍රමාණය)

$MV$ යනු මුදල් යොදා ගනිමින් සිදු කළ ගණුදෙනු ප්‍රමාණයේ වටිනාකමයි.


- මේ නිසා සැබැවින් ම MV = PT විය යුතුම ය.
- විනිමය සමීකරණය තුළ අඩංගු විචල්‍යයන්ගේ හැසිරීම සම්බන්ධයෙන් කරනු ලබන උපකල්පනයන් පදනම් කර ගනිමින් විනිමය සමීකරණය න්‍යායයක් (මුදල් ප්‍රමාණවාදය) බවට පෙරළා ගත හැකි ය.

ඒ සඳහා යොදා ගන්නා උපකල්පන දෙකකි.

1. මුදලේ සංසරණ ප්‍රවේගය (v) ස්ථාවර ව පවතී. එය ස්ථාවර ව පවතින්නේ ආයතනික සාධක පුරුදු මත තීරණය වන විචල්‍යයක් බැවිනි.
2. ආර්ථිකයේ ගනුදෙනු පරිමාව (T) නොවෙනස් ව පවතී. T ස්ථාවර ව පවතින්නේ ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටමක පවත්නා බැවිනි.

   ( T වෙනුවට Y ද භාවිත කෙරේ).

- මෙලෙසින් විනිමය සමීකරණයේ V සහ T යන පද ස්ථාවර ව පවතින්නේ යයි උපකල්පනය කොට මුදල් තොගයට (M) සමානුපාතික ව මිල මට්ටම (P) වෙනස් වන බව මුදල් ප්‍රමාණවාදී න්‍යායය පෙන්වා දේ.
- කේන්සියානු න්‍යායයේ දී උද්ධමනයට හේතු පැහැදිලි කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන්නේ සමාහාර ආදායම් හා සමාහාර වියදම් විශ්ලේෂණය යි.
- ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති සමතුලිතය කරා ළඟා වීමෙන් පසු ව තවදුරටත් සමාහාර ඉල්ලුම වැඩි වූවහොත්, භාණ්ඩ හා සේවා ප්‍රමාණය වැඩි කළ නොහැකි බැවින් සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමට පටන් ගනී.
- උද්ධමනය පිළිබඳ කේන්ස්ගේ මෙම විග්‍රහය පහත රූප සටහනින් පෙන්නුම් කෙරේ.





(පූර්ණ සේවා නියුක්ති නිමවුම)

- රූප සටහෙනන් $Y_1$ මගින් දැක්වෙන්නේ පූර්ණ සේවා නියුක්ති නිමවුම් මට්ටම යි.
- එම අවස්ථාව අදාළ සමාහාර ඉල්ලුම $AD_1$ වක්‍රයෙන් දැක්වේ.
- පූර්ණ සේවා නියුක්ති නිමවුම් මට්ටම ඉක්මවා ආර්ථිකයේ සමාහාර ඉල්ලුම ඉහළ ගිය හොත් පොදු මිල මට්ටම $P_1, P_2, P_3$ ආදී ලෙසින් අඛණ්ඩ ව ඉහළ යාම තුළින් උද්ධමනය හට ගනී.
- පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමන න්‍යායයෙන් දැක්වෙන්නේ යෙදවුම් මිල හෙවත් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා සමාහාර සැපයුම අඩු වීමෙන් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම මගින් පොදු මිල මට්ටමේ ඉහළ යාමක් හට ගත හැකි බව යි.
- මෙහි දී ජාතික ආදායමේ පංගු අල්ලා ගැනීමට විවිධ පීඩන කණ්ඩායම් විසින් කරනු ලබන අරගලවල ප්‍රතිඵල වශයෙන් නිෂ්පාදන පිරිවැය වැඩි වී භාණ්ඩවල හා සේවාවල පොදු මිල මට්ටම ඉහළ යන බව මෙම න්‍යායවාදීහු පෙන්වා දෙති.
- එම පීඩන කණ්ඩායම් වන්නේ,
  - සංවිධානාත්මක ශ්‍රමය
  - කතිපයාධිකාරී ආයතනවල ක්‍රියාකාරකම් ය.
- සංවිධානාත්මක ශ්‍රමය වැඩි වැටුප් ඉල්ලා කරනු ලබන උද්සෝෂණවල ප්‍රතිඵල

වශයෙන් වැටුප් වැඩි කිරීමට සිදු වීමෙන් යෙදවුම් මිල ඉහළ ගොස් නිෂ්පාදන පිරිවැය වැඩි වී, සැපයුම අඩු වී මිල මටටම ඉහළ යයි. මෙවැන්නක් වැටුපෙන් තල්ලු වූ උද්ධමනයක් සේ සැළකේ.

- අනෙක් අතට කතිපයාධිකාරී ආයතනවල ක්‍රියාකලාපය නිසා ලාභ වැඩි කිරීමට සිදු වීමෙන් නිෂ්පාදන පිරිවැය වැඩි වී, සැපයුම අඩු වී මිල මට්ටම ඉහළ යයි. මෙය ලාභයෙන් තල්ලු වූ උද්ධමනයකි.
- යෙදවුම් මිල වැඩි වීමෙන් නිෂ්පාදන පිරිවැය වැඩි වී, සැපයුම අඩු වීමෙන් උද්ධමනයක් හට ගනී. පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනය පහත ප්‍රස්තාර සටහනෙහි දැක්වේ.




- රූප සටහනට අනුව $Y_2$ නිමවුම් මට්ටමේ දී මිල මට්ටම $P_1$ වේ. පිරිවැය වැඩි වීම නිසා සමස්ත සැපයුම් වක්‍රය $AS_1$ සිට $AS_2$ ලෙසින් වමට විතැන් වී ඇත.

  එහෙත් ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් මට්ටමෙහි වෙනසක් සිදු වී නොමැති බැවින් සමාහාර සැපයුම අඩු වීමේ ප්‍රතිඵලය වශයෙන් මිල මට්ටම $P_1$ සිට $P_2$ දක්වා ඉහළ ගොස් ඇත. ඒ උද්ධමනීය තත්ත්වයකි.

- උද්ධමනය ආර්ථිකයට හිතකර හා අහිතකර වශයෙන් විවිධ ප්‍රතිවිපාක ගෙන දෙයි. එබඳු ප්‍රතිවිපාක කිහිපයක් පහත දැක්වේ.

  1. ආදායම් හා ධන ව්‍යාප්තිය අයහපත් වීම
  2. ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වීම
  3. ණයහිමියන්ට අවාසිදායක වන අතර ණයගැතියන්ට වාසි වීම
  4. ඉතිරි කරන්නන්ට අයහපත් වීම

- මෙය පහත පරිදි පැහැදිලි කළ හැකි ය.

- උද්ධමනයක් නිසා ඉතිරි කරන්නන්ගේ ඉතිරි කිරීමට ඇති හැකියාව අඩු වීම නිසා ඉතිරි කිරීම් අඩු වීම සිදු විය හැකි ය.
- අනෙක් අතට මූර්ත පොළී අනුපාතිකයේ පහළ බැසීමක් නිසා ද ඉතිරි කිරීම් අඩුවීම සිදු විය හැකි ය.
- මූර්ත පොළී අනුපාතිකය = නාමික පොළී අනුපාතිකය - උද්ධමන අනුපාතිකය

| | | |
|---|---|---|
| නිදසුන : | නාමික පොළී අනුපාතිකය | = 16% |
| | උද්ධමන අනුපාතිකය | = 20% |
| | මූර්ත පොළී අනුපාතිකය | = 16% - 20% |
| | | = -4% |

- මූර්ත පොළී අනුපාතිකය ඍණ අගයක් ගැනීම ඉතිරි කරන්නන්ට අහිතකර තත්ත්වයකි.
- එසේම මූර්ත පොළී අනුපාතිකය ඍණ අගයක් ගැනීම ස්ථාවර ආදායම් ලාභීන්ට අහිතකර වන අතර විචල්‍ය ආදායම් ලාභීන්ට හිතකර වේ.
- විශ්‍රාමිකයන්, කාර්යාල සේවකයන්, රාජ්‍ය සේවකයන් සහ රජයෙන් ලැබෙන ශුභසාධන දීමනා මත යැපෙන්නන් ස්ථාවර ආදායම්ලාභීන් සඳහා නිදසුන් ය.
- උද්ධමනයක දී ස්ථාවර ආදායම්ලාභීන්ට අහිතකර වන්නේ මුදල් ආදායමේ (නාමික ආදායමේ) ක්‍රය ශක්තිය හෙවත් මූර්ත ආදායම අඩු වන හෙයිනි.

$$\text{මූර්ත ආදායම} = \frac{\text{මුදල් ආදායම}}{\text{මිල දර්ශකය}}$$

- ඉහත පැහැදිලි කළ ප්‍රතිවිපාකවලට අමතර ව පහත සඳහන් ප්‍රතිවිපාක ද උද්ධමනය නිසා සිදු වේ.

1. අනාගත මිල අවිනිශ්චිත වීම නිසා දිගු කාලීන ආයෝජනය අධෛර්යවත් වන අතර කෙටි කාලීන ආයෝජනය කෙරෙහි පමණක් නැඹුරු වීම
2. සපත්තු සම් පිරිවැය සහ මෙනුපත් පිරිවැය ඇති වීම
3. පුද්ගලයන්ගේ ජීවන වියදම ඉහළ යාම සහ ජීවන තත්ත්වය පහළ යාම
4. අපනයනවල තරගකාරිත්වයට බාධා එල්ල වීම
5. විනිමය අනුපාතිකය ක්ෂය වීම

10. නිරපේක්ෂ දරිද්‍රතාව ඉහළ යාම

- උද්ධමනය පාලනය කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් පහත දක්වේ.

- සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා වීම
- සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කිරීම
- ඍජු රාජ්‍ය මැදිහත් වීම
- කාර්යක්ෂම සම්පත් බෙදා හැරීමෙහි ලා පවතින බාධක ඉවත් කිරීම

- සමාහාර ඉල්ලුමේ වර්ධනය සීමා කිරීම යන්නෙන් අදහස් වන්නේ උද්ධමනය පාලනය කිරීමට නම් සමාහාර ඉල්ලුම වර්ධනය වීම පහළ මට්ටමක පවත්වා ගත යුතු බව යි.
- උද්ධමනයට හේතු දක්වීමේ ඉල්ලුමෙන් ඇඳුණු න්‍යායයට අනුව මූල්‍ය ප්‍රසාරණයක් නිසා සමස්ත ඉල්ලුමේ ඉහළ යාමක් තුළින් උද්ධමනයක් හට ගන්නේ නම් එය පාලනය කිරීමට සමස්ත ඉල්ලුමේ වර්ධනය සීමා කළ යුතු ය.
- මූල්‍ය ප්‍රතිපත්ති හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගැනීමෙන් සමස්ත ඉල්ලුමේ වර්ධනය සීමා කළ හැකි ය.
- උද්ධමනයක් පවතින විටෙක සමාහාර සැපයුමේ වර්ධනය වේගවත් කර ගැනීමට හැකි නම් උද්ධමන වේගය පහළ මට්ටමක පවත්වා ගත හැකි බව සැපයුම් පාර්ශ්වීය ආර්ථික විද්‍යාඥයන්ගේ අදහස ය.
- සැපයුම් පාර්ශ්විය ආර්ථික විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ සැපයුමේ අඩු වීමක් නිසා උද්ධමනයක් ඇති වන බව යි.
- එම නිසා ඔවුහු ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති කෙරෙහි එතරම් උනන්දුවක් නොදක්වූ අතර, නිෂ්පාදනයේ වර්ධනය වේගවත් කර ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. මේ සඳහා බදු කපා හැරීමේ වැදගත්කම ද ඔවුහු අවධාරණය කර ඇත.
- බදු කපා හැරීම නිෂ්පාදකයන්ට හා ආයෝජකයන්ට විශාල සානුබලයක් වන හෙයින් එය නිෂ්පාදනයේ වර්ධනයට හේතු වේ.
- මෙහි දී නිෂ්පාදනයේ වර්ධනය වේගවත් කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්විය යුතු බව ද ඔවුන්ගේ අදහස යි.
- උද්ධමනය පාලනය කිරීම සඳහා යොදාගත හැකි සරල ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් ලෙස ඍජු රාජ්‍ය මැදිහත්වීම් සැලකේ.
- මිල පාලනය හා ආදායම් පාලන ප්‍රතිපත්ති ඍජු පාලන ප්‍රතිපත්ති සඳහා නිදසුන්ය.
- වැටුප් අනුපාතිකය සහ මිල ඉහළ යාමේ ප්‍රමාණය සම්බන්ධයෙන් යම් යම් සීමාවන් පැනවීම මෙහි දී සිදු වේ.

- මෙම සෘජු පාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගික වශයෙන් එතරම් පහසු කාර්යය නොවේ.
- සැලසුම් ගත ආර්ථිකයක වැටුප් හා මිල පාලන ප්‍රතිපත්ති සාමාන්‍ය ලක්ෂණයක් වූවත් වෙළෙඳපොළ ආර්ථිකයක දී වැටුප් අනුපාතික හා මිල ගණන් ආශ්‍රිත ව සෘජු මැදිහත් වීම් දක්නට ලැබෙන්නේ යුද්ධ අරගල වැනි යම් යම් අරබුදකාරී තත්ත්වයන් පවතින විටෙක දී ය.
- කාර්යක්ෂම සම්පත් බෙදා හැරීමෙහි ලා බාධක පැවතීම සංවර්ධනය වෙමින් පවතින රටවල මෙන් ම සංවර්ධිත රටවල ද දැකිය හැකි ලක්ෂණයකි.
- බදු පැනවීම, සහනාධාර කපා හැරීම, නියාමන ආයතන විසින් මිල නියම කිරීම, ආනයන සලාකනය ආදිය එබඳු බාධක සඳහා නිදසුන් ය.
- මෙම බාධක ඉවත් කිරීමෙන් නිෂ්පාදනය වැඩි කර උද්ධමනය පාලනය කර ගත හැකි ය.
- කිසියම් කාල පරාසයක් තුළ සාමාන්‍ය මිල මට්ටමෙහි සිදු වන වෙනස් වීම් මැන බලන සංඛ්‍යාත්මක මිනුම මිල දර්ශකයක් නමින් හැඳින්වේ.
- මිල දර්ශකයක් පිළියෙළ කිරීමේ දී සැසඳීම සඳහා යොදා ගන්නා වර්ෂය පාද වර්ෂය සේ සැලකේ.
- එම පාද වර්ෂයේ මිල දර්ශක අගය 100 සේ සලකා සෙසු වර්ෂවල දී එම මිල දර්ශකය වෙනස් වී ඇත්තේ කෙසේ ද යන්න මැන බැලීම සිදු කෙරේ.
- විවිධ ක්‍රමවේද භාවිත කරමින් මිල දර්ශක පිළියෙළ කරනු ලබන අතර, මිල දර්ශකයක් පිළියෙළ කිරීමේ දී භාණ්ඩ පැස තීරණය කිරීම, බර තැබීම, නියදිය තීරණය කිරීම, පදනම් වර්ෂයක් තෝරා ගැනීම වැනි කරුණු සැලකිල්ලට ගනී.
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් මැනීම සඳහා වර්තමානයේ වැදගත් මිල දර්ශක කිහිපයක් පහත දැක්වේ.
    - කොළඹ පාරිභෝගික මිල දර්ශකය
    - ජාතික පාරිභෝගික මිල දර්ශකය
    - නිෂ්පාදකයාගේ මිල දර්ශකය
    - දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය
- කොළඹ පාරිභෝගික මිල දර්ශකය හා සම්බන්ධ විශේෂිත ලක්ෂණ පහත පරිදි වේ.
    - 2007 නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කොට 2008 මැයි මස සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් මැනීමට භාවිත වන මිල දර්ශකයකි.
    - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කෙරේ.

- 2002 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පනවන ලද ආදායම්-වියදම් සමීක්ෂණයට අනුව පිළියෙළ කරන ලද්දකි.
- පාද වර්ෂය 2006/2007 වේ.
- භූගෝලීය ආවරණය කොළඹ දිස්ත්‍රික්කයට සීමා වේ.
- විමර්ශිත ජනගහනය කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ම නාගරික කලාපවල ගෘහ ඒකක ආවරණය කරන්නක් වීම
- කොළඹ නාගරික ප්‍රදේශයේ කුටුම්බවල මුළු වියදමට සාපේක්ෂ වශයෙන් බර තැබීම සිදු කොට තිබීම
- දර්ශකයට පදනම් කර ගත් භාණ්ඩ කාණ්ඩ 10ක් සහ භාණ්ඩ ගණ 95ක් වීම.
- දර්ශකය පිළියෙළ කිරීමේ දී මත්පැන්, දුම්කොළ හා මත්ද්‍රව්‍ය සඳහා කරනු ලබන වියදම් අත් හැරීම
- කොළඹ නාගරික ප්‍රදේශය ආවරණය වන පරිදි මිල ගණන් රැස් කිරීමේ මධ්‍යස්ථාන 14ක් වීම
- 2013 පාද වර්ෂය ලෙස සැලකිල්ලට ගනිමින් (2013=100) සමස්ත දිවයින ම ආවරණය කෙරෙන පරිදි සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්කම් මැන බැලීම සඳහා ශ්‍රී ලංකාවේ පිළියෙළ කර ඇති නවත ම නිල පාරිභෝගික මිල දර්ශකය ජාතික පාරිභෝගික මිල දර්ශකය යි.

- ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි විශේෂිත ලක්ෂණ පහත දැක්වේ.
  - ජාතික පාර්භෝගික මිල දර්ශකය ඉතා පුළුල් භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කිරීම (ශ්‍රී ලංකාවේ පළාත් නවය ම ආවරණය කරමින් දර්ශකය සැකසීම සඳහා අවශ්‍ය මිල ගණන් පිළියෙළ කෙරේ).
  - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කොට ප්‍රකාශයට පත් කෙරේ.
  - ජාතික පාරිභෝගික මිල දර්ශක සකසනු ලබන්නේ 2012/2013 වර්ෂය තුළ මුළු දිවයින ම පදනම් කරමින් තෝරා ගනු ලැබූ නියැදියක් පදනම් කර ගෙන වන අතර, එය පාරිභෝගික හැසිරීම් පිළිබඳ පුළුල් නියෝජනයකි.
  - ඉතා මෑත කාලීන පදනම් වර්ෂයක් භාවිත කිරීම (2013 = 100)
  - දර්ශකය සැකසීමේ දී ශ්‍රී ලංකාවේ සියලු ම කුටුම්බවල මුළු වියදමට සාපේක්ෂ වශයෙන් බර තැබීම සිදු කර තිබීම
  - දිවයින පුරා එක් දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයෙහි මිල ගණන් රැස් කිරීමේ මධ්‍යස්ථාන තුන බැගින් පවත්වා ගෙන යාම
  - නිෂ්පාදකයාගේ මිල දර්ශකය ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට හඳුන්වා දී ඇති නව මිල දර්ශකයකි.

- දේශීය නිෂ්පාදකයන්ට තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන සාමාන්‍ය මිල ගණන්වල කාලයත් සමග සිදු වන වෙනස්කම් මෙම මිල දර්ශකය මගින් මනිනු ලැබේ.
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය හඳුන්වා දීම තුළින් වෙළෙඳපොළෙහි මිල ගණන්වල සිදුවන විචලනයන් වඩා නිවැරදි ව පෙන්නුම් කරන අතර එම ප්‍රවණතා උපයෝගි කර ගනිමින් වඩාත් නිවැරදි ව තීරණ ගැනීමට හැකියාව ලැබේ.
- නිෂ්පාදකයාගේ මිල දර්ශකය වැදගත් සාර්ව ආර්ථික දර්ශකයක් ද වේ.
- එසේ ම කෙටි කාලීන ව ඇති විය හැකි උද්ධමනය තත්ත්වන් පුරෝකථනය කළ හැකි සංඥාවක් ලෙසින් ද, නිෂ්පාදකයාගේ මිල දර්ශකය සැලකේ.
- සාර්ව ආර්ථික විශ්ලේෂණ ක්‍රියාවලියේ දී නිෂ්පාදකයන්ගේ මිල දර්ශක කාර්යය මේ දක්වා සපුරනු ලැබුවේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරන ලද තොග මිල දර්ශකයෙනි.
- එහෙත් වර්තමානයේ තොග මිල දර්ශකය වෙනුවට භාවිත කරනු ලබන්නේ නිෂ්පාදකයාගේ මිල දර්ශකයයි.
- දළ දේශීය නිෂ්පාදිතයෙහි අවධමනකය දළ දේශීය නිෂ්පාදිත තොරතුරුවලින් හෙළි වන දර්ශකයකි.
- ගම්‍ය මිල දර්ශකය, ආරෝපිත මිල දර්ශකය යනාදී නම්වලින් හැඳින්වෙන්නේ ද දළ දේශීය නිෂ්පාදිතයෙහි අවධමනයකි.
- කිසියම් වර්ෂයක දේශීය නිෂ්පාදිතය පවත්නා මිලෙන් සහ ස්ථාවර මිලෙන් ගණනය කිරීමේ දී, පවත්නා මිලට අනුව ලැබෙන වටිනාකම ඉහළ යාම තුළින් පිළිබිඹු වන්නේ ආර්ථිකයේ මිල මට්ටම්වල ඉහළ යාමකි.
- එලෙස පවත්නා මිල සහ ස්ථාවර මිලෙන් ගණනය කිරීමේ දී පවතින මිල මට්ටමේ ඉහළ යාම පිළිබිඹු කරන දර්ශකය දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය නම් වේ.
- දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ගණනය කරනු ලබන්නේ පහත ආකාරයට ය.

$$\text{දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය} = \frac{\text{පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය}}{\text{ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය}} \times 100$$

(මෙහි දී 100 ලෙසින් දක්වා ඇත්තේ පාද වර්ෂයේ මිල දර්ශකය යි. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය පිළියෙළ කිරීමේ පාද වර්ෂය 2010 = 100 වේ).

(i) නිදසුන : 2010 වර්ෂයේ,

පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය = රු. මි. 8 000
ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය = රු. මි. 8 000
නම්,
දේශිය නිෂ්පාදිතයේ අවධමනකය = 100

(ii) නිදසුන : 2011 වර්ෂයේ,

පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදනය = රු. මි. 10000
ස්ථාවර මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය = රු. මි. 8000
දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය = 125

- 2010ට සාපේක්ෂ ව 2011 වර්ෂයේ මිල දර්ශකය 25කින් ඉහළ ගොස් ඇත.
- කිසියම් මිල දර්ශකයක අගය ඉහළ යාම තුළින් පිළිබිඹු වන්නේ සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාම යි.
- ඒ අනුව මිල දර්ශකය ඉහළ යාමේ ප්‍රතිශතය යනු උද්ධමන අනුපාතිකය යි.
- මෑත කාලයේ ශ්‍රී ලංකාවේ භාවිත වන ඒ ඒ මිල දර්ශකයන් ඇසුරෙන් මිල මට්ටමේ හැසිරීම් පිළිබඳ ප්‍රවණතා පහත දැක්වේ.

| දර්ශකය | වර්ෂය | | මිල දර්ශකය වෙනස් වීමේ ප්‍රතිශතය - 2016 |
|---|---|---|---|
| | 2015 | 2016 | |
| කොළඹ පාරිභෝගික මිල දර්ශකය | 109.8 | 114.7 | 4.5 |
| (2013 = 100) | - | - | - |
| ජාතික පාරිභෝගික මිල දර්ශකය | 113.2 | 118.0 | 4.2 |
| (2013 = 100) | | | |
| දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය | 126.8 | 131.4 | 3.6 |
| (2010 = 100) | | | |

**නිපුණතාව 7.0 :** **මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.5 :** ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- මූල්‍ය පද්ධතිය අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සංරචක විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මූල්‍ය පද්ධතියක් යනු දේශීය හා විදේශීය කුටුම්බ, ව්‍යාපාරික ආයතන, රජය යන ප්‍රධාන ආර්ථික ඒකකයන්ගේ මූල්‍ය තීරණයන් ක්‍රියාත්මක කරන වෙළෙඳපොළවල්, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ සහ මූල්‍ය යටිතල පහසුකම් යනාදියෙහි එකතුවකි.
- මූල්‍ය පද්ධතිය පහත සඳහන් සංරචකවලින් සමන්විත වේ.
    - මූල්‍ය ආයතන
    - මූල්‍ය වෙළෙඳපොළ
    - මූල්‍ය උපකරණ
    - මූල්‍ය යටිතල පහසුකම්
    - මූල්‍ය ආයතන අධීක්ෂණය කරන නියාමන ආයතන
- මූල්‍ය ආයතන යනු විවිධ මූල්‍ය උපකරණ ආශ්‍රිත ගනුදෙනුවල යෙදී සිටින විවිධ මූල්‍ය සේවාවන් සපයනු ලබන ආයතනයන් ය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන ව්‍යූහය ප්‍රධාන වශයෙන් කොටස් 4 කින් සමන්විත වේ.

1. ශ්‍රී ලංකාවේ මහ බැංකුව
2. අතරමැදි මූල්‍ය ආයතන
3. මූල්‍ය සේවා සපයන ආයතන
4. මූල්‍ය අධීක්ෂණය හා නියාමන ආයතන

- අතරමැදි මූල්‍ය ආයතන යනු අතිරික්ත අරමුදල් ඇති ඒකකවලින් ඉතුරුම් ඒකරාශී කර ගැනීමත්, අරමුදල් හිඟ ඒකකවලට එම ඉතුරුම් ලබා දීම තුළින් ලාභ උපයා ගැනීමත් සිදු කරන මූල්‍ය ආයතන වේ.
- ශ්‍රී ලංකාවේ ඇති එවැනි අතරමැදි මූල්‍ය ආයතන පහත දැක්වේ.

  1. තැන්පතු බාර ගැනීම සහ එමගින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති ආයතන
  2. අර්ථ සාධක හා විශ්‍රාම අරමුදල්
  3. රක්ෂණ සමාගම
  4. ආයෝජන සමාගම්
  5. ඒකකභාර
  6. කල්බදු සමාගම්

  - තැන්පතු භාර ගැනීමට හා එමගින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.
  - විවිධ තැන්පතු වර්ග මහජනතාවට හඳුන්වාදීම මගින් ඔවුන්ගේ අතිරික්ත මුදල් රැස් කර ගැනීම
  - එසේ රැස් කර ගත් මුදල්, ණය හා ආයෝජන වශයෙන් මහ ජනතාවට ලබා දීම

- තැන්පතු භාර ගැනීමට හා එමගින් බැංකු කටයුතු කිරීමට අවසර ලබා ඇති මූල්‍ය ආයතන කීපයක් පහත දැක්වේ.
  - බලපත්‍රලාභී වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - ලියාපදිංචි මූල්‍ය සමාගම්
  - සමූපකාර ග්‍රාමීය බැංකු
  - සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති (ස.ණ.ස)
  - වෙනත් ණය දෙන සමූපකාර සමිති
- මහජනතාවට සහ ව්‍යාපාර ආයතනවලට මූල්‍ය වෙළෙඳපොළේ සිදු වන ගනුදෙනු කාර්යක්ෂම ව පවත්වා ගෙන යාමට අවශ්‍ය සේවා සැපයීමට විශේෂයෙන් සංවිධානය වූ මූල්‍ය ආයතන මූල්‍ය සේවා සපයන ආයතන වශයෙන් හඳුන්වයි.

- එවැනි මූල්‍ය සේවා සපයන ආයතන සඳහා නිදසුන් පහත දැක්වේ.
    - වාණිජ බැංකු
    - අරමුදල් කළමනාකරණ ආයතන
    - මූල්‍ය තැරැව්කාර ආයතන
    - ආණ්ඩුවේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළෙඳුන්
- මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන යනුවෙන් හැඳින්වෙන්නේ මූල්‍ය පද්ධතියක ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම සඳහා අණපනත් හා රෙගුලාසි කටයුතු ඉටු කිරීමට රජය විසින් ස්ථාපිත කර ඇති ආයතනයන් ය.
- ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකාවේ ඇති මූල්‍ය අධීක්ෂණ හා නියාමන ආයතන වේ.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ මූල්‍ය ආයතන පහත සඳහන් පරිදි වර්ග කර ඇත.
    - මහ බැංකුව
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
    - තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
    - බලපත්‍රලාභී මුදල් සමාගම්
    - සමූපකාර හා ණය ගනුදෙනු සමූපකාර සමිති
- විශේෂිත මූල්‍ය ආයතන
    - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්
    - ප්‍රාථමික අලෙවිකරුවන්
    - කොටස් තැරැව්කරුවන්
    - ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම්
    - වෙළෙඳපොළ අතරමැදියන්
    - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්

- ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන
  - රක්ෂණ සමාගම්
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාරකාර අරමුදල
  - අනුමත විශ්‍රාම හා අර්ථ සාධක අරමුදල
  - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
- කෙටි කාලීන හා දිගු කාලීන අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය උපකරණ මිලට ගැනීම හා විකිණීම සිදු වන සමස්ත වෙළෙඳපොළ මූල්‍ය වෙළෙඳපොළ යනුවෙන් හැඳින්වේ.
- මූල්‍ය වෙළෙඳපොළ ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ.
  1. මුදල් වෙළෙඳපොළ
  2. ප්‍රාග්ධන වෙළෙඳපොළ
- වසරකට අඩු කාලයකින් පරිණත වන භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා හා තැන්පතු සහතික පත් වැනි පොළී උපයන කෙටිකාලීන වත්කම් වෙළෙඳාම සිදු වන වෙළෙඳපොළ මුදල් වෙළෙඳපොළ යනුවෙන් හඳුන්වයි.
- මුදල් වෙළෙඳපොළ පහත සඳහන් උප-වෙළෙඳපොළවලින් සමන්විත වේ.
  1. අන්තර් බැංකු ඒක්ෂණ ණය මුදල් වෙළෙඳපොළ
  2. භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
  3. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ
  4. අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ
- අන්තර් බැංකු ඒක්ෂණ වෙළෙඳපොළ යනු වාණිජ බැංකු තම දෛනික ද්‍රවශීලතාවයේ පවතින අසමතුලිතතා සමනය කර ගන්නා වෙළෙඳපොළකි. ද්‍රවශීලතා හිඟයට මුහුණපා සිටින වාණිජ බැංකු ද්‍රවශීලතා අතිරික්තයක් ඇති බැංකුවලින් ඉතා කෙටි කාලයකට අරමුදල් ණයට ගැනීම මෙහි දී සිදු වේ.
- භාණ්ඩාගාර බිල්පත් යනුවෙන් හැඳින්වෙන්නේ රජය වර්ෂයකට හෝ ඊට අඩු කාලයකට හෝ ණය ලබා ගැනීම සඳහා භාවිත කරන මූල්‍ය උපකරණයකි. මෙම භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතීයක වෙළෙඳපොළ යනුවෙන් කොටස් දෙකකට බෙදේ.
- ව්‍යාපාරික ආයතන කෙටි කාලීන අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා භාවිත කරන මූල්‍ය උපකරණය වාණිජ පත්‍රිකා යනුවෙන් හැඳින්වේ. විශ්වාසය මත පදනම් වන නිසා, මේවා භාවිත කිරීමේ දී සුරැකුම්පත් අවශ්‍ය නොවේ.

- විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම ආශ්‍රිත වෙළෙඳපොළ අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ යනුවෙන් හැඳින්වේ. පවත්නා මිලට මෙන් ම අනාගතයේ එකඟ වූ මිලකට විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම මෙහි දී සිදු වේ.

- වර්ෂයකට වඩා වැඩි කාලයක් පරිණත වන මූල්‍ය උපකරණ හා සමාගම්වල කොටස් යනාදිය හුවමාරු වන වෙළෙඳපොළ ප්‍රාග්ධන වෙළෙඳපොළ යනුවෙන් හැඳින්වේ.

- ප්‍රාග්ධන වෙළෙඳපොළ පහත සඳහන් උප-වෙළෙඳපොළවලින් සමන්විත වේ.

    1. භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ
    2. සමාගමික බැඳුම්කර වෙළෙඳපොළ
    3. කොටස් වෙළෙඳපොළ

- මධ්‍යම හා දිගු කාලීන පදනමින් රජය ණය ලබා ගැනීම සඳහා භාවිත කරන ප්‍රධාන මූල්‍ය උපකරණය භාණ්ඩාගාර බැඳුම්කර යනුවෙන් හඳුන්වයි. මේවා හුවමාරු වන වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතීයක වෙළෙඳපොළ යනුවෙන් කොටස් දෙකකට බෙදේ.

- පෞද්ගලික සමාගම් විසින් මධ්‍යම හා දිගු කාලීන අරමුදල් සපයා ගැනීම සඳහා සමාගමික බැඳුම්කර හුවමාරු වන වෙළෙඳපොළ සමාගමික බැඳුම්කර වෙළෙඳපොළ යනුවෙන් හැඳින්වේ.

- කොටස් වෙළෙඳපොළ යනු මහජනයාට කොටස් අලෙවි කිරීම මගින් ව්‍යාපාරික සමාගම් ඒවායේ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සම්පාදනය කර ගන්නා වෙළෙඳපොළයි. මෙම ගනුදෙනු කොළඹ කොටස් හුවමාරුව (CSE) මගින් සිදු වේ.

- ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ තුළ ගනුදෙනු සිදු වන මූල්‍ය උපකරණ පහත දැක්වේ.

    - රජය නිකුත් කරන ණය උපකරණ
        - භාණ්ඩාගාර බිල්පත්
        - භාණ්ඩාගාර බැඳුම්කර
        - රජයේ ණය සුරැකුම්පත්
    - සමාගම් නිකුත් කරන ණය උපකරණ
        - වාණිජ පත්‍රිකා
        - ණයකර

- වාණිජ බැංකු භාවිත කරන උපකරණ
    - තැන්පතු සහතික
    - වත්කම් පදනම් කරගත් සුරැකුම්පත්
    - කල්බදු හෙවත් කුලී පිට ගැනුම්
    - ඒක්ෂණ ණය
    - ව්‍යාපාරික කොටස්
- මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය වීමත් සමග හුවමාරු වන මූල්‍ය උපකරණ සංඛ්‍යාව ද වැඩි වීම නිසා ඒවායේ ආයෝජනය කරන ආයෝජකයන්ට එම උපකරණවල ගුණාත්මක තත්ත්වය හඳුනා ගෙන ආයෝජන තේරීම් කිරීම සඳහා විධිමත් මඟ පෙන්වීමක් ලෙස ණය ශ්‍රේණිගත කිරීම හඳුන්වා දී ඇත.
- ණය ශ්‍රේණිගත කිරීම යනු ණය හෝ මූල්‍ය උපකරණ හෝ නිකුත් කරන්නාගේ මූල්‍ය ශක්තිය පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කිරීම යි. මෙමගින් නිකුත් කරන්නාට එම නිකුතුව පවත්වා ගෙන යාමට ඇති හැකියාව හා පරිණත වන කාලයට එය සම්පූර්ණයෙන් ම පියවා දැමීමට ඇති හැකියාව සොයා බැලේ.
- ණය ශ්‍රේණිගත කිරීම ආයතන සඳහා නිදසුන් පහත දැක්වේ.
    - මූඩීස් සමාගම
    - ස්ටෑන්ඩර්ඩ් හා පුවර්ස් සමාගම
    - ෆිට් රේටින්ග්ස්

**නිපුණතාව 7.0 : මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.6 :** ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යය විමසයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය ගෙන හැර දක්වයි.
- මූල්‍ය ප්‍රතිපත්ති අර්ථ දක්වයි.
- මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ නම් කරමින් විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකා මහ බැංකුව 1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් 1950 අගෝස්තු 28 වැනි දින පිහිටවනු ලැබී ය. ජෝන් එක්ස්ටර් මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව මහ බැංකුව පිහිටුවනු ලැබී ය.

- ශ්‍රී ලංකා ආර්ථිකයේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම මූල්‍ය කටයුතු සඳහා උපදේශනය, ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගෙන යාම සඳහා පිහිටවූ ස්වාධීන ආයතනය වන්නේ මහ බැංකුව යි.

- 2002 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී මුදල් නීති පනතේ කරන ලද සංශෝධනයට අනුව මහ බැංකුවේ වත්මන් අරමුණු දෙකක් දැක්වෙයි.

    1. ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගෙන යාම

    2. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගෙන යාම

- ආර්ථික හා මිල ස්ථායිතාව යන්නෙන් අදහස් කරන්නේ අඩු උද්ධමන වේගයක් කරා ළඟා වීමට මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම යි. ආර්ථික හා මිල ස්ථායිතාව වැදගත් වීමට හේතු කිහිපයක් පවතී.

    - ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම
    - කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීම
    - නිෂ්පාදකයන්, පාරිභෝගිකයන් හා ආයෝජකයන්ගේ අවදානම අඩු කිරීම
    - ආර්ථික සැලසුම් සකස් කිරීම
- ආර්ථික, මූල්‍ය, දේශපාලන හා වෙනත් කවර ම හෝ ක්ෂේත්‍රයක පැන නඟින අභ්‍යන්තර හෝ බාහිර හෝ කම්පනයන් හමුවේ නොසැලී සිටීමේ හැකියාව මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව යි.

- මහ බැංකුවේ එදිනෙදා කාර්ය රජය, මහජනයා, බැංකු සහ මූල්‍ය ආයතන සඳහා වෙන් වෙන් වශයෙන් හෝ පොදුවේ හෝ රටේ ආර්ථිකයට කරන සේවාවක් වශයෙන් හැඳින්විය හැකි ය. එම කාර්ය කිහිපයකි.
    - මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම
    - විනිමය අනුපාතික ප්‍රතිපත්ති මෙහෙයවීම
    - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම
    - නිල විදේශ සංචිත කළමනාකරණය
    - බැංකු මූල්‍ය සමාගම් සහ රජයේ සුරැකුම්පත් පිළිබඳ කටයුතුවල නියැළුණු ප්‍රාථමික වෙළෙඳුන්ට බලපත්‍ර ලබා දීම, නියාමනය හා අධීක්ෂණ කටයුතු කිරීම
    - රජයේ උපදේශක බැංකුකරු හා මූල්‍ය නියෝජිත වශයෙන් කටයුතු කිරීම
    - නියෝජ්‍යායතන කටයුතු
    - රාජ්‍ය ණය කළමනාකරණය
    - විදේශ විනිමය පාලනය
    - සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය
    - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩ සටහන් සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම
- ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය ප්‍රතිපත්තියේ ස්ථායිතාව යන අරමුණු වෙත ළඟා වීමට පොළී අනුපාතිකය සහ මුදල් සැපයුම කෙරෙහි බලපෑම් කිරීමට මූල්‍ය උපකරණ හැසිරවීමේ ක්‍රියාවලිය මූල්‍ය ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.
- මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩි දියුණු කරමින් එය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් බවට පරිවර්තනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරමින් සිටී.
- වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු කිහිපයකි.
    - මුදල් ඉලක්කකරණය
    - නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය
- මහ බැංකුව වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් මත ඉහත සඳහන් අරමුණු දෙක ඉටු කිරීමට මූලය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරයි.
- මුදල් ඉලක්කකරණය අදහස් කරන්නේ මුදල් ගුණකය හරහා සංචිත මුදල් සමඟ බැඳී ඇති අතරමැදි ඉලක්කය වන පුළුල් මුදල් සමස්ත පාලනය කිරීම තුළින් අවසාන ඉලක්කය වන මිල ස්ථායිතාව ළඟ කර ගැනීම යි. මෙම මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය වශයෙන් සංචිත මුදල් ක්‍රියාත්මක විය. එහෙත් සංචිත මුදල් තවදුරටත් මෙහෙයුම් ඉලක්කය නොවුන ද මූල්‍ය ප්‍රතිපත්තියට මග පෙන්වීම සඳහා ඇති ප්‍රධාන අතරමැදි දර්ශකයක් ලෙස පුළුල් මුදල් සැපයුම යොදා ගනී.

- වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් වෙනුවට හරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය භාවිත කරනු ලබන අතර ප්‍රතිපත්ති පොළී අනුපාතිකය සහ විවට වෙළෙඳපොළ කටයුතු වැනි ප්‍රතිපත්ති උපකරණ කෙරෙහි වැඩි විශ්වාසයක් තබා ගෙන ඇත.

- නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යනුවෙන් අදහස් වන්නේ උද්ධමන ඉලක්කයන් ආසන්නයේ උද්ධමනය මෙන් ම මූර්ත ආර්ථිකය ද ස්ථායි කිරීම වන අතර දැඩි උද්ධමන ඉලක්කරණයේ දී සිදු වන්නේ මූර්ත ආර්ථිකය පිළිබඳ ව එතරම් සැලකිලිමත් නොවී හුදෙක් උද්ධමනය පමණක් ස්ථායි කිරීමට උත්සාහ කිරීමයි.

- මෙම වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය විනිමය අනුපාතිකය කළමනාකරණයේ නම්‍යශීලීත්වයට සහාය දෙන අතර ම මැදි කාලීන ව උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමටත් හේතු වේ.

- ආර්ථිකයේ මිල ස්ථායිතාව, ආර්ථික ස්ථායිතාව හා මූල්‍ය ස්ථායිතාව යන අරමුණු ඉටු කිරීමට මුදල් සැපයුම, පොළී අනුපාතිකය බලපෑම් කිරීමට මහ බැංකුව විසින් භාවිත කරන උපකරණ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හඳුන්වයි. මෙම මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ප්‍රධාන කොටස් දෙකකි.

  1. ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ
  2. ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ

- ණය සැපයුම අඩු කිරීම සඳහා (පාලනය කිරීම සඳහා) පොදුවේ ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හඳුන්වනු ලැබේ.

- ණය පරිමාව සහ ණය ගලා යන දිශාව පාලනය කිරීම සඳහා මහ බැංකුව ගන්නා ක්‍රියාමාර්ග ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ ලෙස හැඳින්වේ.

- ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ තුනකි.
  1. මහ බැංකු පොළී අනුපාතිකය
  2. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය
  3. විවට වෙළෙඳපොළ කටයුතු

- ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණ දෙන වාණිජ බැංකුවලට අවසාන ණය දෙන්නා වශයෙන් මහ බැංකුව විසින් වාණිජ බැංකුවලින් අය කරන පොළිය මහ බැංකු පොළී අනුපාතිකය යි. මෙම පොළී අනුපාතිකය වැඩි කළ විට වාණිජ බැංකු ණය ගැනීම් අඩු වී, සංචිත අඩු වී ණය දීම් අඩු වී, ණය මැවීමේ හැකියාව ද අඩු වී මුදල් සැපයුම සංකෝචනය වේ. මහ බැංකු පොළී අනුපාතිකය අඩු කළ විට මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

- වාණිජ බැංකු විසින් මහ බැංකු නියමයන්ට අනුව තම තැන්පතු ප්‍රමාණයෙන් කිසියම් ප්‍රතිශතයක් අතැති මුදල් හා බැංකු මුදල් ලෙස තබා ගැනීම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ලෙස හඳුන්වයි. මහ බැංකුව වාණිජ බැංකුවල මහජනයාගේ තැන්පතුවලින් 10% ක්, 7% ක් 5% යනා දී වශයෙන් මහ බැංකුවේ තැන්පත් කළ යුතු බව තීරණය කරයි.

- මුල්‍ය ප්‍රසාරණයක් ඇති කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මහ බැංකුව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය පහත හෙළන අතර එහි දී වාණිජ බැංකුවල සංචිත ඉහළ යාමෙන් ණය දීමේ හැකියාව වැඩි වේ. එමෙන් ම මූල්‍ය සංකෝචනයක් ඇති කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ඉහළ දමයි. එහි දී වාණිජ බැංකුවල සංචිත අඩු වන අතර ණය දීමේ හැකියාව අඩු වේ.

  නිදසුන :
  වාණිජ බැංකුවල මහජනයා සතු තැන්පතු = රු. මිලියන 10 000
  ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය = 10%
  යැයි උපකල්පනය කරමු.

  තබා ගත යුතු සංචිතය $= 10000 \times \frac{10}{100}$

  = රු. මි. 1 000

  5% ක් ලෙස ව්‍යවස්ථාපිත සංචිතය පහළ $= 10000 \times \frac{5}{100}$

  දැමූ විට තබා ගත යුතු සංචිතය = රු. මි. 500

- ව්‍යවස්ථාපිත සංචිත පහළ දැමීම නිසා ණය ප්‍රසාරණය වැඩි වීමෙන් මුදල් සැපයුම වැඩි වේ.

- විවිට වෙළෙඳපොළ කටයුතු ලෙස හඳුන්වන්නේ විවෘත වෙළෙඳපොළේ මහ බැංකු සුරැකුම්පත් විකිණීම සහ මිලට ගැනීම යි. මහ බැංකුව විවෘත වෙළෙඳපොළේ සුරැකුම්පත් මිල දී ගත් විට මහ බැංකුවේ සිට මුදල් වෙළෙඳපොළ කරා මුදල් ගලා යාම සිදු වේ. මහ බැංකුව විවෘත වෙළෙඳපොළේ සුරැකුම්පත් විකිණීමෙන් මුදල් වෙළෙඳපොළෙන් මහ බංකුව වෙත මුදල් ගලා යාම සිදු වේ.

- මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ දී මහ බැංකුව විසින් අනුගමනය කරන පොළී අනුපාතික ප්‍රතිපත්ති පොළී අනුපාතික යන්නෙන් අදහස් වේ.

- ඉහත දැක් වූ මහ බැංකු පොළී අනුපාතිකයට අමතර ව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයන් සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතික ප්‍රතිපත්ති පොළී අනුපාතිකයන්ට අයත් ය.

- මහ බැංකුව ප්‍රති මිල දී ගැනීමේ හා ප්‍රති විකුණුම් පොළී අනුපාතිකයන් සිදු කිරීම ප්‍රතිපත්ති පොළී අනුපාතිකය යන්නෙන් අදහස් කරයි.

- අන්තර් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ පොළී අනුපාතිකය සඳහා පොළී අනුපාතික කොරිඩෝවක් සකස් කර ඇත. එහි පහළ සීමාව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය වන අතර ඉහළ සීමාව නිත්‍ය ණය පහසුකම් අනුපාත වේ. මෙම පොළී අනුපාතික කොරිඩෝව මහ බැංකුව ඇති කරක ලද්දේ වෙළෙඳපොළේ කෙටි කාලීන පොළී අනුපාතිකය විශාල වශයෙන් උච්චාවචනය වළක්වාලීම යි. පොළී අනුපාතික කොරිඩෝව තුළ පොළී අනුපාතිකය උච්චාවචනය වීමට ඉඩ සලසා ඇති අතර එය මහ බැංකුව විසින් සිදු කරන ලද නව ප්‍රවණතාවකි.

- ආපසු මිල දී ගැනීමේ එකඟතාව මත මහ බැංකුව සතු සුරැකුම්පත් මුදල් වෙළෙඳපොළේ අලෙවි කිරීම ප්‍රති මිල දී ගැනීම් ලෙස හඳුන්වයි. එය වර්තමානයේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය ලෙස හඳුන්වයි. මුදල් වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවක් පවතී නම් ප්‍රති මිල දී ගැනීම් මගින් එය අවශෝෂණය කර ගත හැකි ය. මෙමගින් අන්තර් ඒක්ෂණ ණය වෙළෙඳපොළේ පොළී අනුපාතිකයේ පහළ සීමාව සීමා වේ.

- ආපසු විකිණීමේ එකඟතාව මත මහ බැංකුව මුදල් වෙළෙඳපොළෙන් සුරැකුම්පත් මිලට ගැනීම ප්‍රති විකුණුම් ලෙස හැඳින්වේ. එය වර්තමානයේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය ලෙස හඳුන්වයි. මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතා හිඟයක් පවතී නම් මහ බැංකුව ප්‍රති විකුණුම්වල යෙදේ. මෙමගින් මුදල් වෙළෙඳපොළේ ද්‍රවශීලතා සැපයුම වැඩි වේ. අන්තර් ඒක්ෂණ වෙළෙඳපොළේ පොළී අනුපාතිකය ඉහළ යාම මෙමගින් සීමා කළ හැකි ය. මේ නිසා ප්‍රති විකුණුම් පොළී අනුපාතිකය අන්තර් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළේ ඉහළ සීමාව පෙන්වයි.

- ණය පරිමාව හා ණය ගලා යන දිශාව පාලනය කිරීම සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග ගුණාත්මක ණය පාලන උපකරණ නම් වේ.

- ගුණාත්මක මූල්‍ය උපකරණ කීපයකි.
    - ණය ශීර්ෂ පිළිබඳ උපරිම සීමා නියම කිරීම
        - යහ පෙලඹුම
        - වරණාත්මක පොළී අනුපාතයක් නියම කිරීම
        - ඇප සුරැකුම් වෙනස් කිරීම
        - බැංකු ණය පාලනය

**නිපුණතාව 7.0 :** **මුදල්වල හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 7.7 :** වාණිජ බැංකුවක කාර්යභාරය විමසයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- වාණිජ බැංකුවක් යන්න අර්ථ දක්වයි.
- වාණිජ බැංකුවල ප්‍රධාන අරමුණු පැහැදිලි කරයි.
- වාණිජ බැංකුවල අරමුණු ඉටු කර ගැනීමට යාමේ දී මුහුණ දෙන ගැටලු පැහැදිලි කරයි.
- වාණිජ බැංකුවල කාර්යය විස්තර කරයි.
- වාණිජ බැංකුවල ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) දක්වයි
- වාණිජ බැංකුවක වත්කම් ව්‍යූහය හඳුන්වයි.
- වාණිජ බැංකුවක් මුදල් මැවීම සිදු කරන ආකාරය ශේෂ පත්‍රයක් ඇසුරෙන් ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- චෙක්පතකින්, විධානයකින් හෝ අන්‍ය ආකාරයකින් ඉල්ලූ විටෙක ආපසු ගෙවීමේ පොරොන්දුවට යටත් ව මහජනයාගෙන් මුදල් තැන්පතු භාර ගැනීම සිය ප්‍රධාන කාර්යය කර ගත් ලාභ ඉපයීමේ අරමුණ සහිත ව මූල්‍ය අතරමැදිකරණයේ නිරත වන ඉතා ප්‍රබල හා ප්‍රමුඛ මූල්‍ය ආයතන විශේෂය වාණිජ බැංකු ලෙස හැඳින්වේ.
- වාණිජ බැංකුවක ප්‍රධාන අරමුණු දෙකකි.
  - මහජන විශ්වාසනීයභාවය පවත්වා ගැනීම සඳහා ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීම
  - ලාභදායකත්වය ඉහළ නංවා ගැනීම
- ද්‍රවශීලතාව යනු පාඩු නොවී වත්කම් ඉක්මනින් මුදල් බවට හැරවීමේ හැකියාව යි. තම තැන්පතු මුදල් තමන්ට අවශ්‍ය ඕනෑ ම විටෙක බැංකුවෙන් ආපසු ලබා ගත හැකි යන මහජන විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා සෑම අවස්ථාවක ම වාණිජ බැංකුවලට සිය ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීමට සිදු වේ.
- ලාභ දායකත්වය යනු ණයක් ලබා දීමෙන් සහ ආයෝජන වත්කම් මගින් උපයා ගන්නා ආදායමෙන් තැන්පතු සඳහා ගෙවන පොළී වියදම් අඩු කිරීමෙන් ලැබෙන ශුද්ධ පොළී ආදායම යි.

- වාණිජ බැංකුවලට ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට යාමේ දී අරමුණු අතර ගැටීමක් ඇති වේ.
- වාණිජ බැංකු සිය ද්‍රවශීලතාව ආරක්ෂා කර ගැනීමට යාමේ දී ලාභදායකත්වය අඩු වේ. ලාභදායකත්වය ආරක්ෂා කර ගැනීමට යාමේ දී ද්‍රවශීලතාව අඩු වේ. මෙම අරමුණු දෙක අතර ඇති වන ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලිය නිසා නිරතුරු ව ම ද්‍රවශීලතාව හා ලාභදායකත්වය අතර සමතුලිතතාවක් පවත්වා ගෙන යාමට වාණිජ බැංකුවලට සිදු වේ.
- වාණිජ බැංකුවල ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
- තැන්පතු භාර ගැනීම
  - ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම් පවත්වා ගෙන යාම. මෙම ගිණුම්වල මුදල් තැන්පතු චෙක්පත් මාර්ගයෙන් ගනුදෙනු කළ හැකි ය.
  - ඉතුරුම් තැන්පතු පවත්වා ගෙන යාම. මෙම තැන්පතුවලට පොළී ගෙවීම් සිදු කෙරේ. ගිණුම් හිමියාට අවශ්‍ය වූ විටෙක මුදල් ආපසු ලබා ගත හැකි ය.
  - කාලීන / ස්ථාවර තැන්පතු. නියමිත දිනයක කල් පිරෙන දිනය අවසන් වූ පසු ව යි. අවශ්‍ය වූ විටෙක එය ඇපයට තබා ණයක් ලබා ගත හැකි ය.
  - ණය සහ අත්තිකාරම් ලබා දීම
  - කෙටි කාලීන ණය
    - අයිරා පහසුකම් මත ණය ලබා දීම
    - කාලීන ණය
    - කල් බදු ණය
    - බිල්පත් වට්ටම් කිරීම
    - ඇසුරුම් ණය
  - නියෝජිත සේවා සැපයීම (පිළිණපත් විකිණීම හා මිල දී ගැනීම)
- පොදු උපයෝගිතා සේවා සැපයීම
  - උසස් සේවා සැපයීම
  - විදේශ විනිමය ගනුදෙනුවලට අවශ්‍ය පහසුකම් සැපයීම
  - විදේශ බැංකු කටයුතුවල දී සහාය සැපයීම
  - බැංකු අණකර, ණයපත් නිකුත් කිරීම
  - වාණිජ බැංකු ශේෂ පත්‍රය හෙවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයකින් පෙන්නුම් කරනුයේ වර්ෂය අවසාන දිනයේ දී බැංකුවේ මූල්‍ය තත්ත්වය යි. මෙය වත්කම් හා වගකීම් යන කොටස් දෙකින් සමන්විත වේ.

- වාණිජ බැංකු ශේෂ පත්‍රයක (මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක) ආකෘතියක් පහත දක්වේ.

| ශීර්ෂය | ප්‍රමාණය (රු. මිලියන) |
|---|---|
| වත්කම් | |
| (i) **ද්‍රවශීල වත්කම්** | xxx |
| අතැති මුදල් | xxx |
| මහ බැංකුවෙන් අය විය යුතු මුදල් ශේෂ | xxx |
| දේශීය බැංකුවලින් අය විය යුතු මුදල් ශේෂ | xxx |
| එකතු වෙමින් පවත්නා මුදල් ශේෂ | xxx |
| අතැති හා පිටරට බැංකුවලින් අය විය යුතු මුදල් | xxx |
| භාණ්ඩාගාර බිල්පත් | xxx |
| භාණ්ඩාගාර බැඳුම්කර | xxx |
| රජයේ වෙනත් සුරැකුම්පත් | xxx |
| වෙනත් ආයෝජන | xxx |
| මිලට ගත් හා වට්ටම් කළ බිල්පත් | xxx |
| අපනයන බිල්පත් | xxx |
| ආනයන බිල්පත් | xxx |
| දේශීය බිල්පත් | xxx |
| (ii) **ණය හා අත්තිකාරම්** | |
| ණය | xxx |
| අත්තිකාරම් | xxx |
| (iii) ස්ථාවර හා අනෙකුත් වත්කම් | xxx |
| වගකීම් | |
| (i) ප්‍රාග්ධන ගිණුම | xxx |
| (ii) මුළු තැන්පතු | |
| • ඉල්ලුම් තැන්පතු | xxx |
| • කාලීන හා ඉතුරුම් තැන්පතු | xxx |
| (iii) ණය ගැනීම් | |
| • දේශීය ණය ගැනීම් | xxx |
| • විදේශීය ණය ගැනීම් | xxx |
| (iv) අනෙකුත් වගකීම් | xxx |
| මුළු වත්කම් / වගකීම් | xxxxx |

- වාණිජ බැංකුවක ව්‍යුහය ඉහත සඳහන් ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) අනුව මෙසේ විශ්ලේෂණය කළ හැකි ය.
- වාණිජ බැංකු ශේෂ පත්‍රයේ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ) සඳහන් පහත දැක්වෙන මුදල් අයිතමයන් ප්‍රාථමික සංචිත වශයෙන් හැඳින්වේ.
    - අතැති මුදල්
    - මහ බැංකුවෙන් අය විය යුතු ශේෂ
    - දේශීය බැංකුවලින් අය විය යුතු ශේෂ
    - එකතු වෙමින් පවත්නා මුදල් ශේෂ
    - අතැති හා පිටරට බැංකුවලින් අය විය යුතු දේශීය මුදල් ශේෂ
- වාණිජ බැංකු ශේෂ පත්‍රයේ (මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ) දක්වා ඇති පහත සඳහන් අයිතම ඉපැයීම් වත්කම් ලෙස දැක්වේ.
    - භාණ්ඩාගාර බිල්පත්
    - භාණ්ඩාගාර බැඳුම්කර
    - රජයේ වෙනත් සුරැකුම්පත්
    - මිලට ගත් හා වට්ටම් කළ බිල්පත්
    - ණය
    - අත්තිකාරම්
- ඉහත සඳහන් ඉපැයීම් හිමිකම්වලින් කොටසක් වන පහත සඳහන් දෑ ද්විතීය සංචිත ලෙස ද යොදා ගැනේ.
    - රජයේ සුරැකුම්පත්
    - වාණිජ පත්‍රිකා
    - අන්තර් බැංකු ඒක්ෂණ ණය
- වාණිජ බැංකුව විසින් තම අධිසංචිත ණයට දීම තුළින් පැවති ප්‍රමාණය මෙන් කිහිප ගුණයක තැන්පතු බිහි කිරීම මුදල් මැවීම ලෙස හැඳින්වේ.
- වාණිජ බැංකු පද්ධතියක් ලෙස කටයුතු කිරීමේ දී මුදල් මැවීම හෙවත් ඉල්ලුම් තැන්පතු මැවීම සිදු කළ හැකි ය. වාණිජ බැංකු පද්ධතියක් මුදල් මැවීමේ ක්‍රියාවලිය සිදු කරන විට පහත සඳහන් උපකල්පන පදනම් කර ගෙන එය සිදු වේ.
    - කිසි දු බැංකුවක් අධිසංචිත පවත්වා නොගැනීම
    - මූලික තැන්පතු කළ පසු බැංකු ක්‍රමය තුළට අලුතෙන් මුදල් ගලා ඒමක් හෝ බැංකු ක්‍රමයෙන් පිටතට මුදල් ගලා යාමක් හෝ සිදු නොවීම
    - සියලු ම ණය ගැනුම්කරුවන් තමන් ලද ණය මුදල් සම්පූර්ණයෙන් වෙනත් බැංකුවක නැන්පත් කිරීම

- තනි වාණිජ බැංකුවක සහ වාණිජ බැංකු පද්ධතියක අධිසංචිත ණයට දීම සිදු වන ආකාරය පහත දක්වේ.

  - තනි බැංකුවක් ලෙස ක්‍රියාත්මක වෙමින් අධිසංචිත ණයට දීම

    වාණිජ බැංකුවක් විසින් මහ බැංකු නියමයන් ට අනුව තම තැන්පතු ප්‍රමාණයෙන් කිසියම් ප්‍රතිශතයක් අතැති මුදල් සහ බැංකු මුදල් ලෙස තබා ගැනීම ව්‍යවස්ථාපිත සංචිතය ලෙස හඳුන්වයි.

නිදසුන : වාණිජ බැංකුවක ඉල්ලුම් තැන්පතු රු. 10,000 ක් නම් තබා ගත යුතු අවශ්‍ය සංචිතය පහත සඳහන් ලෙස ගණනය කළ හැකි ය.

අවශ්‍ය සංචිතය = තැන්පතු X අවශ්‍ය සංචිතය

$$=1000\times\frac{20}{100}$$

= රු. මිලියන 2000

මෙම බැංකුවේ අධිසංචිතය වන්නේ රුපියල් මිලියන 8000/- කි.

= රු 10 000 - 2 000

= රු. මිලියන 8 000/-

- මෙම වාණිජ බැංකුවකට ලබා දිය හැකි උපරිම ණය ප්‍රමාණය රු.මිලියන 8000- කි. තනි බැංකුවක් ලෙස කටයුතු කරන නිසා අධි සංචිතය පමණක් ණය දීම සිදු වේ.
- වාණිජ බැංකුවක පවතින ශේෂ පත්‍රයක් (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) මගින් ද අධිසංචිතය ණය ලෙස ලබා දෙන ආකාරය පැහැදිලි කළ හැකි ය.

| වගකීම් වටිනාකම රු. මිලියන | | වත්කම් වටිනාකම රු. මිලියන | |
|---|---|---|---|
| තැන්පතු | 10 000 | සංචිත | 6 000 |
| | | ණය | 4 000 |
| මුළු වගකීම් | 10 000 | මුළු වත්කම් | 10 000 |

- මෙම වාණිජ බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් නම් තැන්පතු සඳහා අවශ්‍ය කරන සංචිතය රු. මිලියන 2 000 කි.

පවත්නා සංචිතය = රු. මිලියන 6 000

අවශ්‍ය සංචිතය = රු. $10000\times\frac{20}{100}$ = රු. මිලියන 2 000

අධිසංචිත ප්‍රමාණය = 6 000 - 2 000 = රු. මිලියන 4 000

- මෙම බැංකුවට ලබා දිය හැකි අලුත් ණය ප්‍රමාණය රු. මිලියන 4 000/= කි. වාණිජ බැංකු පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් අධිසංචිත ණයට දීම සිදු කරයි.

- වාණිජ බැංකු පද්ධතියක ණය මැවීම තැන්පතු ප්‍රසාරණ සංගුණකය මගින් තීරණය වේ. තැන්පතු ප්‍රසාරණ සංගුණකය යනු ආරම්භක ඉල්ලුම් තැන්පතුවක් මෙන් කොපමණ ගුණයකින් ඉල්ලුම් තැන්පතු වැඩි වේ ද යන්නයි. තැන්පතු ප්‍රසාරණ ගුණකය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ පරස්පරයට සමාන වේ. ප්‍රසාරණ සංගුණකය පහත ලෙස ගණනය කළ හැකි ය.

බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකය (k) = 1/ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

$$= \frac{1}{r}$$

නිදසුන : ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20%

k = බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකය

r = ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

1 = නියතයකි.

බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකය (k) $= \frac{1}{r}$

$$= \frac{1}{20\%}$$

$$= 1 \times \frac{100}{20}$$

$$= \underline{\underline{5}}$$

- බැංකු පද්ධතියක් තුළ මුදල් මැවීම සිදු වන ආකාරය වාණිජ බැංකු පද්ධතියක ශේෂ පත්‍ර (මූල්‍ය තත්ත්ව ප්‍රකාශ) කිහිපයක් ඇසුරෙන් ගණනය කළ හැකි ය.

- A නමැති වාණිජ බැංකුව සතුව රු. මිලියන 10 000/= ක ආරම්භක තැන්පතුවක් සහ 20% ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයක් පවතී යයි උපකල්පනය කරමු. එම බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) පහත දැක්වේ.

A බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)

| වගකීම් වටිනාකම | රු. මිලියන | වත්කම් වටිනාකම | රු. මිලියන |
|---|---|---|---|
| තැන්පතු | 10 000 | සංචිත | 2 000 |
| | | ණය | 8 000 |
| | 10 000 | එකතුව | 10 000 |

- A බැංකුවෙන් කිසියම් පුද්ගලයකුට රු. මිලියන 8 000/= ක් ණයට දුන් පසු එම ගනුදෙනුකරුවා එම මුදල B බැංකුවේ තැන්පත් කළේ යයි සිතමු. එවිට B බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) පහත සඳහන් ලෙස වෙනස් වේ.

B බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)

| වගකීම් වටිනාකම | රු. මිලියන | වත්කම් වටිනාකම | රු. මිලියන |
|---|---|---|---|
| තැන්පතු | 8 000 | සංචිත | 1 600 |
| | | ණය | 6 400 |
| | 8 000 | එකතුව | 8 000 |

B බැංකුවෙන් එම තැන්පතුවලින් 20% ක් වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අනුව රු. මිලියන 1 600/- ක් තබා ගෙන රු. මිලියන 6 400/- ක් ණය ලෙස ලබා දුන් පසු එම මුදල ම ගනුදෙනුකරුවා C වාණිජ බැංකුවේ තැන්පත් කළේ යයි සිතමු. C වාණිජ බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) පහත සඳහන් ලෙස වෙනස් වේ.

C බැංකුවේ ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)

| වගකීම් වටිනාකම | රු. මිලියන | වත්කම් වටිනාකම | රු. මිලියන |
|---|---|---|---|
| තැන්පතු | 6 400 | සංචිත | 1 280 |
| | | ණය | 5 120 |
| | 6 400 | එකතුව | 6 400 |

- මේ ආකාරයට වාණිජ බැංකු තමන් වෙත ලැබෙන තැන්පතුවලින් 20% බැගින් සංචිත වශයෙන් තබා ගෙන අධිසංචිත ණයට දීම මගින් ඉල්ලුම් තැන්පතු මැවීමක් සිදු කළ හැකි ය.

( • එක් එක් බැංකුවල පහත සඳහන් ශේෂ පත්‍ර (මූල්‍ය තත්ත්ව ප්‍රකාශ) අවස්ථා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  - ආරම්භක ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)
  - ණය නිකුත් කළ පසු ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)
  - අවසාන ශේෂ පත්‍රය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)

- ඉහත දක්වන ලද A, B, C ආදී ලෙස දක්වන ලද වාණිජ බැංකු පද්ධතියේ ම ඉල්ලුම් තැන්පතු මැවීම බහුවිධ ප්‍රසාරණය ලෙස හඳුන්වයි.

  වාණිජ බැංකු පද්ධතිය තුළ සිදු වන ඉල්ලුම් තැන්පතුවල බහුවිධ ප්‍රසාරණය සිදු වන ආකාරය පහත දැක්වේ.

| බැංකුව | තැන්පතු රු. මිලියන | නව සංචිත රු.මිලියන | අධිසංචිත රු. මිලියන | ණයට දෙන මුදල රු. මිලියන |
|---|---|---|---|---|
| A | 10 000 | 2 000 | 8 000 | 8 000 |
| B | 8 000 | 1 600 | 6 400 | 6 400 |
| C | 6 400 | 1 280 | 5 120 | 5 120 |
| D | 5 120 | 1 040 | 4 096 | 4 096 |
| E | 4 096 | 819.20 | 3276.80 | 3276.80 |
| ..... | ....... | ......... | ......... | ...... |
| ..... | ....... | ......... | ......... | ...... |
| ..... | ....... | ......... | ......... | ...... |
| බැංකු පද්ධතියේ මුළු එකතුව | 50 000 | 10 000 | 40 000 | 40 000 |

- මෙලෙස සැම වාණිජ බැංකුවක් ම ඉල්ලුම් තැන්පතු භාර ගැනීම සහ ණයට දීම සිදු කරන විට බැංකු පද්ධතියේ සමතුලිතය ගණනය කළ හැකි ය. බැංකු පද්ධතිය අධිසංචිත ශුන්‍ය වන තුරු මුදල් මැවීම සිදු කළ විට මුළු තැන්පතු මැවීම රු. මිලියන 50 000 ක් වී ඇති අතර එයට අවශ්‍ය සංචිතය වන්නේ රු. මිලියන 10 000/= කි. ආරම්භක තැන්පතුව රු. මිලියන 10 000/=ක් වන අතර එයට සමාන බැංකු පද්ධතිය සමතුලිත වීම ලෙස හඳුන්වයි. එම සමතුලනය ඉහත සංඛ්‍යා ලේඛන වගුවේ අවසානයේ නව සංචිතවල පෙන්නුම් කරයි.

මැවිය හැකි උපරිම ණය ප්‍රමාණය = ආරම්භක අධි සංචිත ප්‍රමාණය X ප්‍රසාරණ සංගුණය

= 8 000 X 5

= 40 000/=

බැංකු පද්ධතියක ශේෂ පත්‍රයක් ලබා දුන් විට මැවිය හැකි ඉල්ලුම් තැන්පතු ප්‍රමාණය පහත සඳහන් ආකාරයට ගණනය කළ හැකි ය.

බැංකු පද්ධතියක ශේෂ පත්‍රය

| වගකීම් වටිනාකම (රු. මිලියන) | | වත්කම් වටිනාකම (රු. මිලියන) | |
|---|---|---|---|
| තැන්පතු | 50 000 | සංචිත | 10 000 |
| | | ණය | 40 000 |
| මුළු වගකීම් | 50 000 | මුළු වත්කම් | 50 000 |

නිදසුන :

මහ බැංකු 10%ක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමූ විට මැවිය හැකි උපරිම තැන්පතු ප්‍රමාණය පහත සඳහන් ආකාරයට ගණනය කළ හැකි ය.

මැවිය හැකි උපරිම තැන්පත් ප්‍රමාණය = පවතින සංචිත ප්‍රමාණය x ප්‍රසාරණ සංගුණකය

= රු. මිලියන 10 000 x 10

= රු. මිලියන 100 000/=

- ආර්ථිකයේ මුදල් සැපයුමේ හට ගන්නා සැබෑ ප්‍රසාරණය බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණයෙන් දැක්වෙන ප්‍රමාණයට වඩා වෙනස් විය හැකි ය. මුදල් මැවීම සීමා වීමට පහත සඳහන් හේතු බලපායි.
  - බැංකු පද්ධතිය වෙතින් බැංකු නොවන මූල්‍ය ආයතන කරා ව්‍යවහාර මුදල් ගලා යාම
  - ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීම සඳහා මහජනතාව දක්වන අභිරුචිය
  - අධිසංචිත තබා ගැනීමට වාණිජ බැංකු දක්වන කැමැත්ත
  - බැංකු ණය සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් ඇති නොවීම

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 8.1 :** වෙළෙඳපොළ අසමත් වීමට හේතු විමර්ශනය කරයි.

කාලච්ඡේද ගණන : 08

**ඉගෙනුම් පල :**

- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීම යන්න අර්ථකථනය කරයි.
- වෙළෙඳපොළ ක්‍රමය අසමත් වීමට බලපාන හේතු පැහැදිලි කරයි.
- සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතා පැහැදිලි කරයි.
- සාර්ව ආර්ථික අස්ථායිතාව පැහැදිලි කරයි.
- ආදායම් බෙදී යාමේ විෂමතාව පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් බෙදා වෙන් කිරීමෙහි ලා වෙළෙඳපොළ යාන්ත්‍රණය අපොහොසත් වීම වෙළෙඳපොළ අසමත් වීම යන්නෙන් අදහස් කෙරේ.
- වෙළෙඳපොළ අසමත් වීම කෙරෙහි පහත සඳහන් හේතු බලපායි.
    1. සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීම
    2. ආදායම් බෙදී යාමේ විෂමතාව
    3. සාර්ව අර්ථික අස්ථායිතාව
- සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය වන කොන්දේසිය වන මිල , ආන්තික පිරිවැයට සමාන වීම (P = MC) කොන්දේසියෙන් බැහැර ව කටයුතු කිරීම සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාව යන්නෙන් අදහස් වේ.
- ආර්ථිකය සතු හිඟ සම්පත් සමාජයට හිතකර අයුරෙන් බෙදී නොයාම නිසා සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වන අතර, ඒ සඳහා පහත සඳහන් හේතු බලපායි.
    - පොදු භාණ්ඩ නොසැපයීම
    - අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව පරිභෝජනය නොවීම
    - ශුභසාධන භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම

- සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම
- පොදු සම්පත් අධිභාවිතය
- බාහිරතා සැලකිල්ලට නොගැනීම
- අපූර්ණ තරගය හා ඒකාධිකාරිත්වය
- අපූර්ණ තොරතුරු

- පොදු භාණ්ඩ යනු සාමූහික ව පරිභෝජනය කරනු ලබන භාණ්ඩ වේ.
- පොදු භාණ්ඩවල ප්‍රධාන ලක්ෂණ දෙකකි.

1. ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් කළ නොහැකි වීම
2. පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති වීම

- පොදු භාණ්ඩයක් සැපයූ විට ගෙවීමක් කළ ද නොකළ ද සියලු දෙනාට ම පරිභෝජනය කිරීමට හැකියාව ලැබෙන නිසා ස්වාර්ථය උදෙසා කටයුතු කරන පාරිභෝගිකයෝ එම භාණ්ඩය සඳහා ගෙවීමක් කිරීමට නොපෙලඹෙති.
- එමෙන් ම ලාභය අරමුණු කර ගෙන කටයුතු කරන වෙළෙඳපොළ ආර්ථිකයක කිසිවෙක් එවැනි පොදු භාණ්ඩයක් නිපදවීම සඳහා සම්පත් වෙන් නොකරති.
- එක් පුද්ගලයකු විසින් කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ පරිභෝජනය කිරීම නිසා වෙනත් පුද්ගලයකුට එම භාණ්ඩය ඒ ආකාරයෙන් ම පරිභෝජනය කිරීමේ හැකියාව අහිමි නොවීම පරිභෝජනයේ තරගකාරිත්වය නොමැති වීම යනුවෙන් අදහස් කෙරේ. මේ නිසා අතිරේක පාරිභෝගිකයකුගේ පරිභෝජනයේ ආන්තික පිරිවැය ශුන්‍ය අගයක් ගනී.
- ඔරලෝසු කණු, ජාතික ආරක්ෂාව, වීථි ආලෝකය, ප්‍රදීපාගාර වැනි දෑ පොදු භාණ්ඩ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය.
- මේ අනුව පොදු භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ ක්‍රමය අසමත් වන බව පැහැදිලි වේ.
- සාම්ප්‍රදායික ව රටක් තුළ පවතින පොදු භාණ්ඩලවලට අමතර ව ජාතික දේශ සීමා ඉක්මවා ගිය ඇතැම් පොදු භාණ්ඩ ද පවතී. මේවා ගෝලීය පොදු භාණ්ඩ ලෙස හැඳින්වේ.
- ගෝලීය පොදු භාණ්ඩයක පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි ය.
    - පරිභෝජනයේ තරගකාරිත්වයක් නොමැති වීම
    - ගෙවීමක් නොකරන අයට පරිභෝජනය සීමා කළ නොහැකි වීම
    - එම භාණ්ඩවලින් ලැබෙන ප්‍රතිලාභ ලොව පුරා සිටින සියලු ම දෙනාට භුක්ති විඳිය හැකි වීම

- දනුම, මූල්‍ය ස්ථායිතාව, ලෝක සාමය, වායුගෝලය වැනි දෑ ගෝලීය පොදු භාණ්ඩවලට නිදසුන් ලෙස දැක්විය හැකි ය. මෙවැනි පොදු භාණ්ඩ නොසැපයීම වෙළෙඳපොළ අසමත් වීමට හේතු වේ.

- ධාරිතා මට්ටම කරා ළඟා වන තෙක් පරිභෝජනයේ තරගකාරිත්වයක් දැකිය නොහැකි, පරිභෝජනය සීමා කළ හැකි භාණ්ඩ අර්ධ පොදු භාණ්ඩ වේ.

- අර්ධ පොදු භාණ්ඩයක ලක්ෂණ පහත දැක්වේ.

    1. ධාරිතා මට්ටම උපරිමය කරා ළඟා වනතුරු පරිභෝජනයේ තරගකාරිත්වය දක්නට නොතිබීම

    2. පරිභෝජනය සීමා කළ හැකි වීම

- මහා මාර්ග, මුහුදු වෙරළ සහ කෞතුකාගාර වැනි දෑ අර්ධ පොදු භාණ්ඩවලට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

- උපරිම ධාරිතා මට්ටමට ළඟා වන තුරු අතිරේක පුද්ගලයකුගේ පරිභෝජනය ආන්තික පිරිවැය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරයි. එහෙත් මිලක් අය කිරීම හේතුවෙන් අදාළ භාණ්ඩය හෝ සේවාව හෝ අකාර්යක්ෂම ලෙස උපයෝජනය විය හැකි ය. එවිට එම භාණ්ඩය හෝ සේවාව හෝ සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් පරිභෝජනය කිරීමට සිදු වේ.

- එමෙන් ම අර්ධ පොදු භාණ්ඩ සැපයීමේ දී නිෂ්පාදකයන් ආන්තික පිරිවැයට වඩා වැඩි මිලක් අය කළ හැකි ය. එවැනි අවස්ථාවල දී එම මිලට වඩා අඩු මිලක් ගෙවීමට සූදානම් පාරිභෝගිකයන්ට එම භාණ්ඩය පරිභෝජනය කිරීමේ හැකියාව අහිමි වන බැවින් සමාජීය ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් පරිභෝජනය සිදු වේ. මෙවැනි තත්ත්වයන් මත අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව පරිභෝජනය නොවීම සම්බන්ධයෙන් වෙළෙඳපොළ අසමත් වීම සිදු වේ.

- පරිභෝජනයේ දී පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා විශාල වශයෙන් සමාජ ප්‍රතිලාභ ලැබෙන භාණ්ඩ ශුභසාධන භාණ්ඩ වේ.

- අධ්‍යාපනය, සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා ආදිය ශුභසාධන භාණ්ඩ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි ය.

- වෙළෙඳපොළ ක්‍රමය තුළ ශුභසාධන භාණ්ඩ සැපයීම සඳහා යොමු වීමක් සිදු නොවේ. ඊට හේතුව එම භාණ්ඩ සැපයීමේ දී අදාළ පරිභෝජන තීරණ ගනු ලබන්නේ ඒවායේ බාහිර ප්‍රතිලාභ මුළුමනින් ම නොසලකා හැර එමගින් ලැබෙන පෞද්ගලික ප්‍රතිලාභ හා පිරිවැය පමණක් සැලකිල්ලට ගැනීමයි. මේ නිසා ශුභසාධන භාණ්ඩයක පරිභෝජනය සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් සිදු වේ. එය වෙළෙඳපොළ අසමත් වීමට හේතු වේ.

- පරිභෝජනය නිසා අවශේෂ සමාජය කෙරෙහි ඍණ බාහිරතාවක් හෙවත් අහිතකර  ඍණ පිරිවැයක් ඇති කරන භාණ්ඩ සමාජයට අහිතකර භාණ්ඩ (අවගුණ භාණ්ඩ) වශයෙන් හැඳින්වේ.
- මත්පැන්, දුම්වැටි, මත්ද්‍රව්‍ය වැනි දෑ සමාජයට අහිතකර භාණ්ඩ සඳහා නිදසුන් වේ.
- වෙළෙඳපොළ ඔස්සේ සමාජයට අහිතකර භාණ්ඩ සැපයීමේ දී එම භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් ඇති වන බාහිර පිරිවැය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම නිසා සමාජීය ප්‍රශස්ත මට්ටමට වඩා වැඩි නිෂ්පාදනයක් සිදු වන අතර සමාජීය ප්‍රශස්ත මට්ටමට වඩා පරිභෝජනය කිරීමට පාරිභෝගිකයන්ගේ පෙලඹීමක් ද සිදු වේ. මේ නිසා සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම හමුවේ වෙළෙඳපොළ ක්‍රමය අසමත් වේ.
- පරිභෝජනය සීමා කළ නොහැකි පරිභෝජනයේ තරගකාරීත්වයක් දැකිය හැකි සම්පත් පොදු සම්පත් වේ.

  නිදසුන් : මත්ස්‍ය සම්පත්, තෘණ භූමි, වායුගෝලය
- පොදු සම්පත්වල පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි ය.
  1. ප්‍රතිලාභ ලබන්නන් හා පරිභෝජනය සීමා කළ නොහැකි වීම
  2. පරිභෝජනයේ තරගකාරිත්වයක් දක්නට ලැබීම
- පරිභෝජනය සීමා කළ නොහැකි වීමත් පරිභෝජනයේ තරගකාරිත්වයක් පැවතීමත් නිසා ඕනෑ ම පුද්ගලයෙකුට පොදු සම්පත් කරා ප්‍රවේශ විය හැකි ය. මේ නිසා පොදු සම්පත් අධිඋපයෝජනයට (අධි භාවිතයට) පාත්‍ර වී හායනයට ලක් වේ. වෙළෙඳපොළ තුළ පොදු සම්පත් කාර්යක්ෂම ව උපයෝජනය කළ හැකි යාන්ත්‍රණයක් බිහි නොවීම නිසා එම සම්පත් අකාර්යක්ෂම ලෙස කළමනාකරණය වීමෙන් වෙළෙඳපොළ අසමත් වේ.
- කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවලියක් නිසා වෙනත් පාර්ශ්වයන් මත ඇති කරන, එම නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවලියට ඍජු ව ම සම්බන්ධ වන පුද්ගලයා විසින් සැලකිල්ලට ගනු නො ලබන, ප්‍රතිලාභ හා පිරිවැය බාහිරතා යනුවෙන් හැඳින්වේ.
- හිතකර බාහිරතා හා අහිතකර බාහිරතා යනුවෙන් බාහිරතා කොටස් දෙකකට බෙදෙන අතර, හිතකර බාහිරතා වන ධන බාහිරතා ලෙසත් අහිතකර බාහිරතා ඍණ බාහිරතා ලෙසත් හැඳින්වේ. මෙම බාහිරතා පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා වෙළෙඳපොළ අසමත් වේ.

- අපූර්ණ තරගය හා ඒකාධිකාරී වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ භාණ්ඩය සඳහා අය කරන මිල භාණ්ඩයේ ආන්තික පිරිවැය ඉක්මවයි. මේ නිසා සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය කරන මිල හා ආන්තික පිරිවැය සමාන වීමේ (P - MC) කොන්දේසිය ඉටු නොවේ. මේ නිසා පාරිභෝගිකයා සූරා කෑමකට ලක් වන බැවින් වෙළෙඳපොළ අසමත් වේ.
- පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට තීරණ ගැනීමට අවශ්‍ය කරන තොරතුරු වෙළෙඳපොළ මගින් සම්පූර්ණයෙන් නිවැරදි ව ලබා ගත නොහැකි වීම අපූර්ණ තොරතුරු යනුවෙන් හැඳින්වේ.
- වෙළෙඳපොළක් පූර්ණ තොරතුරු නොලැබීම කෙරෙහි පහත සඳහන් සාධක බලපායි.
  - ප්‍රචාරණය නිසා සැබෑ තොරතුරු විකෘත කොට දැක්වීම
  - සංකීර්ණ තාක්ෂණික කරුණු පිළිබඳ ඇතැම් තොරතුරු ලබා දීමට අපහසු වීම
  - ඇතැම් ප්‍රතිලාභ පිළිබඳ අවිනිශ්චිතතා පැවතීම
- වෙළෙඳපොළෙන් පූර්ණ තොරතුරු නොලැබෙන විට නිෂ්පාදකයා හා පාරිභෝගිකයා ගනු ලබන තීරණ නිසා සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වේ. මේ අනුව පූර්ණ තොරතුරු නොලැබීම වෙළෙඳපොළ අසමත් වීමට හේතු වේ.
- සාර්ව ආර්ථික අස්ථායිතාව යනු ආර්ථිකයක වරින් වර ඇති වන උච්චාවචනයන් ය.
- සාර්ව ආර්ථික අස්ථායිතා පිළිබිඹු කෙරෙන ප්‍රධාන දර්ශකයන් ලෙස විරැකියාව, උද්ධමනය, ආර්ථික පසුබැසීම් හා ආර්ථික ප්‍රසාරණයන් දැක්විය හැකි ය.
- පෞද්ගලික පරිභෝජන අතිරික්ත වැනි සාධකවල ඇති වන වෙනස්කම් නිසා බොහෝ අවස්ථාවල සමස්ත ඉල්ලුමේ හට ගන්නා උච්චාවචන හේතුවෙන් ආර්ථිකයේ කෙටි කාලීන අස්ථායිතාවක් ඇති වේ.
- ආදායම් බෙදී යාමේ විෂමතාව යනු රටේ සමස්ත ආදායම හෝ සම්පත් සෑම පුද්ගලයෙකුට ම ජීවත් වීමට අවශ්‍ය අදායම් මට්ටමක්වත් ලැබෙන අයුරෙන් සමස්ත ජනගහනය අතර බෙදී නොයාමයි.
- ආදායම් බෙදී යාමේ විෂමතා ඇති වීම කෙරෙහි බලපාන හේතු කිහිපයක් පහත දැක් වේ.
  - කැප කරනු ලබන ශ්‍රම ප්‍රමාණය
  - අධ්‍යාපන මට්ටම
  - උරුමයෙන් ලද දේපොළ ප්‍රමාණය
  - සාධක මිල

- මෙම සාධකවල ප්‍රතිඵල මත බිහි වන කුටුම්බ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවන් ඇති වන අතර ආර්ථිකයේ සම්පත් බෙදී යාම ද එම ආදායම් ව්‍යාප්ති රටාවට අනුව සිදු වේ. ඒ අනුව අඩු ආදායම් ලාභීන්ගේ ඉල්ලුම සපුරාලීමට අඩු සම්පත් ප්‍රමාණයකුත්, වැඩි ආදායම් ලාභීන්ගේ ඉල්ලුම සපුරාලීම වැඩි සම්පත් ප්‍රමාණයකුත් වෙන් කෙරේ.

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.2 : වෙළෙඳපොළ අසාර්ථක වීම කෙරෙහි බාහිරතාවල බලපෑම පරීක්ෂා කරයි.**

**කාලච්ඡේද ගණන : 07**

**ඉගෙනුම් පල :**

- බාහිරතා නිර්වචනය කරයි.
- බාහිරතා උපදවන මූලාශ්‍ර නම් කරයි.
- බාහිරතා උපදවන ධනාත්මක හා ඍණාත්මක මූලාශ්‍ර වෙන් වෙන් ව දක්වා නිදසුන් ඉදිරිපත් කරයි.
- බාහිරතා නිසා වෙළෙඳපොළ අසාර්ථක වන අයුරු ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරයි.
- බාහිරතා හේතුවෙන් වෙළෙඳපොළ අසාර්ථක වීම වළක්වා ලීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ධන හා ඍණ බාහිරතා දැක්වෙන විශාල කරන ලද පින්තූර දෙකක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- පින්තූරවල අඩංගු දැවලින් සමාජයට සිදු වන යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පින්තූරවල අඩංගු දැවලින් සමාජයට යහපත් හා අයහපත් ප්‍රතිඵල අත් වේ. ඒ වෙනුවෙන් සමාජයට වන්දියක් හෝ වියදමක් හෝ දැරීමට සිදු නොවේ.
  - මේ ආකාරයට කිසියම් ආර්ථික කටයුත්තක් නිසා ඊට සම්බන්ධ නොවන බාහිර පාර්ශ්වයකට අත් වන වන්දි විචලනය නොකරන ලද වාසි හෝ අවාසි බාහිරතා ලෙස හැඳින්වේ.
  - බාහිරතා නිෂ්පාදනයේ දී මෙන් ම පරිභෝජනයේ දී ද හට ගනී.
  - සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් මාතෘකා අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - නිෂ්පාදනයේ බාහිරතා
    - පරිභෝජනයේ බාහිරතා
- ඔබට ලැබී ඇති මාතෘකාව අවබෝධ කර ගැනීමට කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මාතෘකාවට අදාළ ව ඔබට ලැබී ඇති අත්දැකීම් සාකච්ඡා කර තොරතුරු රැස් කරන්න.
- ඔබ රැස් කර ගත් තොරතුරු ඇසුරෙන් හිතකර බාහිරතා සහ අහිතකර බාහිරතා වෙන් කොට දක්වන්න.
- බාහිරතා ඇති වීමට හේතු හා ඒවායෙහි ප්‍රතිඵල හඳුනා ගන්න.
- බාහිරතා වැලැක්වීමේ වැදගත්කම හා ඒවා වලක්වා ගන්නා ආකාරය පිළිබඳ ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- බාහිරතා යනු කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවක් නිසා වෙනත් පාර්ශ්වයක් මත ඇති කරන, නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවට සෘජුව ම සම්බන්ධ අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි.
- වෙනත් පාර්ශ්වයක් වෙත ඇති කරන අහිතකර ප්‍රතිවිපාක බාහිර පිරිවැයක් ලෙස සලකනු ලැබේ.
- වෙනත් පාර්ශ්වයක් වෙත ඇති කරන  හිතකර ප්‍රතිවිපාක බාහිර ප්‍රතිලාභ ලෙස සලකනු ලැබේ.
- බාහිරතා හිතකර ප්‍රතිවිපාක හෝ අහිතකර ප්‍රතිවිපාක හෝ ලෙස ස්වරූප දෙකක් පවතී. හිතකර ප්‍රතිවිපාක ධන බාහිරතා ලෙසත් අහිතකර ප්‍රතිවිපාක සෘණ බාහිරතා ලෙසත් වර්ග කෙරේ.
- බාහිරතා අසල්වැසි ප්‍රතිවිපාක හෝ තෙවැනි පාර්ශ්ව ප්‍රතිවිපාක ලෙස ද හඳුන්වයි.
- බාහිරතා උපදවන මූලාශ්‍රය දෙකකි.
    1. නිෂ්පාදනය
    2. පරිභෝජනය

- මෙම මූලාශ්‍රය මත හට ගන්නා බාහිරතා ප්‍රභේද 4කි. ඒවා නම්,
    - නිෂ්පාදනයේ සෘණ බාහිරතා
    - නිෂ්පාදනයේ ධන බාහිරතා
    - පාරිභෝජනයේ සෘණ බාහිරතා

- පාරිභෝජනයේ ධන බාහිරතා

- නිෂ්පාදනයේ ඍණ බාහිරතා යනු කිසියම් නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට ඍජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන අවාසි හෙවත් අයහපත් බලපෑම් ය.

  නිදසුන් :

  - අර්තාපල් බෝග නිෂ්පාදනයේ දී පාංශු ඛාදනය නිසා ජලාශවල රොන් මඩ තැන්පත් වීම නිසා සිදු වන හානිකර තත්ත්වය
  - කෘෂි භෝග සඳහා කෘමිනාශක භාවිතය හේතුවෙන් පරිසරය දූෂණය වීම හා ලෙඩ රෝග ඇති වීම

- නිෂ්පාදනයේ ධන බාහිරතා යනු කිසියම් කෘෂි නිෂ්පාදන කටයුත්තක් නිසා ඊට ඍජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන වාසි හෙවත් යහපත් බලපෑම් ය.

  නිදසුන් :

  - මල් උද්‍යානයක් ඇති කිරීමෙන් මී මැසි පාලනයේ ඵලදායිතාව වැඩි වීම
  - වන වගා ව්‍යාපෘතිය නිසා ජල මූලාශ්‍ර ඇති වීම

- පරිභෝජනයේ ඍණ බාහිරතා යනු කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එයට ඍජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන අවාසි හෙවත් අහිතකර බලපෑම් ය.

  නිදසුන් :

  - දුම්පානය නිසා අවට සිටින පුද්ගලයන් ඇති වෙන අහිතකර බලපෑම
  - මෝටර් රථ භාවිතයෙන් පිටවන කාබන් ඩයොක්සයිඩ් වායුව නිසා සමාජයට අහිතකර බලපෑම් ඇති වීම

- පරිභෝජනයයේ ධන බාහිරතා යනු කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එයට ඍජු සම්බන්ධතාවක් නොමැති බාහිර පාර්ශ්වයන්ට ඇති වන වාසි හෙවත් හිතකර බලපෑම් ය.

  නිදසුන් :

  - බෝ වන රෝග සඳහා ලබා දෙන එන්නත් මගින් සියලු ම දෙනාට හිතකර බලපෑම් ඇති වීම
  - දෙමුහුන් වාහන (හයිබ්‍රිඩ්) භාවිතයෙන් සමාජයට සහ පරිසරයට වන හිතකර බලපෑම

- කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් නිසා එහි සියලු ම පිරිවැය නිෂ්පාදකයා විසින් දරන්නේ නම් හෝ කිසියම් පරිභෝජන කටයුත්තක් නිසා එහි සියලු ම ප්‍රතිලාභ එම පාරිභෝගිකයාට හිමි වන්නේ නම් වෙළෙඳපොළ කාර්යක්ෂම වේ. නමුත් බාහිරතා නිසා එය එසේ සිදු නොවේ.

- බාහිරතා නිසා පෞද්ගලික පිරිවැය හා සමාජ පිරිවැය අතරත් පෞද්ගලික ප්‍රතිලාභ හා සමාජ ප්‍රතිලාභ අතරත් වෙනසක් ඇති වෙයි.
- පෞද්ගලික පිරිවැය නිෂ්පාදකයා ඍජුව ම සම්බන්ධ වීමෙන් දරන අතර පෞද්ගලික ප්‍රතිලාභ ඍජුව ම සම්බන්ධ වන පාර්ශ්ව වෙත හිමි වේ.
- බාහිර පිරිවැය යනු කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් හෝ නිසා බාහිර පාර්ශ්වයන්ට දැරීමට සිදු වන පිරිවැය වන අතර එම පිරිවැය අදාළ නිෂ්පාදන කටයුත්තට සම්බන්ධ නැති බාහිර කණ්ඩායම් විසින් මෙම පිරිවැය දරනු ලැබේ.
- බාහිර ප්‍රතිලාභ යනු කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් හෝ පරිභෝජන ක්‍රියාවලියක් නිසා බාහිර පාර්ශ්වයන්ට ලැබෙන ප්‍රතිලාභයක් වන අතර ඒ වෙනුවෙන් ගෙවීමක් සිදු නොකරයි.
- කිසියම් නිෂ්පාදන කටයුත්තක් හෝ පරිභෝජන කටයුත්තක් හෝ නිසා සමස්ත සමාජය විසින් දරන පිරිවැය සමාජ පිරිවැය ලෙස හඳුන්වයි. පෞද්ගලික පිරිවැයට බාහිර පිරිවැය ගැළපීමෙන් සමාජ පිරිවැය තීරණය වේ.


| |
|---|
| සමාජ පිරිවැය = පෞද්ගලික පිරිවැය + බාහිර පිරිවැය |

- පෞද්ගලික ප්‍රතිලාභවලට බාහිර ප්‍රතිලාභ ගැළපීමෙන් සමාජ ප්‍රතිලාභ තීරණය වේ.

| |
|---|
| සමාජ ප්‍රතිලාභ = පෞද්ගලික ප්‍රතිලාභ + බාහිර ප්‍රතිලාභ |

- ආර්ථිකයේ සමාජ පිරිවැය හා පෞද්ගලික පිරිවැය අතර වෙනසක් පවතී නම් හෝ සමාජ ප්‍රතිලාභ හා පෞද්ගලික ප්‍රතිලාභ අතර වෙනසක් පවතී නම් හෝ මිල යාන්ත්‍රණය මගින් සමාජයේ ප්‍රශස්ත ලෙස සම්පත් බෙදාහැරීමක් සිදු නොවේ.
- පූර්ණ තරගකාරී වෙළෙඳපොළක සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉටු වන්නේ මිල, ආන්තික පිරිවැයට සමාන වන (MC = P) අවස්ථාවල දී ය. (MC=P). එසේ නොවන අවස්ථාවල සමාජයේ ප්‍රශස්ත මට්ටමෙන් සම්පත් බෙදීයාමක් සිදු නොවේ.
- බාහිරතා ධනාත්මක හෝ ඍණාත්මක හෝ කවර ස්වරූපයක් ගනු ලැබුව ද ඒවායේ ප්‍රතිඵලය වන්නේ සමාජ පිරිවැය හා පෞද්ගලික පිරිවැය අතර නොගැළපීමක් ඇති කිරීම හෝ සමාජ ප්‍රතිලාභ හෝ පෞද්ගලික ප්‍රතිලාභ අතර නොගැළපීමක් ඇති කිරීම යි.

- නිෂ්පාදනයේ සෘණ බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.





- ප්‍රස්තාර සටහනේ MPC වක්‍රය ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රය වන අතර MSC වක්‍රය ආන්තික සමාජ පිරිවැය වක්‍රය වේ. භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම MPB වක්‍රයෙන් පෙන්නුම් කෙරේ. වෙළෙඳපොළ ක්‍රමයක ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රය (MSB) හා ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වක්‍රය එක සමාන වේ.


- සමාජය සතු සම්පත් ප්‍රශස්ත ලෙස බෙදා වෙන් කරනුයේ ආන්තික සමාජ පිරිවැය ආන්තික සමාජ ප්‍රතිලාභවලට සමාන ($E_1$) වන ලෙස නිෂ්පාදනය සිදු වේ නම් ය.

- පෞද්ගලික නිෂ්පාදනයේ සෘණ බාහිරතා ඇති වන විට ආන්තික සමාජ පිරිවැය ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යනු ඇත. ප්‍රස්තාර සටහනේ ආන්තික සමාජ පිරිවැය (MCS) වක්‍රය ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රයට (MPC) ඉහළින් පෙන්නුම් කෙරේ. ප්‍රස්තාර සටහනේ පෞද්ගලික නිමැවුම් මට්ටම (වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම) (Qp) සමාජීය ප්‍රශස්ත නිමැවුම් මට්ටම (Qs) ඉක්මවා පවතී (අධිනිෂ්පාදනයක් ඇති වේ).

- නිෂ්පාදනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත දක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.





- නිෂ්පාදන ධන බාහිරතාවක දී පෞද්ගලික නිමැවුම් මට්ටම සමාජීය ප්‍රශස්ත නිමැවුම් මට්ටමට වඩා අඩු වේ (ඌන නිෂ්පාදනයක් පවතී).
- ඉල්ලුම් වක්‍රය මගින් (MPB) පෙන්නුම් කරන්නේ පාරිභෝගිකයන් තම පෞද්ගලික ප්‍රතිලාභ මත ඉල්ලුම තීරණය ගන්නා ආකාරය යි.
- ආන්තික පෞද්ගලික පිරිවැය වක්‍රය ආන්තික සමාජ පිරිවැය වක්‍රය ඉක්මවා පවතී. ප්‍රශස්ත නිමැවුම් මට්ටම තීරණය වන්නේ ආන්තික සමාජ පිරිවැය වක්‍රය ආන්තික සමාජ ප්‍රතිලාභ වක්‍රය ඡේදනය වන ලක්ෂ්‍ය පෙන්නුම් කරන $Q_S$ ලක්ෂ්‍යයේ දී ය.
- පරිභෝජනයේ ඍණ බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.



- ඉහත දැක්වෙන ප්‍රස්තාර සටහනින් ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ MPB වක්‍රය මගින් පෙන්නුම් කරන අතර ආන්තික සමාජ ප්‍රතිලාභය MSB වක්‍රය මගින් පෙන්නුම් කරයි. සැපයුම් වක්‍රය මගින් පෙන්නුම් කරනුයේ පෞද්ගලික ආන්තික පිරිවැය වක්‍රය යි.

- ඉහත භාණ්ඩය පරිභෝජනය කරන පාරිභෝගිකයා එමගින් පෞද්ගලික ප්‍රතිලාභ හා පෞද්ගලික පිරිවැය පමණක් සැලකිල්ලට ගන්නා අතර ඔවුන්ගේ පරිභෝජන මට්ටම $Q_P$ මගින් පෙන්නුම් කෙරේ. එහෙත් සමාජ ප්‍රශස්ත මට්ටම වන්නේ $Q_S$ ප්‍රමාණය වේ. මිල යාන්ත්‍රණය මගින් සමාජ ප්‍රශස්ත පරිභෝජන මට්ටම පෙන්නුම් නොකරන නිසා අධි පරිභෝජනයක් ඇති වේ. එමගින් සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවක් පෙන්නුම් කෙරේ.

- පරිභෝජනයේ ධන බාහිරතාවක දී වෙළෙඳපොළ අසමත් වීම සිදු වන ආකාරය පහත දැක්වෙන රූප සටහන ඇසුරෙන් පැහැදිලි කළ හැකි ය.




- පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට සමාජ ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ ඉක්මවා යනු ඇත. එහි දී වෙළෙඳපොළ සමතුලිත නිමැවුම් මට්ටම සමාජීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම් මට්ටමට වඩා අඩු ප්‍රමාණයක් වේ.

- බාහිරතා නිසා ඇති වන වෙළෙඳපොළ බිඳවැටීම් මඟහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක් වේ.
  - පාරිසරික බදු පැනවීම
  - බලපත්‍ර නිකුත් කිරීම
  - ධන බාහිරතා සඳහා සහනාධාර ලබා දීම
  - පෞද්ගලික කේවල් කිරීම
  - රජය මගින් දඩ නියම කිරීම

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.3 : වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්ය භාරය විමර්ශනය කරයි.**

**කාලච්ඡේද ගණන : 08**

**ඉගෙනුම් පල :**

- වෙළෙඳපොළ ආර්ථිකය රජයේ කාර්යභාරය හඳුන්වයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය නිදසුන් සපයමින් පැහැදිලි කරයි.
- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය ඉටු කිරීමට යාමේ දී ආණ්ඩුව අසාර්ථක වන ආකාරය විස්තර කරයි.
- ආණ්ඩුව අසාර්ථක වීමට හේතු ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ කාර්යභාරය පහත පරිදි දැක්විය හැකි වේ.
    - සම්පත් කාර්යක්ෂම ව බෙදා හැරීම
    - ආදායම් හා ධනය සාධාරණ ව බෙදා හැරීම
    - සාර්ව ආර්ථික ස්ථායිතාව ඇති කිරීම
    - තිරසර සංවර්ධනය
- වෙළෙඳපොළ ආර්ථිකයක දක්නට ලැබෙන සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවන් ඉවත් කිරීම සඳහා රජය පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි.
    - පොදු භාණ්ඩවලින් මිලක් අය කර ගත නොහැකි නිසාත් ලාභයක් ලැබිය නොහැකි නිසාත් වෙළෙඳපොළ ක්‍රමයෙන් පොදු භාණ්ඩ නොසපයයි. එහෙත් රජය මැදිහත් වී පොදු භාණ්ඩ සපයයි.
    - වෙළෙඳපොළ ක්‍රමයේ දී අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම නිසා රජය විසින් අර්ධ පොදු භාණ්ඩ සැපයීම
    - ශුභසාධන භාණ්ඩ ප්‍රශස්ත ව සැපයීම සිදු නොවන නිසා ඌන පරිභෝජනයක් සිදු වේ. මේ නිසා ශුභසාධන භාණ්ඩ පරිභෝජනයට පෙලඹවීමට රජය මැදිහත් වේ.
    - වෙළෙඳපොළ ක්‍රමයක් සමාජයට අහිතකර භාණ්ඩ අවගුණ භාණ්ඩ සමාජයට ප්‍රශස්ත මට්ටමට වඩා වැඩියෙන් නිපදවයි. ඒවා සීමා කිරීමට රජයට සිදු වේ.

      නිදසුන් : මත්ද්‍රව්‍ය

- සාධාරණය ස්ථාපිත කිරීම සඳහා රජයක් මගින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලබයි.
    - ආදායම් හා ධන ප්‍රතිව්‍යාප්තිය ඇති කිරීම
    - ධන සමුච්චනය පිළිබඳ සීමා පැනවීම
    - ඉඩම් ප්‍රතිසංස්කරණය
- සාර්ව ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට උද්ධමනය හා සේවා වියුක්තිය ඉවත් කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගනු ලබයි.
- ආර්ථික, සමාජීය හා පාරිසරික යන අංශවල තුලනාත්මක ව වැඩි දියුණු කිරීම, එනම් තිරසර සංවර්ධනය සඳහා වූ වෙළෙඳපොළ ක්‍රමයක් කටයුතු නොකරන අතර රජය ඒ සඳහා මැදිහත් වේ.
- නීති පද්ධතිය, උසාවි, නියාමන ආයතන ආදිය, ළමා රැකවරණය, වැඩිහිටි රැකවරණය වැනි කටයුතු සඳහා වෙළෙඳපොළ ක්‍රමයක අවධානය යොමු නොවන හෙයින් රජයට ඒ සඳහා මැදිහත් වීමට සිදු වේ.
- වෙළෙඳපොළ අසාර්ථක වීම් මැඩ පවත්වා ගැනීම සඳහා රජය මැදිහත් වී විශාල කාර්යභාරයක් ඉටු කළ ද ආණ්ඩුවේ අසමත් වීම සිදු විය හැකි ය.
- ආණ්ඩුවේ අසමත් වීම් යනු වෙළෙඳපොළ අසාර්ථක වීම් මැඩ පවත්වා ගැනීම සඳහා රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට ආවේණික වූ ඇතැම් දුර්වලතා කරණ කොට ගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ තව තවත් අකාර්යක්ෂමතා බිහි කිරීම යි.
    - ආණ්ඩුවේ අසමත් වීම් කෙරෙහි බලපා ඇති හේතු කිහිපයක් පහත දැක්වේ.

        (i) ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයේ දක්නට ලැබෙන දෘඪතාවන්

        ආණ්ඩුවේ මැදිහත්වීම්වල දක්නට ලැබෙන එක් අහිතකර පැතිකඩක් වන්නේ නිරන්තර වෙනස් වන පරිසරයට අනුකූල වන ලෙස අදාළ වෙනස්කම් ඇති කර ගැනීමේ ලා ආණ්ඩුවේ ප්‍රතිපත්ති අතිශයින් මන්දගාමී වීම ය.

        (ii) දේශපාලන ස්වාර්ථය

        දේශපාලකයන් සහ රාජ්‍ය නිලධාරින් ස්වාර්ථය අරමුණු කොට ක්‍රියා කිරීමෙන් සම්පත් නාස්තියක් සිදු වීම

        නිදසුන් : මහා මාර්ග, රෝහල්, පාසල් ඉදි කිරීමේ දි දේශපාලන අවශ්‍යතා පදනම් කර ගැනීම

(iii) ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදුර දෘෂ්ටිකත්වය

බොහෝ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ දී කෙටි කාලීන දෘෂ්ටි කෝණයකින් බලා තීරණ කරා එළඹීම. එම නිසා දිගු කාලීන සමාජ ප්‍රගමනයන්ට අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක නොවේ.

(iv) අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම

අපූර්ණ තොරතුරු නිසා ආණ්ඩුවේ ප්‍රතිපත්ති අකාර්යක්ෂම වීම

(v) සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම

ආදායම් හා ධන ව්‍යාප්තියේ සාධාරණත්වය ඇති කිරීම සඳහා ආණ්ඩුව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග සානුබල හා ඵලදායිතාව කෙරෙහි අහිතකර ප්‍රතිඵල ඇති කරයි.

(vi) ආණ්ඩුවේ මැදිහත්වීම්වලින් වැළකී සිටීමට කටයුතු කිරීම

ආණ්ඩුවේ විවිධ නීතිරීති හා නියාමනයන්ගෙන් වැළකී සිටීමට පුද්ගලයන් හා ආයතන කටයුතු කිරීම නිසා සැඟැවුණු ආර්ථිකයක් බිහි වීමට ඉඩකඩ පැවතීම

(vii) පරිපාලන වියදම් ඉහළ යාම

ආර්ථිකය තුළ ආණ්ඩුවේ මැදිහත් වීම් අතිශයින් පිරිවැය අධික ක්‍රියාවක් විය හැකි ය. අදාළ නීතිරීතිවලින් නියාමනයක් ක්‍රියාවට නැඟීමේ දී ඒවායින් අපේක්ෂිත සමාජ ප්‍රතිලාභ එතරම් විශාල නොවීම නිසා අකාර්යක්ෂමතා පැන නැගිය හැකි ය.

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.4 : බදු මූලධර්ම හා බදු වර්ගීකරණය පිළිබඳ ව විමර්ශනය කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන :** 10

**ඉගෙනුම් පල :**

- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අර්ථ දක්වයි.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණු පැහැදිලි කරයි.
- රාජ්‍ය මූල්‍ය උපකරණ නම් කරයි.
- රාජ්‍ය අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර නම් කරයි.
- බදු අය කිරීමේ අරමුණු පැහැදිලි කරයි.
- බදු මූලධර්ම විස්තර කරයි.
- විවිධ නිර්ණායක මත බදු වර්ගීකණය කරයි.
- බදු එකතු කිරීම හා බදු අපාතය යන සංකල්ප පැහැදිලි කරයි.
- බදු අය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක සොයා බලයි.
- බදු නොවන අයභාරයට අයත් සංරචක පෙන්වා දෙයි.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරයේ මෑත කාලීන උපනති පරීක්ෂා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ආණ්ඩුවේ වියදම්, බදු අය කිරීම් සහ ණය ගැනීම් සඳහා වන අදාළ වෙනස්කම් සිදු කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නම් වේ.
- රාජ්‍ය බදු, රාජ්‍ය වියදම් සහ රාජ්‍ය ණය ප්‍රදාන රාජ්‍ය මූල්‍ය උපකරණ ය.
- රාජ්‍ය අයභාරය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකක් පවතින බව. එනම්,
  - බදු ආදායම
  - බදු නොවන ආදායම
- බදු අය කිරීමේ අරමුණු පහත දැක්වෙන ආකාරයට පැහැදිලි කරයි.
  - ආදායම හා ධනය බෙදියාමේ විෂමතා අවම කිරීම
  - කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් කළමනාකරණය කිරීම
  - ඉහළ සමාජ පිරිවැයක් දරන අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යවත් කිරීම
  - සමාහාර ඉල්ලුම කෙරෙහි බලපෑම
  - සමාහාර සැපයුම කෙරෙහි බලපෑම

- බදු අය කිරීමේ මූලධර්ම පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
    - සාධාරණත්වය
    - පිරිමැසුම් සහිත වීම
    - පහසුව
    - නිශ්චිත වීම
    - කාර්යක්ෂමතාව
    - නම්‍යශීලී වීම
    - අනුකූල බව
- බදු අය කිරීමේ සාධාරණත්වය සහ මූලධර්මය සඳහා කොන්දේසි දෙකක් ඉටු විය යුතු වේ. එනම්,
    - තිරස් සාධාරණත්වය
    - සිරස් සාධාරණත්වය
- තිරස් සාධාරණත්වය යනුවෙන් අදහස් කරනුයේ සමාන ආර්ථික හැකියාවන් ඇති පුද්ගලයන්ට සමාන ලෙස සැලැකීමේ අවශ්‍යතාව යි. එනම් එක සමාන ආදායම් ඇති පුද්ගලයන් එක සමාන බදු බරක් දැරිය යුතු වේ යන්නයි.
- සිරස් සාධාරණත්වය යනු අසමාන ආර්ථික තත්ත්වයන්හි සිටින පුද්ගලයන් කෙරෙහි අසමාන ලෙස සැලකීමේ අවශ්‍යතාව යි. එනම් ආදායම වැඩි වන විට වැඩි බදු බරක් දැරිය යුතු වේ යන්නයි.
- සාධාරණ බදු ක්‍රමයක් සඳහා ආර්ථික න්‍යාය තුළ ප්‍රකාශ වී ඇති ප්‍රධාන මූලධර්ම දෙකකි. එනම්,
    - ප්‍රතිලාභ මූලධර්මය
    - ගෙවීමට ඇති හැකියාව පිළිබඳ මූලධර්මය
- ප්‍රතිලාභ මූලධර්මයෙන් අදහස් කරනු ලබන්නේ ආණ්ඩුව මගින් සපයනු ලබන සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලබා ගන්නා ප්‍රමාණය මත ආණ්ඩුවට බදු ගෙවිය යුතුය යන්න යි.
- ගෙවීමේ හැකියාව යන මූලධර්මයෙන් කියවෙන්නේ විවිධ පුද්ගලයන්ගේ බදු ගෙවීමේ ශක්තිය අනුව බදු අය කිරීම කළ යුතු බව යි.
- පිරිමැසුම් සහිත බව යන මූලධර්මයෙන් අදහස් වන්නේ අය බදු ගෙවීමේ දී බදු ගෙවන අයටත් එකතු කිරීමේ දී ආණ්ඩුවටත් දැරීමට සිදු වන වියදම හැකි තාක් දුරට අඩු විය යුතු බව යි. එය වියදම් පරිපාලනය හා අනුකූලතා යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
- පරිපාලන වියදම් යනු ආණ්ඩුවට බදු අය කිරීමේ දී දැරීමට සිදු වන වියදම් වේ.

- අනුකූලතා වියදම් යනු බදු ගෙවන්නන්ට දැරීමට සිදු වන පිරිවැය යි.

- මෙහි දී රජය බලාපොරොත්තු වන්නේ බදු එකතු කර ගැනීමට වැය කරනු ලබන වියදමට වඩා රජයට ලැබෙන බදු ආදායම වැඩි විය යුතු බව යි. එසේ නොවන විට රජයට ආදායමක් ඉපයිය නොහැකි වේ.

- පහසු බව යන මූලධර්මයෙන් අදහස් වන්නේ බදු ක්‍රමය හැකි තාක් දුරට සරල විය යුතු බව යි. බද්දක් නියමිත පරිදි ගෙවනු ලබන්නේ ද එසේ නැතහොත් බොහෝ අය එයින් වැළකී සිටීමට උත්සාහ කරන්නේ ද? යන්න බද්දක සරල බව විදහාපාන ලක්ෂණයක් වේ.

- බදු වර්ග නියම කරනු ලැබූ විට ඒවා හදිසියේ වෙනස් නොකළ යුතු බව නිශ්චිත භාවය යන මූලධර්මයෙන් හැඳින්වේ. එනම් බදු ගෙවන්නන්ට අනාගතය සඳහා දැරීමට සිදු වන බදු බර කල් තියා අපේක්ෂා කළ හැකි විය යුතු ය. ආයෝජන කාර්යයේ දී අනාගතයේ දී ගෙවීමට සිදු වන බදු නියත වශයෙන් ම දැන ගැනීමට හැකි විය යුතු ය.

- බදු අය කළ යුත්තේ ආර්ථිකයේ සම්පත් කාර්යක්ෂම ව බෙදී යාමේ ක්‍රියාවලියට බලපෑමක් ඇති නොවන අයුරින් ය. අතිරික්ත බදු බරක් ඇති වන ලෙස බදු අය නොකළ යුතු බවත් සිදු වන විකෘති වීම් අවම විය යුතු බව කාර්යක්ෂම බවේ මූලධර්මයෙන් කියවේ.

- ආර්ථික ක්‍රියාවලියේ සිදු වන කාලීන වෙනස් වීම් අනුව බදු ගැලපුම් කිරීමට හැකි වීම නම්‍යශීලී බව පිළිබඳ බදු මූලධර්මයෙන් පැහැදිලි කෙරේ.

- බදු නීති සම්බන්ධ වූ ගොනු කිරීමේ අනුකූලතාව ගෙවීමේ අනුකූලතාව හා වාර්තා කිරීමේ අනුකූලතාව යන කටයුතු සඳහා බදු ගෙවන්නා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වීම අනුකූල බව යන බදු මූලධර්මයෙන් අදහස් වේ.

- විතැන් කිරීමේ හැකියාව මත බදු ප්‍රධාන වර්ග දෙකකි.
  (i) ඍජු බදු
  (ii) වක්‍ර බදු

- ඍජු බද්දට හසුවන පුද්ගලයා හෝ ආයතන විසින් ම හෝ අදාළ බද්ධ ගෙවීමට සිදු වන අතර එය වෙනත් පාර්ශ්වයකට විතැන් කළ නොහැකි වේ. මෙහි දී බද්දට යටත් වූ පාර්ශ්වයන් විසින් ම බදු බර දැරිය යුතු වේ.

  නිදසුන් : අදායම් බදු, දේපොළ බදු

- යම් බද්දක් ගෙවීමට නෛතික ව නියම වූ පුද්ගලයා විසින් එකී බදු බර වෙනත් අයකු මත විතැන් කරනු ලැබේ නම් එය වක්‍ර බද්දක් ලෙස හැඳින්වේ.

- මෙහි දී නෛතික වශයෙන් බද්ද ගෙවනු ලබන පුද්ගලයාත් සැබෑ වශයෙන් බදු බර දරන පුද්ගලයාත් අතර පැහැදිලි වෙනසක් ඇත.

  නිදසුන් : විකුණුම් බදු, දේශීය භාණ්ඩ බදු, රේගු ගාස්තු, වැට් බදු

- බද්දට විෂය වන මූලාශ්‍රය බදු පදනම ලෙස හැඳින්වේ. බදු පදනම මත බදු වර්ග කෙරේ.

    - ආදායම් බදු
    - පරිභෝජන බදු
    - ධන බදු (දේපොළ බදු)
    - ව්‍යාපාර හිමි බදු
    - විදේශීය වෙළෙඳාම් බදු (ආනයන සහ අපනයන තීරු බදු)

- යම් බද්දක් ගෙවීමට නෛතික ව නියම කරන පුද්ගලයකුට එම බද්ද වෙනත් අයෙකු මත පවරනු ලබයි නම් එය බදු බර විතැන් කිරීම යනුවෙන් අදහස් වේ.

- පුද්ගලයකු විසින් එදිනෙදා කරනු ලබන වියදම් තුළ වක්‍ර බදු ඇතුළත් වේ. නෛතික වශයෙන් බද්ද ගෙවනු ලබන පුද්ගලයා හෝ ආයතනය හෝ විසින් තම නිෂ්පාදන හා සේවා මිල දී ගන්නා අය මතට බදු ප්‍රමාණය විතැන් කරනු ලැබේ.

- භාණ්ඩ හා සේවා පරිභෝජනය කරනු ලබන පුද්ගලයෝ අවසාන වශයෙන් ආණ්ඩුවට බදු ගෙවනු ලබති.

- බදු ආපාතය යනු බද්දක් පැනවූ විට අවසාන වශයෙන් බදු බර දරන්නේ කවුරුන් විසින් ද යන්න නිශ්චිත ව හඳුනා ගැනීමයි. නැතහොත් බද්දක් පැන වූ විට එහි බදු බර ආර්ථිකයේ කවර ඒකක මත කෙසේ බලපාන්නේ දැයි සොයා බැලීම යි. මේ අනුව බදු ආපාතයේ ස්වරූප දෙකක් ඇත.

    (i) ව්‍යවස්ථාපිත හෙවත් නෛතික බදු ආපාතය

    (ii) ආර්ථික බදු ආපාතය හෙවත් සැබෑ බදු ආපාතය

- ව්‍යවස්ථාපිත බදු ආපාතය යනු නෛතික වශයෙන් බද්ද කවුරුන් වෙත යොමු කරනවා ද යන්නයි. ආර්ථික බදු ආපාතය යනු සැබෑ වශයෙන් දරනු ලබන බදු බරයි.

    බදු අය කිරීමේ අනුපාතික ව්‍යුහය අනුව ආකාර තුනකට බදු වර්ග කළ හැකි ය.

    1. අනුක්‍රමික බදු
    2. සමානුපාතික බදු
    3. ප්‍රතික්‍රමික බදු

- බදු පදනමේ ප්‍රමාණය විශාල වීමත් සමඟ ක්‍රමයෙන් වැඩි වී යන අනුපාතිකයන්ගෙන් බද්ද අය කිරීම අනුක්‍රමික බදු ක්‍රමයක් ලෙස හඳුන්වනු ලැබේ.

නිදසුන් ፡ ආදායම් බදු

මෙහි දී ආදායම් මට්ටම ඉහළ යත් ම ක්‍රමයෙන් වැඩි වන ප්‍රතිශතයක් බදු වශයෙන් අය කෙරේ.

නිදසුන ፡

| ආදායම් මට්ටම් | බදු අනුපාතිකය |
|---|---|
| රුපියල් 300 000 දක්වා | බදු අය නොකෙරේ |
| 300 000 - 600 000 | 5% |
| 600 000 - 800 000 | 10% |
| 800 000 - 1 000 000 | 15% |
| 1 000 000 - 1 200 000 | 20% |

- බදු පදනම ඉහළ යත් ම ආන්තික බදු අනුපාතිකයත්, සාමාන්‍ය බදු අනුපාතිකයත් දෙක ම ඉහළ නගී.
- බද්දට යටත් වන ආදායම කොපමණ වුව ද සැම මට්ටමේදී ම එක හා සමාන බද්දක් අය කිරීම සමානුපාතික බදු නමින් හැඳින්වේ. ඒ අනුව ආන්තික බදු අනුපාතිකය සාමාන්‍ය බදු අනුපාතිකයට සමාන වේ.


  නිදසුන් ፡ වැට් බදු

  සැම ආදායම් මට්ටමකදී ම 20% බදු අනුපාතිකයන් නියම කරයි.
- බදු පදනමේ ප්‍රමාණය විශාල වීමත් සමග අඩු වී යන අනුපාතිකය බදු අය කිරීමේ ප්‍රතික්‍රම බදු නම් වේ.
- මෙහි දී බදු පදනමේ අගය වැඩි වීමත් සාමාන්‍ය බදු අනුපාතිකය හා ආන්තික ආනුපාතිකය යන දෙක ම පහළ වැටේ.


  නිදසුන් ፡ විකුණුම් බදු
- බදු පදනම වෙනස් වන විට බදු අනුපාතිකය වෙනස් වන ආකාරය පහත පරිදි සංඛ්‍යා නිදසුනක් ඇසුරෙන් පෙන්විය හැකි ය.

| ආදායම් මට්ටම | සමානුපාතික බද්ද | | ප්‍රතික්‍රම බද්ද | | අනුක්‍රම බද්ද | |
|---|---|---|---|---|---|---|
| | බදු මුදල රු. | ආදායමෙන් ප්‍රතිශතය | බදු මුදල රු. | ආදායමෙන් ප්‍රතිශතය | බදු මුදල රු. | ආදායමෙන් ප්‍රතිශතය |
| 50 000 | 12 500 | 25% | 15 000 | 30% | 10 000 | 20% |
| 100 000 | 25 000 | 25% | 25 000 | 25% | 30 000 | 30% |
| 200 000 | 50 000 | 25% | 40 000 | 20% | 80 000 | 40% |


- බදු පදනම හා බදු මුදල් අතර සම්බන්ධතාව පහත පරිදි රූප සටහන් ඇසුරෙන් පෙන්විය හැකි ය.




(i) සමානුපාතික බදු




(ii) අනුක්‍රම බදු




(iii) ප්‍රතික්‍රම බදු

- ආණ්ඩුව විසින් සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය ආදායම් උපයන මාධ්‍යයක් වශයෙන් බදු අය කළ ද එහි බොහෝ ආර්ථික ප්‍රතිවිපාක දක්නට ඇත. ඒවා විවිධ පාර්ශ්වවලට බලපාන්නේ මෙසේ ය.

- **ආයෝජනය කෙරෙහි බලපෑම**

- රජය ආයෝජකයන්ගෙන් බදු අය කරන විට ආයෝජකයන්ගේ පිරිවැය වැඩි වී ලාභය අඩු වීමෙන් ආයෝජනය අධෛර්යයට පත් විය හැකි ය. නමුත් ආයෝජකයන් සඳහා බදු සහන, බදු විරාම, ලබා දෙන විට ආයෝජනය දිරිගැන්වීම සිදු වේ. එමෙන් ම ආනයන භාණ්ඩ සඳහා අය කරන තීරු බදු පැන වීමෙන්, වැඩි කිරීමෙන් දේශීය ආයෝජකයන් දිරිමත් වේ.

•

- **නිෂ්පාදනය කෙරෙහි බලපෑම**

  ආණ්ඩුව නිෂ්පාදකයන්ගෙන් බදු අය කළ විට නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන පිරිවැය වැඩි වී ලාභය අඩු වේ.

- **පරිභෝජනය කෙරෙහි බලපෑම**

  රටක බදු ක්‍රමය එරටේ පරිභෝජන මට්ටම කෙරෙහි විවිධාකාරයෙන් බලපෑම් කරයි. රජය විසින් වක්‍ර බදු එනම් භාණ්ඩ මත පනවන බදු අය කරන විට භාණ්ඩ මිල ඉහළ ගොස් පරිභෝජන මට්ටම අඩු විය හැකි ය. ආදායම් මත සෘජු බදු අය කළ විට වැය කළ හැකි ආදායමට බලපෑමක් ඇති වන නිසා පරිභෝජනය අඩු විය හැකි ය.

- **මිල මට්ටම කෙරෙහි බලපෑම**

  ආණ්ඩුව භාණ්ඩ මත බදු අය කළ විට එරටේ භාණ්ඩවල මිල ඉහළ යාම නිසා මිල මට්ටම වැඩි වීමක් සිදු වේ. මෙලෙස මිල මට්ටම වැඩි වීම නිසා රටේ ජීවන වියදම ඉහළ ගොස් උද්ධමනය ඇති වේ.

- **විදේශ වෙළෙඳාම කෙරෙහි බලපෑම**

  තීරු බදු පැනවීම තුළින් විදේශ වෙළෙඳාමට සෘජු බලපෑමක් ඇති කරයි. තීරු බදු ප්‍රතිශත අඩු කරන විට ආනයන හා අපනයන දිරිමත් වන අතර තීරු බදු වැඩි කරන විට ආනයන හා අපනයන අධෛර්යවත් වේ.

- **ආදායම් ව්‍යාප්තිය කෙරෙහි බලපෑම**

  රටක ධනවත් අයගෙන් බදු අය කර අඩු ආදායම් ලබන අයට සහනාධාර ප්‍රදානය කිරීමෙන් එරටේ ආදායම් ව්‍යාප්ති විෂමතා අඩු වේ. මෙහි දී අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා අඩු බද්දකුත් සුඛෝපභෝගී භාණ්ඩ සඳහා වැඩි බද්දකුත් අය කිරීම් තුළින් ආදායමේ ව්‍යාප්ති විෂමතාව අඩු කළ හැකි ය.

- **ඉතිරි කිරීම් කෙරෙහි බලපෑම**

  භාණ්ඩ මත බදු අය කරන විට ජීවන වියදම ඉහළ යන අතර වැය කළ හැකි ආදායම අඩු වන නිසා ඉතිරි කිරීම් අධෛර්යයට පත් වේ.

- රජය සතු දේපොළවලින් උපයා ගනු ලබන ආදායම් හා ගාස්තු අය කිරීම් බදු නොවන ආදායම් වේ. මේවාට අයත් සංරචක පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

  - බදු කුලී ආදායම : රජයේ නිවාස ආණ්ඩුවේ සේවකයන්හට කුලියට දීම හා රජයේ සංචාරක බංගලා කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායම මෙයට ඇතුළත් කරයි.

  - පොළී ආදායම් : ආණ්ඩුවේ සේවකයන්ට විවිධ ව්‍යාවස්ථාපිත මණ්ඩල වෙත සපයනු ලබන ණය සඳහා අයකරන පොළී මීට අදාළ වේ.

- ලාභ, ලාභාංශ ආදායම් : ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභාංශ, දුම්රිය, තැපැල් සේවාව උපයන ආදායම් සහ වරාය, රාජ්‍ය වාණිජ බැංකු, විදුලි බල මණ්ඩලය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආදියෙන් ලැබෙන ආදායම මෙයට ඇතුළත් වේ.
- කුලී ආදායම් : රජයේ වනාන්තර කුලියට දීම
- සමාජ රක්ෂණ දායක මුදල්
- දඩ අය කිරීම් සඳහා නිදසුන් ලෙස උසාවි දඩ ගැසීම්, රාජ සන්තක කිරීම් ආදිය ඇතුළත් වේ.
- ගාස්තු හා අලෙවි ආදායම් යටතට පහත සඳහන් ද ඇතුළත් වේ.
  - ගුවන් ගමන් සේවා හා ගුවන් තොටුපොළ සංවර්ධන සමාගම් හරහා කරනු ලබන ගුවන් ගත වන්නන් සඳහා අය කරන ගාස්තු
  - ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වීසා ගාස්තු
  - ගමන් බලපත්‍ර ගාස්තු
  - මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු
  - රජය පාවිච්චි කළ භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම
  - ලොතරැයි ආදායම්

  ( ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ කාලීන උපනතී මහ බැංකු වාර්තාව ඇසුරෙන් පැහැදිලි කරන්න).

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.5 : රාජ්‍ය වියදමේ සංයුතිය හා කාලීන උපනති විග්‍රහ කරයි.**

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- රාජ්‍ය වියදම් හට ගැනීමේ හේතු පැහැදිලි කරයි.
- රාජ්‍ය වියදම ආර්ථික පදනම මත වර්ගීකරණය කරයි.
- ආර්ථික වර්ගීකරණයෙහි ඒ ඒ සංරචක පැහැදිලි කරයි.
- රාජ්‍ය වියදමේ සංයුතිය හා එහි උපනති පරීක්ෂා කරයි.
- රාජ්‍ය වියදම්වල ප්‍රතිවිපාක විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා රජය විසින් කරනු ලබන වියදම් රාජ්‍ය වියදම් වේ.
- රාජ්‍ය වියදම් හට ගැනීමට හේතු පහත දැක්වේ.
    - හිඟ සම්පත් බෙදා වෙන් කිරීම කාර්යක්ෂම කිරීම
    - ආදායම් විෂමතාව අවම කිරීම (සාධාරණත්වය ඇති කිරීම)
    - නීතිය හා සාමය ආරක්ෂා කිරීම
    - සමාජයේ යහපතට හේතු වන පෞද්ගලික අංශය විසින් සැපයීමට ඉදිරිපත් නොවන පොදු සේවා හා ආයතන පවත්වා ගෙන යාම
    - ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය
- රාජ්‍ය වියදම ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි ය. එනම්,

    1. වර්තන වියදම් (පුනරාවර්තන වියදම්)
    2. ප්‍රාග්ධන වියදම් (ආයෝජන වියදම්)
    3. ශුද්ධ ණය දීම්

- වර්තන වියදම් යනු නැවත නැවත දැරිය යුතු වියදම් වේ. අදාළ වර්ෂය තුළ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා දැරිය යුතු වියදම් හා සංක්‍රාම දීමනා මීට අයත් වේ. වියදම් කරන කාලය තුළ ම ආර්ථිකයට ප්‍රතිඵල ලබා දෙන වියදමකි.

    නිදසුන් : සේවක වැටුප් ගෙවීම්

- ආහාර සහනාධාර
- විශ්‍රාම වැටුප් ගෙවීම්
- ප්‍රවාහණ වියදම්

- ප්‍රාග්ධන වියදම් යනු සාමාන්‍යයෙන් වර්ෂයකට වැඩි කාලයක් පවතින භාණ්ඩ මිල දී ගැනීමටත් ප්‍රාග්ධන සම්පත් බිහි කර ගැනීමටත් ඒවා ප්‍රතිසංස්කරණය කිරීමටත් දරන්නා වූ වියදම් වේ.

  නිදසුන් :


  - යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම
  - ගොඩනැගිලි ඉදිකිරීම
  - රථවාහන මිල දී ගැනීම
  - මහා මාර්ග ඉදිකිරීම

- ශුද්ධ ණය දීම් යනු වර්තන හා ප්‍රාග්ධන වියදම්වලට ඇතුළත් නොවන රජය විසින් දරනු ලබන වියදම් වේ. අත්තිකාරම් ගිණුම් මගින් ලබා දෙන ශුද්ධ ණය දීම්, ණය ආපසු ලැබීම්, රාජ්‍ය ව්‍යවසායයන් සඳහා ණය ලබා දීම් ආදිය මෙයට ඇතුළත් වේ.

- රජයේ වියදම් ඉහත සඳහන් අයුරෙන් පුළුල් ව වර්ගීකරණය කළ ද එක් එක් වියදම් ගණය තුළ ඇතුළත් විවිධ වියදම් සංරචක හඳුනා ගැනීමේ අරමුණෙන් වර්තන හා ප්‍රාග්ධන වියදම් ප්‍රධාන වර්ගීකරණ දෙකක් යටතේ වෙන් කර දැක්විය හැකි ය. එනම්,

  1. ආර්ථික වර්ගීකරණය
  2. කාර්යාත්මක වර්ගීකරණය

- රාජ්‍ය වියදම් පිළිබඳ ආර්ථික වර්ගීකරණය පහත දැක්වේ.



- වර්තන වියදම් යටතේ, භාණ්ඩ හා සේවා සඳහා දරන වියදම් යනු මහජනතාවට ලබා දෙන විවිධ රාජ්‍ය සේවාවන් සම්පාදනය කිරීම හා පවත්වා ගෙන යාම සඳහා දරණ වියදම් වේ. මෙම වියදම්වල ප්‍රතිලාභ වසරකට සීමා වේ.
  නිදසුන් : ජාතික ආරක්ෂාව, පාසල් අධ්‍යාපනය, රෝහල් සෞඛ්‍ය සේවා,
  මගී ප්‍රවාහණ සේවා

- පොළී ගෙවීම් යනු රජය දේශීය හා විදේශීය වශයෙන් ලබා ගත් ණය වෙනුවෙන් ගෙවනු ලබන පොළී වියදම් වේ. තනි අයිතමයන් ලෙස ගත් විට රාජ්‍ය වියදමේ ඇතුළත් විශාලතම වටිනාකමක් (අගයන්) ගන්නේ පොළී ගෙවීම් ය. පොළී ගෙවීම් වැඩි වන විට රාජ්‍ය ඉතුරුම් පහත වැටෙන අතර ආයෝජනය සීමා වී ආර්ථික වර්ධනය ද සීමා වේ. පොළී ගෙවීම් සංක්‍රාම වියදමක් ලෙස සලකා ජාතික ගිණුම්වලට ඇතුළත් නොකෙරේ.

- වර්තන පැවරුම් හා සහනාධාර යනු රජය විසින් විවිධ රාජ්‍ය ආයතනයන්ට සහ කුටුම්බ අංශය වෙත ලබා දෙන සහනාධාරයන් ය.

- රාජ්‍ය ආයතනයන්ට ලබා දෙන සහනාධාර ලෙස හඳුන්වන්නේ අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායකයන් පවත්වා ගෙන යාම සඳහා රජයෙන් ලබා දෙන අරමුදල් ය.

  නිදසුන් : ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව වැනි රාජ්‍ය ව්‍යවසායන්ට ලබා දෙන සහනාධාර

- කුටුම්බ අංශයට ලබා දෙන සහනාධාර සඳහා නිදසුන් පහත දැක්වේ.
  - සමෘද්ධි සහනාධාර
  - විශ්‍රාම වැටුප් (රජයේ විශාලතම සහනාධාර වටිනාකම වේ)
  - ආහාර මුද්දර
  - ආහාර සහනාධාර
  - පාසල් පොත්, නිල ඇඳුම්, වාර ප්‍රවේශ පත්‍ර, දිවා ආහාර
  - ආරක්ෂක අංශවල රණවිරු සොල්දාදුවන් සඳහා ලබා දෙන සහනාධාර
  - පොහොර සහනාධාර
- වර්තන සහනාධාර ඉහළ යාම නිසා ආර්ථිකයේ වෙනත් ප්‍රමුඛතා අංශවලට සම්පත් යෙදවීමට ඇති හැකියාව සීමා කරයි. එමඟින් රාජ්‍ය ඉතුරුම් පහත වැටෙන අතර ආයෝජන සීමා කිරීම් හා අය වැය හිඟය පුළුල් වීම සිදු වේ.

- ආයෝජන (ප්‍රාග්ධන) වියදමේ ඇතුළත් මූර්ත වත්කම් අත්පත් කර ගැනීමේ වියදම යනු මධ්‍යම රජය විසින් සෘජු ව ම ප්‍රාග්ධන සම්පාදනයට ආයෝජනය කරන මුදල් ප්‍රමාණය යි.

  නිදසුන් : අධිවේගී මාර්ග ඉදි කිරීම සඳහා මධ්‍යම රජය විසින් මුදල් වෙන් කිරීම

- විවිධ රාජ්‍ය ආයතනයන්ට, සංස්ථාවන්ට පළාත් පාලන ආයතනවලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා ලබා දෙන නැවත ආපසු ලබා නොගන්නා මුදල් ප්‍රාග්ධන පැවරුම් ලෙස හැඳින්වේ.

  නිදසුන් : පාසල් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා මධ්‍යම රජය විසින් පළාත් සභාවලට මුදල් ලබා දීම

- අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද ප්‍රාග්ධන වියදම් මුළුමනින් ම වැය කිරීමට හැකියාවක් නොමැති යැයි අපේක්ෂා කෙරෙන විට ප්‍රාග්ධන වියදම් ශේෂයන් වියදම් ඇස්තමේන්තුවලට ඇතුළත් කරන අතර එය ඌන වියදම් වශයෙන් හැඳින්වේ.

- ඌන වියදම් මගින් ප්‍රාග්ධන වියදම් අඩු කොට දක්වන අතර, රාජ්‍ය අයභාරයෙන් අපේක්ෂිත වියදම් පියවා ගැනීමට අතිශයින් ම දුෂ්කර වන අවස්ථාවල දී ද අයවැය හිඟය අඩුවෙන් පෙන්නුම් කිරීමේ උපාය මාර්ගයක් වශයෙන් ඌන වියදම් ශේෂ වියදම් ඇස්තමේන්තුවලට ඇතුළත් කෙරේ.

- ආර්ථික වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් සංයුතිය පහත දැක්වේ.

ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම සහ ශුද්ධ ණය දීම්

| ශීර්ෂය | 2014 (රු.මිලියන) | 2015 (රු. මිලියන) | 2016 තාවකාලික (රු. මිලියන) |
|---|---|---|---|
| • පුනරාවර්තන වියදම් | 1,322,898 | 1,701,658 | 1,757,782 |
| • භාණ්ඩ හා සේවා වියදම් | 568,829 | 72,563 | 746,250 |
| • පොළී ගෙවීම් | 436,395 | 509,674 | 610,895 |
| • වර්තන පැවරුම් හා සහනාධාර | 317,674 | 419,420 | 400,637 |
| • ප්‍රාග්ධන වියදම් | 459,855 | 588,175 | 577,036 |
| • මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 252,303 | 313,260 | 328,202 |
| • ප්‍රාග්ධන පැවරුම් | 207,551 | 274,916 | 248,834 |
| • ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 13,112 | 561 | -934 |
| මුළු වියදම් සහ ශුද්ධ ණය දීම් | 1,795,865 | 2,290,394 | 2,333,883 |

- රාජ්‍ය වියදම් උපනති පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
    - කෙටි කාලීන වශයෙන් රාජ්‍ය වියදමේ දැඩි අනම්‍යශීලී බවක් දැකිය හැකි වීම
    - රාජය වියදමෙන් 60% ක පමණ ප්‍රමාණයක් පොළී ගෙවීම්, වැටුප් හා සංක්‍රාම වියදම්වලින් සමන්විත වීම
    - සංක්‍රාම වියදම්වලින් 2/3ක් පමණ විශ්‍රාම වැටුප්වලින් සමන්විත වීම
    - ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදාවෙන් 13%ක් පමණ රාජ්‍ය සේවකයන් වීම නිසා වැටුප් සඳහා දරන වියදම ඉහළ යාම

    (මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න).

- රාජ්‍ය වියදම්වල ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
    - වර්තන වියදම් ඉහළ යාම නිසා රාජ්‍ය ඉතුරුම් පහත වැටීම
    - රාජ්‍ය ආයෝජන සීමා වීම
    - අයවැය හිඟය විශාල වීම නිසා රජයේ ණය ගැනීම් ඉහළ යාම
    - රාජ්‍ය වියදම් පියවීම සඳහා ණය ලබා ගැනීම නිසා පෞද්ගලික අංශයට ලබා දෙන ණය මුදල් ප්‍රමාණය සීමා වීම හා වෙළෙඳපොළ ණය පොළී අනුපාතිකය ඉහළ යාම නිසා පෞද්ගලික අංශයේ ආයෝජන පහත වැටීම
    - ගෙවුම් ශේෂ ගැටලු ඇති වීම

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.6 : රාජ්‍ය අය වැය ලේඛනයක ස්වරූපය හා අය වැය ප්‍රතිපත්ති විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- රාජ්‍ය අය වැය ලේඛනය අර්ථ දක්වයි.
- හිඟ, අතිරික්ත හා තුලිත අය වැය ඉදිරිපත් කරයි.
- රාජ්‍ය අය වැය ලේඛනයක ආකෘතිය ඉදිරිපත් කරයි.
- වර්තන ගිණුමේ අතිරික්තයක වැදගත්කම විස්තර කරයි.
- ප්‍රාථමික ගිණුමේ ශේෂය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා රජයේ ශුද්ධ මුල්‍ය හිඟය හා සමස්ත ශේෂය අතර වෙනස පැහැදිලි කරයි.
- ප්‍රසාරණාත්මක රාජ්‍ය අය වැය ප්‍රතිපත්ති විස්තර කරයි.
- සංකෝචනාත්මක රාජ්‍ය අය වැය ප්‍රතිපත්ති විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ඉදිරි වර්ෂය තුළ රජයේ කටයුතු සඳහා දැරීමට අපේක්ෂිත වියදමත් එකී වියදම් පියවා ගැනීම සඳහා මුදල් සපයා ගන්නා මාර්ගත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගන්නා වාර්තාව රාජ්‍ය අය වැය ලේඛනය වේ.
- එය ආණ්ඩුවේ ඉදිරි මුදල් සැලැස්ම වන අතර ආණ්ඩුවක ඉදිරි දැක්ම හා ක්‍රියාමාර්ග පිළිබිඹු කරන වැදගත් ලියවිල්ලක් ලෙස ද සඳහන් කළ හැකි ය.
- රාජ්‍ය අය වැය ලේඛනය හා සම්බන්ධ ව විසර්ජන කෙටුම්පත නමින් පණතක් පවතී.
- විසර්ජන කෙටුම්පත යනු ඉදිරි වර්ෂය සඳහා දැරීමට අපේක්ෂිත වියදම් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වශයෙන් වෙන් කොට, ලබා ගැනීම අපේක්ෂා කරන අය මාර්ග සඳහන් කොට ආදායම් වියදම් අතර පරතරයක් පවතී නම් එය මූල්‍යනය කරන ආකාරයත් දැක්වෙන කෙටුම්පතකි.
- විසර්ජන පණත සම්මත වූවාට පසුවත් කිසියම් අමාත්‍යාංශයට අලුතින් මුදල් අවශ්‍යතාවක් පැන නැගුණු විට ඒ සඳහා පාර්ලිමේන්තු අනුමතිය ලබා ගැනීමට අදාළ ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තුව නමින් හැඳින්වේ.

- කිසියම් අනපේක්ෂිත සිදුවීමක් නිසා (යුද්ධමය තත්ත්ව, මැතිවරණ වැනි) නියමිත කාලයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගැනීමට අපොහොසත් වන අවස්ථාවක එය සම්මත කර ගන්නා තෙක් ඉදිරි මුදල් වර්ෂය සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් දැරිය යුතු වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීම සඳහා තාවකාලික වශයෙන් ඉදිරිපත් කළ යුතු වැය ලේඛනය අතුරු සම්මත ගිණුම නමින් හැඳින්වේ.
- අතුරු සම්මත ගිණුමෙහි දැක්වෙන්නේ වැය යෝජනා පමණක් හෙයින් එහි අතිරික්තයක් හෝ හිඟයක් හෝ නොමැත.
- එසේ ම අතුරු සම්මත ගිණුම මාස 03ක් හෝ 04ක් වැනි කෙටි කාලයක් සඳහා ඉදිරිපත් වන්නක් වන අතර අලුත් ප්‍රතිපත්ති ව්‍යාපෘති කිසිවක් එහි ඇතුළත් නොවේ.
- අතුරු අය වැයක් යන්න අතුරු සම්මත ගිණුමෙන් වෙනස් වූවකි.
- අතුරු අය වැයක් යනු වැය යෝජනා පමණක් නොව අය යෝජනා ද ඇතුළත් සම්පූර්ණ අය වැය ලේඛනයකි.
- අතුරු අය වැයක් ලෙස හඳුන්වන්නේ, එක් ආණ්ඩුවක් බලයට පත් ව සිටිය දී ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනය සම්මත ව තිබිය දී ඊට පසු ව බලයට පත් වන ආණ්ඩුවක් තමන්ට අවශ්‍ය සංශෝධන ඇතුළත් කොට නැවත ඉදිරිපත් කරන අය වැය ලේඛනයකි.
- රාජ්‍ය අය වැය ලේඛනයක් හා පෞද්ගලික අය වැය ලේඛනයක් අතර වෙනසක් පවතී.
- පෞද්ගලික අය වැය ලේඛනයක දී පළමු ව අය මාර්ග සඳහන් කොට ඒ අනුව වියදම් සැලසුම් කරති.
- එහෙත් රාජ්‍ය අය වැය ලේඛනයක දී පළමු ව දැරීමට අපේක්ෂිත වියදම් ඇස්තමේන්තු කොට පසු ව එම වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය අය මාර්ග තීරණය කරයි.
- රාජ්‍ය අය වැය ලේඛනයකදී ද රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් ගැළපීමෙන් අය වැය ශේෂය ලබා ගන්නා අතර එම අය වැය ශේෂයෙහි ස්වභාවය අනුව ප්‍රධාන අයවැය සංකල්ප තුනක් හඳුනා ගත හැකි ය.

    1. හිඟ අය වැය
    2. අතිරික්ත අය වැය
    3. තුලිත අය වැය

- රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම වැඩි නම් එය හිඟ අය වැයකි.
- රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම අඩු නම් එය අතිරික්ත අය වැයකි.
- රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් සමාන මට්ටමක පවතී නම් එය තුලිත අය වැය තත්ත්වයකි.

- කල්පිත දත්ත ඇතුළත් රාජ්‍ය අයවැය ලේඛනයක ආකෘතියක් පහත දක්වේ.

**රාජ්‍ය අයවැය ලේඛනය**

| ශීර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| මුළු ආදායම හා ප්‍රදාන | 1,70,000 |
| මුළු ආදායම | 1,65,000 |
| බදු ආදායම | 1,50,000 |
| බදු නොවන ආදායම | 15,000 |
| ප්‍රදාන | 5,000 |
| වියදම් හා ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 2,00,000 |
| පුනරාවර්තන (පොළී ගෙවීම් 21 000) | 1,75,000 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් (රාජ්‍ය ආයෝජන 20,000) | 25,000 |
| වර්තන ගිණුමේ අතිරිත්කය (+/ හිඟය (-) | -10,000 |
| ප්‍රාථමික ගිණුමේ අතිරික්තය (+/ හිඟය (-) | - 9,000 |
| සමස්ත අයවැය අතිරික්තය (+/ හිඟය (-) | - 30,000 |

- රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි මිනුම් කිහිපයකි. ඒවා නම්
  - වර්තන ගිණුමේ ශේෂය
  - සමස්ත ගිණුමේ ශේෂය
  - ප්‍රාථමික ගිණුමේ ශේෂය
  - ශුද්ධ මූල්‍ය හිඟය
- වර්තන ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් හැර) පුනරාවර්තන (වර්තන) වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂය යි.

  ඉහත අය වැය ආකෘතියට අනුව

  මුළු ආදායම = 1,65,000

  පුනරාවර්තන වියදම් = 1,75,000

  වර්තන ගිණුමේ ශේෂය = 1,65,000 - 1,75,000

  = <u>-10,000</u>

- සමස්ත ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළු ව) පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලින් සමන්විත ආණ්ඩුවේ මුළු වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂය යි.

මුළු අයහාරය = 1,70,000

වියදම් හා ආපසු ගෙවීම් අඩු කළ

පසු ණය දීම් (මුළු වියදම්) = 2,0,000

සමස්ත ශේෂය = 1,70,000 - 20,000

= - 30,000

- ප්‍රාථමික ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයහාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළු ව ) රාජ්‍ය ණය සඳහා ගෙවූ පොළී වියදම් ඇතුළත් නොවූ පුනරාවර්තන වියදමත්, ප්‍රාග්ධන වියදමත් යන සංරචක දෙකින් සමන්විත වූ ආණ්ඩුවේ වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂය යි)
- සමස්ත ශේෂයෙන් පොළී ගෙවීම් අඩු කිරීම තුළින් ද ප්‍රාථමික ගිණුමේ ශේෂය ලබා ගත හැකි ය.

ප්‍රාථමික ගිණුමේ ශේෂය = සමස්ත ගිණුමේ ශේෂය - පොළී ගෙවීම්

ප්‍රාථමික ගිණුමේ ශේෂය = -30,000 -(-21,000) = -9,000

- මේ නිසා සමස්ත ගිණුමේ ශේෂය සහ ප්‍රාථමික ගිණුමේ ශේෂය අතර වෙනස රාජ්‍ය ණය සඳහා ගෙවූ පොළී වියදම්වලට සමාන වේ.

ඉහත ආකෘතියට අනුව

සමස්ත ගිණුමේ ශේෂය = -30,000

ප්‍රාථමික ගිණුමේ ශේෂය = -9,000

= -30, 000 - (-9,000)

පොළී ගෙවීම් = - 21 000

- ශුද්ධ මූල්‍ය හිඟය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයහාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළු ව) ණය වාරික ආපසු ගෙවීම් අඩු කළ පසු රජයේ මුළු වියදමත් අතර වෙනස යි (එනම්, ණය වාරික ආපසු ගෙවීම් ඇතුළත් නොකොට ගණනය කරනු ලබන අය වැය හිඟය යි).

නිදසුන් : මුළු අයහාරය රු. මි. 5 000

(දීමනා ලැබීම් ද ඇතුළු ව )

රජයේ මුළු වියදම් රු. මි. 6 100

සමස්ත අයවැය ශේෂය (රු.මි. 5 000 - 6 100) රු. මි. - 1 100

ණය වාරික ආපසු ගෙවීම් = රු. මි. 500

ශුද්ධ වූ මූල්‍ය හිඟය = -1 100 - (-500)

= රු.මි. 600

- මේ අනුව රජයේ ශුද්ධ මූල්‍ය හිඟය සහ සමස්ත අයවැය ශේෂය අතර වෙනස වන්නේ ණය වාරික ආපසු ගෙවීම් ය.

  (ආණ්ඩුවේ වියදම් පිළිබඳ ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය ණය වාරික ආපසු ගෙවීම් ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදම ඇතුළත් නොකෙරේ. එයට හේතුව එම වියදම අදාළ වර්ෂයේ කරන ලද වියදමක් හේතු කොට ගෙන හටගත් ගෙවීමක් නොවීම ය. එහෙත් ආණ්ඩුවේ වියදම ගිණුම්කරණ ප්‍රවේශය ඔස්සේ සටහන් කිරීමේ දී දේශීය හා විදේශීය ණය වාරික ආපසු ගෙවීමේ ප්‍රාග්ධන වියදම් යටතේ ඇතුළත් කෙරේ. මේ නිසා ශුද්ධ මූල්‍ය හිඟය ගණනය කිරීම සඳහා සමස්ත අය වැය ශේෂයෙන් ණය වාරික ආපසු ගෙවීම් අඩු කරනු ලැබේ).

- රාජ්‍ය අය වැය ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.
  1. ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්ති
  2. සංකෝචනාත්මක අය වැය ප්‍රතිපත්ති

- අයවැය හිඟය පියවීමට ලබා ගන්නා රාජ්‍ය ණය මගින් රටේ මුදල් සැපයුම වැඩි වී මිල මට්ටම් ඉහළ යාම තුළින් උද්ධමනාත්මක තත්ත්වයක් ඇති වේ නම් එය ප්‍රසාරණාත්මක අය වැය ප්‍රතිපත්තියක් ලෙස සැලකේ.

  නිදසුන ඃ

  - රජය මහ බැංකුවෙන් ණය ලබා ගැනීම
  - රජය වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීම

- රජයක්මහ බැංකුවෙන් හා වාණිජ බැංකුවලින් ණය ලබා ගෙන අය වැය හිඟය පියවීමේ දී රටේ මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

- මේ නිසා සමස්ත ආදායමට වඩා සමස්ත වියදම ඉහළ ගොස් උද්ධමනාත්මක තත්ත්වයක් හට ගනී.

- අය වැය ලේඛනයේ හිඟය පියවා ගැනීම සඳහා ලබා ගන්නා රාජ්‍ය ණය මගින් මුදල් සැපයුමෙහි වැඩි වීමක් සිදු නොවේ නම් එය සංකෝචනාත්මක අය වැය ප්‍රතිපත්තියක් ලෙස සැලකේ.

  - ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ලබා ගැනීම
  - සේවක අර්ථ සාධක අරමුදලෙන් ණය ලබා ගැනීම
  - මහජනතාවගෙන් ණය ලබා ගැනීම

- මෙවැනි ණය ලබා ගැනීම තුළින් රටේ මුදල් සැපයුමෙහි වැඩි වීමක් සිදු නොවේ. එහි දී එම ආයතන හෝ පුද්ගලයින් හෝ සතු ව පවතින මුදල් ප්‍රමාණයක් රාජ්‍ය ණය වශයෙන් ලබා දීම සිදු වේ.

- මේ නිසා උද්ධමනකාරී තත්ත්වයක් හට නොගනී.

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.7 : රජය අය වැය හිඟය පියවීම හා රාජ්‍ය ණයෙහි සංයුතිය විමසයි.**

**කාලච්ඡේද ගණන :** 08


**ඉගෙනුම් පල :**

- අය වැය හිඟය පියවීම සඳහා යොදා ගන්නා මූලාශ්‍ර වෙන් කර ඉදිරිපත් කරයි.
- අය වැය හිඟය පියවීමේ දේශීය හා විදේශීය මූලාශ්‍රවල ප්‍රතිවිපාක විස්තර කරයි.
- රාජ්‍ය ණයෙහි සංයුතිය ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ ණයවල උපනති මහ බැංකු මූලාශ්‍ර දත්ත මගින් ඉදිරිපත් කරයි.
- දේශීය ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමේ දී ඇති වන ගැටලු විස්තර කරයි.
- රාජ්‍ය ණය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක විමසා බලයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ඉදිරි වර්ෂයක් තුළ ආණ්ඩුවේ අපේක්ෂිත ආදායමට වඩා එම වර්ෂය තුළ වියදම් කිරීමට අපේක්ෂිත මුළු වියදම ඉක්මවා යන අවස්ථා පවතී. ආණ්ඩුවේ ආදායමට වඩා ආණ්ඩුවේ වියදම ඉක්මවා යන විට ඇති වන අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය වන්නේ රාජ්‍ය ණය ගැනීම වේ.

- මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර පහත දැක්වෙන ගැලීම් සටහනින් ඉදිරිපත් කර ඇත.



- අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.
    - දේශීය මූලාශ්‍රය
    - විදේශීය මූලාශ්‍රය

- දේශීය මූලාශ්‍ර නැවත කොටස් දෙකකි.
    - වෙළෙඳපොළ මූලාශ්‍ර
    - වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර
    - ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළ තුළින් භාණ්ඩාගාර බිල්පත්, පිළිණපත්, රුපියල් ණය සුරැකුම්පත් ආදී මූල්‍ය උපකරණ භාවිත කරමින් ණය ලබා ගන්නේ නම් එය වෙළෙඳපොළ මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමක් ලෙස හඳුන්වනු ලැබේ.
- දේශීය වෙළෙඳපොළ මූලාශ්‍ර නැවත කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.
    - බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය
    - බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය
- මහ බැංකුව ඇතුළු වෙනත් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය ලෙස හඳුන්වයි. බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය උද්ධමනකාරී මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ලෙස ද එය හඳුන්වයි. මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මගින් අයවැය හිඟය පියවීමට ණය ලබා ගන්නා විට ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් සිදු වේ.
- ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන බැංකු, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල වැනි වාණිජ බැංකු නොවන ණය මැවීමේ හැකියාවක් නැති ආයතනවලින් ණය ලබා ගැනීම බැංකු නොවන ණය ලබා ගැනීම් ලෙස හඳුන්වයි.
- බැංකු නොවන මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා මුදල් මැවීමක් සිදු නොවන බැවින් මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ.
- වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර ලෙස හඳුන්වන්නේ ආණ්ඩුවේ ආයතන තුළ ඇති තැන්පතු හා අතිරික්ත අරමුදල් තාවකාලික ව අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ලබා ගැනීම යි. එවැනි තාවකාලික ව ලබා ගන්නා අරමුදල් කිහිපයකි.
    - පරිපාලන ණය
    - භාණ්ඩාගාරයේ තැන්පතු (මහ බැංකු අත්තිකාරම්)
    - විවිධ තැන්පතු

- අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍ර මගින් සම්පත් ලබා ගන්නා මූලාශ්‍ර දෙකකි.
    - විදේශීය ණය
    - විදේශීය දීමනා
- අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය දීමනාවලට වඩා විදේශීය ණය වැඩි වැදගත්කමක් පවතී.
- අය වැය හිඟය පියවීම සඳහා විදේශීය රජයකින්, අන්තර්ජාතික මූල්‍ය ආයතනවලින් හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළවලින් ලබා ගන්නා ණය විදේශීය ණය මූලාශ්‍ර ලෙස හැඳින්වේ. මෙලෙස ලැබෙන ණය පවතින ණය කොන්දේසිවල ස්වරූපය අනුව සහනදායි ණය හා සහනදායි නොවන ණය වශයෙන් වෙන් කෙරේ.
- සහනදායි ණයවල දී කොන්දේසි රහිත ව හෝ ඉතා අඩු පොළියක් යටතේ හෝ ණය ගෙවීමේ විරාම කාලයක් ලබා දී හෝ එම ණය ලබා දෙයි.
- සහනදායි නොවන ණය වාණිජ ණය ලෙස හඳුන්වයි. ඉහළ පොළී පිරිවැයක් හා විවිධ කොන්දේසි යටතේ ලබා ගන්නා ණය සහනදායි නොවන ණය ලෙස හැඳින්විය හැකි ය.
- දේශීය ණය හා විදේශීය ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක ලෙස හඳුන්වයි. අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ණය මූලාශ්‍රවල ස්වභාවය මත එම ප්‍රතිවිපාක තීරණය වේ.
- අය වැය හිඟය අඛණ්ඩ ව ඉදිරියට යාම හා රාජ්‍ය ණය ඉහළ යාම නිසා ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක දෙකක් ඇති කරයි.
    - වෙළෙඳපොළ පොළී අනුපාතිකය ඉහළ යාම
    - පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා දේශීය මූල්‍ය සම්පත්වල හිඟයක් ඇති වීම
- අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීමත් පෞද්ගලික අංශය වාණිජ බැංකුවලින් ණය ඉල්ලීමත් හේතුවෙන් ඇති වන තරගකාරී බව නිසා ණය පොළී අනුපාතිය ඉහළ යයි. මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක ලබා දෙයි.
- සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණයක් සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර තරගකාරී බව ඇති වීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජනය දුර්වල වේ.
- එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති වන්නේ වාණිජ බැංකු හා මහ බැංකුව උද්ධමනකාරී මූලාශ්‍ර වීම නිසා ය.

- වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර මගින් අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගැනීමෙන් එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති නොවේ.

  නිදසුන් : රජයේ ආයතන සතු ව ඇති අතිරික්ත මුදල් සංචිතයන් වර්ෂ අවසානයේ අය වැය හිඟය පියවීමට යොදා ගැනීම පරිපාලන ණය වේ. මෙමගින් මූල්‍ය ප්‍රසාරණයක් ඇති නොවන අතර උද්ධමනකාරී බලපෑම් ඇති නොවේ.

- විදේශීය ණය හා ප්‍රදාන නිසා ද ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් ඇති විය හැකි ය. විදේශීය මූලාශ්‍ර අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගැනීම නිසා විදේශීය වත්කම් ප්‍රමාණය ඉහළ යාමෙන් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරන අතර විදේශීය ණය සහ දීමනා දේශීය මුදල්වලට පරිවර්තනය කිරිමෙන් ද ආර්ථිකයේ ප්‍රසාරණාත්මක බලපෑම් ඇති විය හැකි ය.

- මෑත කාලීන ව රාජ්‍ය ණයහි සංයුතිය පහත දැක්වෙන සංඛ්‍යා සටහන විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි කර ගත හැකි ය.

| ශීර්ෂය | වර්ෂය | |
|---|---|---|
| | 2014 | 2015 |
| ණය උපකරණ අනුව | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2 8444 054 | 3 305 248 |
| භාණ්ඩාගාර බිල්පත් | 694 767 | 658 240 |
| රුපියල් ණය | 55 518 | 24 088 |
| මහ බැංකු අත්තිකාරම් | 143 898 | 151 132 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 391 083 | 68 458 |
| අනෙකුත් | 148 463 | 1 520 331 |
| මුළු ණය | 4 277 783 | 4 959 196 |
| ආයතන අනුව | | |
| බැංකු අංශය | 1 669 882 | 1 924 036 |
| මහ බැංකුව | 267 777 | 156 050 |
| වාණිජ බැංකු | 1 402 205 | 1 667 986 |
| බැංකු නොවන අංශය | 2 607 901 | 3 035 160 |
| අර්ථ සාධක හා විශ්‍රාමික අරමුදල | 1 474 560 | 1 655 336 |
| ඉතිරි කිරීම් ආයතන | 379 877 | 428 236 |
| පරිපාලන ණය | 221 584 | 252 615 |
| පෞද්ගලික ව්‍යාපාරික අංශය | 500 773 | 656 367 |
| අනෙකුත් | 570 | 570 |
| මුළු ණය | 4 277 783 | 4 959 196 |

මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව - 2016 )

- ඉහත සංඛ්‍යා සටහනේ තොරතුරු අනුව රාජ්‍ය ණය සංයුතිය විශ්ලේෂණය කිරීමේ දී රාජ්‍ය ණය උපකරණ පිළිබඳ සලකා බැලීමේ දී භාණ්ඩාගාර බැඳුම්කර මගින් ණය ලබා ගැනීම වැඩි වශයෙන් සිදු කර ඇත.
- ආයතන අනුව ලබා ගැනීම සලකන විට බැංකු අංශයට වඩා බැංකු නොවන අංශයෙන් ණය ලබා ගැනීම ඉහළ දායකත්වයක් ගෙන ඇත.
- බැංකු නොවන අංශය තුළ අර්ථසාධක සහ විශ්‍රාමික අරමුදලෙන් ණය ලබා ගැනීම ඉහළ ම අගයක් ගෙන ඇත. 2016 වර්ෂය වන විට දී එම අංශයෙන් ණය ලබා ගැනීම වර්ධනය වී ඇත.
- දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ණය 2015 වර්ෂයේ දී 44.3% ක් වන අතර විදේශීය ණය 31.7% ක් පමණ වී ඇත. 2015 වර්ෂයේ දී විදේශීය ණය ප්‍රමාණය 2000 වර්ෂයට වඩා අඩු වීමක් පෙන්නුම් කරයි. (මහ බැංකුවේ කාලීන තොරතුරු ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න).
- සහනදායි විදේශීය ණය ඉහළ අගයක් පෙන්නුම් කරන අතර වාණිජ ණය ද ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි. පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් එය පැහැදිලි වේ.

| ශීර්ෂය | 2015 |
|---|---|
| ණය වර්ගය අනුව | 1 729 895 |
| සහනදායි නොවන ණය | 507 047 |
| වාණිජ ණය | 1 307 089 |
| මුළු විදේශීය ණය | 3 544 031 |

(මහ බැංකුවේ කාලීන තොරතුරු ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න).

- ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය 2016 වර්ෂය වන විට ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2000 වර්ෂයට වඩා අඩු වී ඇත. පහත දැක්වෙන සංඛ්‍යා වගුවෙන් එය පැහැදිලි වේ.

| වර්ෂය | මුළු රාජ්‍ය ණය (රු. මිලියන) | සමස්ත අයවැය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) | (මුළු රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|
| 2000 | 1 218 700 | - 9.5 | 96.9 |
| 2005 | 222 241 | - 7.0 | 90.6 |
| 2008 | 3 588 962 | - 7.0 | 81.4 |
| 2009 | 461 422 | - 9.9 | 86.2 |
| 2010 | 4 590 245 | - 7.0 | 71.6 |
| 2013 | 4 590 245 | - 5.4 | 70.8 |
| 2014 | 7 390 899 | - 5.7 | 70.7 |
| 2015 | 8 503 227 | - 7.4 | 76.0 |

මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව

(මහ බැංකුවේ කාලීන තොරතුරු ඇසුරෙන් සිසුන්ට ලබා දෙන්න.)

- ශ්‍රී ලංකාවේ සමස්ත අයවැය හිඟය සහ මුළු රාජ්‍ය ණය සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. සමස්ත අය වැය හිඟය ඉහළ මට්ටමක පවතින විට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය ඉහළ යන අතර අය වැය හිඟය පහළ යන විට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය පහළ යාමක් පෙන්නුම් කරයි.

- මුළු රාජ්‍ය ණය ඉහළ අගයක් පෙන්නුම් කළ ද එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඩු වීමක් පෙන්නුම් කිරීමට හේතුව ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය 2000 වර්ෂයට වඩා 2016 වර්ෂය වන විට ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීම යි.

- එය 2012 වර්ෂයේ දී 96.8ක් වන අතර 2015 වර්ෂයේ දී 90.6 දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි.

- දේශීය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා ඇති වන ගැටලු කිහිපයකි.

- දේශීය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ඉහළ මට්ටමක පැවතීමත් දේශීය ණය ප්‍රමාණය ඉහළ යාමත් නිසා ගෙවීමට සිදු වන පොළිය ඉහළ අගයක් ගෙන ඇත. දේශීය ණය පොළී ගෙවීම පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

| වර්ෂය | 2010 | 2012 | 2013 | 204 | 2015 |
|---|---|---|---|---|---|
| දේශීය ණය පොළී ගෙවීම් | - | 28.1% | 29.4% | 24.8% | 23.2% |

(මහ බැංකුවේ කාලීන තොරතුරු ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න).

- දේශීය ණය සඳහා පොළී ගෙවීම් පුනරාවර්තන වියදම් ඉහළ යාමට හේතු වී ඇත. එය වර්තන ගිණුමේ හිඟයක් ඇති වී රාජ්‍ය ඉතුරුම් පහළ යාමට හේතු වේ.
    - දේශීය ණය මූලාශ්‍ර අතරින් බැංකු අංශයෙන් ණය ලබා ගැනීම මගින් මුදල් සැපයුම් ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරයි. ඒ නිසා භාණ්ඩවල හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයක් ඇති වේ.
    - දේශීය ණය ඉහළ යාමත් බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමත් නිසා පෞද්ගලික අංශය වාණිජ බැංකු වෙතින් ණය ඉල්ලුම් කිරීමෙන් ආර්ථිකයේ පොළී අනුපාතිකය ඉහළ යාම කෙරෙහි බලපෑම් ඇති කරයි.

- රාජ්‍ය ණය ලබා ගැනීමේ ආර්ථික ප්‍රතිවිපාක කිහිපයක් පහත දැක් වේ.
    - විශාල වශයෙන් ණය ලබා ගැනීම නිසා පොළී ගෙවීම් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ඉතුරුම් පහළ යාම සහ ආයෝජනය පහළ යාම
    - රාජ්‍ය ණය ඉහළ යාම නිසා ණය වාරික සහ පොළිය ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යාම
    - රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩාත් දුෂ්කර වීම

- පෞද්ගලික අංශය වෙතින් සම්පත් ගලා නොයාම සහ ණය පොළී අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ආර්ථිකයේ තෙරපීමක් ඇති වීම (තෙරපුම් ප්‍රතිපාකය)
- විදේශ ණය මගින් රාජ්‍ය ණය පියවීම හේතුවෙන් ජාත්‍යන්තර ණය අර්බුදයකට මුහුණ දීමට සිදු වීම
- ප්‍රසාරණාත්මක ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා ආර්ථිකයේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම
- විදේශ ණය වාරික හා පොළිය ඉහළ යාමෙන් ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇති වීම
- වර්තමාන පරම්පරාව විසින් අනාගත පරම්පරාව වෙත ණය බර පැටවීම

**නිපුණතාව 08 : සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.**

**නිපුණතාව 8.8 :** සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව ඇසුරෙන් විමසීමට ලක් කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති අර්ථ දක්වයි.
- සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිත්තිවල උපකරණ නම් කරයි.
- ශ්‍රී ලංකාවේ සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්ති යොදා ගන්නා ආකාරය නිදසුන් සහිත ව විස්තර කරයි.
- සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විමසයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සැපයුම් පාර්ශ්වයේ ප්‍රතිපත්ති යනු සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වන අතර ඒවා මගින් අපේක්ෂා කරනුයේ වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම යි.
- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන විට ආයෝජනය වැඩි වීම සහ නිෂ්පාදන පිරිවැය අඩු වී නිෂ්පාදන සාධකවල ඵලදායිතාව ද වැඩි වීමට හේතු වේ. ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් අපේක්ෂිත මට්ටම් කරා ගෙන ඒමට සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය මගින් කටයුතු කරනු ලැබේ.
- සැපයුම් පාර්ශ්වයේ ආර්ථික ප්‍රතිපත්තිවල උපකරණ කිහිපයකි.
    - බදු ප්‍රතිසංස්කරණ
    - පෞද්ගලීකරණය
    - නියාමනහරණය
    - ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ
    - ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ
- නිෂ්පාදනය ඉහළ නැංවීමට අනුබලයක් ලැබෙන සේ බදු ක්‍රමයෙහි වෙනස්කම් ඇති කිරීම බදු ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ.
- වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බදු අය කිරීම මගින් යම් යම් බලපෑම් ඇති කරනු ලබයි.

- බදු හේතුවෙන් නිෂ්පාදනයේ පරිභෝජනයේ ආයෝජනයෙන් ඉතිරිකිරීම්වලත් ප්‍රශස්ත මට්ටමට ළඟා විය නොහැකි වේ.

- ශ්‍රම වෙළෙඳපොළ ඇති දෘඪතාවන් ඉවත් වන ආකාරයෙන් ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම සම්බන්ධයෙන් වෙනස්කම් ඇති කිරීම ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස හැඳින්වේ.

නිදසුන් :

  - පීඩාකාරී කම්කරු නීති ඉවත් කිරීම
  - තරගකාරී ශ්‍රම වෙළෙඳපොළක් බිහි වීම
  - ඒ ඒ වෘත්තීන් සඳහා පුහුණු වීම් පිළිබඳ ව දැනුම්වත් කිරීම

- අඩු සුදුසුකම් ඇති වෘත්තීමය සේවකයින් බඳවා නොගැනීම ආදිය යම් කිසි සීමාවකට යටත් ව අහිතකර ප්‍රතිවිපාක අවම වන ආකාරයට යොදා ගත යුතු වේ.

- ශ්‍රම වෙළෙඳපොළ සම්බන්ධයෙන් කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යාංශය විසින් වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. සේවකයන්ගේ අවම ජාතික වේතන පනත යටතේ 2016 සිට අවම වැටුප රු. 10 000 ක් ලෙස නීතිගත කිරීම, විදේශ රැකියා සඳහා යන අයගේ ශිල්පීය නිපුණතා වර්ධනය කිරීමේ වැඩ සටහන් සැකසීම, මැද පෙරදිග හැර වෙනත් කලාප ඉලක්ක කර ගැනීම තුළින් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කර ගැනීම, ශ්‍රමිකයන් පුහුණු කිරීම ආදී වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

- රජයේ හිමිකාරිත්වය යටතේ පැවති ව්‍යාපාර පෞද්ගලික අංශයට විකිණීම, බදු දීම, කළමනාකරණය පමණක් පැවරීම පෞද්ගලීකරණය යනුවෙන් හැඳින්වේ.

- ඒ තුළින් පහත සඳහන් හිතකර තත්ත්වයන් ළඟා කර ගත හැකි ය.

  - වඩාත් ඵලදායි ලෙස නිෂ්පාදන සම්පත් නිෂ්පාදන කටයුතුවලට යෙදවීමෙන් නිෂ්පාදනය සාර්ථක වීම
  - රාජ්‍ය ඒකාධිකාරය අහෝසි වී තරගකාරී වෙළෙඳපොළක් බිහි වීම
  - නිෂ්පාදිතවල ගුණාත්මක තත්ත්වය ඉහළ යාම
  - ප්‍රාග්ධන හිඟයට පිළියමක් වීම
  - ව්‍යාපාරවලට කෙරෙන දේශපාලන බලපෑම් ඉවත් වීම

- ශ්‍රී ලංකාවේ පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය හිමිකාරිත්වය යටතේ පැවති රාජ්‍ය සංස්ථා රාජ්‍ය සමාගම් පෞද්ගලීකරණය තුළින් ඉහත කරුණු අපේක්ෂා කෙරිණි. එමගින් සාර්ථකත්වයක් ලැබූ ආයතන මෙන් ම අකාර්යක්ෂම වූ ආයතන ද දක්නට විය.

- ආර්ථිකයට තරගකාරීත්වය අඩු වීමට බලපාන නීතියෙන් පනවන ලද හා සමාජීය ලෙස ඇති වී තිබෙන රෙගුලාසි හා බාධා ඉවත් කිරීම නියාමනහරණය යි.

නිදසුන් :

- ව්‍යාපාරයක් ආරම්භ කිරීම සම්බන්ධ ව පවතින දැඩි නීතිරීති ලිහිල් කිරීම
- නිදහස් වෙළෙඳාමට බාධා වන ආකාරයේ රජයේ දැඩි අධීක්ෂණය අඩු කිරීම

- නිෂ්පාදන ඉහළ නංවා ගැනීම සඳහා බාධාවක් ව පවතින ප්‍රාග්ධන හිඟය විසඳාගත හැකි ආකාරයට කටයුතු කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය ලෙස සැලකිය හැකි ය.

  නිදසුන් :

  - ප්‍රාග්ධනයේ ඵලදායිතාව නැංවීම
  - ඍජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
  - සහනදායි කොන්දේසි මත විදේශ ණය ලබා ගැනීම
  - ඉතිරි කිරීම් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම

- පසුගිය වසර කිහිපය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ප්‍රාථමික වෙළෙඳුන්ගේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වූව ද මෙහෙයුම් කටයුතුවල සුළු කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදි.

- ඉහත ප්‍රතිසංස්කරණ තුළින් ආයෝජන වැඩි වී නිෂ්පාදනය ඉහළ යාම හිතකර තත්ත්වයක් වේ. එසේ ම අහිතකර තත්ත්වයන් ද උදා විය හැකි ය.

  නිදසුන් :

  - විදේශ ආයෝජන වැඩි කිරීම තුළින් ලාභ හා ලාභාංශ විදේශ රටවලට ඇදී යාම
  - විදේශ ණය ලබා ගැනීම නිසා ණය වාරික හා පොළිය ලෙස විශාල මුදල් වැය වීම.
  - රාජ්‍ය වර්තන වියදම් අඩු වීම සමාජ ශුභසාධනයට අහිතකර වීම
  - සැපයුම ප්‍රවර්ධන ප්‍රතිසංස්කරණ ලෙස ඉහත ප්‍රතිසංස්කරණයන් යොදා ගැනීමේ දී අහිතකර ප්‍රතිඵල අවම වන අන්දමට යොදා ගත යුතු වේ.

**නිපුණතාව 09 : විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.**

**නිපුණතාව 9.1 : අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි.**

**කාලච්ඡේද ගණන :** 10

**ඉගෙනුම් පල :**

- අන්තර්ජාතික වෙළෙඳාම අර්ථ දක්වයි.
- අන්ත්‍ර්ජාතික වෙළෙඳාමට පදනම් වූ නිරපේක්ෂ වාසි න්‍යායය අර්ථ දක්වයි.
- ඒ ඒ රටට නිරපේක්ෂ වාසි ලැබෙන ආකරය සංඛ්‍යා නිදසුන් මගින් පැහැදිලි කරයි.
- නිරපේක්ෂ වාසි හට ගැනීමට හේතු දක්වයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාපේක්ෂ වාසි න්‍යායය අර්ථ දක්වයි.
- සාපේක්ෂ වාසි න්‍යායය පදනම් වන උපකල්පන දක්වයි.
- සංඛ්‍යා නිදසුන් යොදා ගනිමින් සාපේක්ෂ වාසි ලැබෙන ආකාරය පැහැදිලි කරයි.
- අභ්‍යන්තර හුවමාරු අනුපාතිකය පැහැදිලි කරයි.
- අන්තර්ජාතික වෙළෙඳාමට ප්‍රවේශ වීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි බාහිර හුවමාරු අනුපාතය ගණනය කරයි.
- සාපේක්ෂ වාසි හට ගන්නා මූලාශ්‍ර (හේතු) සඳහන් කරයි.
- තරගකාරිත්වයේ වාසිය අන්තර්ජාතික වෙළෙඳාමට බලපාන ආකාරය පැහැදිලි කරයි.
- අන්තර්ජාතික වෙළෙඳාමේ දී ඇති වන ස්ථිතික වාසි හා ගතික වාසි පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ජපානය ශ්‍රී ලංකාවෙන් ඇගලුම් මිල දී ගැනීමට සහ ශ්‍රී ලංකාව ජපානයෙන් මෝටර් රථ මිල දී ගැනීමට හේතු සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ජපානය මෝටර් රථ නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට වඩා වැඩි කාර්යක්ෂමතාවක් දක්වන අතර ඇගලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු කාර්යක්ෂමතාවක් උසුලයි.
    - ශ්‍රී ලංකාව ඇගලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් වැඩි කාර්යක්ෂමතාවක් උසුලන අතර මෝටර් රථ නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු කාර්යක්ෂමතාවක් උසුලයි.

- මේ නිසා ශ්‍රී ලංකාව වැඩි වශයෙන් ඇඟලුම් නිෂ්පාදනය කර ජපානයට අලෙවි කර ජපානයෙන් මෝටර් රථ මිල දී ගනී.
- ජපානය වැඩි වශයෙන් මෝටර් රථ නිෂ්පාදනය කර ශ්‍රී ලංකාවට අලෙවි කර ශ්‍රී ලංකාවෙන් ඇඟලුම් මිල දී ගනී.
- මේ ආකාරයට රට රටවල් අතර අන්තර්ජාතික වෙළෙඳාම සිදු වේ.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඉගෙනුම් සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ලෝකයේ කිසියම් රටක් තවත් රටක් හෝ රටවල් කිහිපයක් හෝ සමඟ හෝ භාණ්ඩ හා සේවා හුවමාරු කර ගැනීම විදේශ වෙළෙඳාම හෙවත් අන්තර්ජාතික වෙළෙඳාම ලෙස හැඳින්වේ.
- අපනයන වෙළෙඳාම හා ආනයන වෙළෙඳාම ලෙස අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.
- රටවල් අන්තර්ජාතික වෙළෙඳාමට සම්බන්ධ වන්නේ ඒ මගින් වෙළෙඳාම සම්බන්ධ වන රටවලට වාසි අත් වන හෙයිනි. පහත දැක්වෙන්නේ එවැනි වාසි කිහිපයකි.
    - අතිරික්ත නිෂ්පාදනය අලෙවි කිරිම සඳහා විදේශ වෙළෙඳපොළවල් සොයා ගත හැකි වීම
    - දේශීය වශයෙන් නිෂ්පාදනය කළ නොහැකි භාණ්ඩ විදේශ රටවලින් මිලට ගත හැකි වීම
    - සම්පත් කාර්යක්ෂම ව හා ඵලදායි ව නිෂ්පාදන කටයුතු සඳහා යොමු කිරීමට හැකි වීම
    - ගුණත්වයෙන් යුත් භාණ්ඩ අඩු මිලට පරිභෝජනය කළ හැකි වීම
    - දියුණු තාක්ෂණය විදේශ රටවලින් ලබා ගත හැකි වීම
    - විදේශ ආයෝජන, විදේශ ණය හා විදේශ ආධාර ගලා ඒම වේගවත් වීම
    - අන්තර්ජාතික වෙළෙඳ කටයුතු දියුණු වීම හේතු කොට ගෙන ප්‍රවාහණ, බැංකු, රක්ෂණ වැනි සේවාවන් දියුණු වීම නිසා සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා ඉහළ යාම
    - ආර්ථික වර්ධනය වේගවත් කර ගත හැකි වීම
    - අන්තර්ජාතික ආර්ථික සහයෝගිතාව වර්ධනය කර ගත හැකි වීම
- වෙළෙඳාමේ පදනම හා එකී පදනමට හේතු වන වෙළෙඳාමෙන් බිහි වන වාසි, එම වාසි නිර්මාණය වන අන්දම, රටවල් අතර බෙදී යන ආකාරය හා වෙළෙඳාමේ දිශාව ආදිය තීරණය කරන සාධක පැහැදිලි කිරීම සඳහා වෙළෙඳ න්‍යාය ගණනාවක් බිහි ව ඇත.

- අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වන ප්‍රධාන න්‍යායන් දෙකකි.
    1. නිරපේක්ෂ වාසි න්‍යායය
    2. සාපේක්ෂ වාසි න්‍යායය

- වෙළෙඳාමේ පදනම හා වෙළෙඳාමෙන් වාසි බිහි වන ආකාරය පැහැදිලි කිරීම සඳහා ඇඩම් ස්මිත් (1776) නැමැති ආර්ථික විද්‍යාඥයා විසින් නිරපේක්ෂ වාසි න්‍යායය ඉදිරිපත් කර ඇත.
- කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට වඩා අඩු පිරිවැයකින් (වැඩි කාර්යක්ෂමතාවකින්) නිෂ්පාදනය කළ හැකි නම් එකී රටට භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ වාසි පවතින බවත්, එකී රටට කිසියම් භාණ්ඩයක් අඩු පිරිවැයකින් නිෂ්පාදනය කළ නොහැකි නම් (වැඩි පිරිවැය / අඩු අකාර්යක්ෂමතාව) ඒ රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා නිරපේක්ෂ අවාසි පවතින බවත් නිරපේක්ෂ වාසි න්‍යායයෙන් පෙන්වා දේ.
- රටවල් අන්තර්ජාතික වෙළෙඳාමේ යෙදෙන විට නිරපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය නිරපේක්ෂ අවාසි ඇති භාණ්ඩය සමඟ හුවමාරු කර ගැනීමෙන් හුවමාරුවට සම්බන්ධ රටවලට අන්‍යෝන්‍ය වශයෙන් වාසි ලබා ගත හැකි බව නිරපේක්ෂ වාසි න්‍යායයෙන් පෙන්වා දේ.
- නිරපේක්ෂ වාසි න්‍යායය හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි ප්‍රවේශ දෙකකි. එනම්,
    1. යෙදවුම් ප්‍රවේශය
    2. නිමවුම් ප්‍රවේශය
- යෙදවුම් ප්‍රවේශය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටක් තවත් රටකට වඩා අඩු සම්පත් ඒකක ප්‍රමාණයකින් නිපදවිය හැකි භාණ්ඩය අපනයනය කිරීමෙනුත්, වැඩි සම්පත් ඒකක ප්‍රමාණයකින් නිපදවිය හැකි භාණ්ඩය ආනයනය කිරීමෙනුත් දෙරටට ම වාසි අත් වන බව යි.

නිදසුන් : නිමැවුම් ඒකකයක් සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් | (5) | 8 |
| රෙදි | 4 | (2) |

- ඉහත නිදසුනේ සහල් කිලෝ එකක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය ඉන්දියාවට වඩා ශ්‍රී ලංකාවේ අඩු ය. ඉන්දියාවට සහල් කිලෝ 1ක් නිපදවීම ශ්‍රම ඒකක 8ක් අවශ්‍ය වුවත් ශ්‍රී ලංකාවට ඒ සඳහා අවශ්‍ය වන්නේ ශ්‍රම ඒකක 5කි. මේ නිසා ශ්‍රී ලංකාවට සහල් නිපදවීම සම්බන්ධ නිරපේක්ෂ වාසි පවතී.

- ඉහත නිදසුනේ රෙදි මීටරයක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය ශ්‍රී ලංකාවට වඩා ඉන්දියාවේ අඩු ය. ශ්‍රී ලංකාවේ රෙදි මීටරයක් නිපදවීමට ශ්‍රම ඒකක 4ක් අවශ්‍ය වූව ද ඉන්දියාවට ඒ සඳහා අවශ්‍ය වන්නේ ශ්‍රම ඒකක 2කි. මේ නිසා ඉන්දියාවට රෙදි නිපදවීම සම්බන්ධ නිරපේක්ෂ වාසි පවතී.
- ශ්‍රී ලංකාව සහ ඉන්දියාව යන රටවල් දෙක වෙළෙඳාමට සම්බන්ධ වන විට, ශ්‍රී ලංකාව සහල් නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය ඉන්දියාවට අපනයනය කිරීමෙනුත්, ඉන්දියාව රෙදි නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය ශ්‍රී ලංකාවට අපනයනය කිරීමෙනුත් දෙරටට ම වාසි ලබා ගත හැකි ය.
- නිමැවුම් ප්‍රවේශය යනුවෙන් අදහස් වන්නේ කිසියම් රටකට තවත් රටකට සාපේක්ෂ ව, යෙදවුම් ඒකකයකින් ලබා ගත හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය වැඩි නම් එම භාණ්ඩය අපනයනය කිරීමෙනුත්, යෙදවුම් ඒකකයකින් ලබා ගත හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය අඩු නම් එම භාණ්ඩය ආනයනය කිරීමෙනුත් දෙරටට ම වාසි අත්වන බව යි.
- ඉහත යෙදවුම් ප්‍රමාණය හා සම්බන්ධ නිදසුනට සැලකිල්ලට ගත් විට ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගු සටහනෙහි දැක්වේ.

ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමවුම් ඒකක ප්‍රමාණය

| | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| සහල් කි.ග්‍රෑම් | $\left(\frac{1}{5}\right)$ | $\frac{1}{8}$ |
| රෙදි (මීටර්) | $\frac{1}{4}$ | $\left(\frac{1}{2}\right)$ |

- ශ්‍රී ලංකාවට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි සහල් ඒකක ප්‍රමාණය ඉන්දියාවට වඩා වැඩි ය.ඉන්දියාවේ ශ්‍රම ඒකකයක් මගින් නිපදවනු ලබන්නේ සහල් කිලෝ ග්‍රෑම් $\frac{1}{8}$ ක් වුවත් ශ්‍රී ලංකාව ශ්‍රම ඒකකයකින් සහල් කිලෝ ග්‍රෑම් $\frac{1}{5}$ ක් නිපදවයි. මේ නිසා සහල් සම්බන්ධ නිරපේක්ෂ වාසි ශ්‍රී ලංකාවට පවතී.
- රෙදි සම්බන්ධයෙන් ගත් විට ඉන්දියාව ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි රෙදි ඒකක ප්‍රමාණය ශ්‍රී ලංකාවට වඩා වැඩි ය. ශ්‍රී ලංකාවේ ශ්‍රම ඒකකයකින් රෙදි මීටර් $\frac{1}{4}$ ක් නිපදවන අතර ඉන්දියාවේ ශ්‍රම ඒකකයක් සහල් රෙදි මීටර් $\frac{1}{2}$ ක් නිපදවයි. මේ නිසා රෙදි සම්බන්ධ නිරපේක්ෂ වාසි ඉන්දියාවට පවතී.
- නිමැවුම් ප්‍රවේශය හා සම්බන්ධ තොරතුරුවලින් හෙළිවන්නේ ද ශ්‍රී ලංකාව සහ

ඉන්දියාව දෙරට අතර වෙළෙඳාමට සම්බන්ධ වන විට ශ්‍රී ලංකාව ඉන්දියාවට සහල් අපනයනය කිරීමෙනුත්, ඉන්දියාව ශ්‍රී ලංකාවට රෙදි අපනයනය කිරීමෙනුත් දෙරටට ම වාසි අත් කර ගත හැකි බව යි.

- නිරපේක්ෂ වාසි හට ගැනීම කෙරෙහි බලපාන හේතු (මූලාශ්‍ර) කිහිපයකි.
    - දේශගුණයේ සුවිශේෂත්වය
    - සම්පත් උරුමය
    - සාධක සුලබතාව
    - කීර්ති නාමය
    - ඓතිහාසික හේතු
- කිසියම් රටකට කිසි දු භාණ්ඩයක් සම්බන්ධයන් නිරපේක්ෂ වාසි හිමි නොවන විට, එනම් එක් රටකට භාණ්ඩ දෙවර්ගය ම නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසි හිමි වන විට, අන්‍යෝන්‍ය වශයෙන් වාසි සහගත වෙළෙඳාමකට පදනමක් බිහි නොවේ. මෙය නිරපේක්ෂ වාසි න්‍යායයේ ප්‍රධාන ගැටලුවකි.

නිදසුන් : A හා B යන දෙරටට ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි පරිගණක සහ ගුවන්විදුලි යන්ත්‍ර ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගු සටහනෙහි දැක්වේ.

**ශ්‍රම ඒකකයකින් බිහි වන නිමවුම් ඒකක ප්‍රමාණය**

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| ගුවන් විදුලි යන්ත්‍ර | (12) | 2 |
| පරිගණක යන්ත්‍ර | (6) | 4 |

- වගු සටහනෙහි දැක්වෙන ආකාරයට පරිගණක හා ගුවන් විදුලි යන්ත්‍ර යන භාණ්ඩ දෙක ම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි A රටට පවතී.
- B රටට කිසි දු භාණ්ඩයක් සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි නොපවතී. මේ නිසා නිරපේක්ෂ වාසි න්‍යාය අනුව A රට හා B රට අතර වෙළෙඳාමක් සිදු නොවේ.
- නිරපේක්ෂ වාසි න්‍යායයේ පවතින මෙම දුර්වලතාව ඉවත් කිරීම සඳහා සාපේක්ෂ වාසි න්‍යාය ඉදිරිපත් වී තිබේ.
- සාපේක්ෂ වාසි න්‍යායය ඉදිරිපත් කරන ලද්දේ ඩේවිඩ් රිකාඩෝ (1817) නැමැති ආර්ථික විද්‍යාඥයා විසින් ය.
- සාපේක්ෂ වාසි න්‍යායයෙන් පෙන්වා දෙන පරිදි රටකට කිසි දු භාණ්ඩයක් සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි නොලැබුණා වුව ද විදේශ වෙළෙඳාමට සම්බන්ධ වී වාසි ලබා ගත හැකි ය.
- කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් වෙනත් රටකට සාපේක්ෂ ව අඩු ආවස්ථික පිරිවැයකින් නිෂ්පාදය කළ හැකි නම් එකී රටට එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම

සඳහා සාපේක්ෂ වාසි පවතින බවත් කිසියම් රටකට කිසියම් භාණ්ඩයක් නිපදවීමේ දී වෙනත් රටකට සාපේක්ෂ ව වැඩි ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු වේ නම් එම රටට එම භාණ්ඩය  නිෂ්පාදනය කිරීම සඳහා සාපේක්ෂ අවාසි පවතින බවත් සාපේක්ෂ වාසි න්‍යායයෙන් ප්‍රකාශ කෙරේ.

- රටවල් අන්තර්ජාතික වෙළෙඳාමේ යෙදෙන විට සාපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය අපනයනය කිරීමෙනුත් වෙළෙඳාමට සම්බන්ධ වන රටවලට වැඩි වාසි අත් කර ගත හැකි බව සාපේක්ෂ වාසි න්‍යායයෙන් පෙන්වා දෙයි.
- සාපේක්ෂ වාසි න්‍යායය පදනම් කර ගනු ලබන උපකල්පන කිහිපයකි. එනම්,

  1. පූර්ණ සාධක සංචලතාව

     එක් කර්මාන්තයක් සඳහා යොදා ගනු ලබන නිෂ්පාදන සම්පත් කාර්යක්ෂමතාවයේ කිසිදු වෙනස්කමකින් තොර ව වෙනත් කර්මාන්තයක් සඳහා යොදා ගත හැකි වීම පූර්ණ සාධක සංචලතාව යන්නෙන් අදහස් වේ.

  2. ස්ථාවර පරිමාණානුකුල ඵල

     කිසියම් කර්මාන්තයක භාවිත කරන යෙදවුම් ප්‍රමාණය වෙනස් කරනු ලැබූ විට එයට සමානුපාතික ව නිමවුම් ප්‍රමාණය ද වෙනස් වේ.

     නිදසුන් : යෙදවුම් දෙගුණ කළ විට නිමැවුම ද දෙගුණ වේ.

  3. නිෂ්පාදනය හෝ පරිභෝජනය හෝ ආශ්‍රයෙන් බාහිරතා හට නොගනී.
  4. ප්‍රවාහණ පිරිවැය සැලකිල්ලට නොගැනීම

- සාපේක්ෂ වාසි න්‍යායය හඳුනා ගැනීම සඳහා ද භාවිත කළ හැකි ප්‍රවේශ දෙකකි එනම්,
  - නිමැවුම් ප්‍රවේශය
  - යෙදවුම් ප්‍රවේශය
- නිමැවුම් ප්‍රවේශයේ දී කිසියම් යෙදවුම් ඒකකයකින් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය මත පදනම් වෙමින් භාණ්ඩ වර්ග දෙකක් හා සම්බන්ධ රටවල් දෙකෙහි ආවස්ථික පිරිවැය ගණනය කොට එම ආවස්ථික පිරිවැය සැලකිල්ලට ගනිමින් දෙරටට ම වෙළෙඳාමට සම්බන්ධ විය හැකි ආකාරය පෙන්වා දේ.

  නිදසුන් : ස්විට්සර්ලන්තය සහ ජර්මනිය යන දෙරටේ අදාළ ව ඔරලෝසු හා රූපවාහිනී යන්ත්‍ර නිපදවීම සම්බන්ධයෙන් ශ්‍රම ඒකකයක නිමැවුම් පිළිබඳ තොරතුරු පහත වගුවේ  දැක් වේ.

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු | 4 | 20 |
| රූපවාහිනී | 6 | 10 |

- ඉහත වගුවේ දැක්වන තොරතුරුවලට අනුව භාණ්ඩ වර්ග දෙක සම්බන්ධයෙන් දෙරටේ ආවස්ථික පිරිවැය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**ඔරලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ස්විට්සර්ලන්ත $= \frac{6}{4} = 1.5$ (රූපවාහිනී ඒකක)

ජර්මනිය $= \frac{10}{20} = (0.5)$ (රූපවාහිනී ඒකක)

**රූපවාහිනී ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ස්විට්සර්ලන්ත $= \frac{4}{6} = (0.67)$ (ඔරලෝසු ඒකක)

ජර්මනිය $= \frac{20}{10} = 2$ (ඔරලෝසු ඒකක)

- ඉහත තොරතුරුවලට අනුව ඔරලෝසු නිපදවීමේ සාපේක්ෂ වාසි ජර්මනියට හිමි වේ. ඊට හේතුව ස්විට්සර්ලන්තයේ ඔරලෝසු ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැයට වඩා අඩු ආවස්ථික පිරිවැයක් ජර්මනියෙහි පැවතීම යි.
- ජර්මනියේ ඔරලෝසු ඒකකයක් නිපදවීමෙ ආවස්ථික පිරිවැය රූපවාහිනී ඒකක 0.5කි. එහෙත් ස්විට්සර්ලන්තයේ එම අගය 1.5කි.
- රූපවාහිනී නිපදවීම සම්බන්ධ ව සාපේක්ෂ වාසි හිමි වන්නේ ස්විට්සර්ලන්තයට යි.
- රූපවාහිනී ඒකකයක් නිපදවීමේ දී ස්විට්සර්ලන්තයේ ආවස්ථික පිරිවැය ඔරලෝසු ඒකක 0.67කි. ඒ අනුව රූපවාහිනී සම්බන්ධයෙන් අඩු ආවස්ථික පිරිවැයක් ස්විට්සර්ලන්තයට පවතී.

- දෙරටේ භාණ්ඩ වර්ග දෙක නිපදවීම සම්බන්ධයෙන් ගණනය කරන ලද ආවස්ථික පිරිවැය තොරතුරු අනුව ස්විට්සර්ලන්තය අඩු ආවස්ථික පිරිවැයක් සහිත රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය ජර්මනියට අපනයනය කිරීමෙනුත්, ජර්මනියට අඩු ආවස්ථික පිරිවැයක් සහිත ඔරලෝසු නිෂ්පාදනය විශේෂීකරණය කොට එහි අතිරික්තය ස්විට්සර්ලන්තයට අපනයනය කිරීමෙනුත් දෙරටට ම විදේශ වෙළෙඳාමට සම්බන්ධ වී වාසි ලබා ගත හැකි ය.
- එක් එක් රට සාපේක්ෂ වාසි ඇති භාණ්ඩය නිෂ්පාදනය විශේෂීකරණය කොට අතිරික්තය නිෂ්පාදන රටවල් අතර හුවමාරු කර ගනු ලබන්නේ කිසියම් අනුපාතයක් යටතේ ය.
- යම් අනුපාතයක් යටතේ හුවමාරුව සිදු කර ගනු ලබන්නේ ඒ හුවමාරුවෙන් දෙරටට ම වාසි අත් වන්නේ නම් පමණි.
- දෙරටට ම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හුවමාරු අනුපාතය ගණනය කිරීමේ දී ඊට අදාළ වන හුවමාරු අනුපාත ස්වරූප දෙකක් පවතී.

  1. අභ්‍යන්තරික හුවමාරු අනුපාතය
  2. බාහිර හුවමාරු අනුපාතය

- විදේශ වෙළෙඳාමට පෙර ඒ ඒ රටවල් අතර භාණ්ඩ හුවමාරු වූ අනුපාතය අභ්‍යන්තර හුවමාරු අනුපාතය යි.
- සාපේක්ෂ වාසි පෙන්වීම සඳහා සැලකිල්ලට ගත් ස්විට්සර්ලන්තය හා ජර්මනිය සම්බන්ධ නිදසුනට අදාළ අභ්‍යන්තර හුවමාරු අනුපාතය පහත පරිදි ගණනය කළ හැකි ය.

**ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමවුම් ඒකක ප්‍රමාණය**

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු | 4 | 20 |
| රූපවාහිනී | 6 | 10 |

- ස්විට්සර්ලන්තයේ අභ්‍යන්තර හුවමාරු අනුපාතය

  ඔරලෝසු 4 : රූපවාහිනී 6

  ඔරලෝසු 1 : රූපවාහිනි 1.5

  රූපවාහිනි 6 : ඔරලෝසු 4

  රූපවාහිනි 1 : ඔරලෝසු 0.67

- ජර්මනියේ අභ්‍යන්තර හුවමාරු අනුපාතය

  ඔරලෝසු 20 ඃ රූපවාහිනී 10

  ඔරලෝසු 1 ඃ රූපවාහිනී 0.5

  රූපවාහිනි 10 ඃ ඔරලෝසු 20

  රූපවාහිනි 1 ඃ ඔරලෝසු 2

- දෙරටේ භාණ්ඩ වර්ග දෙකෙහි ආවස්ථික පිරිවැය තත්ත්වයන් සැලකිල්ලට ගෙන ජර්මනියට ඔරලෝසු සම්බන්ධවත්, ස්විට්සර්ලන්තයට රූපවාහිනී සම්බන්ධ වත් සාපේක්ෂ වාසි පවතින බව පෙර දී සඳහන් කෙරිණි.
- සාපේක්ෂ වාසිය ඇති භාණ්ඩය හුවමාරු කර ගනිමින් දෙරට වෙළෙඳාමට සම්බන්ධ විය යුත්තේ ඉහතින් ගණනය කරන ලද අභ්‍යන්තර හුවමාරු අනුපාතයට වඩා වාසිදායක තත්ත්වයක් ඇති වන පරිදි බාහිර හුවමාරු අනුපාතයක් තීරණය කර ගැනීමෙනි.
- බාහිර හුවමාරු අනුපාතය යනු වෙළෙඳාමට සම්බන්ධ වීම නිසා දෙරට අතර භාණ්ඩ හුවමාරු වන අනුපාතයයි.
- ඉහත නිදසුන හා සම්බන්ධ දෙරටට ම අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වන බාහිර හුවමාරු අනුපාතය පහත පරිදි වේ.


| |
|---|
| ජර්මනියට ඔරලෝසු 1කට රූපවාහිනී 0.5ට වැඩි සහ 1.5ට අඩු |
| ස්විට්සර්ලන්තයට රූපවාහිනී 1 ඃ ඔරලෝසු 0.67ට වැඩි සහ 2ට අඩු |

- මෙම පරාසයන්ට අයත් බාහිර හුවමාරු අනුපාත බොහෝ ප්‍රමාණයක් තිබිය හැකි ය. ඒ ඕනෑ ම අනුපාතයක් යටතේ හුවමාරුව සිදු කර ගැනීමෙන් වෙළෙඳාමට සම්බන්ධ වී දෙරටට ම වාසි අත් කර ගත හැකි ය. එනම් ඉහළ පරිභෝජන මට්ටමක් කරා ළඟා විය හැකි ය.
- ස්විට්සර්ලන්තය හා ජර්මනිය දෙරට ඉහත පරාසයනට අයත් වන


  | |
  |---|
  | ඔරලෝසු 1 ඃ රූපවාහිනී 1 |

  යන බාහිර හුවමාරු අනුපාතය යටතේ වෙළෙඳාමට ප්‍රවේශ වන්නේ යැයි සිතමු. එවිට දෙරට වෙළෙඳාමට පිවිසීමට පෙර සිටියාට වඩා ඉහළ පරිභෝජන මට්ටමක් කරා ළඟා වේ.

නිදසුන් : විදේශ වෙළෙඳාමට සම්බන්ධ වීමට පෙර ස්විට්සර්ලන්තය සහ ජර්මනිය දෙරටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර පහත පරිදි වේ.




- ඉහත දී ගණනය කරන ලද අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක බාහිර හුවමාරු අනුපාතයට අයත් වන
- ඔරලෝසු 1 : රූපවාහිනී අනුපාතය යටතේ සාපේක්ෂ වාසි භාණ්ඩය හුවමාරු කර ගැනීම නිසා දෙරට නව පරිභෝජන වක්‍රයක් කරා ළඟා වන ආකාරය පහත රූප සටහනින් දැක්වේ.





- අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි බාහිර හුවමාරු අනුපාතයක් යටතේ වෙළෙඳාමට සම්බන්ධ වී හුවමාරු වාසි (ඉහළ පරිභෝජන මට්ටමක් ළඟා කර ගැනීම) ළඟා කර ගන්නා සේ ම වෙළෙඳාමට ප්‍රවේශ වීම නිසා විශේෂීකරණයේ වාසි ද ලබා ගත හැකි ය.
- විශේෂීකරණයේ වාසි යනු මුළු සම්පත් ප්‍රමාණය ඉහළ යාමකින් තොර ව ලෝක නිෂ්පාදනය වැඩි කර ගත හැකි වීම යි.

නිදසුන් : ස්විට්සර්ලන්තය සහ ජර්මනිය යන දෙරට ම මුළු සම්පත් ලෙසින් ශ්‍රම ඒකක 100 බැගින් පවතින බව සිතමු. ශ්‍රම එක්ක 100 ම යොදා නිෂ්පාදනය කළ හැකි රූපවාහිනි හා ඔරලෝසු පිළිබඳ තොරතුරු පහත වගු සටහනින් දැක්වේ.


**ශ්‍රම ඒකක 100කින් බිහි වන නිමැවුම් ඒකක ප්‍රමාණය**

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු (ඒකක) | 400 | 2000 |
| රූපවාහිනී (ඒකක) | 600 | 1000 |

**ස්විට්සර්ලන්තය**




**ජර්මනිය**






- මෙම රටවල් දෙක වෙළෙඳාමට ප්‍රවේශ වීමට පෙර ඉහත නිෂ්පාදන හැකියා මායිම්වල

ස්විට්සර්ලන්තය ඔරලෝසු 200 (ඒකක)
රූපවාහිනී 300 (ඒකක)
සංයෝග දැක්වෙන A ලක්ෂ්‍යයෙන් ද

ජර්මනිය ඔරලෝසු 1500
රූපවාහිනී 250
සංයෝග දැක්වෙන B ලක්ෂ්‍යයෙන් ද

කටයුතු කරන්නේ නම් එම තත්ත්වයන් පහත ලෙස රූප සටහන් ඇසුරෙන් පෙන්නුම් කළ හැකි ය.




- මෙම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රවලින් පෙන්නුම් කෙරෙන පරිදි වෙළෙඳාමට ප්‍රවේශ වීමට පෙර ඔරලෝසු හා රූපවාහිනී ලෝක නිෂ්පාදන තත්ත්ව පහත දැක්වේ.

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය | ලෝක නිෂ්පාදනය |
|---|---|---|---|
| ඔරලෝසු | 200 | 1500 | 1700 |
| රූපවාහිනී | 300 | 250 | 550 |

- වෙළෙඳාමට ප්‍රවේශ වූ ස්විට්සර්ලන්තය රූපවාහිනීත් ජර්මනිය ඔරලෝසුත් විශේෂිකරණය කිරීම නිසා ස්විට්සර්ලන්තය ශ්‍රම සම්පත් 100 ම රූපවාහිනී නිපදවීමටත්, ජර්මනිය ශ්‍රම සම්පත් 100 ම ඔරලෝසු නිපදවීමටත් යොදවයි. (පූර්ණ විශේෂීකරණය) සිදු කරයි. මේ නිසා වෙළෙඳාමෙන් පසු ලෝක නිෂ්පාදනය පහත පරිදි වේ.

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය | ලෝක නිෂ්පාදනය |
|---|---|---|---|
| ඔරලෝසු | 0 | 2000 | 2000 |
| රූපවාහිනී | 600 | 0 | 600 |

- වෙළෙඳාමට පෙර ඔරලෝසුවල ලෝක නිෂ්පාදනය ඒකක 1700ක් වුව ද වෙළෙඳාමෙන් පසු ඔරලෝසුවල ලෝක නිෂ්පාදනය ඒකක 2000ක් වේ. එනම් වෙළෙඳාමට ප්‍රවේශ වීම නිසා ඔරලෝසුවල ලෝක නිෂ්පාදනය ඒකක 300 කින් ඉහළ ගොස් ඇත.
- එසේම වෙළෙඳාමට පෙර රූපවාහිනීවල ලෝක නිෂ්පාදනය ඒකක 550 ක් වේ. වෙළෙඳාමෙන් පසු රූපවාහිනීවල ලෝක නිෂ්පාදනය ඒකක 600ක් වේ. එනම් රූපවාහිනීවල ලෝක නිෂ්පාදනය වෙළෙඳාමෙන් පසු ඒකක 50කින් ඉහළ ගොස් ඇත.

- වෙළෙඳාමට පෙරත් පසුත් ස්විට්සර්ලන්තය සහ ජර්මනියේ පැවතියේ ශ්‍රම සම්පත් වෙනස් වී නොමැත.
- ඒ අනුව ශ්‍රම සම්පත් ප්‍රමාණය ඉහළ යෑමකින් තොර ව විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වී සාපේක්ෂ වාසි ඇති භාණ්ඩය විශේෂීකරණය කිරීමෙන් ලෝක නිෂ්පාදිතය වැඩි කර ගත හැකි බව ඉහත නිදසුනෙන් පැහැදිලි ය. එම වාසිය විශේෂීකරණයේ වාසියයි.
- භාණ්ඩයක් නිපදවීම සඳහා අවශ්‍ය යෙදවුම් ඒකක ප්‍රමාණය දන්නා විට දී ආවස්ථික පිරිවැය ඇසුරෙන් සාපේක්ෂ වාසි ගණනය කළ හැකි ය.

**නිමවුම් ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය ශ්‍රම ඒකක ප්‍රමාණය**

| | A රට | B රට |
|---|---|---|
| පරිගණක | 4 | 6 |
| යතුරුපැදි | 10 | 12 |

- යෙදවුම් ප්‍රමාණය දී ඇති විට සාපේක්ෂ වාසි සෙවීම සඳහා එම තොරතුරු යෙදවුම් ඒකකයකින් බිහි කළ හැකි නිමැවුම් ප්‍රමාණය දැක්වෙන පරිදි පරිවර්තනය කර ගත යුතු ය. (නිමැවුම් ප්‍රවේශයෙන් දැක්වෙන ආකාරයට ම)
- ඒ අනුව ඉහත වගු සටහනෙහි තොරතුරු පහත ආකාරයට පරිවර්තනය සිදු කළ හැකි ය.

**ශ්‍රම ඒකකයක් නිපදවිය හැකි නිමැවුම් ඒකක ප්‍රමාණය**

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| පරිගණක (ඒකක) | $\frac{1}{4}$ | $\frac{1}{6}$ |
| යතුරුපැදි (ඒකක) | $\frac{1}{10}$ | $\frac{1}{12}$ |

- මෙම තොරතුරු හා සම්බන්ධ දෙරටේ ඒ ඒ භාණ්ඩ වර්ගවල ආවස්ථික පිරිවැය තත්ත්වයන් පහත දැක්වේ.

**පරිගණක ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

A රට $= \frac{\frac{1}{10}}{\frac{1}{4}} = (0.4)$ (යතුරුපැදි ඒකක)

B රට $= \dfrac{\frac{1}{12}}{\frac{1}{6}} = 0.5$ (යතුරුපැදි ඒකක)

**යතුරුපැදි ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය**

A රට $= \dfrac{\frac{1}{4}}{\frac{1}{10}} = 2.5$ (පරිගණක ඒකක)

B රට $= \dfrac{\frac{1}{6}}{\frac{1}{12}} = (2)$ (පරිගණක ඒකක)

මෙහි දී A රටට පරිගණක නිපදවීමට ද, B රටට යතුරපැදි නිපදවීමට ද සාපේක්ෂ වාසි පවතී.

- මේ නිසා A රට පරිගණක විශේෂීකරණය කොට නිපදවා එහි අතිරික්තය B රටට අපනයනය කිරීමෙනුත් B රට යතුරුපැදි විශේෂීකරණය කොට නිපදවා එහි අතිරික්තය A රටට අපනයනය කිරීමෙනුත් දෙරටට විදේශ වෙළෙඳාමේ වාසි අත්පත් කර ගත හැකි ය.
- අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වන සාපේක්ෂ වාසි හට ගන්නා ප්‍රධාන මූලාශ්‍ර (සාපේක්ෂ වාසි හට ගැනීමට බලපාන හේතු) කිහිපයක් පහත දැක්වේ.

1. **සම්පත් සම්භාරයේ වෙනස්කම්**

රටක් උරුම කර ගත් සම්පත් සම්භාරයේ වෙනස්කම් නිසා භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය වෙනස්කම් හට ගනී.

නිදසුන් :

ඛනිජ සම්පත් සුලබතාව රටින් රටට වෙනස් ය. දකුණු අප්‍රිකාවේ රත්රන් සුලබ ය. සෞදි අරාබියේ ඛනිජ තෙල් සුලබ ය. මේ නිසා සෞදි අරාබියේ ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා අඩු ආවස්ථික පිරිවැයක් පවතින බැවින් ඛනිජ තෙල් විශේෂීකරණය කොට අපනයනය කරයි. එසේ ම දකුණු අප්‍රිකාවේ රත්රන්වල ආවස්ථික පිරිවැය අඩු නිසා රත්රන් විශේෂීකරණය කොට අපනයනය කරයි.

## 2. ගුණාත්මක තත්ත්වය

සම්පත් ප්‍රමාණය අතින් පමණක් නොව සම්පත්වල ගුණාත්මක තත්ත්වය අතින් ද රටවල් අතර වෙනස්කම් පවතී. නිදසුනක් වශයෙන් ශ්‍රමය බහුල රටක් වුව ද ශ්‍රම හමුදාව නුපුහුණු නම් ඔවුන් ගේ ඵලදායිතාව පහළ මට්ටමක පවතී. එහෙත් ශ්‍රමය අඩු රටක සිටින ශ්‍රම හමුදාව මනාව පුහුණු ලබා තිබේ නම් ඔවුන් ඉහළ ඵලදායිතාවකින් යුක්ත ය. මෙහි දී ශ්‍රමයේ ඵලදායිතාව අඩු වන විට ආවස්ථික පිරිවැය වැඩි නිසා සාපේක්ෂ වාසි අඩු වේ. එහෙත් ශ්‍රමයේ ඵලදායිත්වය ඉහළ යන විට නිපදවන භාණ්ඩවල ආවස්ථික පිරිවැය අඩු නිසා සාපේක්ෂ වාසි ඇති වේ.

## 3. අභිරුචියේ වෙනස්කම්

සියලු ම රටවල් එක හා සමාන කාර්යක්ෂමතාවකින් හා සමාන සම්පත් සම්භාරයක් උරුම කර සිටියත්, රටවල් අතර භාණ්ඩ සම්බන්ධයෙන් පවතින අභිරුචියේ වෙනස්කම් නිසා ද ආවස්ථික පිරිවැයෙහි වෙනස්කම් හට ගනී. රටවල පවත්නා සම්පත් ප්‍රමාණය සමාන වුවත් අභිරුචි රටාවන්හි වෙනස්කම් නිසා භාණ්ඩවල සාපේක්ෂ මිල ගණන් අතර වෙනස්කම් ඇති විය හැකි ය. අභිරුචීන් වැඩි භාණ්ඩ නිපදවීමට වැඩි දිරිගැන්වීම් ලැබීම තුළින් අඩු ආවස්ථික පිරිවැයක් යටතේ එම භාණ්ඩ නිපදවා අපනයනය කොට සාපේක්ෂ වාසි අත් කර ගත හැකි ය.

## 4. පරිමාණානුකූල පිරිමැසුම්

නිෂ්පාදන ධාරිතාව වැඩි කරන විට ඒකක පිරිවැය පහළ වැටේ නම් පරිමාණානුකූල පිරිමැසුම් ඇති වේ. පිරිමැසුම් පවතින විට සාපේක්ෂ ව අඩු ආවස්ථික පිරිවැයක් සහිත ව භාණ්ඩ නිපදවිය හැකි බැවින් ඒ සම්බන්ධ ව සාපේක්ෂ වාසි අත් කර ගත හැකි ය.

## 5. නිෂ්පාදන ප්‍රභේදනය

එක ම කර්මාන්තය තුළ භාණ්ඩ අතර පවතින විවිධ වෙනස්කම් නිසා ද අන්තර්ජාතික වෙළෙඳාම තුළින් ලැබිය හැකි සාපේක්ෂ වාසි පිළිබිඹු වේ. වර්තමානයේ සංවර්ධිත රටවල් බොහෝමයක් විදේශ වෙළෙඳාමෙන් වැඩි ප්‍රමාණයක් මෙම භාණ්ඩ නිෂ්පාදනය මුල් කර ගෙන සිදු වන බව දක්නට ලැබේ. නිදසුන් වශයෙන් මෝටර් රථ කර්මාන්තය ගත් විට ජර්මනිය මහා බ්‍රිතාන්‍යයට මෝටර් රථ අපනයනය කොට මහා බ්‍රිතාන්‍යයෙන් මෝටර් රථ ආනයනය ද කරයි. ඊට හේතුව එක ම කර්මාන්තය වුවත් භාණ්ඩ අතර පවතින වෙනස්කම් නිසා ආවස්ථික පිරිවැයෙහි වෙනස්කම් රටවල් අතර ඇති වීමයි.

## 6. තාක්ෂණික වෙනස්කම්

තාක්ෂණයේ හට ගන්නා වෙනස්කම් නිසා ද රටවල් අතර සාපේක්ෂ වාසි වෙනස් වේ. කිසියම් රටක් කිසියම් භාණ්ඩයක් නිපදවීම සම්බන්ධයෙන් පෙරට වඩා නව තාක්ෂණයක් භාවිත කිරීමට හැකි වේ නම් සාපේක්ෂ වශයෙන් අඩු

ආවස්ථික පිරිවැයකින් එම භාණ්ඩය විශේෂීකරණය කොට නිපදවා සාපේක්ෂ වාසි ලබා ගත හැකි ය.

7. **රාජ්‍ය ප්‍රතිපත්තිය**

රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් ද සාපේක්ෂ වාසි නිර්මාණය කළ හැකි ය. කිසියම් කර්මාන්තයක් පුනර්ජීවනය සඳහා ආණ්ඩුවක් විසින් බදු සානුබල, පර්යේෂණ හා සංවර්ධනය සඳහා සහනාධාර ලබා දීම, ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අඩු පොළී ණය යනාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන විට අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීම හා  වෙළෙඳාම මගින් සාපේක්ෂ වාසි අත් කර ගැනීමට හැකි වේ.

8. **උද්ධමනය**

කිසියම් රටක දිගු කාලීන උද්ධමන අනුපාතයක් පවතින විට භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉහළ යයි. ඒ අනුව සාපේක්ෂ වාසි අඩු වේ. අපනයනය ද අධෛර්යවත් වේ.

9. **ස්ථානගත වීම**

කිසියම් කර්මාන්තයක් ස්ථානගත වී ඇති ආකාරය අනුව ද ඒ ඒ රටවල සාපේක්ෂ වාසි තීරණය  වේ. කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය සියල්ල පහසුවෙන් ලබා ගත හැකි ආකාරයෙන් කර්මාන්ත ස්ථානගත වී තිබේ නම් සාපේක්ෂ අඩු ආවස්ථික පිරිවැයක් යටත් භාණ්ඩ නිපදවමින් සාපේක්ෂ වාසි ලබා ගැනීමට හැකි වේ.

- තරගකාරිත්වයේ වාසිය යනු කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයන් වෙත සැපයීමේ දී සෙසු තරගකරුවන් වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන් වෙත ලබා දිය  හැකි වීමයි.
- මෙම වටිනාකම සෙසු තරගකරුවන්ට වඩා අඩු මිලක් විය හැකි අතර හැකි නම් ඉහළ මිලක් යටතේ වුව ද සෙසු තරගකරුවන්ට වඩා වැඩි ගුණාත්මක සේවාවක් ලබා දිය හැකි ය.
- කර්මාන්තය තුළ සිටින සෙසු තරගකරුවන් උපයන සාමාන්‍ය ලාභ ප්‍රමාණයට වඩා වැඩි ලාභ ප්‍රමාණයක් අඛණ්ඩ ව උපයා ගැනීමට හැකි නම් එම ආයතනයට තරගකාරිත්ව වාසියක් ඇති බව පෙන්නුම් කෙරේ.
- තරගකාරිත්ව වාසිය තිරසාර ලෙස පවත්වා ගෙන යාම ආයතනයේ උපාය මාර්ගයකි.

- තරගකාරිත්වය වාසියට තුඩු දෙන මූලාශ්‍ර කීපයක් පහත දක්වේ.
  - පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන්හි විශාල හැකියාවක් තිබීම. මේ නිසා නව්‍යතා හඳුන්වා දීමේ දී ඉදිරියෙන් සිටීමේ හැකියාව ලැබේ.
  - බුද්ධිමය දේපොළ හිමිකාරිත්වය
  - බෙදා හැරීමේ ජාල පිළිබඳ සුවිශේෂ හිමිකමක් තිබීම

    ප්‍රාග්ධන උපකරණ හිමිකාරිත්වය

නිදසුන් : ඛනිජ තෙල් ගවේෂණ, පතල් කැණීම්

- සුපිරි නිෂ්පාදිතයක් බිහි කිරීම හෝ පාරිභෝගික අවශ්‍යතාවක් හෝ සඳහා කිසියම් ප්‍රතිචාර දැක්වීමේ හැකියාව
- අඩු පිරිවැයක් සහිත ව නිපදවීම
- ඉතා විශාල නිෂ්පාදන ධාරිතාවක් තිබීම
- ශක්තිමත් අලෙවිකරණ උපාය මාර්ග තිබීම
- කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමේ පහසුව
- ඉතා විශිෂ්ට කළමනාකරණ කණ්ඩායම් සිටීම
- ප්‍රවේශය බාධාකාරී වීම හෝ ඒකාධිකාරී ස්වරූපයක් ගැනීම

- අන්තර්ජාතික වෙළෙඳාමේ වාසි ස්ථිතික වාසි හා ගතික වාසි වශයෙන් ද දැක්විය හැකි ය.
- ස්ථිතික වාසි යනු නිෂ්පාදනය හා පරිභෝජනය මුල් කර ගෙන රටකට ස්වාභාවිකව උරුම වී ඇති වාසියකි. මෙයට හේතු කිහිපයකි.

1. සම්පත් සම්භාරය
2. රටවල් අතර අභිරුචීන් ගේ වෙනස්කම්
3. නිෂ්පාදනයේ පරිමාණානුකූල පිරිමැසුම්වල විශාල බව

- ගතික වාසිය යනු තාක්ෂණ දියුණුව, භාණ්ඩ ප්‍රභේදනය, රාජ්‍ය ප්‍රතිපත්ති වෙළෙඳ ගිවිසුම් ආදී රටවල් නිර්මාණය කර ගනු ලබන තත්ත්වයක් නිසා හටගන්නා වාසියකි.

**නිපුණතාව 09 : විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතාව 9.2 : ආරක්ෂාවාදී ක්‍රියාමාර්ග හා එමගින් නිදහස් වෙළෙඳාමට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- ආරක්ෂණවාදය අර්ථ දක්වයි.
- ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වෙන් කර දක්වයි.
- තීරු බදු ආරක්ෂණය පැහැදිලි කරයි.
- නාමික ආරක්ෂණ අනුපාතිකය හා සඵල ආරක්ෂණ අනුපාතිකය පැහැදිලි කරයි.
- තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග සඳහන් කරයි.
- ආරක්ෂණවාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඇති තර්ක ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- දේශීය වෙළෙඳපොළට විදේශීය භාණ්ඩ ඇතුලු වීම සීමා කරන හෝ වළක්වන ඕනෑ ම ක්‍රියා පිළිවෙතක් ම ආරක්ෂණවාදය නමින් හැඳින්වේ.
- නිදහස් වෙළෙඳාමට බාධා කරන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකි ය. එනම්,
    1. තීරු බදු ආරක්ෂණය
    2. තීරු බදු නොවන ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග
- තීරු බදු ආරක්ෂණය යනු අපනයන හා ආනයන මත බදු පැනවීම යි.
- ආනයන මත තීරු බදු පැනවීමෙන් එම භාණ්ඩ මිල දී ගන්නා දේශීය පාරිභෝගිකයන්ට වැඩි මිලක් ගෙවීමට සිදු වීම නිසා ආනයන අධෛර්යවත් වේ.
- ආනයන තීරු බද්දක් පැනවීමේ ප්‍රධාන අරමුණක් වනුයේ දේශීය නිෂ්පාදකයන් විදේශීය තරගයෙන් ආරක්ෂා කිරීම යි.
- ආනයනික භාණ්ඩයක් සඳහා තීරු බදු පැනවූ විට දේශීය භාණ්ඩය සඳහා පාරිභෝගිකයන් යොමු වන බැවින් එම භාණ්ඩයේ දේශීය නිෂ්පාදනය ප්‍රසාරණය වේ.
- මේ නිසා දේශීය භාණ්ඩයේ මිල ඉහළ නැංවීමට අවස්ථාවක් සැලසේ.
- මෙලෙස ආනයන භාණ්ඩ සඳහා ආනයන තීරු බදු වැඩි කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයට ආනයනය කරනු ලබන භාණ්ඩයේ මිල ඉහළ යාමේ ප්‍රතිශතය තුළින් දේශීය නිෂ්පාදනයට ලැබෙන ආරක්ෂණය නාමික ආරක්ෂණ අනුපාතිකය (Nominal Rate of Protection) වශයෙන් හැඳින්වේ.

- නාමික ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිෂ්පාදකයාගේ මිල ආනයනය කරනු ලබන භාණ්ඩයේ දේශීය වෙළෙඳපොළ මිලෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

- නාමික ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදි ව පිළිඹිබු නොවේ.

- නාමික තීරු බදු අනුපාතිකය පනවනු ලබන්නේ ආනයනය කරනු ලබන අවසාන භාණ්ඩයේ වටිනාකම අනුව යි. නමුත් දේශීය නිෂ්පාදකයන් ආනයනය කරන ලද අතරමැදි යෙදවුම් හා භාණ්ඩ රැසක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගනී. මෙම යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත ද තීරු බදු අය කර ඇති විටෙක නාමික තීරු බදු අනුපාතයට අනුව ගණනය කරනු ලබන නාමික ආරක්ෂණ අනුපාතිකයෙන් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණ ප්‍රමාණය නිවැරදි ව පිළිබිඹු නොවේ.

- මේ නිසා ආනයන තීරු බද්දක් පැනවීම මගින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය මැනීම සඳහා සඵල ආරක්ෂණ අනුපාතිකය යොදා ගනී.

- සඵල තීරු බදු අනුපාතිකයට අනුව සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කරනු ලබයි.

- සඵල ආරක්ෂණ අනුපාතිකය ගණනය කිරීම සඳහා පහත සඳහන් සූත්‍රය යොදා ගනී.

$$ERP = \frac{(V_1 - V_0)}{V_0} \times 100$$

ERP = සඵල ආරක්ෂණ අනුපාතිකය

$V_1$= තීරු බද්ද පැනවූ විට දේශීය නිෂ්පාදකයාගේ එකතු කළ අගය

$V_0$= නිර්බාධ වෙළෙඳපොළ තත්ත්වයක් යටතේ දේශීය නිෂ්පාදනයේ එකතු කළ අගය

නිදසුන 1 :

කිසියම් රටක පාවහන් නිෂ්පාදන ආයතනයක් පාවහන් යුගලයක් රු. 5000/- ක මිලකට අලෙවි කරන්නේ යැයි ද එම පාවහන් යුගලය නිපදවීමට අවශ්‍ය යෙදවුම් (සම්, නූල්, ආදි) ආනයනය කිරීම සඳහා රු. 3 000/- ක් වැය කර ඇතැයි ද සිතමු. එවිට දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ වටිනාකම රු. 2000/- (5 000 - 3 000) කි. එම රට දේශීය ආයතනය නිපදවන පාවහන් යුගලයට සමාන පාවහන් යුගලයක් වෙළෙඳපොළේ රු. 5 000/- කට අලෙවි කරන්නේ

යැයි සිතමු. ඒ අනුව දේශීය පාවහන් නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය යම් හෙයකින් රු. 2 000/- කට වඩා වැඩි වුවහොත් දේශීය ව නිපදවන සපත්තු යුගලයේ වටිනාකම (මිල) රු. 5 000/- කට වඩා වැඩි වන නිසා ආනයනික පාවහන් යුගලය සමග තරග කිරීමට නොහැකි වේ. මේ නිසා දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට ආනයනික පාවහන් මත 10% ක ආනයන තීරු බද්දක් පැනවූයේ යැයි සිතමු. එවිට ආනයනික පාවහන් යුගලයක මිල පහත පරිදි වෙනස් වේ.

| | |
|---|---|
| තීරු බද්දට පෙර පාවහන් යුගලයේ මිල | = රු. 5000 |
| තීරු බද්ද සඳහා වැය වන මුදල | = රු. $5000 \times \frac{10}{100}$ |
| බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිල | = රු. 5000 + 500 |
| | = රු. 5500 |

මෙලෙස ආනයනික පාවහන් සඳහා තීරු බද්දක් පැනවීම නිසා දේශීය නිෂ්පාදන ආයතනයේ එකතු කළ අගය රු. 2500 දක්වා ඉහළ නැංවීමේ හැකියාවක් තිබේ.

| | |
|---|---|
| තීරු බද්දෙන් පසු ආනයනික පාවහන් යුගලයේ මිල | = රු. 5500 |
| තීරු බද්දෙන් පසු දේශීය නිෂ්පාදන ආයතනයේ | = රු. 5500 - 3000 |
| එකතු කළ අගය | = රු. 2500 |

ඒ අනුව සඵල ආරක්ෂක අනුපාතිකය පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$$ERP = \frac{\left(V_1 - V_0\right)}{V_0} \times 100$$

$$= \frac{2500 - 2000}{2000} \times 100$$

$$= \underline{\underline{25\%}}$$

- ඉහත නිදසුනට අනුව නාමික තීරු බද්ද නිසා දේශීය නිෂ්පාදනයට 25% ක සඵල ආරක්ෂණයක් සැලසෙන බව පැහැදිලි වේ.
- නමුත් ඉහත තීරු බද්ද පනවා ඇත්තේ අවසාන භාණ්ඩයේ වටිනාකම මත ය. දේශීය ආයතනය පාවහන් නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ආනයනය කිරීමේ දී යම් තීරු බද්දක් අය කර ඇත්නම් එය මේ තුළ අන්තර්ගත වී නැත. එවිට ඉහත ගණනය කරන ලද සඵල ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිෂ්පාදනයට ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය පිළිබිඹු නොවේ.

- ආනයනික යෙදවුම් මත තීරු  බද්දක් පනවා ඇති විටෙක සඵල තීරු බදු අනුපාතකය වෙනස් වන නිසා සඵල ආරක්ෂණ අනුපාතිකය වෙනස් වන ආකාරය පහත සඳහන් නිදසුන ඇසුරෙන් පැහැදිලි කර ගත හැකි ය.

නිදසුන 2 ඃ

ඉහත දක්වන ලද  නිදසුන 1ට  අනුව ආනයනය කරනු ලබන පාවහන් යුගලයක් සඳහා රු. 10% ක තීරු බද්දක් අය කරයි. මෙහි දී දේශීය නිෂ්පාදන ආයතනය ආනයනය කරන ලද යෙදවුම් සඳහා 5% ක තීරු බද්දක් අය  කරතැයි සිතමු. එවිට ආනයනික යෙදවුම්වල වටිනාකම, දේශීය එකතු කළ අගය වෙනස් වේ. ඒ අනුව සඵල ආරක්ෂක අනුපාතිකය ද වෙනස් වේ.

තීරු බද්දට පෙර ආනයනික යෙදවුම්වල වටිනාකම = රු. 3000

යෙදවුම් සඳහා ගෙවන තීරු බදු ප්‍රමාණය = රු. $3000 \times \frac{5}{100}$

තීරු බද්දෙන් පසු යෙදවුම්වල වටිනාකම = රු. 3000 + 150

= රු. 3150

තීරු බද්දෙන් පසු දේශීය එකතු කළ අගය = රු. 5500 - 3150

= රු. 2350

සඵල ආරක්ෂණ අනුපාතිකය $= \frac{2350 - 2000}{2000}$

= 17.5%

- අවසාන භාණ්ඩයට බදු අය කිරීමට අමතර ව ආනයනික ආරක්ෂණ යෙදවුම් මත ද තීරු බදු පැනවීම නිසා සඵල ආරක්ෂණ අනුපාතය 7.5% කින් (25% - 17.5%) පහළ යන බව ඉහත නිදසුනට අනුව පැහැදිලි ය.

- අනෙකුත් කරුණු නොවෙනස් ව පවතින අවස්ථාවල දී පහත සඳහන් කොන්දේසි මත සඵල ආරක්ෂණ අනුපාතිකය ඉහළ අගයක් ගනී.

1. අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන නාමික තීරු බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම
2. ආනයනික යෙදවුම් මත පනවනු ලබන තීරු බදු අනුපාතික පහළ අගයක් ගැනීම
3. භාණ්ඩයේ වටිනාකම තුළ ආනයනික යෙදවුම් ප්‍රතිශතය පහළ අගයක් ගැනීම

- ආනයන සහ අපනයන බදුවලට අමතර ව ආරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග තීරු බදු නොවන ක්‍රියාමාර්ග වේ. එවැනි ක්‍රියාමාර්ග කීපයක් පහත දැක්වේ.

    - සලාක කිරීම හෙවත් කෝටා නියම කිරීම
    - දේශීය නිෂ්පාදකයින්ට සහනාධාර හෝ දිරිගැන්වීම් හෝ ලබා දීම
    - ප්‍රපාතනය
    - ස්වෙච්ඡාවෙන් අපනයන සීමා පනවා ගැනීම
    - විදේශ විනිමය පාලනය
    - අපනයන හා ආනයන සීමා පැනවීම
    - වෙළෙඳ සම්බාධක පැනවීම
    - පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම

- ආරක්ෂණවාදයට පක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.
    - ජාතික ආරක්ෂාවට අදාළ වන නිෂ්පාදන දේශපාලන හා ආර්ථික තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.
    - දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමටත් ඒවායේ සේවා නියුක්ත සේවකයන්ගේ රැකියා ආරක්ෂා කිරීම සඳහාක් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වැදගත් වේ.
    - දේශීය ළදරු කර්මාන්ත සඳහා පළපුරුදු විදේශ තරගකරුවන්ගෙන් ආරක්ෂා කර ගැනීමට ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ඉවහල් වේ.
    - සීමිත භාණ්ඩ කීපයක් මත විශේෂ ප්‍රාගුණ්‍ය කරමින් අන්තර්ජාතික වෙළෙඳාමේ නිරත වන රටවල් මුහුණ පාන උච්චාවචනය වළක්වා ගැනීම (ආර්ථික ස්ථායිතාව ඇති කිරීම) සඳහාත් රටවල ආර්ථිකය විවිධාංගීකරණය කර ගැනීම සඳහාත් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම වැදගත් වේ.
    - ප්‍රපාතනය වළක්වා ගැනීම සඳහා ආරක්ෂණවාදය වැදගත් වේ.
    - ගෙවුම් ශේෂ දුෂ්කරතාවලට විසඳුම් සෙවීමේ දී උපකාරී වේ.
    - දේශීය සම්පත් උපයෝජනය ඉහළ නැංවීම සඳහා වැදගත් වේ.
    - අවගුණ භාණ්ඩ ආනයන වැළැක්වීමේ දී ආරක්ෂණවාදය වැදගත් වේ.
- ආරක්ෂණවාදයට විපක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.
    - ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීම නිසා දේශීය හා විදේශීය වෙළෙඳපොළ සංකෝචනය විය හැකි ය.
    - විදේශ වෙළෙඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම අඩු විය හැකි ය.
    - දේශීය නිෂ්පාදනවල පිරිවැය අඩු කිරීමට සානුබල නොමැති නිසා අකාර්යක්ෂම කර්මාන්ත බිහි විය හැකි ය.
    - ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ නිෂ්පාදනය අඩු විය හැකි ය.
    - දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇති විය හැකි ය.

**නිපුණතාව 09 : විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 9.3 : විදේශ වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දක්වමින් ඒවායේ වෙනස් වීම්වලට හේතු හා ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන** : 08

**ඉගෙනුම් පල :**

- වෙළෙඳ අනුපාතිකය අර්ථ දක්වයි.
- වෙළෙඳ අනුපාතිකයේ විවිධ ප්‍රභේද නම් කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය සමීකරණය මගින් ප්‍රකාශ කරයි.
- දෙන ලද දත්ත මගින් භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වලට හේතු පැහැදිලි කරයි.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වල ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.
- ආදායම් වෙළෙඳ අනුපාතිකය සමීකරණ මගින් ප්‍රකාශ කරයි.
- දෙන ලද දත්ත මගින් ආදායම් වෙළෙඳ අනුපාතිකය ගණනය කරයි.
- ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- අපනයනය කරනු ලබන භාණ්ඩ ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය වෙළෙඳ අනුපාතය ලෙස අර්ථ දැක්විය හැකි ය.
- වෙළෙඳ අනුපාතිකයේ ප්‍රභේද දෙකකි.

  1. භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය
  2. ආදායම් වෙළෙඳ අනුපාතිකය

- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ලෙසින් අර්ථ දක්වන්නේ ද අපනයන ඒකකයකින් ලබා ගත හැකි ආනයන භාණ්ඩ ඒකක ප්‍රමාණය ලෙස දැක්වූ වෙළෙඳ අනුපාතය ම ය.
- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහත සඳහන් පරිදි සමීකරණයක් ඇසුරෙන් දැක්විය හැකි ය.

| | | |
|---|---|---|
| භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය | = | $\dfrac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \times 100$ |

නිදසුන 1

2013 වර්ෂයේ අපනයන මිල දර්ශකය = 103.5

2013 වර්ෂයේ ආනයන මිල දර්ශකය = 108.4

භාණ්ඩ වෙළෙඳ අනුපාතය $= \dfrac{103.5}{108.4} \times 100$

$= \underline{\underline{95.47\%}}$

- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි ය.

| භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අඩු වීම කෙරෙහි බලපාන හේතු | භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වැඩි වීම කෙරෙහි බලපාන හේතු |
|---|---|
| • අපනයන මිල දර්ශකය පහත වැටී ආනයන මිල දර්ශකය ඉහළ යාම | • අපනයන මිල දර්ශකය ඉහළ හා ආනයන මිල දර්ශකය පහළ යාම |
| • ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය පහළ බැසීම | • අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය පහත වැටීම |
| • අපනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී ආනයන මිල දර්ශකය ඉහළ යාම | • අපනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී ආනයන මිල දර්ශකය පහළ යාම |
| • ආනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී අපනයන මිල දර්ශකය පහත වැටීම | • ආනයන මිල දර්ශකය ස්ථාවර ව තිබිය දී අපනයන මිල දර්ශකය ඉහළ යාම |

(මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ඇසුරෙන් භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය වෙනස් වී ඇති ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න)

- පසුගිය වසර කිහිපය තුළ භාණ්ඩ වෙළෙඳ අනුපාතය වෙනස් වී ඇති ආකාරය විශ්ලේෂණය කළ හැකි ය.

නිදසුන් :

| වර්ෂය | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය | භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය |
|---|---|---|---|
| 2010 | 100 | 100 | 100.0 |
| 2011 | 106.3 | 102.5 | 100.2 |
| 2012 | 105.2 | 103.51 | 99.6 |
| 2013 | 105.5 | 108.51 | 97.6 |
| 2014 | 105.5 | 108.51 | 97.6 |
| 2015 | 95.6 | 95.3 | 100.3 |
| 2016 | 94.1 | 90.35 | 104.0 |
| 2017 | 95.1 | 91.35 | 102.0 |

- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වෙනස් වීම්වල ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
  - භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක
    - අපනයනවල ආනයන සක්‍යතාව ඉහළ යාම
    - වෙළෙඳ ශේෂය වාසිදායක වීම
    - සමස්ත ශේෂය (ගෙවුම් ශේෂය) වාසිදායක වීම
    - සංචිත හා වත්කම් ඉහළ යාම

  - භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක
    - අපනයන හා ආනයන ශක්‍යතාව පහළ යාම
    - වෙළෙඳ ශේෂ හිඟය වැඩි වීම
    - ගෙවුම් ශේෂයේ සමස්ත හිඟය වැඩි වීම
    - සංචිත හා වත්කම් අඩු වීම

- ආදායම් වෙළෙඳ අනුපාතිකය යනු අපනයන ආදායමෙහි ආනයන ක්‍රය ශක්තිය මැනීම සඳහා භාවිත කරන දර්ශකය යි.

- ආදායම් වෙළෙඳ අනුපාතිකය මැනීම සඳහා පහත සඳහන් සමීකරණය යොදා ගනී.

$$\text{ආදායම් වෙළෙඳ අනුපාතිකය} = \frac{\text{අපනයන මිල දර්ශකය x අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} \text{X} 100$$

නිදසුන :

| | |
|---|---|
| 2013 වර්ෂයේ අපනයන මිල දර්ශකය | = 103.5 |
| 2013 වර්ෂයේ ආනයන මිල දර්ශකය | = 108.4 |
| 2013 වර්ෂයේ අපනයන පරිමා දර්ශකය | = 116.4 |
| 2013 ආදායම් වෙළෙඳ අනුපාතිකය | $= \frac{103.5 \times 116.4}{108.4} \times 100$ |
| | $= \underline{\underline{11{,}113.8}}$ |

- භාණ්ඩ වෙළෙඳ අනුපාතිකය අපනයන පරිමා දර්ශකයෙන් ගුණ කිරීමෙන් ද ආදායම් වෙළෙඳ අනුපාතිකය ලබා ගත හැකි ය.
- ආදායම් වෙළෙඳ අනුපාතිකයේ ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් පරිදි වෙන් කර දැක්විය හැකි ය.

| ආදායම් වෙළෙඳ අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක | ආදායම් වෙළෙඳ අනුපාතිකය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක |
|---|---|
| • අපනයන ඉපයුම් වැඩි වීම | • ආනයන වියදම් ඉහළ යාම |
| • අපනයන ශක්‍යතාව ඉහළ යාම | • ආනයන ශක්‍යතාව පහළ යාම |
| • වෙළෙඳ ශේෂය ඉහළ යාම | • වෙළෙඳ ශේෂය පහළ යාම |
| • ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය හිතකර තත්ත්වයකට පැමිණීම | • ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අහිතකර තත්ත්වයකට පැමිණීම |
| • උද්ධමනාත්මක බලපෑම් ඇති කිරීම | • උද්ධමනාත්මක බලපෑම් අඩු වීම |

**නිපුණතාව 09 : විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 9.4 : ගෝලීයකරණය, කලාපීයකරණය හා ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් විමසයි.**

**කාලච්ඡේද ගණන : 08**

**ඉගෙනුම් පල :**

- ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණු පැහැදිලි කරයි.
- ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යයන් විස්තර කරයි.
- ගෝලීයකරණය අර්ථ දක්වයි.
- ගෝලීයකරණයට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වී ඇති තර්ක ඉදිරිපත් කරයි.
- ආර්ථික ඒකාබද්ධ වීම් අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෙළෙඳ ගිවිසුම් විස්තර කරයි.
- ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි.
- බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන් දක්වයි.
- විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ලෝක වෙළෙඳ සංවිධානය යනු බහු පාර්ශ්වීය වෙළෙඳාමේ ප්‍රවර්ධනයටත්, වෙළෙඳාම සුමට ව සහ ක්‍රමවත් ව පවත්වා ගෙන යාමටත් වෙළෙඳාම හා තීරු බදු පිළිබඳ පොදු සම්මුතිය වඩාත් ශක්තිමත් කරමින් 1995 දී පිහිටුවා ගනු ලැබූ ජාත්‍යන්තර සංවිධානයකි.
- ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන අරමුණු කිහිපයකි.
  - බහු පාර්ශ්වීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම
  - වෙළෙඳාම ක්‍රමවත් ව පවත්වා ගෙන යාම
  - වෙළෙඳ බාධක අවම කිරීම සහ වෙළෙඳ නීති සංශෝධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ඇති කිරීම
- ලෝක වෙළෙඳ සංවිධානයේ ප්‍රධාන කාර්ය 6කි.
  1. ලෝක වෙළෙඳ සංවිධානය යටතේ සාමාජික රටවල් අත්සන් කොට ඇති ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් නිසි ලෙස ක්‍රියාත්මක වේ ද යන්න පරිපාලනය කිරීම

2. නිදහස් වෙළඳාම ප්‍රවර්ධනය කර ගැනීමට අදාළ සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම
3. වෙළෙඳපොළ ආරවුල් බේරුම් කිරීම
4. සාමාජික රටවල ජාතික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම
5. තාක්ෂණික ආධාර හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් සංවර්ධනය වන රටවලට වෙළෙඳ ප්‍රතිපත්තිය පිළිබඳ ගැටලු විසඳා ගැනීමට ආධාර කිරීම
6. වෙනත් ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම

- ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් ආර්ථිකමය, සංස්කෘතිමය හා දේශපාලනමය වශයෙන් විවිධ ප්‍රමාණයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ප්‍රවණතාව යි.
- ආර්ථික විද්‍යාවේ දී අවධානය යොමු කරනු ලබන්නේ ආර්ථික ගෝලීයකරණය කෙරෙහි ය.
- ආර්ථික ගෝලීයකරණය යනු ලෝකයේ රටවල් වෙළෙඳ, ප්‍රාග්ධන, මූල්‍ය, තාක්ෂණ, ප්‍රතිපත්ති යනාදී විවිධ ප්‍රවාහයන් ඔස්සේ එකිනෙකට ඒකාබද්ධ වීමේ ක්‍රියාවලිය යි.
- වර්තමානයේ ආර්ථික ගෝලීයකරණය තාක්ෂණය හා ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වේ.
- ගෝලීයකරණය නිසා, ලෝක ආර්ථිකයේ අන්‍යෝන්‍ය රැඳියාව, මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්ධනය, නිෂ්පාදන ක්‍රියාවලිය ජාත්‍යන්තරකරණය හා ජාත්‍යන්තර ශ්‍රම සංචලනය තීව්‍ර වේ.
- ගෝලීයකරණයට පක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.
  - නිෂ්පාදන ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීම නිසා නිෂ්පාදන හා පරිභෝජන පර්යන්තයෙන් එපිටට විතැන් වීම
  - නව අදහස් හා අත්දැකීම් ලැබීම
  - ලෝකයේ වෙළෙඳ පරිමාව ඉහළ යාම
  - ආර්ථික වෘද්ධි උපාය මාර්ගයක් ලෙස භාවිත කිරීමට හැකි වීම
  - විදේශ ආයෝජන ඉහළ යාම
  - අමුද්‍රව්‍ය අඩු මිලට ආනයනය කළ හැකි වීම
  - විදේශ සේවා නියුක්තිය ඉහළ යාම
  - අධ්‍යාපනය හා දැනුම දියුණු වීම
  - නව රැකියා අවස්ථා බිහි වීම
  - විදේශීය මුදල් ප්‍රේෂණ ඇතැම් රටවල ප්‍රධාන විනිමය ප්‍රවාහයක් බවට පත් වීම

- ලෝකයේ හුදෙකලා රටවල් එම තත්ත්වයෙන් මිදී ජාත්‍යන්තර අර්ථ ක්‍රමය සමඟ ඒකාබද්ධ වීම
- නව තාක්ෂණය ප්‍රසාරණය වීම
- තරගකාරීත්වය නිසා ගුණාත්මක නිෂ්පාදන බිහි වීම
- අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ලබා ගත හැකි වීම

- ගෝලීයකරණයට විපක්ෂ ව පහත සඳහන් තර්ක ඉදිරිපත් කළ හැකි ය.
  - ගෝලීයකරණයේ ප්‍රතිලාභ ලෝකවාසී සියලු දෙනාට සාධාරණ ව බෙදී නොයාම
  - සංවර්ධිත රටවලට වැඩි ප්‍රතිලාභ හිමි වීම
  - ජාත්‍යන්තර වශයෙන් ආදායම් විෂමතා පුළුල් වීම
  - ගෝලීය ආර්ථික අර්බුද අනෙකුත් රටවලට පහසුවෙන් ව්‍යාප්ත වීම
  - සමාජ ගැටුම් වර්ධනය වීම
  - මිනිස් ජීවිත කෙරෙහි අනාරක්ෂිත බවක් ඇති කිරීම
  - පාරිසරික ගැටලු ඇති වීම
  - සංස්කෘතිය විනාශ වීම
  - මූල්‍ය වෙළෙඳපොළ අස්ථායිතාවන් ඇති වීම නිසා ආර්ථික අර්බුද හට ගැනීම
  - දේශීය කර්මාන්ත බිඳ වැටීම හා රැකියා අහිමි වීම
  - ත්‍රස්තවාදය ව්‍යාප්ත වීම
  - සෞඛ්‍ය ගැටලු ඇති වීම

- විවිධ රටවල් අතර තීරු බදු හා තීරු බදු නොවන බාධකවලින් තොර ව භාණ්ඩ, සේවා සහ නිෂ්පාදන බාධක හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ආර්ථික ඒකාබද්ධ වීම් ලෙස හඳුන්වයි.

  ආර්ථික ඒකාබද්ධ වීම්වල විවිධ ස්වරූප පහත දැක්වේ.

  1. වර්ණීය වෙළෙඳ කලාප (Preferential Trade Agreement - PTA)
  2. නිදහස් වෙළෙඳ කලාප (Free Trade Area - FTA)
  3. තීරු බදු සංගම් (Custom Union - CU)
  4. පොදු වෙළෙඳපොළ (Common Market - CM)
  5. ආර්ථික හා මූල්‍ය සංගම් (Economic and Monetary Unions - EU)
  6. පූර්ණ ආර්ථික ඒකාබද්ධ වීම් (Fully Economic Intergration - FEI)

- සාමාජික නොවන රටවල් අතර වෙළෙඳාමේ දී භාවිත කරන වෙළෙඳ සංරෝධකවලට වඩා අඩු සංරෝධක යටතේ සාමාජික රටවල් අතර භාණ්ඩ හා

සේවා හුවමාරු කර ගැනීම සඳහා රටවල් එකතු වී පිහිටුවාගෙන ඇති සංවිධාන වර්ණිය වෙළෙඳ කලාප ලෙස හැඳින්වේ.

- මේ යටතේ ගිවිසුම්ගත රටවල් විසින් කලාපයේ අභ්‍යන්තර වෙළෙඳාම සඳහා ඒකාග්‍රතාවට බැඳුණු පොදු තීරු බදුවලින් කිසියම් ප්‍රතිශතයක් කපා හරිනු ලබයි.

  නිදසුන් ඃ

  - යුරෝපා ආර්ථික කලාපීය ගිවිසුම (Europeon Economic Area Agreement-FEA)
  - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)

- සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමඟ වෙළෙඳාමේ යෙදෙන විට එම රටවල අභිමතය පරිදි වෙළෙඳ සංරෝධක පවත්වා ගෙන යාමටත් සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාමටත් රටවල් කීපයක් එකතු වී ඇති කර ගන්නා සංවිධාන නිදහස් වෙළෙඳ කලාප වේ.

- මෙහි දී ගිවිසුම්ගත රටවල් විසින් ඒකග වූ තීරු බදු කාණ්ඩවලට අයත් තීරු බදු මුළුමනින් ම ඉවත් කෙරේ.

- නිදහස් වෙළෙඳ කලාප සඳහා නිදසුන් පහත දැක් වේ.

  - අප්‍රිකානු නිදහස් වෙළෙඳ කලාපය (Agrican Free Trade Zone - AFTZ)
  - ආසියානු පැසිපික් නිදහස් වෙළෙඳ කලාපය (Asian Fasific Free Trade Zone - AFTZ)
  - අප්‍රිකානු නිදහස් වෙළෙඳ කලාපය (Agrican Free Trade Zone - AFTZ)
  - මධ්‍යම යුරෝපා නිදහස් වෙළෙඳ කලාපය (Agrican Free Trade Zone - AFTZ)
  - උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ කලාපය (North American Free Trade Zone - NAFTZ)

- සාමාජික රටවල් අතර වෙළෙඳාම වෙළෙඳ සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාම සඳහාත් සාමාජික සහ සාමාජික නොවන රටවල් අතර එක සමාන වෙළෙඳ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යාම සඳහාත් රටවල් කීපයක් එකතු වී ඇති කර ගන්නා සංගම් තීරු බදු සංගම් නමින් හැඳින්වේ.

- මෙහි දී ගිවිසුම්ගත භාණ්ඩ කාණ්ඩවලට අදාළ වෙනත් රටවලින් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා සමාන තීරු බදු ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ගිවිසුම්ගත භාණ්ඩ කාණ්ඩ සඳහා සංගමයේ සාමාජිකත්වය දරන රටවල තීරු බදු මුළුමනින් ම ඉවත් කෙරේ.

- තීරු බදු සංගම් සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ.

- මධ්‍යම අමෙරිකානු පොදු වෙළෙඳපොළ (Central Acerican Common Market - CACM
- කැරිබියානු ප්‍රජාව (Caribbean Community - CARICOM)
- උතුරු අමෙරිකානු ප්‍රජාව (North American Community - NAC)
- දකුණු අප්‍රිකානු තීරු බදු සංගමය (South Aprican Cutsoms Union - SACU)
- උතුරු අමෙරිකානු ප්‍රජාව (North American Community - NAC)
- සාමාජික රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාමටත් සාමාජික රටවල් සාමාජික නොවන රටවල් සමඟ වෙළෙඳාම පවත්වා ගෙන යාමේ දී පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමටත් සාමාජික රටවල් අතර නිෂ්පාදන සාධක නිදහසේ සංචලනය කිරීමටත් රටවල් ඒකාබද්ධ වීම පොදු වෙළෙඳපොළ නමින් හැඳින්වේ.
- මේ යටතේ ශ්‍රමය හා ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක හා භාණ්ඩ හා සේවා ගිවිසුම්ගත රටවල් අතර බාධකයකින් තොර ව සංචලනය කිරීමේ හැකියාව ලැබේ.
- පොදු වෙළෙඳපොළ සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ.
    - කැරිබියන් කොමියුනිටි පොදු වෙළෙඳපොළ (The Caribbean Community & Common Market)
    - මධ්‍යම ඇමරිකානු පොදු වෙළෙඳපොළ (Central American Common Market)
    - මධ්‍යම අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය (Central African Economic & Monetary Community)

- සාමාජික රටවල් අතර වෙළෙඳාම සංරෝධකවලින් තොර ව පවත්වා ගෙන යාමටත් සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා වෙළෙඳාම පොදු ප්‍රතිපත්තියක් යටතේ පවත්වා ගෙන යාමටත් සාමාජික රටවල් අතර ශ්‍රමය හා ප්‍රාග්ධනය නිදහසේ සංචලනය කිරීමටත් සාමාජික රටවල් අතර එක හා සමාන මූල්‍ය ප්‍රතිපත්තියක් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමටත් රටවල් කීපයක් එකතු වී පිහිටුවා ගන්නා සංගම් ආර්ථික හා මූල්‍ය සංගම් යනුවෙන් හැඳින්වේ.
    - ආර්ථික හා මූල්‍ය සංගම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
    - මධ්‍යම අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය (Central African Economic & Monetary Community - CEMAC)
    - බටහිර අප්‍රිකානු ආර්ථික හා මූල්‍ය සංගමය (Economic Community West African - ECOWAS)

- යුරෝපා මූල්‍ය හා ආර්ථික සංගමය
  (Europen Economic & Monetary Union - EMU)

- සාමාජික හා සාමාජික නොවන රටවල් අතර භාණ්ඩ හා සේවා සහ නිෂ්පාදන සාධක හුවමාරු කිරීමේ දී සංරෝධකවලින් තොර ව කටයුතු කිරීම සඳහාත් සාමාජික රටවල් අතර ඒකීය මූල්‍ය ප්‍රතිපත්තියක්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ හා දේශපාලන ප්‍රතිපත්ති පවත්වා ගෙන යාම සඳහාත් ලෝකයේ රටවල් එකතු වීම පූර්ණ ඒකාබද්ධ වීම ලෙස හැඳින්වේ.
- ආර්ථික ඒකාබද්ධ වීම් සඳහා අත්සන් කරනු ලබන ගිවිසුම් වර්ග දෙකකට බෙදිය හැකි ය.

  1. ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්
  2. බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්

- වෙළෙඳාම හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් දෙකක් අතර ඇති කර ගන්නා වෙළෙඳ ගිවිසුම් ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් ලෙස හැඳින්වේ.
- වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළත් වී සිටින ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් පහත දැක්වේ.
  - ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA)
  - පාකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA)
- වෙළෙඳාම හා  මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රටවල් කිහිපයක් අතර ඇති කර ගන්නා වෙළෙඳ ගිවිසුම් බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් වේ.
- ශ්‍රී ලංකාව ඇතුළත් වී සිටින බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් කිහිපයක් පහත දැක්වේ.
  - දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම  (SAFTA)

(වෙළෙඳ ගිවිසුම් පිළිබඳ කාලීන තොරතුරු සිසුන්ට ලබා දෙන්න).

- විදේශ වෙළෙඳ ගිවිසුම්වල ඇති වැදගත්කම පහත දැක්වේ.
  - රටවල් අතර සහයෝගීතාව වර්ධනය වීම
  - වෙළෙඳපොළ පුළුල් වීම
  - ප්‍රවාහණ පිරිවැය අඩු වීම
  - දේශීය වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන් පහළ යාම
  - විදේශ ආයෝජන වර්ධනය වීම
  - නව කාර්මික භාණ්ඩ අඩු මිලකට ලබා ගත හැකි වීම
  - සේවා නියුක්තිය ඉහළ යාම
  - අමුද්‍රව්‍ය මිල පහළ යාම
  - අපනයන විවිධාංගීකරණයට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වීම

**නිපුණතාව 09 : විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 9.5 : ශ්‍රී ලංකා විදේශ වෙළෙඳාමේ ස්වභාවය හා විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති විමර්ශනය කරයි.**

**කාලච්ඡේද ගණන** : 08

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳාම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ අපනයනය ව්‍යූහය විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳාම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යූහය මහ බැංකු වාර්තා දත්ත අනුව විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ ආනයන උපනති මහ බැංකු වාර්තා දත්ත අනුව පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති (කාලීන තොරතුරු ඇසුරෙන්) විස්තර කරයි.
- අපනයන වෙළෙඳාමේ දී මුහුණ පාන ගැටලු විස්තර කරයි.
- අපනයන වෙළෙඳාම මුහුණ දෙන ගැටලු සහ ඒවාට විසඳුම් ඉදිරිපත් කරයි.

**පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

- ශ්‍රී ලංකාවේ වැඩි ම විදේශ විනිමයක් උපයන භාණ්ඩ හා වැඩි විදේශ විනිමයක් වැය කර මිලට ගන්නා භාණ්ඩ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ආසන්න වර්ෂයට අදාළ ව මහ බැංකු වාර්තාව ඇසුරෙන් එම භාණ්ඩ හා සේවා වෙන් කිරිමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- ශ්‍රී ලංකාව භාණ්ඩ හා සේවා රාශියක් අපනයනය හා ආනයනය කරන බව සිසුන්ව දැනුවත් කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් මාතෘකාව අතුරෙන් ඔබ කණ්ඩායමට ලැබෙන මාතෘකාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - අපනයන වෙළෙඳාම
    - ආනයන වෙළෙඳාම
- ඔබට ලැබී ඇති මාතෘකාව හඳුනා ගැනීමට කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයන්න.

- මාතෘකාවට අදාළ ව සංරචක පෙළගස්වන්න.
- එම සංරචකවලට අදාළ ව සාපේක්ෂ දායකත්වය ප්‍රතිශතාත්මක ව පෙන්වන්න.
- කාලයක් තුළ එම සංරචකවල දායකත්වයේ හා ව්‍යුහයේ සිදු වී ඇති වෙනස් වීම වගු ගත කරන්න.
- එම වෙනස් වීම්වලට බලපා ඇති කරුණු දක්වන්න.
- ඔබ කණ්ඩායමේ අනාවරණ නිර්මාණශීලී ව වගු, ප්‍රස්තාර හා ප්‍රතිශතක මගින් නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් ඃ**

- කිසියම් රටක් ලෝකයේ වෙනත් රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළෙඳාම යි.

  නිදසුන් ඃ ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදයට තේ අලෙවි කිරීම
- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  - කෘෂිකාර්මික අපනයන
  - කාර්මික අපනයන
  - ඛනිජ ද්‍රව්‍ය අපනයන
  - වර්ග නොකළ අපනයන

    ( මහ බැංකු වාර්තාව ඇසුරෙන් ආසන්න වර්ෂයක අපනයන ව්‍යුහය පැහැදිලි කරන්න).

- ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ප්‍රතිශතාත්මක ව දැක්විය හැකි වේ.

| | **2015** | **2016** |
|---|---|---|
| කෘෂිකාර්මික අපනයනය | 23.5% | 22.6% |
| කාර්මික අපනයනය | 76% | 77% |
| ඛනිජ ද්‍රව්‍ය අපනයනය | 0.3% | 0.3% |
| වර්ග නොකළ අපනයන | 0.2% | 0.1% |

( මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ඇසුරෙන් පැහැදිලි කරන්න).

- අපනයනය කරනු ලබන කෘෂිකාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි ය.

  තේ, රබර්, පොල්, අනෙකුත් කෘෂිකාර්මික අපනයන
- අපනයනය කරනු ලබන කාර්මික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි දැක්විය හැකි ය.

* ආහාරපාන වර්ග හා දුම්කොළ
* රෙදිපිළි හා ඇඟලුම්
* ඛනිජ නිෂ්පාදිත
* රබර් නිෂ්පාදිත
* පිඟන් නිෂ්පාදිත
* සම්, ගමන් මලු පාවහන්
* යන්ත්‍ර සූත්‍ර හා  උපකරණ
* දියමන්ති හා ස්වර්ණාභරණ
* අනෙකුත් කාර්මික අපනයන

* අපනයනය කරනු ලබන ඛනිජ ද්‍රව්‍යවලට නිදසුන් පහත දැක් වේ.
    * මැණික්
    * අනෙකුත් ආයෝජන භාණ්ඩ අපනයනය

* 1977 න් පසු අපනයන ව්‍යුහයේ වෙනස්වීම වර්තමානය දක්වා පහත ආකාරයට පෙන්වා දිය හැකි ය.

| අපනයන ව්‍යුහය | 1977 | 2016 |
|---|---|---|
| කෘෂිකාර්මික භාණ්ඩ | 79% | 22% |
| කාර්මික භාණ්ඩ | 14% | 77% |
| වෙනත් | 07% | 01% |

( මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ඇසුරෙන් පැහැදිලි කරන්න).

* කාර්මික භාණ්ඩ අපනයනය වෙනස් වීම 1977 සිට 2015 දක්වා විස්තරාත්මක ව පහත වගුවෙන් දැක්වේ.

| **කාර්මික භාණ්ඩ** | **1977** | **2015** | **2016** |
|---|---|---|---|
| රෙදිපිළි හා ඇඟලුම් | 02% | 46% | 47% |
| ඛනිජ තෙල් නිෂ්පාදනය | 09% | 04% | 05% |
| ආහාරපාන හා දුම්කොළ | - | 03% | 03% |
| දියමන්ති හා ස්වර්ණාභරණ | - | 03% | 03% |
| රබර් නිෂ්පාදන | - | 07% | 7% |
| අනෙකුත් කාර්මික භාණ්ඩ | 03 | 06% | 08% |
| ප්‍රවාහණ උපකරණ | - | 2.3 | 01% |
| සම්භාණ්ඩ ප්‍රවාහන හා පාවහන් උපකරණ | - | 1.3 | 2% |

- යම් රටක් ලෝකයේ වෙනත් රටවලින් භාණ්ඩ හා සේවා මිල දී ගැනීම ආනයන වෙළෙඳාම යි.
- ශ්‍රී ලංකාවේ  ආනයන ව්‍යූහය පහත පරිදි දැක්විය හැකි ය.
  - ශ්‍රී ලංකාව ජපානයෙන් වාහන මිල දී ගැනීම
  - පරිභෝජන භාණ්ඩ
  - අන්තර් භාණ්ඩ
  - ආයෝජන භාණ්ඩ
  - වර්ග නොකළ භාණ්ඩ
    (2016 මහ බැංකු වාර්තාවට අනුව)
- ආනයනය කරන පරිභෝගික භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  - සහල්, සීනි, තිරිගු පිටි, කිරි පිටි
  - පෞද්ගලික මෝටර් රථ
  - විදුලි උපකරණ
- ආනයනය කරන අන්තර් භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  - ඛනිජ තෙල්
  - පොහොර
  - රසායනික ද්‍රව්‍ය
  - රෙදිපිළි හා ඇඟලුම්
- ආනයනය කරන ආයෝජන භාණ්ඩවලට නිදසුන් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
  - යන්ත්‍ර සූත්‍ර හා  උපකරණ
  - ප්‍රවාහණ උපකරණ
  - ගොඩනැගිලි ද්‍රව්‍ය
- 1977 සිට 2015 දක්වා ආනයන ව්‍යූහය කාලීන වශයෙන් වෙනස් වී ඇති ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.

| ආනයන ව්‍යූහය | 1977 | 2015 | 2016 |
|---|---|---|---|
| පාරිභෝගික භාණ්ඩ | 42% | 25% | 22% |
| අන්තර් භාණ්ඩ | 48% | 51% | 51% |
| ආයෝජන භාණ්ඩ | 12% | 24% | 27% |
| වෙනත් | 01 | - | - |

- අන්තර් භාණ්ඩවල වෙනස්වීම් 1997 සිට 2016 දක්වා සවිස්තරාත්මක ව පහත දැක්වේ.

| අන්තර් භාණ්ඩ | 1977 | 2015 | 2016 |
|---|---|---|---|
| බොර තෙල් | 23% | 14.3% | 12.8% |
| රෙදිපිළි | 03% | 12% | 14% |
| දියමන්ති | - | 0.9% | 3% |
| රසායනික නිෂ්පාදන | 01% | 4.6% | 4.4% |
| තිරිඟු සහ ඉරිඟු | 01% | 1.9% | 1.3% |
| පොහොර | - | 1.5% | 0.7% |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | - | 15.7% | 15.1% |

(ඉහත තොරතුරු 2016 මහ බැංකු වාර්තා අනුව ඉදිරිපත් කර ඇති අතර ආසන්න වර්ෂයක මහ බැංකු වාර්තාව පරිශීලනය කරමින් ඉහත පරිදි අවශ්‍ය තෙරතුරු සිසුන්ට ලබා දෙන්න).

- ශ්‍රී ලංකාවේ වෙළෙඳ ප්‍රතිපත්තිය ගැන සලකා බැලීමේ දී පහත සඳහන් කරුණු 2016 මහ බැංකු වාර්තාව අනුව දැක්විය හැකි ය.
  - ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සබැඳියාව වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියක් 2015 හා 2016 වසරේ දී අඛණ්ඩ ව ක්‍රියාත්මක විය.
  - විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම සඳහා රජය පුළුල් ව්‍යුහාත්මක වෙනස්කම් රාශියක් යෝජනා කරන ලදි.
  - වෙළෙඳාම තීරණය වන නීති රෙගුලාසි වෙනස් කිරීමට ප්‍රයත්න දැරීම
  - වෙළෙඳ ගිවිසුම් ඇති කිරීම මගින් විදේශ වෙළෙඳපොළ වෙත ශක්තිමත් ප්‍රවේශයක් ඇති කිරීම
  - උපාය මාර්ගික වෙළෙඳ ප්‍රවර්ධනය
  - වෙළෙඳ තීරු බදු ප්‍රතිපත්තිය තව දුරටත් තා්ර්කීකරණය
  - නොබැඳි විදේශ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අපනයනය ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබා දීම
  - ආනයන තාර්කී කරණය සඳහා ද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම
  - ආයෝජන ප්‍රවර්ධනය සඳහා උපකාරී වන ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹීම
  - ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන බහුපාර්ශ්වීය ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩ ව සම්බන්ධ වීම

අපනයන වෙළෙඳාමේ දී මුහුණ දෙන ගැටලු ලෙස ඃ

- අපනයන බෝගවල මිල උච්චාවචනය වීම
- අපනයන පරිමාව අඩු වීම
- ලෝක වෙළෙඳපොළේ ඇති දැඩි අවිනිශ්චිතතාවය
- ගෝලීය ආර්ථික අවපාතය
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් වර්ධනය මන්දගාමී වීම

ඉහත ගැටලුවලට විසඳුම් ලෙස ඉදිරිපත් කළ හැකි කරුණු

- ගෝලීය ආර්ථිකය හා ශ්‍රී ලංකාව අතර ඇති සම්බන්ධතාව වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වීම
- විදේශ වෙළෙඳපොළවල සිදු කරන අලෙවිකරණ හා ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන් ඉහළ නැංවීම
- වෙළෙඳ ගිවිසුම් ඵලදායි ලෙස ශක්තිමත් කිරීම
- නව අපනයන වෙළෙඳපොළවල් ආරක්ෂා කර ගැනීමට හා දැනට පවතින වෙළෙඳපොළවල් පුළුල් කිරීම හා භාණ්ඩ විවිධාංගීකරණය කිරීම
- අපනයනය කෙරෙහි යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ආයතන ස්ථාපිත කිරීම
- අපනයන සංවර්ධනය සඳහා කවුන්සලයක් පිහිටුවීම

**නිපුණතාව 10.0 : ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කරයි.**

**නිපුණතා මට්ටම 10.1 : ගෙවුම් ශේෂ ලේඛනයේ අන්තර්ගතය විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- ගෙවුම් ශේෂ ලේඛනය අර්ථ දක්වයි.
- ගෙවුම් ශේෂ ලේඛනයේ සංරචක නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- කල්පිත සංඛ්‍යා ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයක් පිළියෙළ කරයි.
- මහ බැංකු වාර්තාව ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයේ කාලීන ආකෘතිය ඉදිරිපත් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාව 2013 වර්ෂයේ සිට නව ආකෘතියට අනුව ගෙවුම් තුලන ලේඛනය / **ගෙවුම් ශේෂ ලේඛනය** පිළියෙළ කිරීමට පියවර ගෙන ඇත.

- ගෙවුම් තුලන ලේඛනය /**ගෙවුම් ශේෂ ලේඛනය** යනු වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ රටක් විසින් සෙසු ලෝකය සමග කරන ලද ආර්ථික ගනුදෙනු හේතුවෙන් වෙනත් රටවලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන විදේශ මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනයකි.

- මෙමගින් කිසියම් රටක් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන සියලු ආර්ථික ගනුදෙනු ක්‍රමානුකූල ව ද්විත්ව ගිණුම්කරණ මූලධර්මය මත සටහන් කෙරේ.

- ගෙවුම් තුලන ලේඛනයක ඇතුළත් කරන ගනුදෙනු වාර්තා කිරීමේ දී අනුගමනය කරන මූලික සම්මතය වනුයේ සෑම ගනුදෙනුවක් ම එක හා සමාන වටිනාකමින් දෙතැනක සටහන් කළ යුතු වීම යි.

- මෙම ගනුදෙනු සටහන් කිරීමේ දී සෑම ගනුදෙනුවකට ම වටිනාකම හර අගයක් සහ බැර අගයක් වශයෙන් තීරු දෙකක සටහන් කළ යුතු අතර බැර වටිනාකම (+) ලකුණින් සහ හර වටිනාකම (-) ලකුණින් සටහන් කළ යුතු වේ.

- මෙලෙස ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලු ම ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක සහ හර තීරුවක සටහන් කළ විට සියලු ගනුදෙනුවල ශුද්ධ ශේෂය ශුන්‍ය අගයක් ගනී "ගෙවුම් තුලන ලේඛනය සෑම විට ම තුලනය වේ" යනුවෙන් අදහස් වන්නේ මෙය යි.

- ගෙවුම් තුලන ලේඛනයේ "හර" සහ "බැර" අගයන් වෙන් වෙන් ව සටහන් කිරීමේ දී මූලධර්ම දෙකක් අනුගමනය කළ යුතු ය.
- භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටෙන් වෙනත් රටකට බැහැර වන විට එම අයිතමයේ වටිනාකම බැර වටිනාකමක් (+) ලෙස සටහන් කළ යුතු වේ.

  **නිදසුන්** : ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයන කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ බැර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.
- භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටට වෙනත් රටකින් ලැබෙන විට එම අයිතමයේ වටිනාකම හර වටිනාකමක් (-) ලෙස සටහන් කළ යුතු වේ.

  **නිදසුන්** :ශ්‍රී ලංකාවට මැද පෙරදිග රටකින් ඛනිජ තෙල් ආනයන කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ හර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.
- නව ආකෘතියට අනුව ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් ගනුදෙනු පස් වැදෑරුම් වේ. එනම්,
  - භාණ්ඩ සහ සේවා අපනයනය කිරීම සහ ආනයනය කිරීමට අදාළ ගනුදෙනු
  - ආදායම් ලැබීම හා ගෙවීම ආශ්‍රිත ගනුදෙනු
  - වත්කම්, ධනය, ත්‍යාග වැනි දෑ පිළිබඳ ව ඒක පාර්ශ්වීය ව සිදු කරන ගනුදෙනු
  - නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු
  - මූල්‍ය වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු
- එම ගනුදෙනුවල ස්වභාවයන් අනුව ගෙවුම් තුලන ලේඛනයේ නව ආකෘතියට අනුව ප්‍රධාන ගිණුම් 3 කි.
  - ජංගම ගිණුම
  - ප්‍රාග්ධන ගිණුම
  - මූල්‍ය ගිණුම
- ජංගම ගිණුම නැවත කොටස් තුනකි. එනම්,
  1. භාණ්ඩ හා සේවා ගිණුම
     - 1.1 භාණ්ඩ ගිණුම
     - 1.2 සේවා ගිණුම
  2. ප්‍රාථමික ආදායම් ගිණුම
  3. ද්විතීයක ආදායම් ගිණුම

- ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ ගනුදෙනු කිහිපයක නිදසුන් පහත දැක්වේ.
    1. ශ්‍රී ලංකාවේ ඇඟලුම් සමාගමක් මිලියන 500ක් වටිනා ඇඟලුම් තොගයක් අපනයනය කිරීම
    2. ජපානයේ මෝටර් රථ සමාගමකින් මිලියන 1000ක් වටිනා මෝටර් රථ අපනයනය කිරීම
- මෙම නිදසුන සම්බන්ධ ගනුදෙනුව භාණ්ඩ ගිණුමට ඇතුළත් වේ. ලෝකයේ එක් රටක් සෙසු රටවල් සමඟ සිදු කරන භාණ්ඩ අපනයන හා ආනයනය පිළිබඳ ව සටහන් කරන ගිණුම භාණ්ඩ ගිණුම හෙවත් වෙළෙඳ ගිණුම ලෙස හැඳින්වේ.
    - මෙම වෙළෙඳ ගිණුමේ මූල්‍ය නොවන රත්‍රන් පෞද්ගලික අංශයේ වටිනාකම් සන්නිධියක් ලෙස සටහන් වේ.
- මෙම වෙළෙඳ ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂය ලෙස හඳුන්වයි. දෘශ්‍ය භාණ්ඩ ගිණුමේ ශේෂය ලෙස ද එය හඳුන්වයි.

වෙළෙඳ ශේෂය = භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය

1 නිදසුන : -500 = ඇඟලුම් අපනයනය 500 - ඇඟලුම් ආනයනය 1000

(ඩොලර් මිලියන)

- වෙළෙඳ ගිණුමේ ශේෂය අතිරික්තයක් හෝ (+) හිඟයක් හෝ (-) විය හැකි ය. ඉහත නිදසුන අනුව වෙළෙඳ ගිණුමේ ශේෂය ඍණ අගයකි.
- අන්තර් ජාතික වෙළෙඳාමේ දී රටක් අනෙකුත් රටවල් සමඟ සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම සේවා ගිණුමේ වේ.
- සේවා ගිණුමට පහත සඳහන් සංරචක අයත් වේ.
    - සංචාරක සේවා
    - මුහුදු ප්‍රවාහණ
    - ගුවන් ප්‍රවාහණ
    - මූල්‍ය සේවා
    - විදුලි සන්දේශ සේවා
    - රක්ෂණ සේවා

| |
|---|
| සේවා ගිණුමේ ශේෂය = සේවා අපනයන ආදායම - සේවා ආනයන වියදම |

- සේවා ගිණුමේ ශේෂය අතිරික්තයක් (+) හෝ හිඟයක් (-) විය හැකි ය.
- භාණ්ඩ ගිණුමේ ශේෂය සේවා ගිණුමේ ශේෂය ගැලපීමෙන් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය ලැබේ.

| |
|---|
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය = භාණ්ඩ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය |

- ශ්‍රී ලංකාවේ විදේශ ගනුදෙනු සම්බන්ධ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
  1. ශ්‍රී ලංකාවේ විදේශීය රටවලින් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොළිය මිලියන 500ක් ගෙවීම
  2. ශ්‍රී ලාංකික සමාගමක් මාලදිවයිනේ ඇඟලුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 300ක් ලාභාංශ ලැබීම

  මෙම නිදසුන් සම්බන්ධ ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුළත් වේ.

ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සාධක ලැබීම් - විදේශ සාධක ගෙවීම්

2 නිදසුන : (-200) = විදේශ සාධක ලැබීම් 300 - විදේශ සාධක ගෙවීම් 500 (ඩොලර් මිලියන)

- ප්‍රාථමික ආදායම ගිණුමට ඇතුළත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැන නඟින පොළී, වැටුප් හා මූල්‍ය වත්කම් ආයෝජනයෙන් උපයා ගන්නා ලාභාංශ ආදිය යි.
- ශ්‍රී ලංකාවේ නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදු වන ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.
  - මැදපෙරදිග සේවය කරන ලාංකිකයන් තම ඥාතීන්ට මිලියන 1500ක ප්‍රේෂණ වශයෙන් වාණිජ බැංකුව වෙත එවීම
  - ශ්‍රී ලංකාවේ චීන ජාතිකයන් තම ඥාතීන් වෙත මිලියන 500ක ප්‍රේෂණ චීනයේ බැංකුවක් වෙත යැවීම

නිදසුන :

ගිණුමේ ශේෂය = විදේශ සංක්‍රාම ලැබීම් - විදේශ සංක්‍රාම ගෙවීම

1000 = විදේශ සංක්‍රාම ලැබීම් 1500 - විදේශ සංක්‍රාම ගෙවීම් 500
(ඩොලර් මිලියන)

- ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමට ඇතුළත්
    - භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය
    - ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය
    - ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය ගැලපීමෙන් ජංගම ගිණුමේ ශේෂය ලැබේ.

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | 500 | 1000 | - 500 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | 300 | 500 | - 200 |
| ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය | 1500 | 500 | 500 |
| ජංගම ගිණුමේ ශේෂය | | | - 200 |

- මූල්‍ය වත්කම් මූල්‍ය ගිණුම තුළ ඇතුළත් වන අතර නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ප්‍රාග්ධන ගිණුමේ සටහන් කරනු ලැබේ.
- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදු වන ගනුදෙනු ප්‍රාග්ධන ගිණුමේ හර - බැර ලෙස සටහන් වේ.

- නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම් කිහිපයක් පහත දැක්වේ.
    - බලපත්‍ර
    - බදු ගිවිසුම්
    - සන්නම්
    - කීර්ති නාමය විකිණීම / මිල දී ගැනීම
    - තානාපති කාර්යාලයයකට ඉඩම් විකිණීම
    - ජාත්‍යන්තර ආයතන / රජයෙන් ලබා දෙන ප්‍රදාන
    - පේටන්ට් බලපත්‍ර (ස්වාධිකාරී අයිතිය)
    - පුරස්කාර
- ගෙවුම් තුලන ලේඛනයේ අවසාන උප ගිණුම මූල්‍ය ගිණුමයි.

- නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදු වන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු මූල්‍ය ගිණුමෙහි වාර්තා කෙරේ.

- කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුමේ ගනුදෙනු ප්‍රධාන වශයෙන් කොටස් පහකට බෙදිය හැකි ය. එනම්,
    - සෘජු ආයෝජන
    - කලඹ ආයෝජන
    - මූල්‍ය ව්‍යුත්පන්න
    - වෙනත් ආයෝජන
    - විදේශ සංචිත වත්කම්

  කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව එම රට අවශේෂ ලෝකය සමග ශුද්ධ ණය හිමියෙක් ද (ගෙවුම් තුලන අතිරික්තයක්) නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද ( ගෙවුම් තුලන හිඟයක් ද යන්න පෙන්නුම් කරයි.

- ද්විත්ව ගිණුම් මූලධර්මයට අනුව ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතු අතර කිසියම් සංඛ්‍යානමය වරදක් නිසා අසමානතාවක් හටගතහොත් ''ශුද්ධ වැරදීම් හා අත්හැරීම් යන අයිතමය යොදා ගනිමින් එම සමානත්වය ඇති කෙරේ.

- මූල්‍ය ගිණුම මගින් පෙන්නා දෙන්නේ රටක ශුද්ධ ණයහිමි බව හෝ ශුද්ධ ණය ගැතිබව මූල්‍යනකරණය කෙරෙන ආකාරයයි.

- ගෙවුම් තුලන ලේඛනයේ එක් එක් ගිණුම්වලට අයත් අයිතමයන් කල්පිත සංඛ්‍යා ලේඛන ඇතුළත් කර ඉදිරිපත් කළ හැකි ය.

(රු. මිලියන)

| අයිමය | බැර | හර |
|---|---|---|
| වෙළෙඳ ගිණුම | | |
| අපනයනය | 1000 | |
| ආනයනය | | 1300 |
| මූල්‍ය නොවන රත්රන් ලැබීම් | 150 | |
| මූල්‍ය නොවන රත්රන් ගෙවීම් | | 200 |
| සේවා ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 600 |
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | | (150) |
| ප්‍රාථමික ආදායම් ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 1000 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | | (200) |
| ද්විතීයක ආදායම් ගිණුම | | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම් | 1800 | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ගෙවීම් | | 800 |
| රජයේ සංක්‍රාම ලැබීම් | 400 | |
| ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය | 1400 | |
| ජංගම ගිණුමේ ශේෂය | 1050 | |

| අයිමය | බැර | හර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| ප්‍රාග්ධන ගිණුම - ලැබීම් | 600 | |
| ප්‍රාග්ධන ගිණුම - ගෙවීම් | | 300 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 300 | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 1350 | |
| මූල්‍ය ගිණුම | | |
| ඍජු ආයෝජන : වත්කම් | 150 | |
| ඍජු ආයෝජන : වගකීම් | | 100 |
| විවිධ ආයෝජන : වත්කම් | 200 | |
| විවිධ ආයෝජන : වගකීම් | | 150 |
| අනෙක් ආයෝජන : වත්කම් | 150 | |
| අනෙක් ආයෝජන : වගකීම් | | 50 |
| සංචිත වත්කම් (ශුද්ධ) | 250 | |
| මූල්‍ය ගිණුමේ ශේෂය | 450 | |

(ගෙවුම් ශේෂ ලේඛනයක කාලීන ආකෘතියක් ගෙන සිසුන්ට පැහැදිලි කරන්න.)

- ඉහත කල්පිත ගෙවුම් තුලන ලේඛනයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේසය රු.මි. 1350ක් වන අතර මූල්‍ය ගිණුමේ ශේෂය රු. මි. 450ක් වේ. ද්විත්ව සටහන් මූලධර්මය අනුව ඉත ශේස දෙක සමාන විය යුතු ය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීමේ ශේෂ දෙක සමාන විය යුතු ය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීම් රු.මි. 900 ක් ලෙස ගෙන ඉහත ශේෂ දෙන සමාන කළ හැකි ය.

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.2 : ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කරයි.**

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ඇසුරෙන් ගෙවුම් ශේෂ ලේඛනයේ උපනති පැහැදිලි කරයි.
- ජංගම ගිණුමේ හිඟයේ ස්වරූපය පැහැදිලි කරයි.
- ගෙවුම් තුලනයේ අසමතුලිතතාව නිවැරදි කිරීමට කෙටි කාලීන විසඳුම් යෝජනා කරයි.
- ගෙවුම් තුලන ලේඛනයක හිඟයක් අඛණ්ඩව පවතී නම් එයට දිගු කාලීන විසඳුම් යෝජනා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගෙවුම් තුලන ලේඛනයේ 2013 සිට 2016 දක්වා ගිණුම්වල උපනතින් පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුව 01න් පෙන්නුම් කරයි.

| වර්ෂය | භාණ්ඩ සහ සේවා ගිණුමේ ශේෂය | ප්‍රාථමික ආදායම් ගිණුමේ | ද්විතීයක ආදායම් ගිණුමේ | ජංගම ගිණුමේ ශේෂය | ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | මූල්‍ය ගිණුමේ ශේෂය | සමස්ත ගිණුමේ ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| 2012 | - 8155 | -1219 | 5392 | -3982 | 130 | 4263.4 | 151.2 |
| 2013 | - 6429 | -1817 | 5639 | -2607 | 71 | 30637 | 958.4 |
| 2014 | - 6407 | -1808 | 6227 | -1988 | 58.3 | -1536.1 | 1369 |
| 2015 | - 6105 | -2097 | 6193 | -2008.5 | 46.3 | -2312.3 | -149 |
| 2016 | - 6211 | - 2184 | 6453 | - 1942 | 26 | 2199 | - 500 |

මහ බැංකු වාර්තාව

- ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝ කාලීන හිඟයක් පවතී.
- භාණ්ඩ ගිණුම් ශේෂය (වෙළෙඳ ශේෂය) දීර්ඝ කාලීන හිඟයක් පෙන්නුම් කරයි. සේවා ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කරයි.
- භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය පසුගිය වසර කීපය තුළ උච්චාවචනයට ලක් වී ඇත. (මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.)
- භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂයේ පවතින හිඟය පිළිබඳ දත්ත විශ්ලේෂණයක් පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුවෙන් ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | භාණ්ඩ ගිණුමේ ශේෂය | සේවා ගිණුමේ ශේෂය | භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය |
|---|---|---|---|
| 2012 | -9417 | 1262 | - 8155 |
| 2013 | - 7609 | 1180 | - 6429 |
| 2014 | - 8287 | 1880 | - 6407 |
| 2015 | - 8430 | 2325 | - 6105 |
| 2016 | -9090 | 2879 | - 7211 |

- වගුව 01 මගින් ප්‍රාථමික ආදායම් ගිණුමේ පවතින හිඟය ඉහළ යාම පෙන්නුම් කරන අතර එම හිඟය ජංගම ගිණුමේ හිඟය කෙරෙහි බලපා ඇත.
- ද්විතීයක ආදායම් ගිණුමේ ශුද්ධ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන අතර එය ක්‍රමක් ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරයි. එය ඉහළ යාම නිසා ජංගම ගිණුමේ අඩු වේ.
- 2010 වර්ෂයේ සිට මූල්‍ය ගිණුම ධන අගයක් ගෙන 2014 සිට හිඟයක් පෙන්නුම් කරයි.
- ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝ කාලීන හිඟයක් පෙන්නුම් කරයි. එය 1977 වර්යේ දි පමණක් ධන අගයක් ගෙන ඇති අතර ආර්ථිකය විවෘත වීමත් සමග දීර්ඝ කාලීන හිඟයක් පෙන්නුම් කරයි. (මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.)
- ජංගම ගිණුමේ ශේෂය ලබා ගන්නේ වෙළෙඳ ශේෂය, සේවා ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සහ ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය එකට ගැළපීමෙන් ය. ජංගම ගිණුමේ ශේෂය හිඟය තීව්‍රතාවට වෙළෙඳ ශේෂය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සෘණ අගයක් ගැනීම හේතු වී ඇත.
- ගෙවුම් තුලන ලේඛනයේ අසමතුලිතතාව ලෙස හඳුන්වන්නේ සමස්ත ශේෂයේ හිඟයක් හෝ අතිරික්තයක් හෝ පැවතීම යි.
- කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව එම රට අවශේෂ ලෝකය සමඟ ශුද්ධ ණය හිමියෙක් ද නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද යන්න පෙන්නුම් කරයි.
- ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අතිරික්තකට වඩා හිඟයක් පෙන්නුම් කරන විට ආර්ථික වශයෙන් ඉතා ප්‍රබල ප්‍රතිවිපාක ඇති කරයි. එම නිසා ගෙවුම් ශේෂයේ කෙටි කාලීන හිඟය පියවීමට අවධානය යොමු කළ යුතු වේ.
- කෙටි කාලීන ව හිඟය පියවන්නේ කෙසේ ද යන්න කෙටි කාලීන මූල්‍යයනය

කිරීම ලෙස හඳුන්වයි.

- කෙටි කාලීන මූල්‍යායනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.
    - විදේශ සංචිත යොදා ගැනීම
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සමීපස්ථ ණය ලබා ගැනීම
    - වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් කෙටි කාලීන අරමුදල් ලබා ගැනීම

- දීර්ඝ කාලීන හිඟයක් පවතින විට ඒ සඳහා ඉදිරිපත් කළ හැකි විසඳුම් පහත දැක්වේ.
    - අපනයන විවිධාංගීකරණය
    - ඍජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
    - සාම්ප්‍රදායික අපනයනය දිරිමත් කිරීම
    - අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
    - විදේශ රටවල් සමඟ ගිවිසුම්වලට එළඹීම
    - විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම
    - දේශීය උද්ධමනය පාලනය කොට අපනයනවල තරගකාරිත්වය ඉහළ නැංවීම
    - ආනයන ආදේශන කර්මාන්ත වැඩි දියුණු කිරීම
    - අත්‍යවශ්‍ය ආනයනය හැර අවශේෂ ආනයනය අධෛර්යවත් කිරීම

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.3 : විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව වෙනස් වූ ආකාරය විශ්ලේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- විදේශ සම්පත් පරතරය අර්ථ දක්වයි.
- කල්පිත සංඛ්‍යා ඇසුරෙන් විදේශ සම්පත් පරතරය ගණනය කරයි.
- මෑත කාලයේ දී විදේශ සම්පත් පරතරය පියවූ ආකාරය මහ බැංකු වාර්තාව ඇසුරෙන් පැහැදිලි කරයි.
- විදේශ වත්කම් අර්ථ දක්වයි.
- විදේශ වත්කම්වල සංයුතිය දක්වයි.
- විදේශ වත්කම් පවත්වා ගැනීම රටකට වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.
- විදේශ වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය මැනීම හා එහි මෑත කාලීන ප්‍රමාණය මහ බැංකු වාර්තාව ඇසුරෙන් පැහැදිලි කරයි.
- විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව කොපමණ කාලයකට ප්‍රමාණවත් වේ ද යන්න ප්‍රකාශ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- නිශ්චිත කාලච්ඡේදයක් තුළ ආර්ථිකයට ගලා එන සියලු විදේශ ලැබීම් සහ ආර්ථිකයෙන් බැහැරට ගලා යන සියලු විදේශ ගෙවීම් අතර වෙනස විදේශ සම්පත් පරතරය ලෙස හඳුන්වයි.

  විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම්

- විදේශ ලැබීම් ලෙස සලකන්නේ අපනයන, සේවා ලැබීම්, ප්‍රාථමික ආදායම් ලැබීම් සහ ද්විතීයක ආදායම් ලැබීම් ය. විදේශ ගෙවීම්වලට ආනයන ගෙවීම්, සේවා ගෙවීම්, සාධක ආදායම් ගෙවීම් සහ ණය ආපසු ගෙවීම්, පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම්, ආයෝජන ගලා යාම්, වාණිජ බැංකුවල ගෙවීම් ඇතුළත් වේ.

නිදසුන : කල්පිත ආර්ථිකයක විදේශ ලැබීම් හා විදේශ ගෙවීම් පහත දැක්වේ.

| **විදේශ ලැබීම් (රු. බිලියන)** | | **විදේශ ගෙවීම් (රු. බිලියන)** | |
|---|---|---|---|
| අපනයන ඉපැයුම් | 800 | ආනයන ගෙවීම් | 1 10 |
| සේවා ලැබීම් | 120 | සේවා ගෙවීම් | 50 |
| ප්‍රාථමික ආදායම් ලැබීම් | 130 | ප්‍රාථමික ආදායම් ගෙවීම් | 150 |
| ද්විතීයික ආදායම් ලැබීම් | 140 | පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම් | 70 |
| | | ණය ආපසු ගෙවීම් | 260 |
| | | ආයෝජන ගලා යාම් | 40 |
| | | වාණිජ බැංකුවල ගෙවීම් | 60 |
| සමස්ත විදේශ ලැබීම් | 730 | සමස්ත විදේශ ගෙවීම් | 740 |

- ශ්‍රී ලංකාවේ විදේශ සම්පත් පරතරය ඍණ අගයකි (හිඟයකි). ඊට හේතු කිහිපයක් පහත දැක්වේ.
    - අපනයනවලට සාපේක්ෂ ව ආනයනය වැඩි අගයක් ගැනීම
    - ප්‍රාථමික ආදායම් ලැබීම්වලට සාපේක්ෂ ව ප්‍රාථමික ආදායම් ගෙවීම් අධික වීම
    - ණය ආපසු ගෙවීම් අධික වීම
    - වාණිජ බැංකු විසින් විදේශ රටවලට කරන ගෙවීම් ප්‍රමාණය ඉහළ යාම

- විදේශ සම්පත් පරතරය හිඟයක් (ඍණ අගයක්) වීම ආර්ථිකයට එතරම් හිතකර නොවේ. විදේශ සම්පත් පරතරය හිඟ වූ විට ආර්ථිකය වෙත පහත ප්‍රතිවිපාක ඇති කරයි.
    - විදේශ වත්කම් ප්‍රමාණය පහළ යාම
    - විදේශ ණය ගැනීමට සිදු වීම
    - මුදලේ විදේශ අගය පහළ යාම
    - මුදල් සැපයුම පහත වැටීම
    - විදේශ ණය සේවා කරන ගෙවීම් ඉහළ යාම
    - ජාත්‍යන්තර ණය අර්බුදවලට පාත්‍ර වීම
- විදේශ සම්පත් පරතරයෙහි සාපේක්ෂ ප්‍රමාණය මැන දක්වනු ලබන්නේ,
    - දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ ව සහ
    - මුළු විදේශ ඉපයුම්වලට සාපේක්ෂවයි.

- මෑත වර්ෂවල විදේශ සම්පත් පරතරය පිය වූ ආකාරය
    - කෙටි කාලීන ණය
    - සැපයුම්කරුවන්ගෙන් ගන්නා ණය
    - බැංකු ණය
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ණය
    - ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක් ව පැවති කාලයේ දී මෙරටට ලැබෙන විදේශ ප්‍රදාන විදේශ ආධාර විදේශ ඍජු ආයෝජන වැනි ණය නොවන මූලාශ්‍රවලින් විදේශ සම්පත් පරතරයේ සැලකිය යුතු ප්‍රමාණයක් පියවාගත් නමුත් ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ග කිරීම නිසා ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රදාන ආධාර සීමා වී ඇත. එබැවින් ,
        - කෙටි කාලීන ණය
        - වාණිජ බැංකු ණය
        - සැපයුම්කරුවන්ගෙන් ණය
        - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්නා ණය

      වැනි මාර්ගවලින් ණය ලබා ගෙන විදේශ සම්පත් පරතරය පියවීමට සිදු වී තිබේ. එහි අහිතකර ප්‍රතිවිපාක වන්නේ පොළී පිරිවැය අධික වීම කෙටි කාලයක් තුළ ණය පියවීමට සිදු වීම නිසා විදේශ වත්කම් ප්‍රමාණය ශීඝ්‍රයෙන් අඩු වීම වැනි ආදිය යි.
    - විදේශ වත්කම් යනු කිසියම් රටක් වෙනුවෙන් වෙනත් රටවල මහ බැංකුවල තැන්පත් කර තිබෙන විදේශ මුදල් හා සුරැකුම් පත් ය.
    - විදේශ වත්කම් ශ්‍රී ලංකා මහ බැංකුවෙත්, තැන්පතු භාර ගන්නා ආයතනවලත්, ශ්‍රී ලංකා රජයත් සතු ව පවතී.
    - මෙයින් ආණ්ඩුව, මහ බැංකුව සහ වාණිජ බැංකුවලට අයත් වත්කම් දළ මුළු වත්කම් වේ.
    - එයින් ආණ්ඩුව සහ මහ බැංකුව සතු විදේශ වත්කම් දල නිල වත්කම් වේ.
- විදේශ වත්කම්වල සංයුතිය පහත දැක්වේ.
    - මහ බැංකුව සතු විදේශ බැංකු තැන්පතු
    - මහ බැංකුව මිල දී ගත් විදේශ සුරැකුම් පත්
    - ශ්‍රී ලංකා රජය සතු විශේෂ ගැනුම් හිමිකම්
    - වාණිජ බැංකු සතු විදේශ ව්‍යවහාර මුදල්
    - වාණිජ බැංකු මිල දී ගත් විදේශ සුරැකුම් පත්

- විදේශ වත්කම්වල සංයුතිය පිළිබඳ සාකච්ඡා කරන විට විදේශ වත්කම්වල හිමිකම සකස් වූ ආකාරය වැදගත් වේ. 2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වත්කම්වල හිමිකාරිත්වය පහත දක්වේ.

| ආයතනය | මුළු විදේශ වත්කම්වලින් හිමි කර ගත් ප්‍රතිශතය (%) |
|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව | 73 |
| තැන්පතු භාර ගන්නා ආයතන | 22 |
| ශ්‍රී ලංකා රජය | 5 |
| | 100 |

(මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.)

- රටකට විදේශ වත්කම් පවත්වා ගැනීම කිහිප ආකාරයකින් වැදගත් වේ. ඒවා නම්
  - මුදලේ විදේශ අගය ස්ථාවර ව පවත්වා ගෙන යාමට
  - මුදල් සැපයුම තීරණය කිරීමට
  - ආනයන ශක්‍යතාව පිරික්සීමට
  - ගෙවුම් ශේෂ හිඟය පියවීමට
  - මූල්‍ය අධිකාරියට විදේශ විනිමය වෙළෙඳපොළට බලපෑම් කිරීමේ හැකියාව තීරණය වීමට
  - විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය දිනාගත හැකි වීමට
- රටකට හිමි විදේශ වත්කම්වල සාපේක්ෂ ප්‍රමාණය මනිනු ලබන්නේ විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව කොපමණ කාලයක් සඳහා ප්‍රමාණවත් වේ ද යන්න මතයි. නැතිනම් විදේශ වත්කම්වල ආනයන හැකියාව මාස කොපමණකට ද යන්න මිනුම් කිරීමයි. එය ගණනය කරනු ලබන්නේ පහත පරිදි ය.

$$\text{විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව (මාස)} = \frac{\text{විදේශ වත්කම් ප්‍රමාණය}}{\text{මාසික ආනයන වියදම}}$$

නිදසුන් ලෙස රටකට හිමි විදේශ වත්කම් ප්‍රමාණය = රු. බිලියන 5 000

වාර්ෂික ආනයන වියදම = රු. බිලියන 12 000

විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව (මාස)

$$= \frac{60000}{12000}$$

= මාස 5

- මින් අදහස් කරන්නේ මාස 5කට භාණ්ඩ හා සේවා ආනයනය කිරීම සඳහා විදේශ වත්කම් ප්‍රමාණවත් වන බව යි.
- ශ්‍රී ලංකාවේ මෑත වසරවල විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව පහත පරිදි වගුවකින් ඉදිරිපත් කළ හැකි ය.

| වර්ෂය | විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව (මාස) |
|---|---|
| 2011 | 4.3 |
| 2012 | 4.7 |
| 2013 | 4.8 |
| 2014 | 5.1 |
| 2015 | 4.9 |

- විදේශ වත්කම්වල ආනයන ශක්‍යතාව ඉතා සුළු වැඩි වීමක් පෙන්වයි. ඊට හේතුව භාණ්ඩ හා සේවා ආනයන වැඩි වන ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් විදේශ වත්කම් ප්‍රමාණය ඉහළ යාම යි. (මහ බැංකු වාර්තාවේ කාලීන තොරතුරු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.)

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.4 : විදේශ ආයෝජනය රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි.**

**කාලච්ඡේද ගණන :** 04

**ඉගෙනුම් පල :**

- විදේශ ආයෝජන අර්ථ දක්වයි.
- විදේශ ආයෝජන වර්ගීකරණය කරයි.
- ඍජු ආයෝජන හඳුන්වා මෑත කාලීන ප්‍රවණතා දක්වයි.
- ඍජු ආයෝජනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක විග්‍රහ කරයි.
- කළඹ ආයෝජන හඳුන්වා එහි මෑත කාලීන ප්‍රවණතා විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටක්, ආයතනයක් හෝ පුද්ගලයකු හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිල දී ගැනීම හෝ තම ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාරවල කොටස් වැඩි සංඛ්‍යාවක් මිල දී ගැනීම විදේශ ආයෝජනයයි.
- විදේශ ආයෝජනය ප්‍රධාන කොටස් දෙකක් යටතේ විස්තර කළ හැකි ය.
    - ඍජු විදේශ ආයෝජන
    - කළඹ විදේශ ආයෝජන
- ඍජු විදේශීය ආයෝජන යනු කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය රටක ඵලදායි මූර්ත වත්කම් අත්පත් කර ගැනීම යි.

  නිදසුන් : කර්මාන්ත ශාලා, පතල්, ඉඩකඩම් ආදී වත්කම් විදේශීය ආයෝජකයන් අත්පත් කර ගැනීම

- කිසියම් වර්ෂයක් විදේශ ඍජු ආයෝජන ඇස්තමේන්තු කිරීමේ දී රට තුළට ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහයන් හා රටින් පිටතට ගලා යන ප්‍රාග්ධනය යන දෙක ම සැලකිල්ලට ගැනේ.
- විදේශීය ඍජු ආයෝජන පිළිබඳ ව මෑත කාලීන ප්‍රවණතා පහත දැක්වේ.
    - පසුගිය වසර කිහිපය තුළ විදේශීය ඍජු ආයෝජන බලාපොරොත්තු මට්ටමට අඩු වීම

- ආයෝජකයන්ගේ විශ්වාසය අඩු වීමට හේතුවක් ලෙස රට තුළ දේශපාලන ස්ථාවරත්වයක් නොතිබීම නිසා ආයෝජන පහළ මට්ටමක පැවතීම
- පොළී අනුපාතිකය මෑත වර්ෂවල වැඩි වීමේ ස්වභාවයක් පෙන්නුම් කිරීම නිසා ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් නැගී එන ආර්ථිකයන්ට දැඩි බලපෑමක් එල්ල වීම
- ආයෝජකයන් නැගී එන වෙළෙඳපොළ ආර්ථිකය තුළ ආයෝජනය කිරීමට මැලි වීම

- ඍජු ආයෝජනයේ හිතකර හා අහිතකර ප්‍රතිවිපාක
  - විදේශ ආයෝජන තුළින් ශක්තිමත් වන ජාත්‍යන්තර සාධක සංචලතාව හේතු කොට ගෙන සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාව ඉහළ යාම
  - අමතර ප්‍රාග්ධන ප්‍රවාහයන් රට තුළට ගලා ඒම තුළින් සම්පත් පරිහරණය (ඉතුරුම්-ආයෝජන) පියවා ගැනීමට හැකි වීම
  - විදේශ විනිමය පරතරය පියවා ගැනීමට හැකි වීම (විදේශීය ලැබීම් - විදේශීය ගෙවීම් - අපනයන පරතරය)
  - ගෙවුම් ශේෂ හිඟයට පිළිතුරක් වීම
  - ණය බර ඉහළ නොයාම
  - නව තාක්ෂණය හා කළමනාකරණය රටට ලබා ගත හැකි වීම
  - ලාභාංශ හා පොළී වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් පිටරටට ඇදී යාම
  - දේශීය ආර්ථික කටයුතුවලට අයහපත් බලපෑම් ඇති වීම
  - ප්‍රාග්ධන සූක්ෂ්ම නිෂ්පාදන ශිල්පීය ක්‍රම භාවිතය නිසා රැකියා අවස්ථා අහිමි වීම
  - ස්වභාවික සම්පත් අධිපරිභෝජනයට ලක් වීම
  - දේශීය කර්මාන්ත අඩපණ වීම
  - රජයට ලැබෙන බදු ආදායම් නියම ලෙස නොලැබී යාම
  - දේශීය ආයෝජකයන් සඳහා ඇති මුදල් විදේශ ව්‍යාපාර වෙත ඇදී යාම
  - දේශීය ව්‍යාපාරවල දක්ෂ සේවකයන් විදේශ ව්‍යාපාර කරා යාම

(මහ බැංකු වාර්ෂික වාර්තාව ඇසුරෙන් ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනවල කාලීන තොරතුරු හා උපනතීන් පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න).

- කළඹ ආදිය ආයෝජනය යන්නෙන් අදහස් වන්නේ මූල්‍ය ප්‍රතිලාභයන් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස්, පිළිණපත්, ණයකර, වාණිජ පත්‍රිකා ආදි මූල්‍ය වෙළෙඳපොළ උපකරණ මිල දී ගැනීම යි. කළඹ විදේශ අයෝජනවල දී ආයෝජකයන්ට විදේශ ව්‍යාපාරයන්ගේ කළමනාකාරීත්වය හිමිකම හෝ පාලනය හෝ පිළිබඳ හිමිකමක් නොලැබෙනු ඇත.

කළඹ ආයොජනයේ මෑත කාලීන ප්‍රවණතා පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

- මෑත වර්වල හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජනය අඩු වීමක් පෙන්නුම් කිරීම
- රටෙහි පවතින දේශපාලන අස්ථාවරභාවය මත විදේශ අංශ කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීම මන්දගාමී ස්වරූපයක් දක්වීම
- කොටස් වෙළෙඳපොළ අස්ථාවරත්වය දිගට ම අඛණ්ඩ ව පැවතීම හේතුවෙන් ආයෝජකයන් ආයෝජනයට මැළි වීම පෙන්නුම් කිරීම
- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කරනු ලබන සීමා හා ක්ෂේත්‍ර පුළුල් කිරීම හරහා රජයේ ප්‍රතිපත්ති හා සමගාමී ව ආණ්ඩුවේ ආයෝජන ප්‍රතිපත්ති නැවත සමාලෝචනය කිරීම

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.5 :** විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද ගණන :** 04

**ඉගෙනුම් පල :**

- විදේශ විනිමය වෙළෙඳපොළ අර්ථ දක්වයි.
- විදේශ විනිමය අනුපාතිකය අර්ථ දක්වයි.
- විදේශ විනිමය අනුපාත ක්‍රම තීරණය වන ආකාරය පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විදේශ විනිමය හුවමාරු වන ආයතනික ව්‍යුහයන්ගේ සම්බන්ධතාවන් විදේශ විනිමය වෙළෙඳපොළ ලෙස හඳුන්වයි. නොඑසේ නම් විදේශ විනිමය ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් එම විදේශ විනිමය අනුපාතිකයන් හා හුවමාරු කර ගන්නා විදේශ විනිමය ප්‍රමාණයන් තීරණය කර ගැනීමට සම්බන්ධ වන ආයතනික ව්‍යුහයන් විදේශ විනිමය වෙළෙඳපොළ ලෙස හැඳින්විය හැකි ය.
- ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය ගනුදෙනු පහසු කිරීම සඳහා විදේශ විනිමය සපයා දීම පිණිස විදේශ විනිමය වෙළෙඳපොළ සංවිධානය වී ඇත. එම වෙළෙඳපොළවල් ලෝකයේ විශාල ම වෙළෙඳපොළ ලෙස හැඳින්විය හැකි ය.
- කොටස් වෙළෙඳපොළකට වඩා විදේශ විනිමය වෙළෙඳපොළ ලෝකය පුරා පැතිරුණු වෙළෙඳුන්ගේ ජාලයක් ලෙස සංවිධානය වී ඇත.
- විදේශ විනිමය වෙළෙඳාමේ යෙදී සිටින වෙළෙඳුන් අදාළ විදේශ මුදලේ ගැනුම් මිල සහ විකුණුම් මිල පිළිබඳ තොරතුරු සෙසු වෙළෙඳුන්ගෙන් විමසා බලා වඩාත් වාසිදායක තත්ත්වය තීරණය කරයි. විදේශ විනිමය වෙළෙඳපොළවල බොහෝ ගනුදෙනු සිදු වන්නේ දුරකථන මගින් වන අතර පසු ව එය විද්‍යුත් තැපැල හෝ ෆැක්ස් පිණිවිඩ මගින් සනාථ කරගනු ලබයි.
- විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරී පාර්ශ්වයන් රාශියක් සිටී.
    - වාණිජ බැංකු
    - විදේශ විනිමය තැරැව්කරුවන්
    - ව්‍යාපාරික ආයතන
    - මහ බැංකුව

- මහජනතාව
- ආණ්ඩුව

- වාණිජ බැංකු විදේශීය වෙළෙඳපොළේ වඩාත් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. මෙහි දී විදේශීය විනිමය ගැනුම් මිල සහ විකුණුම් මිල ප්‍රකාශයට පත් කිරීම වැදගත් වේ. විකුණුම් මිල සහ ගැනුම් මිල අතර පරතරය ආයතනයේ ලාභාන්තිකය නිරූපණය කරයි. විදේශ විනිමය වෙළෙඳපොළවල බහුල ව හුවමාරු වන්නේ ලෝකයේ ප්‍රබල මුදල් වර්ග වන ඇමරිකා එක්සත් ජනපද ඩොලරය, ස්ටර්ලින් පවුම්, යූරෝ සහ ජපානයේ යෙන් ආදිය යි.

- ප්‍රධාන විදේශ විනිමය වෙළෙඳපොළ මධ්‍යස්ථානවල මිල ගණන් අතර කිසියම් වෙනස්කමක් ඇති වුවහොත් විදේශ විනිමය ජාවාරුම්කරුවන් එම අවස්ථාවෙන් ප්‍රයෝජනයට ගෙන ලාභ උපය යි. එනම් මිල අඩු විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලට ගෙන මිල වැඩි වෙළෙඳපොළටට විදේශ විනිමය අලෙවි කරයි.

- දේශීය ව්‍යාවහාර මුදල් ඒකකයක් විදේශ ව්‍යවහාර මුදල් ඒකක බවටත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් දේශීය ව්‍යවහාර මුදල් ඒකක බවටත් පරිවර්තනය කරන අනුපාතිකය විදේශ විනිමය අනුපාතිකය ලෙස හඳුන්වයි. මෙලෙස කිසියම් මුදල් ඒකකයක මිල තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය නමින් හඳුන්වයි.

- විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කරන ක්‍රම දෙකක් ඇත. එනම්,
  - ඍජු කියවීම්
  - වක්‍ර කියවීම්

- ඍජු කියවීමේ ක්‍රමය හෙවත් මිල නිර්ණය කරන ක්‍රමයට විනිමය අනුපාතිකය ප්‍රකාශයට පත් කරන්නේ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක මිල දේශීය ව්‍යවහාර මුදල්වලින් දැක්වීම මගිනි. නිදසුන් ලෙස ඇමරිකා එක්සත් ජනපද ඩොලරයක් මිල දී ගැනීමට ශ්‍රී ලංකා රුපියල් කොපමණ ප්‍රමාණයක් අවශ්‍ය ද යන්න දැක්වීම

USA $ 1 = ශ්‍රී ලංකා රුපියල් 152

- වක්‍ර කියවීමේ ක්‍රමය හෙවත් පරිමාව නිර්ණය කිරීමේ ක්‍රමයට විනිමය අනුපාතිකය මගින් දක්වන්නේ දේශීය මුදල් ඒකකයේ මිල විදේශ ව්‍යවහාර මුදල් ඒකක මගින් දැක්වීම යි. වක්‍ර කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතිකය ඍජු කියවීමේ ක්‍රමයට විනිමය අනුපාතිකයේ පරස්පරය යි.

ශ්‍රී ලංකා රුපියල් (LKR) 1= එක්සත් ජනපද ඩොලර් $ = $\frac{1}{152} = 0.00657$

- ඍජු කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතිකය තීරණය වන්නේ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට පවතින ඉල්ලුම හා සැපයුම මත ය. නිදසුනක් ලෙස ඇමරිකා එක්සත් ජනපද ඩොලරයේ රුපියල් මිල තීරණය වන්නේ විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත ය.

- ඩොලර් ඉල්ලුම් කරන්නේ විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කිරීමට, විදේශ රටවල සංචාරය කිරීමට ණය ආපසු ගෙවීමට, ණය සඳහා පොළිය ගෙවීමට හා විදේශ රටවලට සංක්‍රාම ගෙවීමට ආදි ගෙවුම් ශේෂ ලේඛනයේ ගෙවීම් ගනුදෙනු පියවීමට ය. ඩොලරයේ රුපියල් මිල හා ඩොලර් ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී.


- පවතින විනිමය අනුපාතිකය යටතේ ආනයන වැඩි වීම, විදේශ සංචාර වැඩි වීම, ණය පොළී ගෙවීම් ඉහළ යාම විදේශවලට කෙරෙන සංක්‍රාම ගෙවීම් ඉහළ යාම ආදි සාධක මත ඩොලර් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. ආනයන අඩු වීම, විදේශ සංචාර අඩු වීම, විදේශ සංක්‍රාම ගෙවීම් අඩු වීම ආදි හේතු මත ඩොලර් ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන් වේ.

- ඩොලර් සඳහා සැපයුමක් ඇති වන්නේ භාණ්ඩ අපනයන සේවා ලැබීම්, ප්‍රාථමික ආදායම් ලැබීම්, ද්විතීයක ආදායම් ලැබීම් ආදි ගෙවුම් තුලන ලේඛනයේ ලැබීම් ගනුදෙනු මගිනි. ඩොලරයේ රුපියල් මිල හා ඩොලර් සැපයුම අතර පවතින්නේ අනුලෝම සම්බන්ධතාවකි.


- පවත්නා විනිමය අනුපාතිකය යටතේ අපනයන වැඩි වන විට සංචාරක ලැබීම්, ණය ලැබීම් වැඩි වන විට ඩොලර් සැපයුම වැඩි වේ. සැපයුම වක්‍රය දකුණට විතැන් වේ. අපනයන අඩු වන විට සේවා ලැබීම් අඩු වන විට ඩොලර් සැපයුම අඩු වේ. ඩොලර් සැපයුම් වක්‍රය වම්පසට විතැන් වේ.

- ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම තුලනය වන විට ඩොලරයේ රුපියල් මිල තීරණය වේ.

විදේශ විනිමය අනුපාතිකය $\frac{Rs}{\$}$



- ඩොලරයක් රු. 100 බැගින් දිනකට 100 000 $ක් හුවමාරු වේ.
- වක්‍ර කියවීමේ ක්‍රමයට විනිමය අනුපාතිකය තීරණය වන්නේ දේශීය ව්‍යවහාර මුදල් ඒකකයට මෙරට තුළ පවතින ඉල්ලුම හා සැපයුම මත ය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකා රුපියලකින් මිලට ගත හැකි ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය තීරණය වන්නේ ශ්‍රී ලංකා රුපියල් සඳහා පවතින ඉල්ලුම හා සැපයුම මත ය.
- අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් ඉල්ලුම් කරනු ලබන්නේ විදේශිකයන් විසිනි. එසේ රුපියල් ඉල්ලුම් කරන්න් ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ මිලට ගැනීම, ශ්‍රී ලංකාව තුළ සංචාරය කිරීම, ගත් ණය ආපසු ගෙවීම් ආදී ගෙවුම් තුලන ලැබීම් ගනුදෙනු සඳහා ය. රුපියලේ ඩොලර් මිල හා ශ්‍රී ලංකා රුපියල් ඉල්ලුම අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවකි.
- පවතින විනිමය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකාවේ පැත්තෙන් අපනයන වැඩි වන විට, සේවා ලැබීම් වැඩි වන විට රුපියල් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. අපනයන අඩු වන විට සේවා ලැබීම් අඩු වන විට හා ප්‍රාථමික ආදායම් ලැබීම් අඩු වන විට රුපියල් ඉල්ලුම අඩු වේ.රුපියල් ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.
- ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් සපයන්නේ ස්වදේශිකයන් විසින් ය. එසේ රුපියල් සපයන්නේ විදේශ රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය සඳහා ය. රුපියල් සපයා ඩොලර් මිල දී ගෙන විදේශ රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කරයි. රුපියල් ඩොලර් මිල හා රුපියල් සැපයුම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.
- පවතින විනිමය අනුපාතිකය යටතේ ආනයන වැඩි වන විට සේවා ගෙවීම් වැඩි වන විට රුපියල් සැපයුම් දකුණට විතැන් වේ. ආනයන හා සේවා ගෙවීම් අඩු වන විට රුපියල් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.
- විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත රුපියලක ඩොලර් මිල තීරණය වේ.




- රුපියලක වටිනාකමට ඩොලර් 0.006 (0.006$) බැගින් දිනකට ශ්‍රී ලංකා රුපියල් 100 000ක් හුවමාරු වේ.

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍යය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.6 :** විදේශ විනිමය අනුපාතික ක්‍රම තුලනාත්මක ව විස්තර කරයි.

**කාලච්ඡේද ගණන** : 08

**ඉගෙනුම් පල :**

- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වා එම ක්‍රමයේ වාසි හා අවාසි දක්වයි.
- නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වා එම ක්‍රමයේ වාසි හා අවාසි දක්වයි.
- පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය හඳුන්වයි.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ප්‍රධාන වශයෙන් විනිමය අනුපාත ක්‍රම දෙකක් පිළිබඳ ව සාකච්ඡා කෙරේ. එනම්,
    - ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය
    - නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය
- මූල්‍ය අධිකාරිය විසින් තීරණය කළ විනිමය අනුපාතිකය නැවත මූල්‍ය අධිකාරිය විසින් ම වෙනස් කරන තෙක් ම එක ම මට්ටමක පවතින්නේ නම් එය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය ලෙස හඳුන්වයි.
- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයට පදනම් වූයේ රන් මිනුම් ක්‍රමය හා රන් හුවමාරු ක්‍රමය යි. එනම් රන් සංචිත ක්‍රමය මත ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පදනම වේ. ඇමරිකා එක්සත් ජනපදය රන් අවුන්සයක් පෙඩරල් සංචිත බැංකුවේ තැන්පත් කළ විට ඩොලර් 35ක් නිකුත් කරන ලදි. එංගලන්තයේ මහ බැංකුවේ රන් අවුන්සයක් තැන්පත් කළ විට ස්ටර්ලින් පවුම් 12.50ක් නිකුත් කරන ලදි. ඒ අනුව ඩොලර් හා පවුම් අතර විනිමය අනුපාතිකය £1 = $ 2.80 විය. එය රන් අවුන්සයකට නිකුත් කරන ඩොලර් ප්‍රමාණය හෝ ස්ටර්ලින් පවුම් ප්‍රමාණය වෙනස් වන තෙක් ම ස්ථාවර ව තිබිණි.
- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය රටකට වාසිදායක ලෙස බලපාන්නේ පහත පරිද්දෙන් ය.
    - විනිමය අනුපාතිකය ස්ථාවර නිසා ආනයනකරුවන්ට ඇති වන අවදානම අඩු ය.
    - විනිමය අනුපාතිකය ස්ථාවර නිසා විදේශ ආයෝජකයන්ට විදේශ ණය සැපයුම් කරුවන්ට ඇති වන අවිනිශ්චිත බව අඩු ය.


- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමස්ත ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයන් කළමනාකරණය කිරීමේ කිරීමේ හැකියාව වැඩි ය.
- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවතින විට සමපේක්ෂණ චේතනාවෙන් විදේශ ව්‍යවහාර මුදල් ඉල්ලුම් කිරීමට නොපෙළඹෙන නිසා විදේශ විනිමය හිඟයක් ඇති නොවේ.
- විනිමය අනුපාතිකයේ වෙනස් වීම මගින් අපනයන කරුවන්ට වාසි ලබා ගත නොහැකි බැවින් අපනයනවල තරගකාරිත්වය ඉහළ නංවා ගැනීම අපනයන කරුවන් පෙළඹෙයි.

- ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය  රටකට අවාසිදායක ලෙස බලපාන්නේ පහත පරිද්දෙන් ය.
  - බාහිර සමතුලිතතාව (ගෙවුම් තුලනයේ සමබරතාව) පවත්වා ගැනීමට, අභ්‍යන්තර සමතුලිතතාව (සමාහාර ඉල්ලුම හා සමාහාර සැපයුම තුලිත ව පවත්වා ගැනීම) කැප කිරමට සිදු වීම. ගෙවුම් ශේෂ හිඟයක් ඇති වුවහොත් එය සමනය කර ගැනීමට අභ්‍යන්තර ආර්ථිකයේ අවධානයක් ඇති කර ගැනීමට සිදු වේ.
  - ස්ථාවර විනිමය අනුපාතිකයේ අධි තක්සේරුවක් හෝ ඌන තක්සේරුවක් පැවතුණහොත් එය නිරතුරු ව ගෙවුම් ශේෂ හිඟයක් හෝ අතිරික්තයක් හෝ ඇති වීමට හේතු වේ.
  - ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන විට එහි අධි තක්සේරු වීම් යටතේ මතු වන විදේශ විනිමය හිඟයක් පියවීමට මූල්‍ය අධිකාරියට විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගෙන යාමට සිදු වීම. එය විශාල මූල්‍ය ප්‍රමාණයක් අකර්මණ්‍ය ලෙස සිර කර තැබීමකි.
  - විදේශ විනිමය සංචිත අවසාන වන විට විනිමය හිඟය පියවා ගැනීමට විකල්ප ක්‍රියා මාර්ග ලෙස ආනයන පාලනය වැනි ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සිදු වීමෙන් විවෘත වෙළෙඳාමෙන් ලැබිය හැකි ශුභ සාධනය අඩු වේ.
- විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම මත තීරණය වන විනිමය අනුපාතිකය නම්‍ය විනිමය අනුපාතිකය, (චල විනිමය අනුපාතිකය, පාවෙන විනිමය අනුපාතිකය) ලෙස හඳුන්වයි. එය ඉල්ලුම හා සැපයුම බලවේගවල වෙනස් වීම මත නිරන්තරයෙන් වෙනස් වේ.
- 1970න් පසු ලෝකයේ බොහෝ රටවල නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක විය. විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම ඉහළ යන විට විදේශ විනිමය අනුපාතිකය වැඩි වන අතර විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම පහළ යන විට විදේශ විනිමය අනුපාතය පහළ යයි.  විනිමය අනුපාතිකය ඉහළ යාම නිසා දේශීය මුදලේ විදේශ අගය පහළ යාම මුදලේ විදේශ අගය ක්ෂය වීම ලෙස හඳුන්වයි.

- නම්‍ය විනිමය අනුපාතිකයේ චලනයන්ට බලපාන්නේ රටක් තුළට ගලා එන හා රටින් පිටතට ගලා යන විදේශ විනිමය ප්‍රවාහයන් ය. එනම් ගෙවුම් ශේෂ ලේඛනයේ ලැබීම් හා ගෙවීම් පාර්ශ්වයන්ගේ ගනුදෙනු විනිමය අනුපාතිකයේ වෙනස් වීමට බලපානු ඇත.
- ගෙවුම් ශේෂ ලේඛනයේ අපනයන ශීඝ්‍රයෙන් වර්ධනය වන විට නම්‍ය විනිමය අනුපාතිකය පහළට ගමන් කරයි. මුදලේ විදේශ අගය ඉහළ යයි.
- මෙය පහත රූප සටහනෙන් පෙන්නුම් කෙරේ.




- ගෙවුම් ශේෂ ලේඛනයේ ආනයන ශීඝ්‍රයෙන් වර්ධනය වූ විට නම්‍ය විනිමය අනුපාතිකය ඉහළට ගමන් කරයි. මුදලේ විදේශ අගය පහළ යයි.
- නම්‍ය විනිමය අනුපාතිකය මගින් ගෙවුම් ශේෂය ස්වයංක්‍රිය ව තුලනය වන යාන්ත්‍රණයක් නිර්මාණය වේ. ගෙවුම් ශේෂ ලේඛනයේ හිඟයක් පවතින විට



විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩි වීම හා සැපයුම අඩු වීම මගින් විනිමය අනුපාතිකය ඉහළ යන්නට පටන් ගනී. එවිට මුදලේ විදේශීය අගය පහළ ගොස් අපනයන වර්ධනය වේ. ආනයන අධෛර්යවත් වේ. ගෙවුම් ශේෂ ලේඛනයේ අතිරික්තයක් පවතින විට විදේශ විනිමය සඳහා සැපයුම වැඩි වේ. ඉල්ලුම අඩු වේ. එවිට විනිමය අනුපාතිකය පහළ යන්නට ගනී. මුදලේ විදේශ අගය ඉහළ යයි. එවිට ආනයන වැඩි වේ. අපනයන අඩු වේ. ගෙවුම් තුලන සමබරතාව ඇති වේ.

- නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයේ වාසි පහත දැක්වේ.
  - නම්‍ය විනිය අනුපාතිකය විදේශ විනිමය ඉල්ලුම සහ සැපයුම සමාන කෙරෙන සමතුලිත විනිමය අනුපාතිකයක් බැවින් විනිමය අනුපාතිකය අධි තක්සේරු වීමටත් ඌන තක්සේරු වීමටත් ඉඩක් නොමැත.
  - තාත්ත්වික විනිමය අනුපාතිකයක් පවත්නා බැවින් ගෝලීය ආර්ථික සම්පත් විකල්ප භාවිතයන් අතර වඩාත් කාර්යක්ෂම ආකාරයට බෙදී යයි.
  - නම්‍ය විනිමය අනුපාත ක්‍රමය මගින් බාහිර සමතුලිතතාව නිරායාසයෙන් ගොඩ නැගෙන බැවින් ප්‍රතිපත්ති සම්පාදකයන් හට අභ්‍යන්තර සමතුලිතතාව උදෙසා තම පූර්ණ ප්‍රයත්නය යෙදවිය හැකි ය.
  - මූල්‍ය ප්‍රතිපත්ති බාහිර සාධකවලින් බලපෑමෙන් සම්පූර්ණයෙන් ම නිදහස් නිසා දේශීය ආර්ථිකය ශක්තිමක් කිරීමට මූල්‍ය ප්‍රතිපත්ති නිදහසේ යොදා ගත හැකි ය.
  - විනිමය අනුපාත තීරණය වීමේ දී විදේශ විනිමය වෙළෙඳපොළේ ඉල්ලුම හා සැපයුම සමතුලිත වන නිසා විදේශ විනිමය හිඟයක් හෝ අතිරික්තයක් හෝ ඇති නොවේ. එම නිසා විශාල විදේශ විනිමය සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් මතු නොවේ.
  - ආනයන හා අපනයන පාලනය සඳහා ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු නොවන බැවින් වඩාත් විවෘත වෙළෙඳාම මගින් සමාජ ශුභ සාධනය උපරිම වශයෙන් භුක්ති විඳීමට ඉඩ ප්‍රස්තා ව හිමි වේ.
- නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයේ අවාසි පහත දැක්වේ.
  - විනිමය අනුපාතිකය නිරන්තරයෙන් උස් පහත් වීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනයට නම්‍ය විනිමය අනුපාතිකය බාධාවකි.
  - නම්‍ය විනිමය අනුපාතිකය විදේශ ආයෝජකයන්ට හා ණය සැපයුම් කරුවන්ට දැඩි අවිනිශ්චිත බවක් ඇති කරයි.
  - නම්‍ය විනිමය අනුපාතිකයක් පවත්නා විට විනිමය වෙළෙඳපොළ ආශ්‍රිත සමපේක්ෂණ ක්‍රියා බහුල වේ. එමගින් විනිමය අනුපාතිකයේ උච්චාවචනය තව තවත් තීව්‍ර කරයි.

- නිරන්තරයෙන් වෙනස් වන විනිමය අනුපාතිකයක් බැවින් සමස්ත ආර්ථිකයේ විනය පවත්වා ගැනීම දුෂ්කරයි.
- විනිමය අනුපාතිකයේ උච්චාවචනය මගින් අපනයන කරුවන්ට වාසි ලැබිය හැකි බැවින් අපනයන තරගකාරිත්වය වර්ධනය කර ගැනීමට දක්වන උනන්දුව අඩු වේ.

- පාලිත විනිමය අනුපාතිකය ස්ථාවර විනිමය අනුපාතිකයේත් නම්‍ය විනිමය අනුපාතිකයේත් සංකලනයකි. ස්ථාවර විනිමය අනුපාතිකය සහ නම්‍ය විනිමය අනුපාතිකයේ වාසි අත්පත් කර ගැනීම සඳහා පාලිත නම්‍ය විනිමය අනුපාතිකය සකසා ඇත.
- ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන අවස්ථාවක එය කිසියම් පරාසයක් තුළ වෙනස් වීමට ඉඩ දී ඇත. එම පරාසය ඉක්මවා වෙනස් වන විට මූල්‍ය අධිකාරිය විදේශ විනිමය වෙළෙඳපොළට පිවිස විදේශ විනිමය / දේශීය මුදල් විකිණීම හෝ මිල දී ගැනීම මගින් විදේශ විනිමය අනුපාතිකයේ අන්තගාමී දෝලනය පාලනය කරනු ලබයි. එය පාලිත නම්‍ය විනිමය අනුපාතිකය හෙවත් කළමනාකරණය කළ නම්‍ය විනිමය අනුපාතය ලෙස හඳුන්වයි.
- මෙසේ මූල්‍ය අධිකාරිය විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වන්නේ කෙටි කාලීන වශයෙන් වූව ද එමගින් විනිමය අනුපාතිකයේ කාලීන ස්ථාවරත්වයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.
- කිසියම් රටක ව්‍යවහාර මුදල් ඒකකය සඳහා විදේශ විනිමය අනුපාතිකය, විවිධ විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂ ව විවිධ ප්‍රමාණයන්ගෙන් සහ විවිධ දිශාවන්ට වෙනස්වන විට එම වෙනස් වීම්වල මධ්‍යගත අගය ගණනය කිරීම සඳහා සඵල විනිමය අනුපාතය ගණනය කරයි.
- සඵල විනිමය අනුපාතිකයේ ස්වරූප දෙකක් ඇත.
  - නාමික සඵල විනිමය අනුපාතිකය
  - මූර්ත සඵල විනිමය අනුපාතිකය
- නාමික සඵල විනිමය අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාව සමඟ විදේශ වෙළෙඳාමේ යෙදෙන ප්‍රධාන රටවල් 24හි නාමික විනිමය අනුපාතිකයන් මත, එම රටවල් අතර ඇති වන විදේශ වෙළෙඳාමේ ප්‍රමාණය මත බර තබා ගණනය කළ හැකි බරිත සාමාන්‍ය විනිමය අනුපාතිකය නාමික සඵල විනිමය අනුපාතිකය වේ.
- මූර්ත සඵල විනිමය අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය සහ විදේශ වෙළෙඳාමේ යෙදෙන රටවල උද්ධමන අනුපාතිකයන් අතර වෙනසේ සාමාන්‍ය, නාමික සඵල විනිමය අනුපාතිකයට ගළපා සකස් කළ විනිමය අනුපාතිකය වේ.

- නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අතර සම්බන්ධය සරල නිදසුනක් මගින් පහත පරිදි විග්‍රහ කළ හැකි ය.

| වෙළෙඳ හවුල්කරුවන් | නාමික විනිමය අනුපාතිකය (R) | විදේශ වෙළෙඳාම මත බර තැබීම (W) | $R \times W$ | ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය | විදේශ රටේ උද්ධමන අනුපාතිකය | වෙනස |
|---|---|---|---|---|---|---|
| 1. ඇමරිකා එක්සත් ජනපදය | 1 \$ = රු. 150 | 30 | 4500 | 8 | 10 | -2 |
| 2. එක්සත් රාජධානිය | 1 \$ = රු.200 | 20 | 4000 | 8 | 12 | -4 |
| 3. ඉන්දියාව | 1 Rs = රු.225 | 50 | 8 | 8 | -5 | +3 |
| 4. චීනය | 1 U = රු.2 | 10 | 20 | 8 | 10 | -2 |
| 5. ජපානය | 1 F = රු. 2 | 5 | 10 | 8 | 5 | +3 |
| | | $\sum W = 100$ | 8580 $\sum RW$ | | | -8+6=-2 |

නාමික සඵල විනිමය අනුපාතිකය $= \dfrac{E_{RW}}{E_W}$

$$= \frac{8580}{100}$$

$$= \underline{\underline{85.80}}$$

- නාමික සඵල විනිමය අනුපාතිකය 85.80 යන්නෙන් අදහස් කරන්නේ ඉහත දැක් වූ ශ්‍රී ලංකාව සමඟ විදේශ වෙළෙඳාමෙහි යෙදෙන ඕනෑ ම රටක සාමාන්‍ය විනිමය අනුපාතිකය රු. 85.80 ක් වන බවයි.
- ඉහත සඳහන් නාමික සඵල විනිමය අනුපාතිකයට එක් එක් රටවල උද්ධමන අනුපාතිකය හා ශ්‍රී ලංකාවේ උද්ධමනය අනුපාත වෙනසෙහි සාමාන්‍ය ගැළපූ විට මූර්ත සඵල විනිමය අනුපාතිකය ලැබේ.
- මූර්ත සඵල විනිමය අනුපාතිකය = නාමික සඵල විනිමය අනුපාතිකය + දෙරටේ විනිමය අනුපාතිකය වෙස්වීමේ සාමාන්‍යය

$$= 85.80 + (-2)$$

$$= \underline{\underline{83.80}}$$

- ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකයට වඩා විදේශ වෙළෙඳාමේ යෙදෙන රටෙහි උද්ධමන අනුපාතිකය වැඩි නම් නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය අඩු අගයක් ගනී.

- ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකයට සාපේක්ෂ ව විදේශ වෙළෙඳාමේ යෙදෙන රටවල උද්ධමන අනුපාතික අඩු නම් නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය ඉහළ අගයක් ගනී.

- නාමික සඵල විනිමය අනුපාතිකයේ ස්වභාවය වනුයේ විවිධ රටවල නාමික විනිමය අනුපාතිකයන් නිරතුරු ව ම ඉහළ හා පහළ යයි. එවිට රුපියලේ විදේශ අගය නිශ්චිත ව ප්‍රකාශ කළ නොහැකි වේ. ඊට විසඳුමක් ලෙස විදේශ රටවල නාමික විනිමය අනුපාතිකයන්ගේ මධ්‍යයන අගයක් ලෙස සඵල විනිමය අනුපාතිකය අනුව දේශීය මුදලේ විදේශ අගය වඩාත් නිශ්චිත පදනමකින් ප්‍රකාශ කළ හැකි වේ.

- මූර්ත විනිමය අනුපාතිකයේ ස්වභාවය වනුයේ අදාළ රටේ අපනයන තරගකාරිත්වය මිනුම් කිරීමට දර්ශකයක් වශයෙන් යොදා ගැනීමට හැකි වීම යි. මූර්ත සඵල විනිමය අනුපාතිකය ගණනය කරනුයේ නාමික සඵල විනිමය අනුපාතිකයට වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමනය අනුපාතිකයක් මෙරට උද්ධමන අනුපාතිකයත් අතර වෙනස ගැලපීම මගිනි.

- නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය පහළ අගයක් ගැනීම මගින් අදහස් කරන්නේ මෙ රටේ උද්ධමන අනුපාතිකය වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමන අනුපාතිකයට වඩා අඩු බව යි. එයින් තහවුරු වන්නේ මෙරටේ අපනයන තරගකාරිත්වය ඉහළ මට්ටමක පවතින බව යි.

- නාමික සඵල විනිමය අනුපාතිකයට වඩා මූර්ත සඵල විනිමය අනුපාතිකය ඉහළ අගයක් ගැනීම මගින් අදහස් කරන්නේ වෙළෙඳ හවුල්කරුවන්ගේ උද්ධමන අනුපාතිකයට සාපේක්ෂ ව මේ රටේ උද්ධමන අනුපාතිකය වැඩි බව යි. එයින් තහවුරු වන්නේ මේ රටේ අපනයන තරගකාරිත්වය පහළ මට්ටමක පවතින බව යි.

- නාමික සඵල විනිමය අනුපාතිකය මූර්ත සඵල විනිමය අනුපාතිකය සමඟ සැසඳීම ඔස්සේ දේශීය නාමික විනිමය අනුපාතිකය අධි තක්සේරුවකින් යුක්ත ද ඌන තක්සේරුවකින් යුක්ත ද සම තක්සේරුවකින් යුක්ත ද යන්න මිනුම් කළ හැකි ය.

- මූර්ත විනිමය අනුපාතිකය යනු රටවල් දෙකක් අතර පවතින මිල මට්ටම්වල වෙනස්කම් ගලපන ලද නාමික විනිමය අනුපාතිකය යි. එය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

$$\boxed{RER = NER\ (Pd/Pf)}$$

RER = මූර්ත විනිමය අනුපාතිකය

NER = නාමික විනිමය අනුපාතිකය

(රුපියලකින් මිල දී ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය)

Pd = දේශීය මිල මට්ටම්

Pf = විදේශීය රටේ මිල මට්ටම

නිදසුන :

ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් 1 = ශ්‍රී ලංකා රුපියල් 150

ශ්‍රී ලංකාවේ මිල මට්ටම = 110

ඇමෙරිකා එක්සත් ජනපද මිල මට්ටම = 220

මූර්ත විනිමය අනුපාතිකය

$$= \frac{1}{150} \times \frac{110}{220}$$

$$= \underline{\underline{0.0033}}$$

- මූර්ත විනිමය අනුපාතිකය වෙනස් විය හැකි ආකාර දෙකක් ඇත.
    1. මූර්ත විනිමය අනුපාතිකය පහළ යාම
    2. මූර්ත විනිමය අනුපාතිකය ඉහළ යාම

- මූර්ත විනිමය අනුපාතිකය පහළයාම යනුවෙන් අදහස් කරන්නේ වර්ෂය මුල මූර්ත විනිමය අනුපාතිකයට සාපේක්ෂ ව වර්ෂය අවසානයේ මූර්ත විනිමය අනුපාතිකය පහළ අගයක් ගැනීම යි.

නිදසුන :

වර්ෂය මුල මූර්ත විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් 1 = $ 0.03 සිට වර්ෂය අවසානයේ මූර්ත විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා රුපියල් 1 = $ 0.01 දක්වා පහළ යාම.

- මූර්ත විනිමය අනුපාතිකය පහළ යන අවස්ථා පහත දැක්වේ.
    - දේශීය මිල මට්ටම හා විදේශීය මිල මට්ටම ස්ථාවර ව තිබිය දී නාමික විනිමය අනුපාතිකය පහළ යාම

- නාමික විනිමය අනුපාතිකය සහ විදේශ රටේ මිල මට්ටම දේශීය මිල මට්ටම පහළ යාම
- නාමික විනිමය අනුපාතිකය සහ දේශීය මිල මට්ටම ස්ථාවර ව තිබිය දී විදේශ රටේ මිල මට්ටම ඉහළ යාම

- මූර්ත විනිමය අනුපාතිකය පහළ යාමෙන් පහත සඳහන් ප්‍රතිවිපාක ඇති වේ.
    - අපනයන තරගකාරිත්වය වැඩි වී අපනයන ධෛර්යමත් වේ.
    - ආනයන අධෛර්යවත් වේ.
    - වෙළෙඳ ගිණුමේ යහපත් ප්‍රවණතාවක් ඇති වේ.
- සමතුලිත විනිමය අනුපාතිකයන් පිළිබඳ සාකච්ඡා කිරීමක දී ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය වඩාත් වැදගත් සංකල්පයක් වේ.
- වෙළෙඳාමට පාත්‍ර වන සමාන භාණ්ඩ පැසක වටිනාකම රටවල් දෙකේ දේශීය මුදල් ඒකකවලින් මනිනු ලැබුවහොත් එම අගයයන් දෙක අතර අනුපාතිකය ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය වේ.

නිදසුන :

සමාන වර්ගයේ භාණ්ඩ පැසක මිල = රු. 1000/-

එම භාණ්ඩ පැසෙහි විදේශීය රටෙහි මිල $ 20

මේ අනුව ක්‍රය ශක්ති සාම්‍ය $ 20 = රු. 1000/-

$$\$ 1 = රු. = \frac{1000}{20}$$

= රු. 50

- මෙයින් අදහස් කරන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ දී ඩොලරයේ ක්‍රය ශක්තිය ශ්‍රී ලංකාවේ රු. 50 ක ක්‍රය ශක්තියට සමාන බව යි.
- නාමික විනිමය අනුපාතිකය හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය අතර යම් වෙනසක් පැවතුණ ද දිගු කාලයේ දී සමතුලිත විනිමය අනුපාතිකය ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය කරා නැඹුරු විය යුතු ය.
- රටවල් දෙකක් අතර නාමික විනිමය අනුපාතිකය සහ ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය සමාන නම් ඉන් අදහස් වන්නේ දෙරටේ භාණ්ඩවල මිල ගණන් එකිනෙකට සමාන වන බව යි. මේ නිසා එක් රටක් අභිබවා අනෙක් රටට තරගකාරිත්වයේ වාසි ලබා ගත නොහැකි ය.

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍යය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.7 : විනිමය අනුපාතිකයේ වෙනස් වීම් සහ එහි ප්‍රතිවිපාක විග්‍රහ කරයි.**

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- විනිමය අනුපාතිකය වෙනස් වන ආකාරය දක්වයි.
- විනිමය අනුපාතිකය අවප්‍රමාණය සහ ක්ෂය වීම අර්ථ දක්වයි.
- අවප්‍රමාණයේ ප්‍රතිවිපාක නිදසුන් ඇසුරෙන් විස්තර කරයි.
- විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය සහ අගය ඉහළ යාම අර්ථ දක්වයි.
- ප්‍රතිප්‍රමාණයක ප්‍රතිවිපාක නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරයි.
- මුදල් අවප්‍රමාණයේ අපේක්ෂිත ඉලක්ක ඉටු වීමට තිබිය යුතු කොන්දේසි පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විදේශ විනිමයට පවතින ඉල්ලුම සහ සැපයුම මත විනිමය අනුපාතිකය වෙනස් විය හැකි ය. එය නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය තුළ සිදු වේ.

  නිදසුන : වාණිජ බැංකුවල දිනපතා විවිධ විදේශ විනිමයවල අගයන් ප්‍රදර්ශනය කර ඇත. එවැනි ප්‍රදර්ශන පුවරුවක විනිමය අනුපාතික වෙනස් වීම මත ආර්ථිකයේ විදේශ විනිමය මිලට ගැනීම සහ විකිණීම සිදු වේ.

- විදේශ විනිමය අනුපාතිකය වෙනස් වීමට බලපාන සාධක කිහිපයක් ඇත.
  - ජාත්‍යන්තර වෙළෙඳාම
  - ප්‍රාග්ධන සංචලන
  - මිල විචලනය
  - සමපේක්ෂණය
  - ආර්ථික ශක්තිය
  - රාජ්‍ය ප්‍රතිපත්ති
  - කොටස් වෙළෙඳපොළ කටයුතු
  - දේශපාලණික තත්ත්වය
- විනිමය අනුපාතිකය අවප්‍රමාණය විම සහ ප්‍රතිප්‍රමාණය වීම ස්ථාවර විනිමය අනුපාතයක් තුළ සිදු වේ.

- විනිමය අනුපාතිකය ක්ෂය වීම සහ අගය ඉහළ යාම නම්‍ය විනිමය අනුපාතිකයක් තුළ සිදු වේ.

- අපනයන හා ආනයන වෙළෙඳාමට පවතින ඉල්ලුම් සැපයුම් බලවේග මත විනිමය අනුපාතිකය වෙනස් වේ.

01. නිදසුන : ශ්‍රී ලංකාවේ අපනයනකරුවකුට එක්සත් රාජධානියේ ආනයනකරුවා ගෙවිය යුත්තේ ස්ටාර්ලින් පවුම්වලින් ය.

01 නිදසුනට අනුව විදේශ විනිමය සැපයුම ඉහළ යන විට රුපියලේ බාහිර අගය ඉහළ යයි.

02. නිදසුන ශ්‍රී ලංකාවේ ආනයනකරුවකු ජපානයෙන් මෝටර් රථ ආනයනය කරන විට ජපානයේ අපනයන සමාගමට ගෙවිය යුත්තේ යෙන්වලින් ය.

02 නිදසුනට අනුව විදේශ විනිමය සඳහා ඉල්ලුම ඉහළ යාම නිසා දේශීය රුපියලේ බාහිර අගය ක්ෂය වීමට ලක් වෙයි.

- විදේශ ආයෝජන ඉහළ යාම මගින් රටක ප්‍රාග්ධන සංචලනයක් නිසා විදේශ විනිමය සැපයුම ඉහළ යයි. විදේශ විනිමය සැපයුම ඉහළ යන විට රුපියලේ බාහිර අගය ශක්තිමක් වේ.

- ආර්ථිකයේ භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම උච්චාවචනය වීමට සාපේක්ෂ ව අන්තර්ජාතික ව ගනුදෙනු සිදු කරන රටවල භාණ්ඩ හා සේවාවල මිල මට්ටම වෙනස් වීම විනිමය අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපායි.

  නිදසුන : ශ්‍රී ලංකාවේ භාණ්ඩවල හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමට සාපේක්ෂ ව ඉන්දියාවේ සාමාන්‍ය මිල මට්ටම පහළ නම් ඉන්දියානු රුපියල්වලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ රුපියල්වලට බාහිර අගය ක්ෂය වේ.

- විදේශ විනිමය එක් රැස් කිරීම හා විකිණීම මත විනිමය අනුපාතිකය වෙනස් වෙයි. සමපේක්ෂණයේ යෙදෙන්නෝ විනිමය එක් රැස් කිරීම සහ විකිණීමේ කටයුතු සිදු කරති. අනාගතයේ ලාභ ඉපයීම සඳහා විනිමය එක් රැස් කිරීම සිදු කරති. එය විදේශ විනිමය අනුපාතිකය වෙනස් විම කෙරෙහි බලපායි.

- රාජ්‍ය ප්‍රතිපත්තිවල විනිමය ප්‍රතිපත්ති ලිහිල් කිරීම නිසා ඒ රට තුළට ගලා ගෙන එන විනිමය සැපයුම ඉහළ යාම පහළ යාම සිදු විය හැකි ය. එය විනිමය අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපායි.

- කොටස් වෙළෙඳපොළ සක්‍රිය වීම විනිමය සැපයුම ඉහළ යාම සහ පහළ යාම කෙරෙහි බලපායි. එය ද විනිමය අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපායි.

- දේශපාලන ස්ථාවර වීම සහ අස්ථාවර වීම විනිමය අනුපාතිකය වෙනස් වීම කෙරෙහි බලපායි.

නිදසුන : ශ්‍රී ලංකාවේ වසර 30 ට ආසන්න කාලයක පැවති දේශපාලන අස්ථාවර බව විනිමය අනුපාතිකය ක්ෂය වීමට එක් හේතුවකි.

- ස්ථාවර විනිමය අනුපාතිකයක් යටතේ මූල්‍ය අධිකාරීන් නිල විනිමය අනුපාතිකය වෙනස් කිරීම නිසා විනිමය අනුපාතිය අවප්‍රමාණය කිරීම සහ ප්‍රතිප්‍රමාණය සිදු වේ. ගෙවුම් ශේෂයේ හිඟය අඛණ්ඩ ව පවතී නම් නිල විනිමය අනුපාතිකයට වඩා එය පහළ දැමීම විනිමය අනුපාතිකය අවප්‍රමාණය ලෙස හඳුන්වයි.

- නම්‍ය විනිමය අනුපාතිකයක් යටතේ විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ සැලසිය හැකි ය. විනිමය අනුපාතිකය ක්ෂය වීමක් යනුවෙන් අදහස් කරන්නේ දේශීය ව්‍යවහාර මුදල් ඒකකයේ අගය විදේශීය මුදලින් පහත වැටීම යි.

  නිදසුන : ඍජු ප්‍රවේශයට අනුව අමෙරිකානු ඩොලරයේ මිල රුපියල් 100 ක්ව තිබී පසු ව එය රුපියල් 114 දක්වා ඉහළ ගියහොත් එයින් අදහස් කරන්නේ රුපියලේ විදේශ විනිමය වටිනාකමට පහළ වැටීමක් හෙවත් ක්ෂය වීමට පත් ව ඇති බව යි.

- විනිමය අනුපාතිකය අවප්‍රමාණය හෝ ක්ෂය වීම අවස්ථා දෙකක් යටතේ සිදු වූවත් එහි ප්‍රතිඵලය එක හා සමාන වේ.

- විනිමය අනුපාතිකය අවප්‍රමාණයේ ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් වේ.
  - ආනයනවල දේශීය මිල ඉහළ යාම
  - පෙරට වඩා ආනයන වියදම් ඉහළ යාම
  - දේශීය ඉල්ලුම ආනයනය මත රඳා පවතී නම් දේශීය උද්ධමනය ඉහළ යාම
  - විදේශීය ණය වාරික හා පොළිය ඉහළ යාම
  - සංචාරක ඉපයීම් ඉහළ යන අතර ගෙවුම් තුලන ලේඛනයේ සේවා ගිණුමේ ශේෂය හිතකර වීම
  - මැද පෙරදිග ඇතුලු රටවල ශ්‍රී ලාංකික සේවා නියුක්තයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම නිසා සංක්‍රාම ගිණුම යහපත් වීම
  - ආනයන මිල ඉහළ යාම නිසා ආනයනය අධෛර්යවත් වී ආනයන ඉල්ලුම දේශීය භාණ්ඩ වෙත යොමු වීම
  - අපනයන භාණ්ඩ සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වී අපනයන ඉපයීම් ඉහළ යාම

    නිදසුන : ඍජු ප්‍රවේශය අනුව ඩොලරයේ වටිනාකම රුපියල් 100කි. ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයක ඒකකයක වටිනාකම රුපියල් 100කි. විනිමය අනුපාතික ක්ෂය වීමෙන් පසු ඩොලරයේ වටිනාකම රුපියල් 150 වූයේ නම් ඇඟලුම් අපනයන ඒකකයකට ගෙවිය යුත්තේ ඩොලර් 0.66 කි. මේ නිසා අපනයන ඉල්ලුම ඉහළ යයි.

- විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය යනු දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල්වලින් ඉහළ යාම යි.

නිදසුන : ඍජු ප්‍රවේශයට අනුව ඩොලරය රුපියල් 114කට හුවමාරුව තිබිය දී ඩොලරයේ මිල රුපියල් 100 දක්වා වෙනස් වුවහොත් එයින් ප්‍රකාශ වන්නේ විනිමය අනුපාතිකයේ අගය වැඩි වීමකි. මින් පිළිබිඹු වන්නේ ඩොලරයට සාපේක්ෂ ව රුපියලේ අගය ඉහළ ගොස් ඇති නිසා රුපියල් මිල දී ගැනීමට ඉහළ ඩොලර් ප්‍රමාණයක් ගෙවිය යුතු බව යි.

- නම්‍ය විනිමය අනුපාතිකයක් තුළ දී විනිමය අනුපාතිකය ඉහළ යා හැකි ය. විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය වීම හෝ ඉහළ යාම හෝ නිසා ඇති වන ප්‍රතිඵලය එක සමාන වේ.
- විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක පහත සඳහන් වේ.
    - ආනයනවල දේශීය මිල ගණන් පහළ යාම
    - උද්ධමන අනුපාතිකය පහළ යාම (ආනයනය මත රඳා පවතී නම්)
    - විදේශීය ණයවල දේශීය මූල්‍ය වටිනාකම පහළ යාම
    - විදේශීය ණය ආපසු ගෙවීමේ පිරිවැය අඩු වීම
    - ආනයනවල දේශීය මිල පහළ යාම නිසා ආනයන ඉල්ලුම ප්‍රසාරණය වී අනයන වියදම් ඉහළ යාම
    - ඒ නිසා වෙළෙඳ ශේෂය කෙරෙහි අහිතකර බලපෑම
    - අපනයනකරුවන්ට ලැබෙන විදේශ විනිමය ආදායම්වල දේශීය මුදලින් වටිනාකම අඩු වීම නිසා අපනයන අධෛර්යවත් වීම
    - විදේශීය සේවා නියුක්තීන්ගේ ඉපයීම් සඳහා දේශීය මුදලින් වටිනාකම අඩු වීම නිසා සේවා නියුක්තයන්ට අවාසි වීම
- විනිමය අනුපාතිකය අවප්‍රමාණයේ අපේක්ෂිත අරමුණු කිහිපයකි.
    - ගෙවීම් තුලන ලේඛනයේ දිගු කාලීන හිඟය අවම කිරීම
    - ආනයන ඉල්ලුම අධෛර්යවත් කිරීම
    - අපනයන සැපයුම ධෛර්යවත් කිරීම
    - සේවා නියුක්තයන්ගේ ප්‍රේෂණ දිරිමත් කිරීම
    - විදේශ ඍජු ආයෝජන ඉහළ නැංවීම
- මෙම අපේක්ෂිත ඉලක්ක සපුරා ලීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කිහිපයකි.

    (i) අපනයනය සඳහා විදේශිකයින්ගේ ඉල්ලුම මිල නම්‍ය වීම

    (ii) ආනයනය සඳහා ඇති දේශීය ඉල්ලුම මිල නම්‍ය වීම

(iii) අපනයනය හා ආනයනය ඉල්ලුම වෙන් වෙන් ව ගත් විට මිල ඉල්ලුම් නම්‍යතාවක් නොපෙන්නුවත් එම දෙකෙහිම එකතුව මිල ඉල්ලුම් නම්‍යතාව එකට වැඩි අගයක් ගැනීම (මාර්ෂල්-ලර්නර් කොන්දේසිය).

(iv) අපනයන පිළිබඳ දේශීය සැපයුම නම්‍ය වීම

(v) දේශීය මිල මට්ටම ස්ථාවර වීම

- විනිමය අනුපාතිකය ක්ෂය වීම හෝ අවප්‍රමාණය කිරීමෙන් හෝ අපේක්ෂිත අරමුණු වෙත යාමට දේශීය මිල මට්ටම සථාවර වීම අත්‍යවශ්‍ය සාධකයකි. විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමෙන් විදේශිකයන්ට ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ මිල දී ගැනීම වාසි දායක විය හැකි ය. ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා මිල ඉහළ යාමක් සිදු වන්නේ නම් විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමේ එම වාසිය නොලැබෙනු ඇත.

**නිපුණතාව 10.0 : විදේශ මූල්‍ය ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය ගවේෂණය කරයි.**

**නිපුණතා මට්ටම 10.8 : බහු පාර්ශ්වීය මූල්‍ය ආයතනවල කාර්යයන් විමසයි.**

**කාලච්ඡේද ගණන** : 06

**ඉගෙනුම් පල :**

- බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන නම් කරයි.
- අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ අරමුණු දක්වයි.
- අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ කාර්යයන් විස්තර කරයි.
- ලෝක බැංකුවේ අරමුණු දක්වයි.
- ලෝක බැංකුවේ කාර්යයන් විස්තර කරයි.
- ලෝක බැංකුවේ කාලීන වෙනස්කම් විමසයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව ශක්තිමත් කොට ලෝක වෙළෙඳාම වර්ධනය කිරීමත් විනිමය අනුපාතිකයන්හි ක්‍රමවත් භාවයක් ඇති කිරීමත් අරමුණු කර ගනිමින් ලෝකයේ රටවල් එකතු වී පිහිටුවා ගෙන ඇති මූල්‍ය ආයතන බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන යනුවෙන් හඳුන්වයි.
- එසේ පිහිටුවා ගෙන ඇති ප්‍රධාන බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන දෙකකි.

    (i) අන්තර්ජාතික මූල්‍ය අරමුදල

    (ii) ලෝක බැංකුව

- ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, විනිමය අනුපාතිකයන්හි ස්ථාවරත්වය සහ විනිමය අනුපාතික ප්‍රබල විධිමත් භාවය ප්‍රවර්ධනය කිරීම සඳහාත් ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්ත මට්ටම් වර්ධනය කිරීමටත් ගෙවුම් ශේෂ ගැළපීම් පහසු කරලීම සඳහා සාමාජික රටවලට තාවකාලික මූල්‍ය ආධාර සැපයීම සඳහාත් 1945 දෙසැම්බර් 27 දින අන්තර්ජාතික මූල්‍ය අරමුදල ආරම්භ කර ඇත.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ආරම්භක සාමාජිකයන් සංඛ්‍යාව 29ක් වන අතර වර්තමාන සාමාජික සංඛ්‍යාව 186කි.
- අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ අරමුණු පහත දැක්වේ.

    1. ජාත්‍යන්තර මූල්‍ය ගැටලුවල දී උපදේශන සහ සහයෝගීතාව ලබා දෙන ස්ථිර ආයතනයක් පිහිටුවීම මගින් මූල්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම

2. සියලුම සාමාජික රටවල නිෂ්පාදන සම්පත් සංවර්ධනය කිරීමටත් ඉහළ සේවා නියුක්තයක් හා මූර්ත ආදායමක් පවත්වා ගෙන යාමටත් අන්තර් ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයටත් අවශ්‍ය පහසුකම් සැපයීම

3. සංවර්ධන රටවල් අතර විනිමය අනුපාතියන් ක්‍රමවත් ව පවත්වා ගෙන යමින් විනිමය අනුපාතිකයන්හි ස්ථාවර භාවයක් ඇති කිරීම

4. සාමාජික රටවල වර්තන ගනුදෙනු සම්බන්ධයෙන් බහු පාර්ශ්වීය ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරීම හා අන්තර් ජාතික වෙළෙඳාමේ වර්ධනයට බාධා පමුණුවන විදේශ විනිමය සීමාවන් ඉවත් කිරීම

5. ගෙවුම් ශේෂයේ ගැළපුම ඇති කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සාමාජික රටවලට තාවකාලික ව ලබා දීම

6. සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතා සහ එම අසමතුලිතතා පවතින කාලය අඩු කිරීම

- අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ කාර්යයන් පහත දැක් වේ.

1. ජාතික ආර්ථිකයන් හා ලෝක ආර්ථිකයන් අනතුරුදායක තත්වයන්ට පත් වන අවස්ථාවල දී නිවැරදි මඟට යොමු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

2. බැංකු හා මූල්‍ය කටයුතුවල ගුණාත්මක භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය නීතිරීති පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දීම

3. හදිසි මූල්‍ය අර්බුදවල දී සාමාජික රටවලට තාවකාලික ණය පහසුකම් ලබා දීම, දිගු කාලීන ආර්ථික ගැටලුවල දී මූල්‍ය පහසුකම් ලබා දීම හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කොට විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම

4. සාමාජික රටවලට තාක්ෂණික සහයෝගීතාව ලබා දීම හා රජයේ හා මහ බැංකු නිලධාරීන් පුහුණු කිරීම

5. සාමාජික රටවල් අතර රාජ්‍ය මූල්‍ය, විදේශ මූල්‍ය හා ජාතික ගිණුම් වැනි අංශ සම්බන්ධ ප්‍රමිති සැකසීම හා ඒ අනුව තොරතුරු ප්‍රකාශයට පත් කිරීම මගින් අන්‍යෝන්‍ය අවබෝධය හා අධ්‍යාපනය සාමාජික රටවල් අතර බෙදා හැරීම

- ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය ඇතුළු රටවල් 42 ක සහභාගිත්වයෙන් 1944 ජූලි මාසයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ බ්‍රෙට්න්වුඩ්ස් නගරයේ පැවති බ්‍රෙට්න්වුඩ්ස් සමුළුවේ ප්‍රතිඵලයක් ලෙස දෙවන ලෝක සංග්‍රාමයෙන් විනාශයට පත් වූ යුරෝපා රටවල් යළි පුනරුත්ථාපනය කිරීමේ අරමුණෙන් 1947 මාර්තු 01 දින ලෝක බැංකුව පිහිටුවා ඇත.

- 1946 වර්ෂයේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ ලෝක බැංකුවේ ආරම්භක සාමාජික සංඛ්‍යාව 38කි. වර්තමානය වන විට ලෝකයේ රටවල් 186 ක් මෙහි සාමාජිකත්වය දරයි.
- ලෝක බැංකුව ප්‍රධාන ආයතන දෙකකින් සමන්විත වේ.
  1. ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව
  2. අන්තර්ජාතික සංවර්ධන සංගමය
- ලෝක බැංකුවේ අරමුණු පහත දැක්වේ.
  - සාමාජික රටවල නිෂ්පාදන කටයුතු සඳහා අන්‍යෝන්‍ය පහසුකම් සැපයීම මගින් එම රටවල ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම
  - සාමාජික රටවලට ලිහිල් කොන්දේසි මත විදේශ ප්‍රාග්ධනය නොලැබෙන විට විදේශ පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම් සඳහා අවශ්‍ය පහසුකම් හා අවස්ථා ඇති කිරීම
  - පෞද්ගලික ආයෝජනවලට අමතර ව බැංකුවේ අරමුදල් හා වෙනත් මාර්ගවලින් ලබා ගන්නා අරමුදල් ද භාවිත කරමින් සාමාජිත රටවල ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා දිගු කාලීන ණය සැපයීම
  - සාමාජික රටවලට කාර්මික හා ශිල්පීය උපදෙස් සේවා ලබා දීම
  - සාමාජික රටවල නිෂ්පාදන සම්පත් වර්ධනය කිරීම මගින් හා අන්තර්ජාතික ආයෝජන දිරි ගැන්වීම මගින් අන්තර්ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයක් ඇති කිරීම
  - ලෝකයේ දිළිඳු බව අඩු කිරීම
- ලෝක බැංකුවේ කාර්යයන් පහත සඳහන් වේ.
  - සාමාජික රටවලට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයීම
  - සාමාජික රටවලට සහනදායී කොන්දේසි යටතේ ණය ලබා දීම
  - විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබා දීම
  - සාමාජික රටවල සංවර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීමට හා අධීක්ෂණය කිරීමට ලෝක බැංකු විශේෂඥයන්ගේ සහයෝගය ලබා දීම
  - තිරසර සංවර්ධනය ඇති කිරීම සඳහා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරිමටත් ආර්ථික ඵලදායිතා ඉහළ නැංවීමටත්, පරිසරය ආරක්ෂා කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සහයෝගීතාව ගොඩ නැංවීමටත් කටයුතු කිරීම

- සාමාජික රටවලට ගෝලීයකරණ ගමන් මඟට පිවිසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
- ලෝක වෙළෙඳපොළේ මුහුණපෑමට සිදු වන අවාසිදායක තත්ත්වයන් සමනය කර ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය ආධාර සැපයීම
- ලෝක ප්‍රජාව සමඟ යහපත් සම්බන්ධතා ගොඩ නඟා ගැනීම සඳහා සහයෝගය ලබා දීම
- නව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබා දීම

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.1 : ආර්ථික වෘද්ධියේ වැදගත්කම අගය කරමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරයි.**


**කාලච්ඡේද ගණන : 08**

**ඉගෙනුම් පල :**

- ආර්ථික වෘද්ධිය අර්ථකථනය කරයි.
- ආර්ථික වෘද්ධිය මැනීම සිදු කරන ආකාරය විස්තර කරයි.
- ආර්ථික වෘද්ධිය තීරණය වන සාධක පෙන්වා දෙයි.
- ආර්ථික වෘද්ධියේ වැදගත්කම පැහැදිලි කරයි.
- ආර්ථික වෘද්ධියේ පිරිවැයක් පවතින බව නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික වෘද්ධි ප්‍රවණතා පැහැදිලි කරයි.
- වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ විග්‍රහ කරයි.


**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික වෘද්ධිය යන්නෙන් අදහස් වන්නේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩි වීම යි.
- න්‍යායාත්මක ප්‍රවේශයක් ඔස්සේ නිර්වචනය කරන විට ආර්ථික වෘද්ධිය යනු ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ප්‍රසාරණය වීම යි.
- ආර්ථික වෘද්ධියක දී ආර්ථිකයේ මූර්ත නිමැවුම දිගු කාලීන ව ප්‍රසාරණය වීමක් සිදු වේ.
- නමුත් සැබවින් ම ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් කරනුයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමෙහි ලා ආර්ථිකය සතු ධාරිතාව ප්‍රසාරණය වීමයි.
- ආර්ථික වෘද්ධිය පෙන්නුම් කළ හැකි ආකාර දෙකකි.
    1. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇසුරෙන් පෙන් වීම




ඉහත රූප සටහනේ නිෂ්පාදන හැකියා මායිම $PPF_1$ සිට $PPF_2$ දක්වා විතැන් වීම මගින් ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය නිරූපණය කර ඇත.

2. සමාහාර ඉල්ලුම් හා සමාහාර සැපයුම් ඇසුරෙන් පෙන් වීම




- ඉහත රූප සටහනට අනුව ආර්ථිකයේ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය $AS_1$ සිට $AS_2$ දක්වා දකුණට විතැන් වීම මගින් ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටමේ වැඩි වීම නිරූපණය කළ හැකි ය. විභව නිමැවුම් මට්ටම වැඩි වීමෙන් පෙන්නුම් කරනුයේ ආර්ථික වෘද්ධිය යි.
- ආර්ථික වෘද්ධිය මැනීම සඳහා ක්‍රම දෙකක් භාවිත කරයි.
    1. කාලයක් සමග මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ ශුද්ධ දේශීය නිෂ්පාදිතයෙහි හට හෝ නොගන්නා වැඩි වීම
    2. කාලයක් සමග ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ ප්‍රතිශීර්ෂ මූර්ත ශුද්ධ දේශීය නිෂ්පාදිතයේ හට හෝ නොගන්නා වැඩි වීම
- ආර්ථික වෘද්ධිය මනිනු ලබන්නේ ආර්ථික වෘද්ධි අනුපාතිකය මගිනි.

| | |
|---|---|
| ආර්ථික වෘද්ධි අනුපාතිකය = | (අදාළ වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය - පෙර වර්ෂයේ වූ මූර්ත දළ දේශීය නිෂ්පාදනය) / පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය X 100 |

නිදසුන් : අදාළ වර්ෂයේ මූර්ත දළ දේශීයනිෂ්පාදිතය රු. ට්‍රිලියන 210 යැයි ද පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. ට්‍රිලියන 200 යැයි ද සිතමු. එවිට,

ආර්ථික වෘද්ධි අනුපාතය

$$= \frac{210 - 200}{200} \times 100$$

$$= \underline{\underline{5\%}}$$

- ආර්ථික වෘද්ධිය තීරණය කරන සාධක පහත පරිදි දැක්විය හැකි ය.
    - සම්පත් සම්භාරය
    - භෞතික ප්‍රාග්ධනය
    - මානව ප්‍රාග්ධනය
    - ස්වාභාවික ප්‍රාග්ධනය
    - සමාජ ප්‍රාග්ධනය
    - ඵලදායිතාව
        - තාක්ෂණය
        - මානව ප්‍රාග්ධනය
    - ආර්ථික ස්ථායීතාව
        - දේශපාලන ස්ථාවරත්වය
        - යහපාලනය
- ආර්ථික වෘද්ධියේ වැදගත්කම පහත සඳහන් පරිදි වේ.
    - ඉහළ ජීවන මට්ටමක් අත්පත් කර ගැනීමට හැකි වීම
    - සේවා නියුක්තිය ඉහළ යාම
    - සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගත හැකි වීම
    - ආයෝජන ශක්තිමත් වීම
    - විශ්වසනීයත්වය වර්ධනය වීම නිසා ව්‍යාපාරිකයන්ගේ ලාභ වැඩි වීම

- ආර්ථික වෘද්ධියේ පිරිවැය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
    - පාරිසරික ගැටලු ඇති වීම
        - පරිසර දූෂණය
        - පරිසර හායනය
        - ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් විනාශ වීම
        - නිෂ්පාදනයේ හා පරිභෝජනයේ සෘණ බාහිරතා ඇති වීම
- ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයන් පැන නැඟීම
- ආදායම් විෂමතා හට ගැනීම
- ප්‍රදේශයේ විෂමතා හට ගැනීම
- ජනතාවගේ ශුභසාධනය වර්ධනය වන ක්ෂේත්‍ර තුළ ආදායම ආයෝජනය නොවුවහොත් ජීවන තත්ත්වයට බලපෑම් ඇති වීම
- වර්තමාන පරිභෝජනය පහළ යාම

(ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෘද්ධි ප්‍රවණතා අදාළ වර්ෂයන්හි මහ බැංකු වාර්තා පරිශීලනය කරමින් සිසුන්ට පැහැදිලි කරන්න).

- වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ පහත දැක්වේ.
    - ගෝලීය ආර්ථිකයෙහි පූර්ණ ලෙස වාසි ලබා ගැනීම
    - සාර්ව ආර්ථිකයෙහි ස්ථායිතාව පවත්වා ගැනීම
    - ඉහළ ඉතුරුම් හා ආයෝජන මට්ටමක් රඳවා ගැනීම
    - සම්පත් බෙදා හැරීම වෙළෙඳපොළ බලවේග මගින් සිදු වීම
    - කැප වුණු විශ්වසනීය හා කාර්යක්ෂම ආණ්ඩු පැවතීම

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.2 : සංවර්ධනය ආශ්‍රිත විවිධ සංකල්ප විග්‍රහ කරයි.**

**කාලච්ඡේද ගණන : 08**

**ඉගෙනුම් පල :**

- ආර්ථික සංවර්ධනය අර්ථ දක්වයි.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක දී ආර්ථික ව්‍යූහයේ ඇති වන වෙනස්කම් විස්තර කරයි.
- සංවර්ධන සංකල්ප අර්ථ දක්වයි.
- සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.
- ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනස සසඳයි.
- මානව සංවර්ධනය අර්ථ දක්වයි.
- තිරසර සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.
- සංවර්ධනය ආශ්‍රිත නව ප්‍රවණතා විග්‍රහ කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආර්ථික සංවර්ධනය පරිණාමන ක්‍රියාවලියක් වන අතර ආර්ථික වෘද්ධියක් සමග බැඳුණු ආර්ථිකයේ ව්‍යූහමය වෙනස් වීම් ඊට ඇතුළත් වේ.
- ආර්ථික වෘද්ධිය ප්‍රමාණාත්මක පැතිකඩක් පමණක් වන අතර ආර්ථික සංවර්ධනයේ දී ප්‍රමාණාත්මක පැතිකඩට අමතර ව ගුණාත්මක ලක්ෂණ ද ඇතුළත් ය.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක දී ආර්ථික වෘද්ධියත් සමග ආර්ථික ව්‍යූහයේ පහත සඳහන් ගුණාත්මක වෙනස්කම් සිදු විය යුතු ය.
    - කාර්මීකරණය වේගවත් වීම
    - නිෂ්පාදන සම්පත්වල ඵලදායකත්වය ඉහළ යාම
    - නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්ෂණය උසස් වීම
    - නවීකරණය වීම
    - නිෂ්පාදන අංශයන්හි ව්‍යූහාත්මක වෙනස්කම් සිදු වීම
    - දුගී බව, විරැකියාව අඩු වීම හා ආදායම් විෂමතාව නැති වීම

- සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි. මිනිස් ජීවිතයේ ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික ආදි වශයෙන් සියලු ම පැතිකඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වැඩි දියුණු වීමත් සංවර්ධනය යන්නෙන් අදහස් වේ.
- මිනිසාගේ ජීවන තත්ත්වය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් කරා වෙනස්වීම සංවර්ධනය යි.
- ජීවන තත්ත්වය අයහපත් වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක 5කි.
    1. භෞතික දැ හිඟ වීම
    2. ශාරීරික වශයෙන් දුර්වල වීම (රෝගී වීම)
    3. සමාජ සම්බන්ධතා අයහපත් වීම
    4. අනාරක්ෂිත භාවය
    5. බල රහිත වීම
- සංවර්ධනය ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික වශයෙන් පැතිකඩ සමූහයක් සමඟ බැඳී පවතී.
- ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර පහත සඳහන් වෙනස්කම් හඳුනා ගත හැකි ය.
    - ආර්ථික වෘද්ධිය මගින් ආර්ථිකය සතු නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර සංවර්ධනය මගින් ආර්ථිකයක වෙසෙන මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.
    - ආර්ථිකයේ භාණ්ඩ හා සේවා පරිමාවේ හෝ ආදායමේ හෝ හටගෙන ඇති ප්‍රමාණාත්මක වැඩි වීම ආර්ථික වර්ධනය මගින් දක්වන අතර එම ආර්ථික වර්ධනයත් සමඟ මිනිස් ජීවිතවල සිදු වන ගුණාත්මක වර්ධනය සංවර්ධනය මගින් දක්වයි.
    - ආර්ථික වර්ධනය මගින් පෙන්නුම් කරනුයේ රටක ප්‍රමාණාත්මක පැතිකඩ පමණි. සංවර්ධනය මගින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක පැතිකඩ යන දෙක ම පිළිබිඹු කෙරේ.
    - රටක ප්‍රතිශීර්ෂ ආදායම, මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ආදිය යොදා ගනිමින් රටක ආර්ථික වෘද්ධිය මිනුම් කළ හැකි ය.
- මානව සංවර්ධනය යනු මිනිසුන්ට තමන්ගේ මානව හැකියාවන් සම්පූර්ණයෙන් ම පුළුල් කර ගැනීමට මෙන් ම එකී හැකියාවන් ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලන යන ක්ෂේත්‍රයන් හි උපරිම වශයෙන් භාවිත කිරීමට ඇති හැකියාව ලබා දීම සහ අනාගත පරම්පරාවට ද එම අයිතිය තහවුරු කිරීම යි.
- මානව සංවර්ධනය විවිධ පැතිකඩ සහිත විවෘත සංකල්පයක් වන අතර එය ක්‍රියාවලියක් වශයෙන් එක් එක් පුද්ගලයන්ගේ උරුම හා හිමිකම් තත්ත්වයන් වෙන් කොට දක්වන්නා වූ ගෝලීය වශයෙන් සම්බන්ධ වූ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ව්‍යුහයන් තුළ ක්‍රියාත්මක වේ. එයින් ජනතාව විසින් භුක්ති විඳිනු ලබන නිදහස නිර්ණය කෙරේ.

- එම පැතිකඩයන්ට අයත් වන අංශ පහත දැක්වේ.
    - ආදායම
    - අධ්‍යාපනය
    - සෞඛ්‍ය තත්ත්වය
    - සවිබල ගැන්වීම
    - දේශපාලන ස්වාධීන බව
    - යහපත් සමාජ සම්බන්ධතා
    - සමානතාව
        - වැඩ කරන පරිසරය
        - විවේක ගැනීමේ පහසුකම්
        - දේශපාලන සුරක්ෂිත බව
        - ආර්ථික නිදහස
        - පාරිසරික ගුණාත්මක භාවය
    - අනාගත පරම්පරාවලට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ලෙස වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනෙන සංවර්ධනය තිරසර සංවර්ධනය යි.
    - තිරසර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජීය හා පාරිසරක යන අංශ තුනෙහි ම තුලනාත්මක වර්ධනයක් සිදු විය යුතු ය.
    - තිරසර සංවර්ධනයේ පැතිකඩ පහත දැක්වේ.
    - ආර්ථික පැතිකඩ
        - පාරිසරික පැතිකඩ
        - කාර්යක්ෂමතාව
        - ස්ථායිතාව
    - පාරිසරික පැතිකඩ
        - මිනිසුන්ට හිතකර සනීපාරක්ෂක පරිසරය
        - ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් කාර්යක්ෂම උපයෝජනය කිරීම
        - ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් සුරැකීම
    - සමාජීය පැතිකඩ
        - සාධාරණත්වය
        - සහභාගිත්වය
        - සවිබල ගැන්වීම
        - සමාජ සංචලතාව
        - සමාජ සහජීවනය
        - සංස්කෘතික අනන්‍යතාව

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.3 :** සංවර්ධනය මිනුම් කිරීමේ දර්ශක පෙළගස්වමින් සංයුක්ත දර්ශක පිළිබඳ ව විමර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශක පෙළ ගස්වයි.
- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම හා අඩුපාඩු අනාවරණය කරයි.
- ප්‍රතිශීර්ෂ ආදායම පදනමක් ලෙස යොදා ගෙන ලෝක බැංකුව ආර්ථික වර්ගීකරණය කරන ආකාරය ඉදිරිපත් කරයි.
- සංවර්ධනය මැනීම සඳහා සංයුක්ත දර්ශක නම් කරයි.
- මානව සංවර්ධන දර්ශක හඳුන්වයි.
- මානව සංවර්ධන දර්ශකය සකස් කිරීමට යොදා ගැනෙන සංරචක නම් කරයි.
- මානව සංවර්ධන දර්ශකය මත පිහිටා රටවල් වර්ග කරන ආකාරය දක්වයි.
- මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙයි.
- මානව සංවර්ධනයෙහි ලා ශ්‍රී ලංකාව අත්පත් කර ගත් ප්‍රගතිය අනාවරණය කරයි.
- සන්තුෂ්ටි දර්ශකය හඳුන්වයි.
- එහි සංරචක විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සංවර්ධනය මිනුම් කිරීම සඳහා යොදා ගන්නා දර්ශක ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
    1. ආර්ථික දර්ශක
    2. සංයුක්ත දර්ශක
- සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා ආර්ථික දර්ශක පහත දක්වේ.
- ප්‍රතිශීර්ෂ ආදායම යනු දේශීය හෝ ජාතික ආදායමේ වටිනාකම ජනගහනයට සාපේක්ෂ ගණනය කළ විට එක් පුද්ගලයකුට ලැබෙන ආදායම යි. එය මූර්ත වශයෙන් මෙන් ම මූල්‍ය වශයෙන් ද ගණනය කළ හැකි ය.

- ප්‍රතිශීර්ෂ ආදායම ගණනය කරනුයේ පහත සඳහන් අයුරෙනි.

$$\text{ප්‍රතිශීර්ෂ ආදායම} = \frac{\text{දළ දේශීය / ජාතික ආදායම}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$$

  - දළ දේශීය හා දළ ජාතික ආදායමේ වර්ධනය
  - දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික වර්ධනය (කෘෂිකාර්මික, කාර්මික, සේවා)
  - දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය
  - ඉතිරි කිරීම් (දේශීය, ජාතික)
  - ආයෝජන (පෞද්ගලික, රාජ්‍ය)
  - උද්ධමනය
- මෙම ආර්ථික දර්ශකවලින් ආර්ථිකයේ විවිධ අංශවල සංවර්ධන මට්ටම් මැන බැලේ. එම නිසා ඒවා ආංශික මිනුම් ය.
- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
  - සංවර්ධනය මැනීම සඳහා ප්‍රතිශීර්ෂ ආදායම යොදා ගන්නා විට, වඩාත් යෝග්‍ය මිනුම වන්නේ ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය යි. මෙමගින් සැබෑ වශයෙන් භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වෙනස් වීම හඳුනා ගත හැකි ය.
  - එමෙන් ම වර්ෂය තුළ සිදු වන මුළු නිෂ්පාදිතයෙන් ජනතාවට වර්තමාන හා අනාගත පරිභෝජනය සඳහා ලැබෙන ප්‍රමාණය හඳුනා ගැනීමට ඉඩ සැලසේ.
  - සමස්තයක් වශයෙන් රටක ජනතාව ලබන ප්‍රතිලාභ මෙම දර්ශකය මගින් මැනේ. එනම් පරිභෝජනය හා ආයෝජනය සඳහා රටක ජනතාවට ලබා හැකි මූර්ත භාණ්ඩ හා සේවා ප්‍රමාණය කොපමණ දැයි මෙමගින් ගණනය කළ හැකි ය.
  - රටවල් අතර දියුණුව සැසඳීමේ දර්ශකයක් ලෙස වැදගත් වේ.
- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල පහත සඳහන් අඩුපාඩු හඳුනා ගත හැකි ය.
- ඉහත සඳහන් ආංශික දර්ශක සියල්ල ම ගණනය කරනු ලබන්නේ ජාතික ආදායම් ගිණුම් දර්ශක පදනම් කර ගෙන යි. එසේ වුවත් ජාතික ආදායම් ගිණුම් දත්තවල පවත්නා දුර්වලතා සහ ඒවා සකස් කිරීමේ දී පැන නඟින ගැටලු

සැලකිල්ලට ගත් විට සංවර්ධනයේ ආර්ථික පැතිකඩ මෙම දර්ශක මගින් නිවැරදි ව මැනේ ද යන්න ගැටලුවකි.

- ජාතික ආදායම් දත්ත යොදා ගැනීමේ දී පැන නැගෙන ඌනතා පහත දැක්වේ.
  1. ද්විගණන දෝෂ හට ගැනීම
  2. භාණ්ඩවල ගුණාත්මක තත්ත්වයේ හට ගන්නා වෙනස්කම් පෙන්නුම් නොකිරීම
  3. වෙළෙඳපොළ ගනුදෙනුවලට පාත්‍ර නොවන ඵලදායි ආර්ථික කටයුතුවල එකතු කළ අගයන් වාර්තා නොවීම
  4. ශුභසාධනයට අහිතකර අවගුණ භාණ්ඩ නිෂ්පාදන දත්ත ඇතුළත් වීම
  5. නිෂ්පාදනය නිසා හට ගන්නා ස්වාභාවික සම්පත් ක්ෂය වීම් හා පරිසරයට සිදු වන හානි සැලකිල්ලට නොගැනීම
  6. ආදායම් බෙදී යන ආකාරය පිළිබිඹු නොවීම
  7. විදේශ ණය ගැති භාවය සහ විදේශ සම්පත් ක්ෂය වීම් ජාතික ගිණුම් තුළින් පිළිබිඹු නොවීම
  8. භෞතික ශුභසාධනයට අදාළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පමණක් ජාතික ගිණුම් තුළට ඇතුළත් කිරීම
  9. ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් පෙන්නුම් නොකිරීම
  10. රටවල් අතර සංවර්ධන මට්ටම් සැසඳීමේ දී ප්‍රතිශීර්ෂ ආදායම, නාමික විනිමය අනුපාතිකය යොදා ගනිමින් ඇමරිකානු ඩොලර් ඒකකවලින් ප්‍රකාශ කිරීම
- ප්‍රතිශීර්ෂ ආදායම පදනමක් ලෙස යොදා ගෙන ලෝක බැංකුව ලෝකයේ රටවල් පහත සඳහන් අයුරෙන් වර්ගීකරණය කරයි.
  1. අඩු ආදායම් රටවල් (ඩොලර් 975 හෝ ඊට අඩු)
  2. පහළ මැද ආදායම් රටවල් (ඩොලර් 977 - 3855)
  3. ඉහළ මැද ආදායම් රටවල් (ඩොලර් 975 - 11905)
  4. ඉහළ ආදායම් රටවල් (ඩොලර් 11906 හෝ ඊට වැඩි)
- සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා සංයුක්ත දර්ශක පහත දැක් වේ.
  1. මානව සංවර්ධන දර්ශකය
  2. සන්තුෂ්ටි දර්ශකය

- ලෝකයේ විවිධ රටවල සමාජ ආර්ථික සංවර්ධනය පරික්ෂා කර බැලීම සඳහා වඩා පරිපූර්ණ හා විශ්ලේෂණාත්මක මිනුමක් වශයෙන් 1990 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් මානව සංවර්ධන දර්ශකය හඳුන්වා දී ඇත.
- මෙම දර්ශකය මගින් රටක ආර්ථිකයේ පුළුල් පැතිකඩක් ආවරණය කරන අතර වසරින් වසර යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යයි.
- මානව සංවර්ධනය මැනීම සඳහා නිර්ණායක විශාල සංඛ්‍යාවක් භාවිත කළ හැකි වුවත් සංවර්ධනයේ ප්‍රධාන අරමුණු 3ක් වන සෞඛ්‍ය, දැනුම හා ජීවන මට්ටමට අදාළ සංරචක 3ක් යොදා ගනිමින් මෙම දර්ශකය සකස් කර ඇත.

මානව සංවර්ධන දර්ශකයට ඇතුළත් කර ඇති ප්‍රධාන සංරචක 3 පහත දැක්වේ.

1. උපතේ දී ආයු අපේක්ෂාව (සෞඛ්‍ය)
2. (i) පාසල් අධ්‍යාපනය ලැබූ අතර සංඛ්‍යාවේ මධ්‍යයන අගය (දැනුම)

   (i) පාසල් අධ්‍යාපනයට යොමු වන දරුවකු අධ්‍යාපනයේ නිරත වෙතැයි අපේක්ෂිත වසර සංඛ්‍යාව (දැනුම)
3. ක්‍රය ශක්ති සාම්‍යය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම

$$\text{ක්‍රය ශක්ති සාම්‍යය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම} = \frac{\text{රටක නිපදවන භාණ්ඩ ප්‍රමාණය} \times \text{ඒ ඒ භාණ්ඩයේ ඩොලර් මිල}}{\text{ජනගහන ප්‍රමාණය}}$$

- මානව සංවර්ධන දර්ශකයේ අගය පදනම් කර ගනිමින් ලෝකයේ රටවල් මානව සංවර්ධන මට්ටම් 4ක් යටතේ වර්ග කරයි.
  1. ඉතා ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල්
  2. ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල්
  3. මධ්‍යම මානව සංවර්ධනයක් සහිත රටවල්
  4. අඩු මානව සංවර්ධනයක් සහිත රටවල්

  (අදාළ වර්ෂයට අනුව මානව සංවර්ධන දර්ශකය අනුව රටවල් වර්ගීකරණය සිසුන්ට ලබා දෙන්න).
- මෙම වර්ගීකරණය කර ඇත්තේ මානව සංවර්ධන දර්ශකයේ නිරපේක්ෂ දර්ශක අගයන් මත නොව රටවල් සියල්ල එක් ව ගෙන ඒවායේ සාපේක්ෂ තත්ත්වය සැලකිල්ලට ගනිමිනි.

- සංවර්ධන මිනුමක් ලෙස මානව සංවර්ධන දර්ශකයේ පහත සඳහන් ප්‍රබලතා දැකිය හැකි ය.
    - ගෝලීය වශයෙන් කෙරෙන සැසඳීම්වල දී සංවර්ධනය මනින වඩාත් තොරතුරු සහිත නිර්ණායකයක් වශයෙන් මානව සංවර්ධන දර්ශකය වැදගත් වේ.
    - සංවර්ධනයට අයත් දෑ කවරේ ද සංවර්ධන ක්‍රියාවලියේ දී සාර්ථක වී ඇති රටවල් කවරේ ද යන්න පිළිබඳ ව දැනුම හා අවබෝධය පුළුල් කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ඉතා ප්‍රයෝජනවත් මිනුමක් ලෙස මානව සංවර්ධන දර්ශකය වැදගත් වේ.
    - සංවර්ධනය යනු මිනිසාට තේරීම් කිරීමට ඇති නිදහස පුළුල් කෙරෙන ක්‍රියාවලියක් බැවින් එය තීරණය වන්නේ හුදෙක් ආදායම් මට්ටම මත පමණක් නොව ආයු අපේක්ෂණය, සාක්ෂරතාව, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සමාජීය සාධක මගිනි. මානව සංවර්ධන දර්ශකය මේවා සැලකිල්ලට ගෙන ඇත.
    - සංවර්ධනය මැනීමේ දී යොදා ගන්නා ප්‍රතිශීර්ෂ ආදායම වැනි පටු මිනුම්වලින් හට ගන්නා සීමාකම් මානව සංවර්ධන දර්ශකයෙන් පහ ව යයි.
    - මෙම දර්ශකය පදනම් කර ගනිමින් ලෝකයේ රටවල් සංවර්ධන මට්ටම් අනුව වර්ග කළ හැකි ය.
- සංවර්ධන මිනුමක් වශයෙන් මානව සංවර්ධන දර්ශකයේ පහත සඳහන් දුබලතා දැකිය හැකි ය.
    - මානව සංවර්ධන දර්ශක සමාහාර මිනුමක් වන බැවින් රටවල් අභ්‍යන්තරයේ දැකිය හැකි සංවර්ධන විෂමතාවන් (ආදායම් ව්‍යාප්තිය, ප්‍රදේශීය සංවර්ධනය වැනි) හඳුනා ගත නොහැකි ය.

        නිදසුන් : සංවර්ධනයට අදාළ සියලු අංග මේ යටතේ සැලකිල්ලට නොගනී.

        එනම්. සහභාගිත්වය, දේශපාලන නිදහස, මානව ආරක්ෂාව වැනි අංග
    - ගුණාත්මක වෙනස්කම් මෙම දර්ශකයෙන් සැලකිල්ලට නොගනී.

        නිදසුන් : පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය

        සෞඛ්‍ය පහසුකම්වල ගුණාත්මක වෙනස්කම්
    - අධ්‍යාපනය මිනුම් කිරීමේ දී ප්‍රාථමික අධ්‍යාපනයට ආරම්භයේ දී ම යොමු වූ ශිෂ්‍ය සංඛ්‍යාව පමණක් සැලකිල්ලට ගනී. එහෙත් අතරමඟ දී පාසල් හැරයන ප්‍රමාණය සැලකිල්ලට නොගනී.
    - සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මෙම දර්ශකය තුළ අන්තර්ගත නොවේ.

- දර්ශකයට අදාළ ප්‍රධාන පැතිකඩ සඳහා සමාන බර තැබීමක් කර ඇත.

  (මානව සංවර්ධනයෙහි ලා ශ්‍රී ලංකාව අත්පත් කර ගත් ප්‍රගතිය පසුගිය වසර කිහිපයක මානව සංවර්ධන දර්ශක දත්ත යොදා ගනිමින් සිසුන්ට පැහැදිලි කරන්න.)

- ශ්‍රී ලංකාව 2015 වර්ෂය වන විට මානව සංවර්ධන දර්ශකයේ අගය 0.0750ක් ලබා ගනිමින් ලෝකයේ රටවල් අතර 73 වන ස්ථානයේ පසු වේ. දකුණු ආසියානු කලාපීය රටවල් අතර ප්‍රථම ස්ථානයේ පසු වේ.
- ලෝකයේ රටවල සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා පාරිසරික සියලුම අංශවල සංවර්ධනය මැන බැලීම සඳහා 2008 වර්ෂයේ දී සන්තුෂ්ටි දර්ශකය හඳුන්වා දී ඇත.
- සන්තුෂ්ටි දර්ශකයට ඇතුළත් වන සංරචක පහත දැක්වේ.
    - යහපාලනය
    - පරිසරය
    - සංස්කෘතිය
    - මානසික සතුට
    - කාල කළමනාකරණය
    - අධ්‍යාපනය
    - සෞඛ්‍යය
    - ජීවන තත්ත්වය
    - සමාජීය සබඳතා

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.4 :** ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා සම්මත ක්‍රම පරීක්ෂා කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- ආදායම් ව්‍යාප්ති විෂමතාව අර්ථ දක්වයි.
- නිරපේක්ෂ ආදායම සහ සාපේක්ෂ ආදායම් ව්‍යාප්ති විෂමතාව අර්ථ දක්වමින් පැහැදිලි කරයි.
- ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා විවිධ මිනුම් පැහැදිලි කරයි.
- ලෝරන්ස් වක්‍රය නිර්මාණය කරයි.
- ගිණි සංගුණකය ගණනය කරයි.
- පංචමක අපකිරණ අනුපාතිකය විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආදායම් ව්‍යාප්ති විෂමතාව යනු කිසියම් රටක ආදායම් බෙදී ගොස් තිබෙන ආකාරයේ පවතින විෂමතාවය යි.
- කිසියම් රටක ආදායම් ව්‍යාපාතිය දෙස ප්‍රවේශ දෙකක් ඔස්සේ බැලිය හැකි ය. එනම්,
    1. කාර්යාත්මක ආදායම් ව්‍යාප්තිය
    2. පුද්ගල ආදායම් ව්‍යාප්තිය
- කාර්යාත්මක ආදායම් ව්‍යාප්තිය යනු රටක ආදායම් බිහි කරන මූලාශ්‍ර අනුව ආදායම් බෙදී යන ආකාරය විමසා බැලීම යි.
- මෙහි දී භූමිය, ශ්‍රමය, ව්‍යවසායකත්වය යන විවිධ නිෂ්පාදන සම්පත් මූලාශ්‍ර නිසා බිහි වන බදු කුලී, වැටුප්, පොළී, ලාභ යන ප්‍රධාන ආදායම් කාණ්ඩවල සාපේක්ෂ විශාලත්වයන් විමසා බැලේ.
- පුද්ගල ආදායම් ව්‍යාප්තිය යනු ආදායම් උපයන මාර්ගය කුමක් වුවත් එම මූලාශ්‍ර ඔස්සේ පුද්ගලයකු නිශ්චිත කාලයක් තුළ උපයනු ලබන මුළු ආදායම් ප්‍රමාණය අනුව පුද්ගලයන් පෙළ ගැස්වීම යි.
- මෙහි දී පුද්ගලයා උපයන මුළු ආදායම් ප්‍රමාණය අනුව විවිධ ආදායම් පන්තිවලට ඔවුන් අනුයුක්ත කරන අතර එමගින් විවිධ ආදායම් පන්තිවලට ඇතුළත් වන

පුද්ගල සංඛ්‍යාවත්, මුළු ආදායමෙන් ඒ ඒ ආදායම් පන්තියට හිමි වන ප්‍රතිශතයන් ගණනය කළ හැකි ය.


- ආර්ථිකයේ සියලු ම ආදායම් උපයන්නන්ගේ ආදායම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අපහසු බැවින් සියලු දෙනා ම නියෝජනය වන පරිදි තෝරා ගත් නියැදියක් ඇසුරෙන් පවත්වනු ලබන සමීක්ෂණයක් මගින් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව වරින් වර පුද්ගල ආදායම් ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු රැස් කරනු ලබයි.
- පුද්ගල ආදායම් ව්‍යාප්තිය විග්‍රහ කළ හැකි ප්‍රවේශ දෙකකි.
  1. නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය
  2. සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය
- නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය යනු ආර්ථිකය තුළ සිටින විවිධ පුද්ගලයන්ගේ නිරපේක්ෂ ආදායම් මට්ටම් එකිනෙක සංසන්දනය කිරීම යි.
- විවිධ ආදායම් පන්ති යටතේ පුද්ගලයන් පෙළගස්වා ඒ ඒ ආදායම් පන්තිය තුළ සිටින පුද්ගලයන් සංඛ්‍යාවත් පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයත් මෙහි දී ගණනය කළ හැකි ය.
- ආර්ථිකයේ දිළිඳු පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ දත්ත ප්‍රයෝජනවත් වේ.
- සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය යනු ආදායම් මට්ටම අනුව පෙළගස්වන ලද පුද්ගල ආදායම් මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.
- සෑම පුද්ගලයකුගේ ම හෝ කුටුම්බයක ම හෝ මුළු ආදායම ආරෝහණ හෝ අවරෝහණ ක්‍රමයට සකස් කොට ආදායම් ලාභීන් කණ්ඩායම් වශයෙන් පෙළ ගැස්වීමෙන් සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය ගණනය කරනු ලබයි.
- එලෙස ගණනය කරන ලද අඩු ආදායම් ලබන කණ්ඩායමට හිමි වන ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙසත්, ඉහළ ආදායම් ලබන කණ්ඩායමට හිමිවන ආදායම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙසත් ගණනය කොට සංසන්දනය කරයි.
- ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ දත්ත වඩාත් ප්‍රයෝජනවත් වේ.

| නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය | | සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය | |
|---|---|---|---|
| මාසික ආදායම රුපියල් | ආදායම් ලාභීන්ගේ / කුටුම්බ ප්‍රතිශතය | ආදායම් ලාභීන්ගේ / කුටුම්බ දශමක වශයෙන් | ආදායම් ප්‍රතිශතය |
| රු. 1000ට අඩු | 10 | පළමුවන(අඩු ම)10% | 2.5 |
| රු. 1001 - 2000 | 30 | දෙවන 10% | 5.0 |
| රු. 2001 - 3000 | 32 | තෙවන 10% | 24.5 |
| රු. 3001 - 4000 | 20 | සිවු වන 10% | 28.0 |
| රු. 20,000ට වැඩි | 08 | දස වන 10% | 40.0 |
| | 100 | | 100.0 |

- නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය හා සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය ඉදිරිපත් කරන ආකාරය පහත දැක්වේ.
- ආදායම් විෂමතාව මැනීම සඳහා පහත සඳහන් මිනුම් භාවිත කරයි.
  1. ලෝරන්ස් වක්‍රය
  2. ගිනී සංගුණකය
  3. පංචමක අපකිරණ අනුපාතිකය
- ලෝරන්ස් වක්‍රය මගින් පෙන්වන්නේ කිසියම් ආදායම් ව්‍යාප්තියක සමුච්චිත ප්‍රතිශත අගයන් ප්‍රාස්තාරික නිරූපණය කිරීම යි.
- ව්‍යාප්ති විෂමතාවන් හඳුනා ගැනීමට ඉතා ප්‍රයෝජනවත් වන ලෝරන්ස් වක්‍රය 1905 දී ඇමරිකානු ජාතික ආර්ථික විද්‍යාඥයකු වූ මැක්ස් ලෝරන්ස් විසින් හඳුන්වා දෙන ලදි.
- කල්පිත දත්ත යොදා ගනිමින් පහත සඳහන් පරිදි ලෝරන්ස් වක්‍රය නිර්මාණය කළ හැකිය.

| පුද්ගලයන් | ආදායම රුපියල් | මුළු එකතුවේ අනුපාතයක් ලෙස | | සමුච්චිත අගය | | සමුච්චිත අගය ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|---|
| | | පුද්ගලයන් | ආදායම | පුද්ගලයන් | ආදායම | පුද්ගලයන් | ආදායම |
| 1 | 5 | 0.2 | 0.05 | 0.2 | 0.05 | 20 | 5 |
| 1 | 10 | 0.2 | 0.10 | 0.4 | 0.15 | 40 | 15 |
| 1 | 15 | 0.2 | 0.15 | 0.6 | 0.30 | 60 | 30 |
| 1 | 25 | 0.2 | 0.25 | 0.8 | 0.55 | 80 | 55 |
| 1 | 45 | 0.2 | 0.45 | 1.0 | 1.00 | 100 | 100 |

- වගුවේ අවසාන තීරු දෙකෙහි දැක්වෙන දත්ත තිරස් හා සිරස් අක්ෂවල නිරූපණය කරමින් ලෝරන්ස් වක්‍රය පහත පරිදි නිර්මාණය කළ හැකි ය.




- ලෝරන්ස් වක්‍රය සම ව්‍යාප්ති රේඛාවෙන් ඈත් වන විට ආදායම් අසමානතාව වැඩි වන අතර, ලෝරන්ස් වක්‍රය සම ව්‍යාප්ති රේඛාවට ආසන්න වන විට ආදායම් අසමානතාව අඩු වේ. ආදායම් විෂමතාවක් නොමැති නම් ලෝරන්ස් වක්‍රය සම ආදායම් ව්‍යාප්ති රේඛාව මත පතිත වේ.
- කිසියම් ආදායම් ව්‍යාප්තියක පවතින විෂමතාව සංඛ්‍යාවක් මගින් දැක්වීම ගිනී සංගුණකය යි.
- 1912 දී ඉතාලි ජාතික සංඛ්‍යා විද්‍යාඥයකු වූ කොරාඩෝ ගිනී විසින් හඳුන්වා දී ඇති ගිනී සංගුණකය ගණනය කරන ආකාරය ලෝරන්ස් වක්‍රය මගින් පරීක්ෂා කර බැලිය හැකි ය.
- ඉහත රූප සටහනෙහි සම ආදායම් ව්‍යාප්ති රේඛාව OA රේඛාවෙන් දැක්වෙන අතර එම ලක්ෂ්‍ය (OA) සම්බන්ධ කරමින් ලෝරන්ස් වක්‍රය නිර්මාණය කර ඇත. ලෝරන්ස් වක්‍රය මගින් සත්‍ය ආදායම් ව්‍යාප්ති රේඛාව පෙන්නුම් කෙරේ.
- ගිනී සංගුණකය ගණනය කරනුයේ සම ආදායම් ව්‍යාප්ති රේඛාව සහ ලෝරන්ස් වක්‍රය අතර ඇති ප්‍රදේශයේ (C) වර්ගඵලයත් OAB ත්‍රිකෝණයේ වර්ගලයත් අතර අනුපාතයක් වශයෙනි.
- ගිනී සංගුණකය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

$$\text{ගිනී සංගුණකය} = \frac{\text{C කොටසේ වර්ගඵලය}}{\text{OAB ත්‍රිකෝණයේ වර්ගඵලය}}$$

ලෝරන්ස් වක්‍රය OAB ත්‍රිකෝණය මත වැටුනහොත් ආදායම් විෂමතාව උපරිම වේ (ගිනී සංගුණකය 1ට සමානයි).

- මේ අනුව ගිනී සංගුණකය ශුන්‍ය වන විට ආදායම් විෂමතාව අඩු වන අතර ගිනී සංගුණකය 1ට සමාන වන විට ආදායම් විෂමතාව උපරිම වේ.
- ආදායම් ව්‍යාප්තියේ විෂමතාව මැනීම සඳහා මිනුමක් ලෙස පංචමක අපකිරණ අනුපාතිකය භාවිත කරයි.
- ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් පංචමක අපකිරණ අනුපාතිකය ගණනය කරනු ලැබේ.
- මෙහි දී පහළ ආදායමේ සිට ඉහළ ආදායම දක්වා ආදායම ලබන ආකාරය අනුව ආදායම් ලාභීන් ආදායම් පන්තිය පහකට වර්ග කරනු ලැබේ. මෙම ආදායම් පන්ති ආදායම් පංචමක ලෙස හැඳින්වේ. එම ආදායම් පන්ති පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

  1. පහළ ආදායම් ලබන පන්තිය (Low - පළමු වන පංචමකය )
  2. පහළ මැදි ආදායම් ලබන පන්තිය (Low mid - දෙවන පංචමකය)
  3. මැදි ආදායම් ලබන පන්තිය (Mid - තෙවන පංචමකය)
  4. මැදි ඉහළ ආදායම් ලබන පන්තිය ( Mid upper - සිව්වන පංචමකය)
  5. ඉහළ ආදායම් ලබන පන්තිය (Upper - පස් වන පංචමකය)

- මුළු සාමාන්‍ය මාසික ආදායමෙන් එක් එක් ආදායම් පන්තිවලට හිමි සාමාන්‍ය මාසික ආදායම ගණනය කරනු ලැබේ.

නිදසුන් ඃ

| **ආදායම් පන්තිය** | **සාමාන්‍ය මාසික ආදායම** |
|---|---|
| පහළ ආදායම් ලබන පන්තිය | 8 211 |
| පහළ මැදි ආදායම් ලබන පන්තිය | 16 062 |
| මැදි ආදායම් ලබන පන්තිය | 23 880 |
| මැදි ඉහළ ආදායම් ලබන පන්තිය | 35 552 |
| ඉහළ ආදායම් ලබන පන්තිය | 98 575 |

මූලශ්‍රය ඃ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- පහත සඳහන් සූත්‍රය භාවිත කරමින් පංචමක අපකිරණ අනුපාතිකය ගණනය කළ හැකි ය.

$$\text{පංචමක අපකිරණ අනුපාතිකය} = \frac{\text{ඉහළ ආදායම ලබන පන්තියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}{\text{පහළ ආදායම ලබන පන්තියට හිමි සාමාන්‍ය මාසික ආදායම}}$$

නිදසුන් :

- ඉහත වගුවේ තොරතුරු ඇසුරෙන් පහත පරිදි පංචමක අපකිරණ අනුපාතිකය ගණනය කළ හැකි ය.
  - ඉහළ ආදායම ලබන පන්තියට හිමි සාමාන්‍ය මාසික ආදායම = 98 575
  - පහළ ආදායම ලබන පන්තියට හිමි සාමාන්‍ය මාසික ආදායම = 8 211
  - පංචමක අපකිරණ අනුපාතිකය $= \frac{98575}{8211}$ = 12

- පංචමක අපකිරණ අනුපාතිකයේ අගය 12 යන්නෙන් අදහස් වන්නේ පහළ ආදායම් ලබන පන්තියේ සාමාන්‍ය ආදායම මෙන් දොළොස් ගුණයක සාමාන්‍ය ආදායමක් ඉහළ ආදායම් ලබන පන්තියට හිමි වන බවයි.

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායකවීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.5:** දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- දරිද්‍රතා සංකල්පය නිර්වචනය කරයි.
- දරිද්‍රතාව මැනීමේ විවිධ මිනුම් නම් කරයි.
- ජාතික දරිද්‍රතාව ඉම පැහැදිලි කරයි.
- ජනගහන දරිද්‍රතා දර්ශකය පැහැදිලි කරයි.
- ජාත්‍යන්තර දරිද්‍රතා දර්ශකය පැහැදිලි කරයි.
- ජාත්‍යන්තර දරිද්‍රතා ඉම පැහැදිලි කරයි.
- දරිද්‍රතාව මගින් මිනුම් ආශ්‍රයයෙන් රටවල් අතර දරිද්‍රතාව තුලනාත්මක ව විග්‍රහ කරයි.
- දරිද්‍රතාවේ ස්වරූප දෙක හඳුන්වා දෙයි.
- දරිද්‍රතාවේ පැතිකඩ දෙක පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- දරිද්‍රතාව යනු යම් පුද්ගලයකුට හෝ පුද්ගල සමූහයකට හෝ යහපත් පැවැත්මක් සඳහා අවශ්‍ය වන සාධාරණ හේතු සහිත ව හඳුනා ගත් අවම ශුභසාධන තත්ත්වයන්ට එනම් කිසියම් පරිභෝජන හෝ ආදායම් මට්ටමකට හෝ නිවාස, සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සහ මානුෂික අවශ්‍යතා හා පවත්නා සමාජ ආර්ථික තත්ත්වයන් මත හඳුනා ගත් රැකියා දේපළ සහ වෙනත් අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවම මට්ටමකට ළඟා වීමට නොහැකි වීම යි.
- දරිද්‍රතාව, දුඃඛිත භාවය, විහීනතාව, බලරහිත වීම, බැහැර කිරීම, දුප්පත්කම, දිළිඳුකම යන නම්වලින් ද හැඳින්වේ.
- දරිද්‍රතාව විවිධ සංකල්ප ඔස්සේ විග්‍රහ කළ හැකි ය.
- දරිද්‍රතාව මැනීම සඳහා පහත සඳහන් දර්ශක යොදා ගනී.
    1. ජාතික දරිද්‍රතා ඉම
    2. ජනගහන දරිද්‍රතා දර්ශකය
    3. ජාත්‍යන්තර දරිද්‍රතා ඉම
    4. වෙනත් දරිද්‍රතා දර්ශක

- මානව දරිද්‍රතා දර්ශකය
- පාරිභෝජන දරිද්‍රතා දර්ශකය
- දරිද්‍රතා අන්තර් දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය

- ජාතික දරිද්‍රතා ඉම යනුවෙන් අදහස් කරනුයේ මූලික අවශ්‍යතා සඳහා වැඩි වන වියදම පදනම් කර ගත් ක්‍රමවේදයට අනුව දෛනික ඒක පුද්ගල ආහාරමය ශක්ති පරිභෝජන අවශ්‍යතා සහ ආහාර නොවන අත්‍යවශ්‍ය පරිභෝජන අවශ්‍යතා යන අවශ්‍යතාවන් සපුරා ගැනීමට අදාළ ව නිශ්චිත ව පිහිටුවා ඇති නිරපේක්ෂ දරිද්‍රතා රේඛාවකි.
- මෙය ගණනය කරනු ලබන්නේ පුද්ගලයකුට මසක අවම වශයෙන් කායික ශක්තිය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන කැලරි ප්‍රමාණය මිල දී ගැනීම සඳහා වැය කරන වියදමක් ආහාර නොවන අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා වැය කරන මුදලක් සැලකිල්ලට ගැනීමෙනි.
- දියුණු පුද්ගලයකුට දිළිඳු බවින් මිදීමට අවශ්‍ය කරන අවම පෝෂණ මට්ටම ළඟා කර ගැනීමට අවශ්‍ය ආදායම් ජාතික දරිද්‍රතා ඉම වශයෙන් හඳුන්වයි.

  (මේ අනුව ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයකුට දිනකට කිලෝ කැලරි 2030 ක් අවශ්‍ය බව ගණන් බලා ඇත).
- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මිල වෙනස් වීම් සඳහා යාවත්කාලීන කොට මාසික ව ජාතික දරිද්‍රතා ඉමෙහි වටිනාකම මූර්ත අගයක් ලෙස ප්‍රකාශයට පත් කරයි.
- මෙම ජාතික දරිද්‍රතා ඉමට වඩා අඩු ආදායමක් උපයන පුද්ගලයන් දිළින්දන් වශයෙන් හඳුනා ගැනේ.
- ජනගහන දරිද්‍රතා දර්ශකය යනු දරිද්‍රතා ඉමට පහළින් සිටින දිළිඳු ජනගහන ප්‍රමාණය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම යි.
- ජනගහන දරිද්‍රතා දර්ශකය ගණනය කිරීම සඳහා පහත සඳහන් සූත්‍රය යොදා ගනී.

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතා ඉමට පහළ සිටින ජන කොටස}}{\text{මුළු ජනගහනය}} \times 100$$

- 2015 වර්ෂයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්බන්ධයෙන් දිනකට ඇමරිකානු ඩොලර් 1.9 කට වඩා අඩු ආදායමකින් දිවි පෙවෙත රැක ගන්නා ජන අනුපාතය වෙන් කර දක්වන රේඛාව ජාත්‍යන්තර දරිද්‍රතා ඉම යනුවෙන් හැඳින්වේ.

- 2015 වර්ෂයේ දියුණු රටවල් ජාත්‍යන්තර දරිද්‍රතාව ගණනය කිරීමේ දී දිනක ආදායම ඇමරිකානු ඩොලර් 2.5 ට අඩු අදායම් ලබන ජන සංඛ්‍යාව යොදා ගනී.
- වර්තමානයේ ලෝකයේ රටවල දරිද්‍රතාව අඩු වෙමින් පවතින බවක් පෙනී යයි.
- දරිද්‍රතාව මැනීම සඳහා භාවිත කරන වෙනත් දරිද්‍රතා දර්ශක කීපයක් පහත දැක්වේ.
    - මානව දරිද්‍රතා දර්ශකය
    - පරිභෝජන  දරිද්‍රතා දර්ශකය
    - දරිද්‍රතා අන්තර් දර්ශකය
    - බහුමාන දරිද්‍රතා දර්ශකය
- මානව දරිද්‍රතා දර්ශකය යනු ජීවත් වීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති කම වැනි පටු සංකල්පයකට වඩා පැතිකඩ කිහිපයක් සහිත පුළුල් සංකල්පයකි.
- පුද්ගලයෙකුට අර්ථවත් ජීවිතයක් ගත කිරීම සඳහා ඇති තේරීම් හා ඉඩ ප්‍රස්තා අහිමි වීමත් මානව දරිද්‍රතාව යන්නෙන් අදහස් කෙරේ.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව දරිද්‍රතාව මැනීම සඳහා ප්‍රධාන පැතිකඩ 3ක් සැලකිල්ලට ගනී.
    1. දීර්ඝ හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් නොමැති වීම
    2. යහපත් ජීවන තත්ත්වයක් නොලැබීම
    3. දැනුම නොමැති වීම
- මානව දරිද්‍රතා දර්ශකයෙහි ස්වරූප දෙකකි.
    1. සංවර්ධනය වන රටවල් සඳහා සැකසෙන මානව දරිද්‍රතා දර්ශකය
    2. සංවර්ධිත රටවල් සඳහා සැකසෙන මානව දරිද්‍රතා දර්ශකය

    අවම දෛනික ඒක පුද්ගල ආහාරමය ශක්ති පරිභෝජන අවශ්‍යතා හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝජන අවශ්‍යතා ප්‍රමාණයන් මැන දැක්වීම පරිභෝජන අවශ්‍යතා දර්ශකයෙන් සිදු කෙරේ.
- ආහාර හා ආහාර නොවන නිශ්චිත පාරිභෝජන අවශ්‍යතා ප්‍රමාණයන් පදනම් කර ගනිමින් කාලයත් සමඟ එහි පිරිවැයෙහි වෙනස සලකා බලා ඒ අනුව දරිද්‍රතාවයේ වෙනස්කම් විශ්ලේෂණය කිරීම මෙම දර්ශකය මගින් සිදු කෙරේ.
- දිළිඳු පුද්ගලයකුට පරිභෝජන දරිද්‍රතාවයෙන් මිදීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය (හිඟ මුදල් ප්‍රමාණ) දරිද්‍රතා අන්තර් දර්ශකය යන්නෙන් අදහස් කෙරේ.

$$\text{දරිද්‍රතා අන්තර් දර්ශකය} = \frac{\text{දිළිඳු පුද්ගලයකුගේ මුළු මාසික පරිභෝජන වියදම}}{\text{දරිද්‍රතා රේඛාවේ අගය අතර වෙනස}}$$

- දිළිඳු අයකුගේ දරිද්‍රතා අන්තර් දර්ශකයේ අගය 0 ලෙස සලකා මෙම දර්ශකය පිළියෙල කෙරේ.
- ආදායම පදනම් කර ගත් සරල මිනුමක් ඔස්සේ දුගී භාවය මිනුම් කරනවා වෙනුවට කුටුම්බ මට්ටමේ දී පුද්ගලයන්ට මුහුණ පෑමට සිදු වන විවිධාකාර වූ හිඟතාවන් පදනම් කර ගෙන දරිද්‍රතා මිනුම් කිරීම බහුමාන දරිද්‍රතා දර්ශකයෙන් සිදු වේ.
- සෞඛ්‍ය, අධ්‍යාපනය, ජීවන තත්ත්වය යන පුළුල් ක්ෂේත්‍ර තුනට අදාළ විහීනතාවන් 10ක් පාදක කර ගනිමින් බහුමාන දරිද්‍රතා දර්ශකය පිළියෙළ කර ඇත.
- මෙම විහිනතා සියල්ල කැටි කරන ලද විහීනතා දර්ශකයේ අගය 30% ඉක්මවා ඇති කුටුම්බ දිළිඳු කටුම්බ ලෙස හඳුනා ගැනේ.
- විහීනතා දර්ශකය යන දෙකෙහි සාමාන්‍ය අගයන් එකිනෙකින් ගුණ කරමින් බහුමාන දරිද්‍රතා දර්ශකය ලබා ගනී.

බහුමාන දර්ද්‍රතා දර්ශකය = ජනගහන දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය

(ඉහත සඳහන් දර්ශකවල කාලීන දත්ත ඇසුරෙන් රටවල් අතර දරිද්‍රතාව වෙනස් වන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න).

- දරිද්‍රතාවේ ස්වරූප දෙකකි.
  1. නිරපේක්ෂ දරිද්‍රතාව
  2. සාපේක්ෂ දරිද්‍රතාව
- නිරපේක්ෂ දරිද්‍රතාව යනු කිසියම් පුද්ගලයකුට හෝ කුටුම්බයකට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන තත්ත්වයකි.
- ජාතික දරිද්‍රතා ඉම හා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම මගින් පෙන්වනුයේ නිරපේක්ෂ දරිද්‍රතාව යි.
- සාපේක්ෂ දරිද්‍රතාව යනු ආදායම් ව්‍යාප්තියේ විෂමතාව හේතුවෙන් ඇතැම් ජන කොටස්වලට අනෙකුත් ජන කොටස්වලට සාපේක්ෂ ව අඩු ආදායමක් ලබෙන තත්ත්වයකි.

- අඩු ම ආදායම් ලබන 40%ට මුළු ආදායමෙන් කොපමණ ප්‍රමාණයක් හිමි වේ ද යන්න මෙහි දී සලකා බැලේ.
- සාපේක්ෂ දරිද්‍රතාව ආදායම් විෂමතාව තුළින් ඇති වන දරිද්‍රතාවකි.

දරිද්‍රතාවයේ පැතිකඩ දෙකකි.

1. පරිභෝජන දරිද්‍රතාව ( ආදායම් දරිද්‍රතාව)
2. මානව දරිද්‍රතාව

- පරිභෝජන හෙවත් ආදායම් දරිද්‍රතාව යනු අවම ජීවන තත්ත්වයක් සඳහා අවශ්‍ය කරන පරිභෝජන මට්ටම පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් ආදායමක් නොලැබීම යි.
- පරිභෝජ්‍ය දරිද්‍රතාවයේ පැතිකඩ දෙකකි. එනම් නිරපේක්ෂ දරිද්‍රතාව හා සාපේක්ෂ දරිද්‍රතාව යි.
- පරිභෝජන දරිද්‍රතාව මනිනු ලබන්නේ පෝෂණ මට්ටමෙනි. පෝෂණ මට්ටම දෛනික ආහාර වේලක අඩංගු කැලරි ප්‍රමාණය හා ප්‍රෝටීන් ප්‍රමාණය මත ය.
- ලෝක සෞඛ්‍ය සංවිධාන ඇස්තමේන්තුවලට අනුව වයස අවුරුදු 20-30 අතර පුද්ගලයෙකුට දිනකට කැලරි 2500ක් ප්‍රෝටීන් ග්‍රෑම් 53ක් පමණ ද අවශ්‍ය වේ.
- නමුත් ලෝකයේ රටවල් පරිභෝජන දරිද්‍රතාව මැනීම සඳහා තම තමන්ට ආවේණික පෝෂණ මට්ටම් භාවිත කරයි.
- ඒ අනුව ශ්‍රී ලංකාවේ පෝෂණ පදනම කැලරි 2145ක් වේ.
- නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්න ව සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීම සාක්ෂාත් කර ගැනීමට අදාළ මානව සංවර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්තා හා තේරීම් අහිමි වී ගිය තත්ත්වයක් මානව දරිද්‍රතාව ලෙස හැඳින්වේ.
- මානව දරිද්‍රතා දර්ශකය මගින් මැනීමට උත්සාහ කරනුයේ මානව සංවර්ධනයට අහිතකර ලෙස බලපාන විචල්‍යය වේ.
- දීර්ඝායුෂ නොමැති වීම. දැනුම නොමැති වීම, හා යහපත් ජීවන තත්ත්වයක් නොලැබීම යන සාධක පදනම් කර ගනිමින් මානව දරිද්‍රතා දර්ශකය සකස් කර ඇත.

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.6:** ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව විමර්ශනයට ලක් කරයි.

**කාලච්ඡේද ගණන :** 06

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම හඳුන්වයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රදේශීය වෙනම්කම්වලට හේතු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවට හේතු වූ කරුණු ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කරන ක්‍රියාමාර්ග යෝජනා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාව මනිනු ලබන්නේ පරිභෝජන දරිද්‍රතාව පදනම් කර ගෙන යි.
- මෙය ගණනය කිරීම සඳහා අවශ්‍ය ආදායම් හා වියදම් දත්ත සපයා ගනු ලබන්නේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් වසර තුනකට වරක් පවත්වනු ලබන කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණ මගිනි.
- ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන අයුරින් මෑත කාලීන ව මෙම සමීක්ෂණය පවත්වා ඇත්තේ 2012/2013 වර්ෂයේ දී ය.
- මෙම සමීක්ෂණයට අනුව 2009/10 වර්ෂයේ දී 8.9% ක් වූ ජාතික දරිද්‍රතා අනුපාතිකය 2012/13 වර්ෂයේ දී 6.7% දක්වා අඩු වී ඇත.
- ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකය අනුව දිස්ත්‍රික්ක මට්ටමින් අඩු ම දරිද්‍රතා අනුපාතිකය 1.4% ක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ වාර්තා කරන අතර වැඩි ම දරිද්‍රතා අනුපාතිකය වන 28.8% මුලතිව් දිස්ත්‍රික්කය වාර්තා කර ඇත.
- පළාත් වශයෙන් ගත් විට අඩු ම දරිද්‍රතා අනුපාතිකය වන 2.0% බස්නාහිර පළාත් වාර්තා කරන අතර, ඉහළ ම දරිද්‍රතා අනුපාතය වන 15.4% ඌව පළාතෙන් වාර්තා වේ.
- සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ 2012/13 වර්ෂයේ නාගරික අංශයේ දරිද්‍රතා අනුපාතිකය 2.1% ක් ද ග්‍රාමීය අංශයේ දරිද්‍රතා අනුපාතිකය 7.6% ක් ද වතු අංශයේ දරිද්‍රතා අනුපාතිකය 10.9% ක් ද වේ.
- ඉහත සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රදේශීය වෙනස්කම් ඇති වීම කෙරෙහි බලපාන හේතු දැක්වේ.
    - ආර්ථික වර්ධනය පහළ මට්ටමක පැවතීම
    - ජන සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වීම
    - ස්වාභාවික විපත්

- යටිතල පහසුකම් දුර්වල වීම
- අයහපත් රාජ්‍ය පාලනය
- අධ්‍යාපන, සෞඛ්‍ය සේවා දුර්වල වීම
- වෙළෙඳපොළට පිවිසීමේ බාධා
- කුටුම්බවල විශාලත්වය
- පෝෂණ මට්ටම්වල විෂමතා
- සංස්කෘතික බලපෑම්
- අභ්‍යන්තර ගැටුම්

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි පහත සඳහන් සාධක බලපායි.
- ප්‍රදේශීය සාධක
    - නගර හා වෙළෙඳපොළ අතර සබඳතාව දුරස් වීම
    - යුද ගැටුම් හා වාර්ෂික අරගල
    - කෘෂි කර්මාන්තය ප්‍රධාන රැකියා මූලාශ්‍රයයක් වීම
- ආංශික සාධක
    - අධ්‍යාපනයේ ගුණාත්මක බව පහළ මට්ටමක පැවතීම
    - කෘෂි කර්මාන්තයේ ඵලදායිතාව පහළ අගයක් ගැනීම
- කුටුම්බ සාධක
    - පවුලේ වැඩි දරුවන් සංඛ්‍යාවක් සිටීම
    - අඩු අධ්‍යාපන මට්ටම
    - උරුමයෙන් ලත් වත්කම් අඩු වීම
    - මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පහත දැක්වේ.

1. දිළිඳු ජන කොටස්වල ජීවන තත්ත්වය උසස් කිරීමට ඇති අවස්ථා පුළුල් කිරීම
    - රැකියා අවස්ථා බහුල කිරීම
    - සෞඛ්‍ය පහසුකම් සැපයීම
    - යටිතල පහසුකම් සැපයීම
    - කුඩා පරිමාණයේ ව්‍යාපාර ශක්තිමත් කිරීම
    - විවිධ ශුභසාධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
2. තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වන ජන කොටස් සවිබල ගැන්වීම
    - රාජ්‍ය පරිපාලනය පහසු කිරීම
    - නෛතික ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව පුළුල් කිරීම
    - තොරතුරු ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම
3. අනාරක්ෂිත තත්ත්වයෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය රැකවරණ ලබා දීම
    - බෝවන රෝග පාලනය
    - රක්ෂණ ආවරණ ලබා දීම
    - සහනාධාර සැපයීම

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.7:** ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තියේ වෙනස් වීම් සහ එහි ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- ජනගහන වර්ධනය හා එහි තීරක හඳුන්වයි.
- ජනගහනයේ ස්වාභාවික වර්ධන අනුපාතිකය හා ශුද්ධ විග්‍රහ අනුපාතිකය ගණනය කරයි.
- වයස් ව්‍යූහයේ වෙනස් වීම් නිසා ඇති වන ප්‍රතිවිපාක විමර්ශනය කරයි.
- ජනගහන ව්‍යාප්තියේ වෙනස් වීම් හා එහි ආර්ථික ප්‍රතිවිපාක විමර්ශනය කරයි.
- ශ්‍රී ලංකාවේ ජනගහනයේ ආංශික ව්‍යාප්තිය පැහැදිලි කරයි.
- ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය අර්ථ දක්වමින් පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාත අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාත ගණනය කරයි.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- ජනගහනය ගතික ප්‍රපංචයකි. එය නිරන්තරයෙන් වෙනස් වේ.
- රටක ජනගහන වර්ධනය තීරණය කරන ප්‍රධාන සාධක තුනකි.

    1. උපත්
    2. මරණ
    3. සංක්‍රමණ

- උපත් යනු යම් ජන සංඛ්‍යාවකට උපදින සජීව උපත් ප්‍රමාණයයි.
- නිශ්චිත වර්ෂයක මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් දහසකට ඇති වන සජීව උපත් සංඛ්‍යාව දළ උපත් අනුපාතිකය ලෙස හැඳින්වේ.

$$\text{දළ උපත් අනුපාතිකය} = \frac{\text{සජීව උපත් සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 1000$$

- දළ මරණ අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ නිශ්චිත වර්ෂයක මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් පුද්ගලයින් දහසකට සිදු වන මරණ සංඛ්‍යාවයි.

- දළ මරණ අනුපාතිකය පහත සඳහන් පරිදි ගණනය කෙරේ.

$$\text{දළ මරණ අනුපාතිකය} = \frac{\text{මරණ සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 1000$$

- ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනය යනුවෙන් අදහස් කරන්නේ නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ සිදු වූ උපත් හා මරණ සංඛ්‍යාවේ වෙනස යි.
- ස්වාභාවික වර්ධන අනුපාතිකය පහත සඳහන් පරිදි ගණනය කෙරේ.

$$\text{ස්වභාවික වර්ධන අනුපාතිකය} = \frac{\text{උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 100$$

- සංක්‍රමණ යනු පදිංචිය වෙනස් කිරීම සඳහා එක් ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයකට කෙරෙන ස්ථාන මාරුව යි.
- රටවල් අතර කෙරෙන අන්තර් ජාතික සංක්‍රමණයේ දී රටකට ඇතුළු වීම ආගමන ලෙසත් රටකින් වෙනත් රටකට පිටවීම විගමන ලෙසත් හැඳින්වේ.
- මෙම ආගමනවලින් විගමන අඩු කිරීම මගින් ශුද්ධ සංක්‍රමණ ලබා ගත හැකි ය.
- ශුද්ධ සංක්‍රමණ මුළු ජනගහනයෙන් දහසකට කොපමණ දැයි දැක් වූ විට එය ශුද්ධ සංක්‍රමණ අනුපාතිකය ලෙස හැඳින්වේ.

$$\text{ශුද්ධ සංක්‍රමණ අනුපාතය} = \frac{\text{ආගමනය වූ ජන සංඛ්‍යාව - විගමනය වූ ජන සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}} \times 1000$$

- පසුගිය දශක කීපයක් තුළ ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තියේ ඇති වූ වෙනස් වීම් පහත දැක්වේ.
    - ජනගහන වර්ධන වේගය පහත වැටීම
    - වයස් ව්‍යුහයේ විශාල වශයෙන් වෙනස්කම් සිදු වීම
    - ළමා ජනගහන ප්‍රතිශතය අඩු වෙමින් පැවතීම
    - දළ උපත් හා දළ මරණ අනුපාතිකයන් පහළ වැටීම
    - ආයු අපේක්ෂණය ඉහළ අගයක් ගැනීම

- ජනගහන ව්‍යාප්තියේ වයස් ව්‍යුහයේ ඇති වන වෙනස්කම් නිසා පහත ප්‍රතිවිපාකවලට මුහුණ පෑමට සිදු වේ.
  - ශ්‍රම බලකාය පහළ වැටීම
  - යැපුම් අනුපාතිකය ඉහළ යාම
  - ශ්‍රම ඵලදායිතාව අඩු වීම
  - රජයේ වාර්තාහි වියදම් ඉහළ යාම
  - අයවැය හිඟය වැඩි වීම
- ශ්‍රී ලංකාවේ ජනගහනයේ ආංශික සංයුතිය ප්‍රජා විද්‍යාත්මක ව දැක්විය හැකි ආහාර දෙකකි.
  1. ස්ත්‍රී පුරුෂ භාවය අනුව
  2. වයස් සංයුතිය අනුව
- ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය කිරීමේ දී පුමිතිරි අනුපාතය යොදා ගනී.
- පුමතිරි අනුපාතය යනු යම් ජන සංඛ්‍යාවක ස්ත්‍රීන් 100 දෙනෙකුට සිටින පුරුෂ සංඛ්‍යාව කොපමණ ද යන්න දැක්වීම යි.
- පුමතිරි අනුපාතය පහත සඳහන් ආකාරයෙන් ගණනය කරයි.

$$\text{සමස්ත පුමිතිරි අනුපාතය} = \frac{\text{මධ්‍ය වාර්ෂික පුරුෂ සංඛ්‍යාව x 100}}{\text{මධ්‍ය වාර්ෂික ස්ත්‍රී සංඛ්‍යාව}}$$

(ආසන්න වර්ෂවල පුමිතිරි අනුපාත සිසුන්ට ලබා දෙන්න).

- වයස් සංයුතිය යනු වයස් කාණ්ඩ අනුව ජන සංඛ්‍යාව වෙන් කර දැක්වීම යි.

  විග්‍රහ කිරීමේ පහසුව සඳහා බොහෝ රටවල් පහත සඳහන් පරිදි ජන සංඛ්‍යාව කාණ්ඩ තුනකට වෙන් කරයි (ශ්‍රී ලංකාවේ ද එම බෙදීම සිදු කරයි).

  1. ළමා ජනගහනය (අවුරුදු 15ට අඩු)
  2. වැඩ කරන වයස් ජනගහනය (අවුරුදු 15-59 අතර)
  3. වයස්ගත ජනගහනය (අවුරුදු 60 හා ඊට වැඩි )
- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ ප්‍රක්ශේපිත ජන සංඛ්‍යාව (වයස් කාණ්ඩ අනුව) පහත වගුවේ දැක්වේ. මෙහි පාදක වර්ෂය ලෙස යෙදා ගෙන ඇත්තේ 2001 වර්ෂය යි.

| වර්ෂය | අවු. 15ට අඩු ළමයින් | | වැඩ කරන වයසේ ජන සංඛ්‍යාව (අවු.15-59) | | වැඩිහිටියන් (අවු.60ට වැඩි) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 2001 | 4922.4 | 26.3 | 12080.5 | 64.5 | 1731.4 | 9.2 |
| 2006 | 4807.4 | 24.4 | 12836.7 | 65.1 | 2075.7 | 10.5 |
| 2011 | 4692.4 | 22.8 | 13294.8 | 64.7 | 2570.4 | 12.5 |
| 2016 | 4523.6 | 21.4 | 13591.9 | 64.2 | 3070.2 | 14.5 |
| 2021 | 4196.1 | 19.4 | 13378.8 | 63.8 | 3605.1 | 16.7 |
| 2026 | 3825.3 | 17.5 | 13863.2 | 63.6 | 4115.0 | 18.9 |
| 2031 | 3520.3 | 16.1 | 13826.2 | 63.2 | 4536.1 | 20.7 |
| 2036 | 3363.2 | 15.4 | 13589.3 | 62.3 | 4888.8 | 22.4 |
| 2041 | 3299.0 | 15.2 | 13026.7 | 60.0 | 5386.7 | 24.8 |

- ඉහත සංඛ්‍යාලේඛන අනුව ළමා ජන සංඛ්‍යාව හා වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වෙමින් පවතින ආකාරයක් වැඩිහිටි ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින ආකාරයක් පැහැදිලි වේ.
- එක්සත් ජාතින්ගේ සංවිධානය (2015) දක්වන පරිදි අනුව ශ්‍රී ලංකාවේ ජනගහනය දකුණු ආසියාවේ වියපත් ම ජනගහනය වන අතර ලෝකයේ වේගයෙන් වියපත් වන ජනගහන අතරින් එකක් ද වේ.
- 2015 වයසේ ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.96ක් පමණ වූ අතර ඉන් 13.9% ක් වයස අවුරුදු 60ට වැඩි බව ඇස්තමේන්තු කර ඇත.
- වයස අවුරුදු 60ට වැඩි ජනසංඛ්‍යාව වසර 2050 වන විට 68.6% දක්වාත් වසර 2100 වන විට 40.0% දක්වාත් වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. (එක්සත් ජාතින්ගේ සංවිධානය 2015).
- වයස් ව්‍යූහයේ ඇති වී තිබෙන පරිවර්තන හේතුවෙන් වැඩ කරන වයසේ පසු වන ජනගහනයේ ප්‍රතිශතය යැපෙන්නන්ගේ ප්‍රතිශතයට වඩා සැලකිය යුතු ඉහළ අගයක් ගන්නා අතර එය ආර්ථික වර්ධනය සඳහා හිතකර තත්ත්වයක් බව හඳුනා ගෙන ඇත.
- නමුත් ජනගහනය වේගයෙන් වියපත් වීම නිසා මෙම තත්ත්වය වැඩි කාලයක් ගතවීමට පෙර වියැකී යනු ඇත.
- ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය යනුවෙන් අදහස් කරනුයේ රටක හෝ ප්‍රදේශයක හෝ කාලයක් තුළ නොවෙනස් ව ඉහළ මට්ටමක පැවති උපත් හා මරණ අනුපාතික යම් කාලයක දී වෙනස් වීමට පටන් ගෙන ක්‍රමයෙන් අඩු වී නැවත පහත මට්ටමක නොවෙනස් ව පවතින තත්ත්වයකට පත් වීමකි.

- බොහෝ විට ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය අදියර හතරකින් පෙන්නුම් කෙරේ.

  අදියර 1: උපත් අනුපාතිකය හා මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පවතී.
  ස්වාභාවික වර්ධන වේගය ඉතා අඩු ය.

  අදියර 2 : උපත් අනුපාතිකය ඉහළ මට්ටමක පවතී. මරණ අනුපාතිකය ක්‍රමයෙන් පහළ බසී. ස්වභාවික වර්ධන වේගය ක්‍රමයෙන් වැඩි වේ.

  අදියර 3 : උපත් අනුපාතිකය ක්‍රමයෙන් පහළ බසී. මරණ අනුපාතිකය පහළ බැස ඇත. ස්වාභාවික වර්ධනය ක්‍රමයෙන් අඩු වේ.

  අදියර 4 : උපත් අනුපාතික දෙක ම පහත් මට්ටමක නොවෙනස් ව පවතී.
  ස්වාභාවික වර්ධන වේගය අඩු වේ.

- කාර්මීකරණය හා ආර්ථික හා සමාජීය දියුණුව නිසා බොහෝ යුරෝපා රටවල ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය ඉහත අදියර ඔස්සේ සිදු වුණත් මැද පෙරදිග රටවල එය එලෙස ම සිදු වී නැත.
- ආර්ථික වශයෙන් ඉතා ඉහළ මට්ටමකට ළඟා නොවී සිටිය දී ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය අදියර 3 දක්වා සිදු වී තිබේ.
- 2000 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ තෙවන අදියරේ අවසාන අවස්ථාවට ළඟා වී තිබුණ ද 2006/07 ශ්‍රී ලංකා ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයෙන් වාර්තා වන ආකාරයට මුළු සාඵල්‍යතා අනුපාතිකය නැවතත් වැඩි වී ඇති බැවින් ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ආපසු හැරීමක් දැකිය හැකි ය.
- නමුත් 2008 වසරේ සිට මරණ අනුපාතිකය පහළ මට්ටමක පවතින අතර උපත් අනුපාතිකය අඩු වෙමින් පැවතීමත් හා ස්වාභාවික වර්ධන අනුපාතිකය අඩු වීම ක් දැකිය හැකි ය.
- ශුභසාධන , අධ්‍යාපනය හා සෞඛ්‍යය සඳහා දශක කීපයක් පුරා කරන ලද ආයෝජන හේතුවෙන් ආයු අපේක්ෂාව ඉහළ යාම හා ශීඝ්‍රයෙන් පහළ යන සාඵල්‍යතා අනුපාතය සහ ශ්‍රී ලංකාවට අනන්‍ය ජනවිකාශ ලක්ෂණ හේතුවෙන් මෙරට දකුණු ආසියානු කලාපයේ සුවිශේෂ රටක් ලෙස හඳුනා ගෙන ඇත.
- කිසියම් රටක සංඛ්‍යාවක වැඩ කරන වයසේ පුද්ගලයන් 100 දෙනෙකුට සාපේක්ෂ ව යැපෙන්නන් කොපමණ සංඛ්‍යාවක් වේ ද යන්න පිළිබිඹු කරන අගය යැපුම් අනුපාතය යි.
- යැපුම් අනුපාත ප්‍රභේද 3කි. එම ප්‍රභේද හා ඒවා ගණනය කරන ආකාරය පහත දැක්වේ.

1. ළමා යැපුම් අනුපාතය

$$\text{ළමා යැපුම් අනුපාතය} = \frac{\text{අවුරුදු 0-14 අතර ජන සංඛ්‍යාව}}{\text{අවුරුදු 15-59 අතර ජන සංඛ්‍යාව}} \times 100$$

2. වැඩිහිටි යැපුම් අනුපාතය

$$\text{වැඩිහිටි යැපුම් අනුපාතය} = \frac{\text{අවුරුදු 60 හා ඊට වැඩි ජන සංඛ්‍යාව}}{\text{අවුරුදු 15-59 අතර ජන සංඛ්‍යාව}} \times 100$$

3. මුළු යැපුම් අනුපාතය

මුළු යැපුම් අනුපාතය = ළමා යැපුම් අනුපාතය + වැඩිහිටි යැපුම් අනුපාතය

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.8:** ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය හා එය ගණනය කරන ආකාරය විග්‍රය කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- ශ්‍රම බලකාය අර්ථ දක්වයි.
- කල්පිත සංඛ්‍යා දත්ත භාවිත කරමින් ශ්‍රම බලකාය ගණනය කරයි.
- වැඩ කළ හැකි වයසේ ජනගහනය හා ශ්‍රම බලකාය අතර වෙනස පැහැදිලි කරයි.
- ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ගණනය කරයි.
- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ලාක්ෂණික පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- යම් නිශ්චිත කාල සීමාවක් තුළ වැටුපක් හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක් හෝ අපේක්ෂාවෙන් ආර්ථික වටිනාකමක් ඇති භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමය සපයන සහ සැපයීමට අපේක්ෂා කරන අවම හා උපරිම වයස් සීමාවන් තුළ සිටින සියලු ම පුද්ගලයන්ගේ එකතුව ශ්‍රම බලකාය යනුවෙන් හැඳින්වේ.
- වඩාත් සරල ව පවසන්නේ නම් ශ්‍රම බලකාය යනු කිසියම් රටක කිසියම් කාලයක් තුළ (සලකා බලන කාලය තුළ) සේවා නියුක්ත ව සහ සේවා වියුක්ත ව සිටින දෙපිරිසෙහි එකතුව යි.
- ශ්‍රම බලකාය ගණනය කිරීමේදී ලෝකයේ විවිධ රටවල් විවිධ වයස් සීමාවන් යොදා ගනියි.
- ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව ශ්‍රම බලකාය ගණනය කරන ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| මුළු ජනගහනයෙන් වයස අවු. 15 හා ඊට වැඩි සියලු **දෙනා** | | x x x |
| **අඩු කළා :** ගෘහණියන් | x x x | |
| පූර්ණ කාලීන සිසුන් | x x x | |
| පූර්ණ ආබාධිතයන් | x x x | |
| ස්ව කැමැත්තෙන් රැකියා නොකරන අය | x x x | - (x x x) |
| ශ්‍රම බලකාය (වයස අවු. 15 හා ඊට වැඩි **සක්‍රිය** ජනගහනය) | | x x x |

- ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් වයස අවුරුදු 15 හා ඊට වැඩි ජන සංඛ්‍යාව වැඩ කළ හැකි වයසේ ජනගහනය ලෙස හැඳින්වෙන අතර එම වයස් පරාසය තුළ සිටින ජන සංඛ්‍යාවෙන් ගෘහණියන්, පූර්ණ කාලීන ශිෂ්‍යයන්, විශ්‍රාමිකයන්, මහළු අය, බෙලහීන හෝ ආබාධිත අය හෝ , ස්ව කැමැත්තෙන් සේවා වියුක්ත වූවන් අඩු කළ විට ඉතිරි වන ජන සංඛ්‍යාව ශ්‍රම බලකාය යනුවෙන් හැඳින්වේ.
- ශ්‍රම බලකාය වැඩ කළ හැකි වයසේ ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ලෙස හැඳින්වේ.

$$\text{ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය} = \frac{\text{ශ්‍රම බලකාය}}{\text{වැඩ කළ හැකි වයසේ ජනගහනය}} \times 100$$

- ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ මෑත කාලීන ව දැකිය හැකි ලක්ෂණ කීපයක් පහත දැක්වේ.
    - වැඩ කළ හැකි වයසේ ජනගහනය අඩු වීම
    - ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය ඉහළ යාම
    - කාන්තාවන්ගේ ශ්‍රම සහභාගිත්ව අනුපාතය ඉහළ යාම
    - කාන්තාවන්ට සාපේක්ෂ ව පිරිමි ශ්‍රම සහභාගිත්ව අනුපාතය ඉහළ අගයක් ගැනීම

(ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය පිළිබඳ ව මහ බැංකු වාර්ෂික වාර්තාව ඇසුරෙන් සිසුන් සමඟ සාකච්ඡා කරන්න).

**නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

**නිපුණතා මට්ටම 11.9** : ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ හා සේවා වියුක්තියේ ව්‍යුහාත්මක ලක්ෂණ විමසා බලයි.

**කාලච්ඡේද ගණන** : 08

**ඉගෙනුම් පල**

- සේවා නියුක්තිය අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියන්ගේ ලක්ෂණ දක්වයි.
- සේවා නියුක්ති අනුපාතිකය ගණනය කරයි.
- ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතය හා වෙනස් වීම් විමර්ශනය කරයි.
- ඌන සේවා නියුක්තිය අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ ඌන සේවා නියුක්තියට හේතු හා එහි ප්‍රතිවිපාක පෙන්වා දෙයි.
- සේවා වියුක්තිය අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය හා වෙනස් වීම් පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට හේතු පෙන්වා දෙයි.
- සේවා වියුක්තියේ සමාජ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු නිර්වචනයට අනුව සේවා නියුක්තිය යනු සමීක්ෂණය පවත්වනු ලබන දිනට පෙර සතිය තුළ කිසියම් පුද්ගලයකු අවම වශයෙන් පැයක් වත් යම් ආර්ථික ක්‍රියාවලියකට දායක වීම යි.

  සරල ව පැවසුවහොත් සේවා නියුක්තිය යනු වැටුපක් හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක් හෝ අපේක්ෂාවෙන් කිසියම් පුද්ගලයකු ඵලදායි ආර්ථික කටයුත්තක නිරත වීම යි.

- රටක සේවා නියුක්ත පුද්ගලයන් ප්‍රධාන වශයෙන් කොටස් 4කට බෙදිය හැකි ය.

  1. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයන්
  2. සේව්‍යයන්
  3. ස්වයං රැකියාවල නිරත වන්නන්
  4. ගෙවීමක් (වැටුපක්) නොලබන පවුලේ ශ්‍රමිකයන්

- සේවා නියුක්ත ජන සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් වශයෙන් දැක්වීම සේවා නියුක්ති අනුපාතිකය ලෙස හැඳින්වේ.

$$\text{සේවා නියුක්ති අනුපාතය} = \frac{\text{සේවා නියුක්ත ජන සංඛ්‍යාව}}{\text{ශ්‍රම බලකාය}} \times 100$$

- (ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතිකය හා වෙනස් වීම් මහ බැංකු වාර්තාවට අනුව කාලීන දත්ත ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න).
- ඌන සේවා නියුක්තිය යනු ශ්‍රම සම්පත පූර්ණ ලෙස සේවා නියුක්ත නොවීමයි.

- ඌණ සේවා නියුක්තිය ඇති විය හැකි ආකාර දෙකකි.
  1. දාශ්‍ය ඌන සේවා නියුක්තිය
  2. අදාශ්‍ය ඌන සේවා නියුක්තිය
- දෘශ්‍ය ඌන සේවා නියුක්තිය යනු ප්‍රමාණවත් පැය ගණනක් වැඩ නොමැති වීම යි.
- අදෘශ්‍ය ඌන සේවා නියුක්තිය යනු නිපුණතා මට්ටමට වඩා අඩු නිපුණතා මට්ටමේ රැකියාවක නිරත වීම යි.

  නිදසුන් : උපාධිධාරියකු කාර්යාලය ක ලිපිකරුවකු වශයෙන් සේවය කිරීම
- ශ්‍රී ලංකාවේ ඌන සේවා නියුක්තිය කෙරෙහි පහත සඳහන් හේතු බලපා ඇත.
  - රැකියා ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම් හා හැකියාවන් ශ්‍රම වෙළෙඳපොළෙහි අවශ්‍යතාවන් සමග නොගැළපීම
  - ශ්‍රම වෙළෙඳපොළට අවශ්‍ය නිපුණතා බිහි කිරීමට රජය අපොහොසත් වීම
  - ශ්‍රම බලකායේ වර්ධනයට සාපේක්ෂ ව ආර්ථික වර්ධනය වේගවත් නොවීම
  - ආයතන තුළ අවශ්‍ය ප්‍රමාණයට වඩා ශ්‍රමිකයන් රඳවා ගැනීම
- ශ්‍රී ලංකාවේ පවතින ඌන සේවා නියුක්ති තත්ත්වය නිසා පහත සඳහන් ප්‍රතිවිපාකවලට මුහුණ පා ඇත.
  - ආර්ථිකයේ නිෂ්පාදනය අඩු වීම
  - ශ්‍රමය අපතේ යාම
  - ආදායම් ව්‍යාප්ති විෂමතා ඇති වීම
  - ශ්‍රමයේ ඵලදායිතාව අඩු වීම
  - දරිද්‍රතාවට මුහුණ පෑම
  - සමාජ විරෝධී ක්‍රියාවන් ඇති වීම
- සේවා වියුක්තිය යනු ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් කිසියම් ආර්ථික

කටයුත්තකට ශ්‍රමය සැපයීමට කැමැත්තෙන් සිටියත් ඒ සඳහා අවස්ථාවක් නොමැති තත්ත්වයකි.

සේවා වියුක්තියේ ප්‍රභේද 4කි.

1. වාරික සේවා වියුක්තිය
2. සාර්ෂික සේවා වියුක්තිය
3. ව්‍යුහමය සේවා වියුක්තිය
4. චක්‍රීය සේවා වියුක්තිය

- සේවා වියුක්ත ජන සංඛ්‍යාව ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම සේවා වියුක්ත අනුපාතිකයයි.

$$\text{සේවා වියුක්ති අනුපාතිකය} = \frac{\text{සේවා වියුක්ත ජන සංඛ්‍යාව}}{\text{ශ්‍රම බලකාය}} \times 100$$

- ශ්‍රී ලංකාවේ සේවා වියුක්ත අනුපාතිකය හා එහි වෙනස් වීම් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.
  - ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවතීම
  - උගත් තරුණ කොටස් අතර සේවා වියුක්ති අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම
  - ග්‍රාමීය අංශයේ සේවා වියුක්තිය සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගැනීම
  - ස්ත්‍රී සේවා වියුක්තිය සාපේක්ෂ වශයෙන් ඉහළ අගයන් ගැනීම
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය කෙරෙහි බලපාන හේතු කීපයකි.
  - රැකියා ඉල්ලුම් කරන්නන්ගේ සුදුසුකම් හා හැකියාවන් ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවන් සමග නොගැලපීම
  - රැකියාවේ ගරුත්වය හා පිළිගැනීම වැනි කරුණු නිසා පෞද්ගලික අංශයේ රැකියාවලට යොමු නොවී රාජ්‍ය අංශයේ රැකියා ලැබෙන තුරු බලා සිටීම
  - ශ්‍රම බලකයේ වර්ධනයට සමගාමී ව ආර්ථික වර්ධනය වේගවත් නොවීම නිසා රැකියා ජනනය නොවීම
- නීති රීති නිසා පෞද්ගලික නිෂ්පාදන ආයතනවලට සේවකයන් බඳවා ගැනීම සීමා කිරීම
- ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය ඉහළ යාම නිසා පහත සඳහන් ප්‍රතිවිපාකවලට

මුහුණ පා ඇත.

- සමාජයට ලබා ගත හැකි උපරිම නිමැවුම් මට්ටම අහිමි වීම
- දරිද්‍රතාව ඉහළ යාම
- බාහිර සංක්‍රමණ ඉහළ යාම
- රජයේ ශුභසාධන වියදම් ඉහළ යාම
- දේශපාලන හා සමාජ නොසන්සුන්තා ඇති වීම
- සමාජ විරෝධී ක්‍රියා ඉහළ යාම
- පාසල්වලින් හා විශ්ව විද්‍යාලවලින් පිටවන්නන්ගේ නවීන චින්තනය ආකර්ෂණය කර ගැනීමේ ප්‍රමාදය නිසා නව නිපැයුම් බිහි වීම හිඟ වීම

**නිපුණතාව 12.0 : ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යූහය හා ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 12.1 :** නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගත් වෙනස්කම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද ගණන :** 08

**ඉගෙනුම් පල :**

- නිදහසින් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් විස්තර කරයි.
- ආනයන ආදේශන ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ නම් කරයි.
- කාර්මීකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.
- අපනයන අභිමුඛ කාර්මිකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිය අර්ථකථනය කරයි.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණ විස්තර කරයි.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය සහ නිර්බාධකරණ ප්‍රතිපත්ති මගින් ආර්ථිකයට වන බලපෑම විමර්ශනය කරයි.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- නිදහසින් පසු ආර්ථික ලක්ෂණ අනුව අවධි කීපයක් හඳුනාගත හැකි ය.
    - 1948 - 1960 දක්වා අවධිය
    - 1961 - 1977 දක්වා අවධිය
    - 1977 - 1994 දක්වා අවධිය
    - 1994 - 2015 දක්වා අවධිය

- 1948 - 1960 දක්වා අවධියේ ප්‍රධාන ලක්ෂණ
    - යටත් විජිත යුගයේ පැවති ලක්ෂණ සුළු වෙනස්කම් සහිත ව ක්‍රියාත්මක වීම
    - ලෝක බැංකු බලපෑම් ප්‍රථම වතාවට ආර්ථිකය මත පතිත වීම
    - ආර්ථික සංවර්ධනයේ උපාය මාර්ගයක් ලෙස කෘෂිකර්මයට හා කර්මාන්තවලට ප්‍රබල තැනක් ලබා දීම
    - යැපුම් කෘෂිකර්මාන්තය හා ගොවි ජනපද ව්‍යාපාරයේ ප්‍රගතියක් ඇති වීම
    - ගෙවුම් ශේෂ අර්බුද ආරම්භ වීම
    - ආර්ථික ක්‍රම සම්පාදනය සහ සැලසුම් සම්පාදනය ආරම්භ වීම
    - අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය
    - පුළුල් ශුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වීම

    - ජනසතු ව්‍යාපාර ආරම්භ වීම
- 1961 - 1977 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ
    - අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම
    - විනිමය පාලනය, ද්විත්ව විනිමය අනුපාත ක්‍රමය ක්‍රියාත්මක වීම
    - ආනයන පාලනය
    - විදේශ විනිමය අර්බුද ඇති වීම
    - ආනයන ආදේශන කාර්මික ප්‍රතිපත්ති ආරම්භ වීම
    - අපනයන විවිධාංගීකරණය
    - රාජ්‍ය අංශයේ මහා පරිමාණ කර්මාන්ත ආරම්භ වීම
    - දේපොළ හා වත්කම් ප්‍රතිව්‍යාප්තිකරණය
    - විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය

- 1978 - 1994 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ
    - අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්වය
    - ඒකීය විනිමය අනුපාත ක්‍රමයක් ඇති වීම
    - ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඉවත් ඇති කොට පාවෙන විනිමය අනුපාත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
    - විනිමය පාලනය, හා ආනයන පාලනය ඉවත් කිරීම
    - පාලන ප්‍රතිපත්ති ඉවත් කොට ඉල්ලුම් හා සැපයුම් බලවේග ඔස්සේ ක්‍රියාත්මක වන මිල ක්‍රමයකට ඉඩ සැලසීම
    - ශුභසාධන ප්‍රතිපත්ති සීමා කිරිම
    - ආර්ථිකය විවෘත කිරීම
    - ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටු වීම
    - පෞද්ගලීකරණය, ප්‍රතිව්‍යුහගතකරණය වැනි සැපයුම් පාර්ශ්වීය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
    - දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- 1994 - 2015 අවධියේ ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ
    - දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ඔස්සේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති තව දුරටත් ක්‍රියාත්මක වීම
    - විදේශ ආයෝජන සීමා වීම
    - උතුරු නැගෙනහිර යුද්ධය අවසන් කිරීමට විශාල වියදමක් දැරීම
    - යටිතල පහසුකම් සංවර්ධනය
    - විදේශ ණය කෙරෙහි විශාල වශයෙන් යොමු වීම

- දේශීය කෘෂිකර්මාන්ත හා ඉදිකිරීම් කර්මාන්ත කෙරෙහි පුළුල් රාජ්‍ය අනුග්‍රහය දැක්වීම

**ආයනය ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය**

- ආනයන ආදේශන ප්‍රතිපත්ති යනු විදේශ රටවලින් ආනයනය කරන භාණ්ඩ සීමා කර, එම භාණ්ඩ දේශීය ව නිෂ්පාදනය කිරීමට පසුබිම සකස් කිරීම ය.
- පළමු ව සුඛෝපභෝගී භාණ්ඩ හා අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කළ අතර එම භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය ආරම්භ කරන ලදි.
- දෙවනු ව අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන සීමා කළ අතර, ඒවා දේශීය නිෂ්පාදනයට හා අභ්‍යන්තර හුවාමාරු කිරීම් මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කරන ලදි (හාල්, මිරිස්, ලූණු ප්‍රවාහනය සීමා කිරීම).
- ආනයන ආදේශන කෘෂි නිෂ්පාදිතයන් ලෙස සහල්, ලූනු, මිරිස්, කවුපි, සෝයා, මුං ඇට, කුරහන් ආදී නිෂ්පාදිතයන් දිරිගන්වන ලදී.
- ආනයන ආදේශන කර්මාන්ත ලෙස සබන්, සුවඳ විලවුන්, රෙදිපිළි, ඇඟලුම්, බෙහෙත් ද්‍රව්‍ය ආදිපාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය දේශීය වශයෙන් දිරි ගන්වන ලදි.
- මෙකල පැවති විදේශ විනිමය අර්බුදය හා ගෙවුම් ශේෂ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා මෙම ආනයන පාලනය හා විදේශ විනිමය වෙළෙඳපොළ සීමා කිරීම් සිදු කරන ලදී.

**අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය**

- ආනයනය කරන භාණ්ඩවලට ආදේශන ලෙස දේශීය වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනවා වෙනුවට විදේශ වෙළෙඳපොළ ඉලක්ක කොට ගෙන තරගකාරී ව භාණ්ඩ නිෂ්පාදනය කරන කාර්මීකරණ ප්‍රතිපත්ති අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්ති ලෙස අදහස් කරයි.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරිම ආරම්භ වූයේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන් 1977න් පසු කාලපරිච්ඡේදය තුළ ය.
- අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියක ප්‍රධාන ම ඉලක්කය වන්නේ ආනයන සීමා කිරීම නොව අපනයන තරගකාරිත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොළ තුළ සිය ොකටස පුළුල් කර ගැනීම ය.

- 1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ සෙසු ඉලක්ක වූයේ,
  - ගෙවුම් ශේෂ ගැටලු නිරාකරණය
  - විදේශ විනිමය ගැටලු නිරාකරණය
  - ආර්ථික වර්ධන උපාය මාර්ග ලෙස අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය
  - අපනයන ඉලක්ක කර ගත් කර්මාන්ත වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
  - සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීම සඳහා අපනයන වෙත යොමු වූ කර්මාන්ත ප්‍රවර්ධනය
    - විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රසාරණය කරනු පිණිස අපනයන ප්‍රසාරණය
  - අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.
    - මෙය විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අනුබලයක් ලෙස ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්තියකි.
    - නිදහස් වෙළෙඳාමට ඉඩ ලැබෙන පරිදි ආනයන හා අපනයන සීමා ඉවත් කිරීම
    - විදේශ විනිමය සීමා ඉවත් කිරීම
    - ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක් ඇති කිරීම
    - නිල විනිමය ක්‍රමය සහ වි.වි.හි.ස විනිමය අනුපාතය අහෝසි කොට විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම මත තීරණය වන නම්‍ය විනිමය අනුපාත ක්‍රමය ඇති කිරීම
    - විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% ක් අවප්‍රමාණය කිරීම
    - විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම, විදේශ බැංකු හා මූල්‍ය ආයතනවලට රට තුළට පැමිණීමට ඉඩ හසර ලබා දීම
    - ආනයන තීරු බදු ඉවත් කිරීම හා ආනයන තීරු බදු ලිහිල් කිරීම
    - අපනයනය සඳහා පැවති රාජ්‍ය ඒකාධිකාරිය අහෝසි කොට තරගකාරීව අපනයනයට අවස්ථාව ලබා දීම

**නිපුණතාව 12.0 : ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය හා ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 12.2 : ශ්‍රී ලංකා ආර්ථිකයේ නව ප්‍රවණතා ගවේෂණය කරයි.**

**කාලච්ඡේද ගණන : 08**

**ඉගෙනුම් පල :**

- කාලීන දත්ත ඇසුරෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්කම් විස්තර කරයි.
- ආර්ථිකයේ සේවා නියුක්තිය, විදේශ සේවා නියුක්තිය, ප්‍රේෂණ, යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක කර්මාන්තය හ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ ව කාලීන දත්ත ඇසුරෙන් විග්‍රහ කරයි.
- සේවා නියුක්තිය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ හේතු වූ සාධක විස්තර කරයි.
- සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා විශ්ලේෂණය කරයි.
- ප්‍රදේශීය සංවර්ධනයේ වැදගත්කම පැහැදිලි කරයි.
- ආර්ථිකයේ ප්‍රදේශීය සංවර්ධන විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති වූ ව්‍යුහමය වෙනස් වීම් පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.
    - දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහමය වෙනස්කම්
    - සේවා නියුක්තියේ ව්‍යුහය වෙනස් වීම
- දළ දේශීය නිෂ්පාදිතයේ ව්‍යුහය කාලීන ව පහත පරිදි වෙනස් වී ඇත.
  නිදසුන් :
    - කෘෂිකාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම අඩු වීම
    - කාර්මික නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම
    - සේවා නිෂ්පාදිතයේ ප්‍රතිශතක වැදගත්කම වැඩි වීම

( මහ බැංකු වාර්තා ඇසුරෙන්)

- සේවා නියුක්තියේ ව්‍යුහය කාලීන වශයෙන් වෙනස් වී ඇත.
  නිදසුන් :
    - කෘෂි අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය අඩු වී ඇත.
    - කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.
    - සේවා අංශයේ සේවා නියුක්ති ප්‍රතිශතය වැඩි වී ඇත.

**සේවා නියුක්තිය : 1963 2016**

| අංශය | 1963 | 1973 | 1981/82 | 1996/97 | 2003/04 | 2013 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 46.3 | 37.8 | 28.6 | 27.6 | 26.3 | 19.9 | 8.5 | 8.1 |
| කාර්මික අංශය | 36.9 | 45.4 | 47.9 | 42.8 | 47.7 | 52.8 | 54.6 | 56.3 |
| සේවා අංශය | 37 | 34 | 29 | 37 | 40 | 40 | 44 | 44 |

- දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය තුළ හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය තුළ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම අඩු වී කාර්මික අංශයේ ප්‍රතිශකාත්මක වැදගත්කම සහ සේවා අංශයේ ප්‍රතිශතාත්මක වැදගත්කම වැඩි වී ඇත.
  - 1977 න් පසු ශ්‍රී ලංකාව වඩාත් විවෘත ආර්ථික රටාවක් කර මාරුවීමත් සමග ශ්‍රී ලාංකීය සේවකයන් විදේශ සේවා නියුක්තිය කරා යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇති බව පෙනී යයි. එහි අතුරු ඵලයක් ලෙස විදේශවලින් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.

| විදේශ සේවා නියුක්තිය | 2017 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මුළු විදේශ රැකියා | 30073 | 100 | 263443 | 100 | 242930 | 100 |
| ස්ත්‍රී පුරුෂ බව | | | | | | |
| පුරුෂ | 190217 | 63.3 | 172788 | 65.6 | 16032 | 66.0 |
| ස්ත්‍රී | 110486 | 36.7 | 90655 | 34.4 | 82628 | 34.0 |
| ශ්‍රම බාණ්ඩය අනුව | | | | | | |
| වෘත්තීය | 5372 | 1.8 | 6251 | 2.4 | 6574 | 2.7 |
| මධ්‍යම | 20778 | 6.9 | 6951 | 2.6 | 8235 | 3.4 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත පුහුණු ශ්‍රමික | 29267 | 9.7 | 12501 | 4.7 | 19864 | 4.5 |
| පුහුණු ශ්‍රමික | 73162 | 24.3 | 81682 | 31.0 | 76559 | 31.5 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 3977 | 1.3 | 4847 | 1.8 | 3939 | 1.6 |
| නුපුහුණු ශ්‍රමික | 79519 | 26.4 | 77985 | 29.6 | 71641 | 29.6 |
| ගෘහ සේවිකා | 88628 | 29.5 | 73226 | 27.8 | 65127 | 26.8 |

- **විදේශ සේවා නියුක්තියේ මෑත කාලීන ප්‍රවණතා**
  - 2016 වසරේ විදේශ රැකියා සඳහා පිටත් ව යන්නන්ගේ 7.8%ක පහළ යාමක් වාර්තා විය.
  - විදේශ සේවා නියුක්තිය සඳහා පිටත් ව යන්නන් අඛණ්ඩ ව අඩුවීමට හේතු වූයේ, ගෘහසේවිකා පිටත් ව යාම් අඩු කිරීමට රජය ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, පිටත් වීමට පෙර සපුරාලිය යුතු පුහුණු අවශ්‍යතා සහ මැද පෙරදිග රටවල ආර්ථික පසුබැසීම හේතුවෙන් ශ්‍රම ඉල්ලුම පහළ යාම යි.

- දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත් වීම් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද ඉන් වැඩි ප්‍රතිශතයක් (97%) නුපුහුණු ශ්‍රමික කාණ්ඩයට අයත් වේ.

- පුහුණු කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත් වීම් වැඩි වන විට විදේශ ප්‍රේෂණ ගලා ඒම් වැඩි වනු ඇත.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2017 අය වැය මඟින් යෝජනා කළ පරිදි නුපුහුණු ශ්‍රමිකයකුගේ අවම වැටුප $ 350 ලෙස ද පුහුණු ශ්‍රමිකයකුගේ අවම වැටුප $ 450 ලෙස ද නියම කරන ලදී.

- විදේශ සේවා නියුක්ත ලාංකීය ශ්‍රමිකයින් මෙරටට එවන විදේශ මුදල් හා වෙනත් දෑ විදේශ ප්‍රේෂණ ලෙස හඳුන්වයි. ශ්‍රී ලංකාවේ මුළු විදේශ ලැබීම් තුළ ඉහළ ම වැදගත්කම හිමි කර ගන්නේ විදේශ ප්‍රේෂණයන් ය.

**විදේශ සේවා නියුක්තීන්ගේ ප්‍රේෂණ**

එක්සත් ජනපද ඩොලර් මිලියන

| | ප්‍රභවය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| 1. | මැද පෙරදිග | 3358 | 3562 | 3902 | 3796 | 3889 |
| 2. | යුරෝපා සංගමය | 1071 | 1160 | 1270 | 1222 | 1282 |
| 3. | ඈත පෙරදිග ආසියාව | 509 | 557 | 611 | 698 | 739 |
| 4. | අනෙකුත් යුරෝපා රටවල් | 275 | 308 | 337 | 307 | 333 |
| 5. | උතුරු ඇමරිකාව | 174 | 186 | 204 | 209 | 210 |
| 6. | ගින්කොන දිග ආසියාව | 63 | 288 | 316 | 391 | 398 |
| 7. | ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය | 132 | 147 | 161 | 161 | 174 |
| 8. | දකුණු ආසියාව | 90 | 83 | 91 | 98 | 109 |
| 9. | දකුණු හා මධ්‍යම ඇමරිකාව | 48 | 58 | 63 | 63 | 51 |
| 10. | අනෙකුත් | 66 | 58 | 63 | 63 | 51 |
| | එකතුව | 5985 | 6407 | 7018 | 6980 | 7242 |

- විදේශ ප්‍රේෂණ ලැබීම්වල අඩු වීමක් 2015 වසරේ දී වාර්තා කළ ද 2016 වර්ෂයේ දී එය මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කර ඇත. පසුගිය වසරවල විදේශ ප්‍රේෂණ අඩු වී ඇත්තේ මැද පෙරදිග රටවල රැකියා සඳහා පිටත් ව ගිය ශ්‍රමිකයන් ක්‍රමයෙන් අඩු වීම හා මැද පෙරදිග රටවල ආර්ථික පසුබෑම නිසා ශ්‍රම ඉල්ලුම අඩු වීම ය.

- විදේශ සේවා නියුක්තිය හා විදේශ සේවා ප්‍රේෂණ ලැබීම් ආර්ථිකය මත ඇති කරන බලපෑම
    - සේවා වියුක්ති අනුපාතය පහළ යාමට ඉවහල් වීම
    - පුද්ගලයින්ගේ ආදායම් ඉහළ යාම
    - දරිද්‍රතාව පහළ යාම
    - කුටුම්බ ඉතුරුම් වැඩි වී කුඩා ව්‍යවසායන් වර්ධනය වීම
    - විදේශ ඉපයීම් වර්ධනය වීම
    - ගෙවුම් ශේෂ ගැටලුවලට ප්‍රබල විසඳුමක් වීම
    - විදේශ වත්කම් ශක්තිමත් වීම
    - මුදලේ විදේශ අගය ඉහළ යාම
    - දේශීය ශ්‍රම වෙළෙඳපොළේ පුහුණු ශ්‍රම හිඟයක් ඇති වීම හා වැටුප් වට්ටම් ඉහළ යාම
    - පුහුණු ශ්‍රමය විදේශගත වන විට සම්පත් සම්භාරය සංකෝචනය වීම
    - ගෘහ සේවය සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටලුවලට හා දරුවන් හුදෙකලා වීම හා අනාරක්ෂිත වීමට හේතු වීම

- රටක නිෂ්පාදන හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට හා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට උපස්තම්භන වන ප්‍රාග්ධනය, යටිතල පහසුකම් ලෙස හඳුන්වයි. යටිතල පහසුකම් පහත පරිදි වර්ග කළ හැකි ය.

**යටිතල පහසුකම්**

- ආර්ථික යටිතල පහසුකම්
    - දෘඩ පහසුකම්
        - මහා මාර්ග
        - අධිවේගී මාර්ග
        - පාලම්
        - උමං
        - දුම්රිය මාර්ග
        - වාරි මාර්ග
        - ගුවන් තොටුපළ
        - වරාය
        - විදුලි සංදේශ
        - ප්‍රවාහන පද්ධති
    - මෘදු පහසුකම්
        - වෘත්තීය පුහුණු වැඩ සටහන්
        - මූල්‍ය ආයතන පහසුකම්
        - පර්යේෂණ හා සංවර්ධන පහසුකම්
        - තාක්ෂණ හුවමාරුව
        - අපනයන දිරිගැන්වීම්
- සමාජ යටිතල පහසුකම්
    - දෘඩ පහසුකම්
        - රෝහල්
        - පාඨශාලා
        - ජල සම්පාදනය
        - නිවාස
        - ළමා රැකවරණය
        - වැඩිහිටි රැකවරණය
        - බන්ධනාගාර
        - කසළ බැහැර කිරීම
    - මෘදු පහසුකම්
        - සමාජ ආරක්ෂණය
        - ප්‍රජා සේවය
        - පරිසරය සුරැකීමේ ව්‍යාපෘති

- යටිතල පහසුකම් සඳහා වන ආයෝජනය යනු ආර්ථිකය කාර්යක්ෂම ව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කෙරෙන සේවා සහ පහසුකම් සැපයීමට භෞතික හා සංවිධාන ව්‍යුහයන් ගොඩ නැංවීම ය. යටිතල පහසුකම් රටක හෝ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබිඹු කෙරෙන වැදගත් දර්ශකයකි.
- යටිතල පහසුකම් ක්ෂේත්‍රය ආර්ථික හා සමාජීය වශයෙන් උප කොටස් දෙකකට වර්ග කළ හැකි ය. ආර්ථික යටිතල පහසුකම් යනු මහා මාර්ග, ජල සම්පාදන හා ජලා පවහන පහසුකම්, සන්නිවේදන පහසුකම් ජාල යනාදිය ය. සමාජ යටිතල පහසුකම් වනුයේ පාසල්, විශ්වවිද්‍යාල, රෝහල්, නිවාස සංවර්ධනය යනාදිය වේ.
- යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජනය ආර්ථික වෘද්ධියට විවිධාකාරයට දායක වේ. යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම රටක සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ දෙන ප්‍රධාන බාධකයකි. අසතුටු දායක මංමාවත්, වාහන තදබදය, කෙටි දුරක් යාමට වැඩි කාලයක් ගත වීම යනාදිය සංවර්ධන ක්‍රියාවලියට බලපාන සරල බාධාවන් වේ. මහා මාර්ග, පාලම්, වරාය, දුම්රිය මාර්ග, සන්නිවේදන ජාල, වාරිමාර්ග පහසුකම් සංවර්ධනය කිරීම ආර්ථික වෘද්ධියට විශාල අනුබලයක් වේ.
- යටිතල පහසුකම් සංවර්ධනය වී ඇති විට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සහ ඒවා වෙළෙඳපොළට බෙදාහැරීම ඉතා පහසුවෙන් හා කාර්යක්ෂම ව කළ හැකි වේ.
- මෑත දී සිදු කරන ලද පර්යේෂණ හා අධ්‍යයන මගින් හෙළි කොට ඇත්තේ යටිතල පහසුකම් ඉහළ යන සෑම 10% ක් පාසා ම දිගුකාලීන නිමැවුම 1%කින් වර්ධනය වන බව ය.
- යටිතල පහසුකම්වල ආර්ථික හා සමාජීය වශයෙන් වැදගත් වීමට බලපාන හේතු කිහිපයක් පහත දක්වේ.
  - ඵලදායිත්වය ඉහළ යාම
  - ආර්ථික වෘද්ධිය වේගවත් වීම
  - ආයෝජකයින් ආකර්ෂණය කිරීමට පිටිවහල් වීම
  - ආයෝජකයින්ගේ පෞද්ගලික පිරිවැය අඩු වීමට ඉවහල් වීම
  - අපතේ යාම් සහ නාස්ති වීම් අවම වීමට ඉවහල් වීම
  - කළමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂම වීම
  - ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු වීමට ඉවහල් වීම

- සමාජ සංවර්ධනයට හේතු වීම
- මානව ප්‍රාග්ධනය බිහි වීමට හේතු වීම
- ආර්ථිකයේ තරගකාරිත්වය ඉහළ යාම

යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවේශ වන මූලාශ්‍ර කිහිපයකි.

- යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන
- යටිතල පහසුකම් සඳහා ස්වේච්ඡා ආයෝජන
- යටිතල පහසුකම් සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය (PPP)

- යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

| වර්ෂය | ආර්ථික සේවා | | සමාජ සේවා | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස | රුපියල් බිලියන | දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස |
| 2012 | 343.8 | 3.9 | 71.2 | 0.8 | 415.0 | 4.8 |
| 2013 | 369.4 | 3.9 | 77.6 | 0.8 | 447.0 | 4.7 |
| 2014 | 330.1 | 3.2 | 112.3 | 1.1 | 442.5 | 4.4 |
| 2015 | 429.0 | 3.6 | 117.3 | 1.0 | 541.3 | 4.6 |

- ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ආයෝජන, දළ දේශීය නිෂ්පාදන ප්‍රතිශතයක් ලෙස 5% කට ආසන්න මට්ටමේ පවතී. නමුත් ආර්ථිකයේ තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහාත්, ආර්ථික වෘද්ධියේ උපරිම මට්ටමට ළඟා වීම සඳහාත් විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කිරීම සඳහාත්, යටිතල පහසුකම් සංවර්ධනයේ ආයෝජනය තව දුරටත් ඉහළ නැංවීමේ අවශ්‍යතාව පවතී. ඒ සඳහා ඇති ප්‍රබල බාධාවන් වන්නේ රාජ්‍ය ආදායම් සීමිත වීම, රාජ්‍ය ණය ඉහළ යාම වළක්වා ගැනීම, රාජ්‍ය ණය ආපසු ගෙවීම් හැකියාව සීමිත වීම ආදියයි. මේ තත්ත්වය යටතේ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය තුළින් යටිතල පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික ආයෝජන ආකර්ෂණය කර ගැනීම වැදගත් වේ.

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමය ඔස්සේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය දිරිගැන්වීමට ලෝක බැංකුවේ හා USAID ආයතනයේ සහාය ඇති ව මුදල් අමාත්‍යාංශය තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා 2017 ජනවාරි මාසයේ දී අමාත්‍යාංශ අනුමතිය හිමි විය.

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය දිරි ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව මගින් දේශපාලනඥයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් ඇතුළු සියලු ම පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත් බව ඉහළ නැංවිය යුතු අතර පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම සහ සේවාවල ගුණාත්මක භාවය සහ සාධාරණ මිල ගණන් සහතික කිරීමට සුදුසු නියාමන හා පරිපාලන යාන්ත්‍රණය නිර්මාණය කළ යුතු ය. ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල පෞද්ගලික ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති, යහපාලනය. විනිවිද භාවය, ආයතනික හැකියා වැඩි දියුණු කිරීම, ඵලදායි නියාමනයන් හා කාර්යක්ෂම මූල්‍ය වෙළෙඳපොළවල් ආදි පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය. මේ අතර කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීම තහවුරු කිරීම සඳහා ආර්ථිකයට වැඩි ප්‍රතිලාභ හිමි වන අයුරෙන් ව්‍යාපෘතිවල ප්‍රමුඛතා අනුපිළිවෙල හඳුනා ගැනීමට යටිතල පහසුකම් ව්‍යාපෘති පුළුල් ශඛ්‍යතා අධ්‍යයනයකට ලක් කළ යුතු යි.

## යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය

- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ යටිතල පහසුකම් සංවර්ධනයෙහි ලා වඩාත් සාර්ථක ක්‍රමවේදයකි. තනිකරම පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය හෝ ම කාර්යයන් ඉටු කරනවා වෙනුවට, ඒ දෙපාර්ශ්වය ම සහභාගි වෙමින් තම තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශ්වය විසින් තෝරා ගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැගිය හැකි වේ.
- ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වලක්වා ගත හැකි වේ. කාර්ය සාධනය මනින දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය යොදා ගත හැකි ය.
- තනිකර ම රජය හෝ පෞද්ගලික අංශය හෝ ඉටු කරන ව්‍යාපෘතියකට වඩා ඉහළ ආයෝජන ලාභ අනුපාතිකය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති මගින් අත්කර ගත හැකි ය. දෙපාර්ශ්වය ම එක් ව ක්‍රියාත්මක කරන විට සැලසුම් කිරීම හා මූල්‍යනය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.
- ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමකට ලක් කොට එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ හෝ දේශපාලන අවශ්‍යතා සහ වෙනත් අභිලාශයන් මත ශක්‍යතාවකින් තොර ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමට සැලසුම් කරනු ලැබුවහොත් පෞද්ගලික අංශය එවැන්නක් කිරීමට එකඟ නොවනු ඇත.
- පිරිවැය පාලනය කිරීමේලා වඩා පළපුරුද්ද සහ අත්දැකීම් ඇති පෞද්ගලික අංශය වෙත ව්‍යාපෘති මෙහෙයවීම් සහ ක්‍රියාවට නැගීමේ අවදානම් පැවරීමට රජයට අවස්ථාව සැලසේ.

- බොහෝ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති තුළ කල් තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රසාද දීමනා (bonus) ඇතුළත් වන බැවින්, සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂම ව නිම කිරීමට හැකියාව ලැබේ.
- රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ලෙස වැය කිරීම මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත්කමක් ඇති වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව උදා වේ.
- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය රාජ්‍ය මූලයට වාසිදායක වේ. අයවැය පරතරය අඩු කර ගැනීමට දායක වනු ඇත.
- ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරක දීම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.
- රාජ්‍ය වියදම් අඩු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ජනතාව මත බදු බර ද අඩු විය හැකි ය.
- පෞද්ගලීකරණය ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධතාවක් පවතින විට එයට සාර්ථක ව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති දැකිය හැකි ය.

**සංචාරක කර්මාන්තය**

- ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් වන සංචාරක කර්මාන්තය අඛණ්ඩ ව වර්ධනය වීමේ ප්‍රවණතාවක් පෙන්වයි. ඉතිහාසයේ පළමු වර මිලියන දෙකෙහි සන්ධිස්ථානය පසු කරමින් 2016 වසරේ දී සංචාරක පැමිණීමේ සංඛ්‍යාව 2,050,832 ක් දක්වා 14% ක කැපී පෙනෙන වාර්ෂික වර්ධනයක් වාර්තා කළේ ය.
- සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා පිටුවහල් වූ සාධක වනුයේ
    - සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කළ ආයෝජනය ඉහළ යාම
    - නව ගුවන් සේවා, මගී නෞකා සේවා ක්‍රියාත්මක වීම
    - ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීමේ වැඩ සටහන් ක්‍රියාත්මක වීම
    - ලෝකයේ ප්‍රධාන සංචාරක ගමනාන්තවල භූගෝලීය, දේශපාලනික අවිනිශ්චිතතා වර්ධනය වීම
- අප්‍රිකාව හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලෙන් ම සංචාරක පැමිණීම් වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණෙන විශාලතම සංචාරක කලාපය බටහිර යුරෝපයෙනි (31%කි). 2016 වසරේ දී මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 64333කි.

- නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 20.7% කි. 2016 වසරේ දී වැඩි ම සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණි රට ඉන්දියාවයි. දෙවනු ව චීනය ය. තෙවන රට එක්සත් රාජධානියයි. සංචාරකයින් පැමිණීමේ අරමුණ අනුව බලන විට වැඩි ප්‍රතිශතයක් විවේකය ගත කිරීම සඳහා ය.
- මෑත වර්ෂවල සංචාරක ඉපයීම් අඛණ්ඩ ව වර්ධනය වූ අතර එමගින් සේවා ගිණුම ශක්තිමත් විය. 2016 වසරේ මුළු සංචාරක ඉපැයීම් එක්සත් ජනපද ඩොලර් මිලියන 3518 කි. එය පෙර වසරට වඩා 18% ක වර්ධනයකි.
- මෑත වර්ෂවල දී සංචාරක අංශයේ ආයෝජන දිගට ම වර්ධනය විය. 2015 වසරේ දී අනුමත වූ හෝටල් ව්‍යාපෘති 37 සමග සැසඳීමේ දී 2016 වසරේ දී එක්සත් ජනපද ඩොලර් මිලියන 526 කින් සමන්විත හෝටල් ව්‍යාපෘති 41ක් සඳහා අනුමැතිය ලැබී තිබිණි.
- රටෙහි නැගෙනහිර සහ උතුරු පළාත්වල සංචාරක කර්මාන්තයේ ඉහළ විභවතක් උකහා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවධානය යොමුවීමත් සමඟ එම පළාත්වල සංචාරක කර්මාන්තයේ අඛණ්ඩ ව වර්ධනය විය.
- පසුගිය වසර කීපය තුළ ප්‍රබල ප්‍රවර්ධන වැඩ සටහන් හා සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර මෙරටට විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වූව ද, ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළෙඳපොළ තුළ තම පූර්ණ විභවතාව ළඟා කර ගෙන නොමැත.

සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

| ශීර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2016 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් සංඛ්‍යාව | 1,000,605 | 1,274,593 | 1,527,153 | 1,798,380 | 2,050,382 | 14.0 |
| පැමිණීමේ අරමුණ අනුව | | | | | | |
| විනෝදාස්වාදය | 748,436 | 915,208 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 42.7 |
| ව්‍යාපාර | 90,040 | 67,946 | 20,270 | 23,323 | 37,121 | 59.2 |
| වෙනත් | 167,129 | 291,439 | 469,239 | 576,817 | 303,684 | -47.4 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී | 10,056 | 10,909 | 15,119 | 18,163 | 20,918 | 15.2 |
| කාමර උපයෝජනය | 71.2 | 71.7 | 74.3 | 74.5 | 74.8 | 0.4 |
| දළ සංචාරක ලැබීම් | 132,427 | 21,72 | 317,79 | 405,492 | 512,373 | 26.4 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් | 131,688 | 173,594 | 207,889 | 225,476 | 249,837 | 10.8 |
| මුළු සේවා වියුක්තිය | 162,869 | 270,150 | 299,890 | 319,436 | 335,659 | 5.1 |
| සෘජු සේවා නියුක්තිය | 67,862 | 112,550 | 129,790 | 135,930 | 146,115 | 7.5 |
| වක්‍ර සේවා නියුක්තිය | 95,007 | 157,600 | 170,100 | 183,506 | 189,544 | 3.3 |

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව

- මෑත කාලයේ විදේශ විනිමය ඉපයීම හා සේවා නියුක්තිය සම්බන්ධයෙන් සංචාරක කර්මාන්තයේ දායකත්වය පහත පරිදි ඉදිරිපත් කළ හැකි ය.

**විදේශ විනිමය ඉපයීම**

| මුදල් ඒකකය | 2015 | 2016 |
|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් මිලියන | 405,492 | 512,294 |
| ඇමරිකානු ඩොලර් මිලියන | 2,981 | 3,518 |

- ශ්‍රී ලංකාවේ මුළු විදේශීය විනිමය ඉපයීම් සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය 2015 දී 12% ක් වූ අතර 2016 වර්ෂයේ දී එය 14.2% ක් විය. විදේශ ප්‍රේෂණ සහ රෙදිපිළිවලට හා ඇඟලුම්වලට පසුව තුන් වැනි තැනට පත් ව ඇත්තේ සංචාරක කර්මාන්තයයි.

**සේවා නියුක්තිය දායකත්වය**

| | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| සෘජු සේවා නියුක්තිය | 129,790 | 135,930 | 146,115 |

සංචාරක කර්මාන්තය බිහි කළ සෘජු සහ වක්‍ර සේවා නියුක්තිය 2015 දී 319,436 ක් වූ අතර, 2016 දී 335,659 ක් විය.

- සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග කිහිපයකි. සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමී ව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම. අපේක්ෂිත විශාල සංචාරක ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙතැයි ඇස්තමේන්තු කොට ඇතත්, 2016 අවසානයේ දී සංචාරක හෝටල් සහ අතිරේක ආයතන යන දෙඅංශය ම සතු ව ඇත්තේ හෝටල් කාමර 34,000 ක් පමණි.
- සංචාරක ක්ෂේත්‍රයේ නියැළුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම රජයට කිරීම සිදු කළ නොහැකි බැවින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.
- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම. බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කොට නොමැත. ෆෝබ්ස් සඟරාව නම් කර ඇති ලොව හොඳම අන්තර් ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරෙන් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි.

- සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද. කර්මාන්තය තුළ සැලකිය යුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාර ධර්ම වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතු වනු ඇත.

- විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීම ඇති හැකියාව : සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයන් සඳහ අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහි දී චීන භාෂාවෙන් විකාශනය වන රූපවාහිනිය හා ගුවන්විදුලි නාලිකා, චීන භාෂාව කතා කරන සංචාරක මග පෙන්වන්නන් ආදිය අවශ්‍ය වේ.

- නැවතී සිටින රාත්‍රි සංඛ්‍යාව ලෙස ගණනය කෙරෙන සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එකලෙස ම පැවතීම : දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වි තිබුණ ද, ප්‍රධාන වශයෙන් ම සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩු වීම නිසා සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව රාත්‍රි 10 ක් පමණ නොවෙනස් ව පවතී. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ෂණයන් විවිධාංගකරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර එහි දී සංචාරක රාත්‍රි කාල සීමාව අවම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා මගී නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අමුණු කරගත් සංචාර, විනෝදාස්වාදය අරමුණු කර ගත් සංචාර වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතු වේ.

- තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නොව, බස්රථ, කුලී රථ සහ හෝටල් වෙන් කිරීම්, ජංගම දුරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයන්ට සේවා සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ෂණයන් හි සහ ප්‍රධාන ප්‍රවාහණ කේන්ද්‍රස්ථානයන්හි තව දුරටත් වැඩි කිරීම අවශ්‍යතාවක් පවතී.

- සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළු ව සංචාරක කර්මාන්තයේ නියුතු සියලු ම පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍ය වන අතර එමගින් වඩා සහසම්බන්ධතාවකින් යුතුව ඉහළ මට්ටම් ක්‍රමෝපාය ක්‍රියාවට නැගීමට ඉඩ සැලසෙනු ඇත.

- දැනුම් ආර්ථිකය යනු බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පරිභෝජනය සහ නිෂ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල සියලු ආර්ථික

ක්‍රියාකාරකම්වල විශාල කොටසකි. දැනුම් ආර්ථිකය තුළ ස්වාභාවික වටිනාකම්වලින් සැලකිය යුතු කොටසක් අශ්පෘශ්‍ය වත්කම්වලින් සමන්විත වන අතර, එහි සේවක දැනුම් (බුද්ධිමය ප්‍රාග්ධනයේ) වටිනාකමක් ඇතත් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුව මෙම වත්කම් ශේෂ පත්‍රවල ඇතුළත් කිරීමට ඉඩ නොදෙනු ඇත.

- සංවර්ධිත රටවල් කෘෂිකර්මාන්තය සහ නිෂ්පාදන ආර්ථිකය පදනම් කර ගෙන සිටින අතර, දියුණු වෙමින් පවතින රටවල නිෂ්පාදන හා සේවා පාදක ආර්ථිකයන් ද වර්ධනය වී ඇති අතර සංවර්ධිත රටවල සේවා ආර්ථිකය පදනම් කර ගෙන ඇති බව පෙනේ. දැනුම් ආර්ථික ක්‍රියකාරකම්වලට නිදසුන් නම්, පර්යේෂණ, තාක්ෂණික සහාය සහ උපදේශනයන් ය.
- තොරතුරු යුගයේ දී ගෝලීය ආර්ථිකය., දැනුම් ආර්ථිකය වෙත යොමු විය. තොරතුරු යුගයට මෙම සංක්‍රමණය ඇතුළත් වන්නේ, සේවා කාර්යක්ෂම, නිෂ්පාදන කාර්යක්ෂම හා ශ්‍රම සූක්ෂ්ම ආර්ථික වර්ධනයන්ගෙන් ලබා ගන්නා ලද හොඳම භාවිතයන් ය. දැනුම හා දැනුම පදනම් කර ගත් සාධක එකතු කර ඇති අන්තර් සම්බන්ධතා සහ ගෝලීය ආර්ථිකය සඳහා ප්‍රවේශ වන දැනුම සහ වෙළෙඳ රහස් ආර්ථික වර්ධනයේ තීරණාත්මත සාධකයන් වන අතර, ආර්ථික සම්පතක් ලෙස ද වැදගත් වේ.
- දැනුම හා අධ්‍යාපනය යනුවෙන් හඳුන්වන මානව ප්‍රාග්ධනය එලදායි වත්කමක් ලෙස හෝ ව්‍යාපාර නිෂ්පාදනයක් ලෙස හෝ යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අවධානය යොමු කරයි. නිෂ්පාදිත පරිභෝජනයට හෝ අපනයන සඳහා හෝ යොදා ගත හැකි අතර මානව ප්‍රාග්ධනය ව්‍යාපාර සඳහා සහ ආර්ථිකය සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට යොදා ගත හැකි ය.

**දැනුම පදනම් කර ගත් ආර්ථිකයේ ආශ්‍රිත වැදගත් සංකල්ප**

- දැනුම්කරුවන්
- දැනුම් ඉංජිනේරුවන්
- දැනුම් ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- බුද්ධිමය දේපොළ

**දැනුම් ආර්ථිකය කරා යාමේ අභියෝග :**

- ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම
- මේ නිසා සමාජයේ අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පවතී. මේ නිසා මානව ප්‍රාග්ධන සමුච්චිතය පහළ ගොස් ඇත.
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා වැය කරන අරමුදල් පහළ මට්ටමක පැවතීම
- ශ්‍රී ලංකාව තුළ පවතින අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කර ගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරුවීමේ හැකියාව අඩු වී ඇත.
- 1998 වන විට ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටක සිට පහළ මැද ආදායම් ලබන රටක් බවට පත් වීමත් සමඟ ශ්‍රී ලංකාවට විදේශවලින් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා වීම.
- මේ නිසා අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය අඩු වී ඇත.
- ඍජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රම සූක්ෂ්ම කර්මාන්ත වෙත බහුල වශයෙන් ගලා ඒම නිසා මානව ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්තා අඩු වීම

**දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය**

- දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය සකස් කිරීමට පහත සඳහන් නිර්ණායක යොදා ගනී.
  - ආර්ථික සානුබලය සහ ආයතනික ව්‍යූහය
  - නව්‍යතාවන් හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ නැඹුරුව
  - අධ්‍යාපනය හා පුහුණුව
  - ICT යටිතල පහසුකම්
- මෙම දර්ශකය අනුව 2012 වර්ෂයේ ප්‍රමුඛස්ථානය ගත් රටවල් පහත දැක්වේ.
  - ස්වීඩනය
  - ෆින්ලන්තය
  - ඩෙන්මාර්කය
  - නෙදර්ලන්තය
  - නෝර්වේ

- නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල වැඩි ප්‍රතිලාභ හිමි වූයේ නාගරික අංශයට යි. එම නිසා ශ්‍රී ලංකාවේ ඉහළ ආර්ථික වෘද්ධියක් හා සමාජ සංවර්ධනයක් හිමි කර ගනු ලැබුවේ බස්නාහිර පළාතින් කොළඹ දිස්ත්‍රික්කය යි. දිවයිනේ සෙසු පළාත් හා දිස්ත්‍රික්ක ඊට සමගාමී ව අඩු සංවර්ධන මට්ටමක් හිමි කර ගත් නිසා තුලිත ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති තෝරා ගත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කිරීමට සිදු විය.
- ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත, උතුරු පළාත, ඌව පළාත යන පළාත්වල විරැකියාව, ආදායම් ව්‍යාප්ත වීමේ විෂමතාව හා දරිද්‍රතාව ඉහළ මට්ටමක තිබූ අතර යටිතල පහසුකම් හා මානව නිපුණතා සංවර්ධනය අඩු මට්ටමක පැවතිණි. මේ නිසා එම දිස්ත්‍රික්ක අළලා ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පැන නැගුණි. ඒ සඳහා විවිධ ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.

  නිදසුන් : ග්‍රාම ශක්ති ව්‍යාපාරය, ගම්පෙරලිය වැඩ සටහන, උදාගම් වැඩ සටහන, ගම නැගුම, ගැමි පුබුදුව, ගැමිදිරිය, ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම

( කාලීන නිදසුන් ඇසුරෙන් සිසුන්ට පැහැදිලි කරන්න.)

**නිපුණතාව 12.0 : ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යූහය හා ප්‍රතිපත්ති පිළිබඳ ව තුලනාත්මක ව විමර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 12.3 :** සමකාලින ආර්ථික සිදු වීම් සහ ප්‍රතිපත්ති විමර්ශන කරයි.

**කාලච්ඡේද ගණන** : 04

**ඉගෙනුම් පල :**

- ආර්ථිකයට දේශීය හා ගෝලිය සිදු වීම් බලපාන ආකාරය විස්තර කරයි.
- දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධිවලට නිදසුන් දක්වයි.
- දේශීය හා ගෝලීය ආර්ථික සිද්ධි ඇති වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.
- සමකාලීන ආර්ථික ප්‍රතිපත්ති විස්තර කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- වර්තමාන ලෝකයේ සෑම රටක් ම බාහිර ලෝකයට විවිධ ප්‍රමාණවලින් විවෘත ව පවතී. එනම් ආවෘත ආර්ථිකයන් දක්නට නැත. එම නිසා ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට දේශීය සංසිද්ධි මෙන් ම ගෝලීය සිදු වීම් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි.
- මෙහි දී දේශීය හා ගෝලීය සිදු වීම් ආර්ථිකයේ විවිධ අංශ වෙත සෘජුව ම හෝ වක්‍ර ලෙස බලපෑම් ඇති කරයි. එනම් සාර්ව ආර්ථිකයේ,
    - නිෂ්පාදනය
    - සේවා නියුක්තිය
    - මිල මට්ටම
    - පොළී අනුපාතිකය
    - අන්තර් ජාතික වෙළෙඳාම
    - ගෙවුම් ශේෂය
    - විදේශ විනිමය අනුපාතිකය
    - ප්‍රාග්ධන වෙළෙඳපොළ යන අංශ කෙරෙහි බලපෑම් ඇති කරයි.
- ආර්ථිකයට බලපාන දේශීය සිදු වීම්වලට නිදසුන් කිපයක් පහත දැක්වේ.
    - ආණ්ඩු බලය වෙනස් වීම

    නිදසුන් :

    - 1977 බලයට පත් වූ නව රජය ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා විදේශ වෙළෙඳ රටාව, දේශීය වෙළෙඳ රටාව, කර්මාන්ත ව්‍යූහය, මූල්‍ය හා බැංකු පද්ධතිය මුළුමනින් ම වෙනස් විය.

- 1994 ආණ්ඩු බලය වෙනස් වීම් සමග ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස් වීම් නිසා ආර්ථිකය ගමන් කළ දිශාව කිසියම් ප්‍රමාණයකින් වෙනස් විය. එනම් ආර්ථිකයේ විවෘත භාවය ඉතා සුළු ප්‍රමාණයකින් අඩු කිරීම, පෞද්ගලීකරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම, මිල ස්ථායිතාව, සේවා වියුක්ති ගැටලු අවම කිරීම, නීතිය හා සාමය තව දුරටත් ශක්තිමත් කිරීම ආදි වශයෙන් කාලීන වෙනස්කම් ගණනාවක් සිදු විය.
- 2006 වර්ෂයේ දී ආණ්ඩු බලය වෙනස් වීම මත දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නව ආර්ථික ප්‍රතිපත්ති හා ගැළපුම් ක්‍රියාත්මක කිරීම සිදු විය.
    - දේශීය කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීම
    - පෞද්ගලීකරණ වැඩ පිළිවෙළ සීමා කිරීම
- 2015 ආණ්ඩු බලය වෙනස් වීමත් සමග නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් කරා නැඹුරු වීම, යහපාලනය පිළිබඳ කතිකාව, ජාතික ඒකාබද්ධතාවක් ඇති කිරීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීම ආදි වෙනස්කම් සිදු විය.
- 1983 සිට 2009 දක්වා (අවුරුදු 30) පැවති යුද තත්ත්වය

  මේ නිසා රටේ යටිතල පහසුකම්. කර්මාන්ත ශාලා, කෘෂිකාර්මික ගොවිබිම් විනාශ වු අතර, නිෂ්පාදනය පහළ වැටිණි. විරැකියාව වැඩි විය. දේශීය සම්පත් ඌන උපයෝජනයට ලක් විය. රජයට ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදු විය.
- 1989 සිට 1991 දක්වා දිවයිනේ සෙසු ප්‍රදේශවල පැවති සිවිල් අරගල සිදු වීම ද රටේ නිෂ්පාදනය පහළ යාමට මිල මට්ටම ඉහළ යාමට, දේපොළ සම්පත් හා යටිතල පහසුකම් විනාශ වීමට හේතු විය.
- වරින් වර ඇති වූ ස්වාභාවික උපද්‍රව
    - 2004 වර්ෂයේ ඇති වූ සුනාමි තත්ත්වය
    - වරින් වර ඇති වූ ගංවතුර හා නායයාම්
    - වරින් වර ඇති වූ නියඟ තත්ත්වයන්
    - වන සතුන්ගෙන් ඇති වන හානි

  ආර්ථිකයට බලපෑ ගෝලීය සිදු වීම් සඳහා පහත සඳහන් නිදසුන් දැක්විය හැකි ය.
- ආසියාතික මූල්‍ය අර්බුදය

  මේ නිසා අග්නිදිග ආසියා කලාපයේ මූල්‍ය වෙළෙඳපොළ දැඩි පීඩනයකට ලක් වීම නිසා හා එම කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් ඒකක දැඩි ලෙස

අවප්‍රමාණය විය. මේ නිසා ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම, එම කලාපයෙන් ආනයනය කරන භාණ්ඩ මිල ගණන් ඉහළ යාම සිදු විය.

- යුරෝපා ආර්ථික අර්බුදය

2006 වසරේ සිට ඇමරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ ආර්ථික අවපාතය නිසා එම කලාපයේ නිෂ්පාදනය පහළ ගිය අතර, විරැකියාව වැඩි විය. මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. දැඩි රාජ්‍ය ණය අර්බුදයක් හට ගැණිනි. මෙය ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ, විදේශ සේවා නියුක්තිය, විදේශ ආයෝජන අඩු වීම කෙරෙහි විශාල බලපෑමක් ඇති කෙරිණ.

- ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගට ම ඇති වූ අර්බුදයන්

විශේෂයෙන් ඉරාකය, ඇෆ්ගනිස්ථානය, සිරියාව, ආදී රටවල ඇති වූ යුද ගැටුම් නිසා ඛනිජ තෙල් මිල ඉහළ යාම ශ්‍රී ලංකාවේ ආනයන වෙළෙඳපොළ පහළ යාම, විදේශ ආයෝජන අඩු වීම සිදු විය.

- ලෝකයේ ඛනිජ තෙල් හා රන් මිල ගණන් ඉහළ යාම. මේ නිසා ලංකාවේ ආනයන වියදම ඉහළ යාම, ගෙවුම් ශේෂ හිඟය, රුපියලේ විදේශ අගය පහළ යාම, බලශක්ති හා බැඳුණු උද්ධමනය ඉහළ යාම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බලපා ඇත.

- ලෝක ආහාර හිඟය

2000 වසරේ මුල් වකවානුවේ දී ලෝකයේ ආහාර නිෂ්පාදනය කරන රටවල්වල ඇති වූ බලපෑම නිසා සහ ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් භාවිත කිරීම නිසා දැවැන්ත ආහාර හිඟයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ආනයනය කරන තිරිඟු පිටි, කිරි පිටි, සීනි ආදී ආහාර මිල ගණන් ශීඝ්‍රයෙන් වැඩි විය.

- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව

ශීඝ්‍ර කාර්මීකරණයත් සමග ගෝලීය අවකාශයට මුදා හැරෙන අහිතකර වායූන් නිසා ගෝලීය උෂ්ණත්වය ශීඝ්‍රයෙන් ඉහළ යාමෙන් ග්ලැසියර් දියවීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සිදු වේ. එමෙන් ම සාගර සම්පත් විනාශ වීම, බෝග එලදාව අඩු වීම ද මේ නිසා සිදු වේ. කෘෂි කාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෙම තත්ත්වය විශාල ලෙස බලපෑම් ඇති කරයි.

**මූලාශ්‍ර :**


අතපත්තු, ඩී. (2009). *ආර්ථික විද්‍යා ප්‍රවේශය 1(පළමු මුද්‍රණය).* මහරගම තරංජි ප්‍රින්ට්ස්

අතපත්තු, ඩී. (2011). *ආර්ථික විද්‍යා ප්‍රවේශය 2.(පළමු මුද්‍රණය).* මහරගම තරංජි ප්‍රින්ට්ස්

ශ්‍රී ලංකා මහ බැංකුව, (2016). *වාර්ෂික වාර්තාව 2015.* ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව, (2017). *වාර්ෂික වාර්තාව 2016.* ශ්‍රී ලංකා මහ බැංකුව

Anderton, A. (2005). *Economics.- 3rd edition*. Delhi: Pearson Education Pte. Ltd.

Mankiw, G.N. (2007) *Pricipal of Economic 4th Edition.* Thomas South Western

Peter S. (2007). *Edexcel Advanced Economics.* Philip Allan Updates